


www.sinhalaelibrary.com








# 01

**සැ**න්ද ඉර මලේ අවසන් ලා රෝස පැහැය මෘදු ලෙස කාමරයට කඩා වැටුණි.. මම කියවමින් සිටි ආර්ථික විද්‍යා සටහන් පොත නවා තැබුවෙමි. මේ දහවල් තැම කං පුවුලේ ඉඳගත් ගමන්ය.. උසස් පෙළ විභාගයට තව ඇත්තේ හරියටම සති දෙකක් පමණි. අතට ගත් පොතක් බිමින් තබන්නට බිය හිතෙන්නේ ඒ නිසාය.

දිගටම තනිවම කාමරයට වී පාඩම් කරද්දී මට මහා පාළුවක් දැනෙයි.. පාඩම් කරන නිසා අම්මාවත් නංගිවත් කතා කරන්නටවත් එන්නේ නැත.. තේ එකක් රැගෙන දෙදෙනාගෙන් කෙනෙකු කාමරයට ආවද 'ඔයා පාඩම් කරන්න' යැයි කියා මාව තනිකර යති.

එහෙත් මේ පාළුවට මම ආශා කළෙමි. අළුත් නිවසේ මේ තනි පුංචි කාමරය මම මුලදීම තෝරා ගත්තේද එසේ තනිවෙන්නට තිබූ ආශාව නිසාය.. හැම හැන්දෑවකම කාමරයට යාබදව තිබූ කුඩා බැල්කනියේ වේවැල් පුටුවක් තබාගෙන ඈත රබර් ගස් දෙස මම බලාගෙන ඉන්නෙමි. පාන්දරක නම් මෙතෙනට ඈත සමනල කන්දද පෙනේ.. තුනී මීදුම තට්ටු අතරින් සමනල කන්ද දකිද්දී හදවතට වෙනමම බැතිබර හැඟීමක් දනෙයි. හයියෙන් වැහි වැටෙන අහස අඳුරු මන්දරම් වූ දිනයක සමනල කන්ද නොපෙනෙයි.. එහෙම දවසට මුළු තුන් හිතටම මහා දුකක් දනෙයි...

මම කමිසය ගලවා දමා සරම පිටින්ම බැල්කනියට ගියෙමි. පොතටම ඇලී තිබීම නිසා අඳුරු වී ගිය දෙනෙතට බටහිර අහසේ බැස යමින් තිබූ ඉරේ එළිය එක්වරම හසුවිය.. දැස් කැවෙන්නට වූයෙන් මම දෑතින්ම දෙනෙත් පොඩිතර ගත්තෙමි....

දෑසින් දේතම ගෙන සෙමෙන් දෙනෙත් හැරියෙමි. දුටු දසුනෙන් මම ඇත්තටම ඇවිලී ගියෙමි. දැස් වල පටලයක් වැනි යමක් බැඳී තිබුනෙන් මම දෙතුන් වරක් ඇහිපිය ගැහුවෙමි.. නැත... මා දකින්නේ සිහිනයක් නොවේ... සැබෑවකි...

අපේ නිවසට සමාන්තරව ඉදිරිපස වූ ඉඩමේ තිබූ අඩක් නිම කළනිවසේ උඩු මහලේ සිට යුවතියක් මා දෙසම බලා උන්නාය.. මගේ දැස් වලින් ඒ තරම් හැඟීම් බර යුවතියක් මීට පෙර මම දැක නොමැත්තෙමි. අඩක් නිම කළ උඩු මහලේ කොන්ක්‍රීට් කණුවකට බර වී ඇය බලා උන්නේ මා දෙසමය..

මට දෙනෙත් ඈ වෙතින් ඉවතට ගන්නට මොහොතක් ගතවිය. නොසිතූ මොහොතක ඇය සිනාසුනාය.. ඒ හිනාව පපුවේ බිත්ති ඇල්පෙනිති තුඩකින් ඉරා දමන්නාක් බඳු විය..





මට සිනාසෙන්නට අමතක විය...

ජීවිතයේ ප්‍රථම වරට මම යුවතියකගේ ඇස් දෙකක් ඉදිරියේ අසරණ වූයෙමි. මගේ සුරත ගියේ පපුවටය.. උඩු කය නිරුවත් බව මට දැනුනේ එවිටය.. මම වහා බැල්කනියෙන් තිබූ වේවැල් පුටුවට බර වූණෙමි. දැන් ඇයට පෙනෙතත් පෙනෙන්නේ මගේ මුහුණ පමණි.. එහෙත් මට ඇයව මුළුමනින්ම පෙනේ.. බටර් පැහැයට හුරු කහ පැහැගත් සල්වාර් ඇඳුම... ගෙළ දිගේ විත් කරට වැටුණු නිදහස් කොණ්ඩය පමණක් නොව තටාකාර ඇහි බැම, මැද නළලේ පහළ තබා තිබූ කුඩා පොට්ටුව පවා මම අපූරුවට දැක ගත්තෙමි.

ඇය දෙස තව වරක් බලන්නට මට ආශා සිතුණි. බැලිය නොහැක්කේ ඇගේ දැස් සරලව මා දෙසට යොමුව තිබූ නිසාය... මටද තිබුණේ එහෙමම ඈ දෙස බලන්නටය... එහෙත් ඊට කලින් හිත කළබල වී ඇත. සමහර විට හිතේ කළබලය දැස් වලින් පිට වන්නට ඇත.

කොන්ක්‍රීට් කුළුණ බද උන් ඇය තවත් තත්පරයක් ඉඳ කපරාරු නොකළ ගඩොල් බිත්ති අතරින් නොපෙනී ගියාය...

මට හීල්ලින....

මගේ දැස උනන්දුවෙන් කලබලයෙන් අළුත් නිවසේ ගඩොල් බිත්ති දිගේ යන්නට විය... ඇයවත් ඇගේ බටර් පැහැගත් සල්වාර් ඇඳුමවත් පෙනෙන්නට නැත.

හිනාවෙන්නට බැරි වීම ගැන මම දුක් උනෙමි...

මාස ගණනක් තිස්සේ මේ නිවස ගොඩ නැංවෙමින් තිබුණද ඇයව මම කිසි දිනයක නොදුටුවෙමි. එක අතකට එය දකින්නට මම ගෙදරද නොවුන්නෙමි.. පාන්දරම පාසැල් ගොස් ඒ ගමන්ම අමතර පංති ගොස් මා එද්දී කළුවරද වැටී අවසානය..



www.sinhalaelibrary.com

ඇය දිගටම එන්නට ඇත.

මම වේවැල් පුටුව බැල්කනිය වටා වූ කෙටි තාප්පය අසළටම ගෙන තාප්පයට දෑතම තබා ඊට මුහුණ බර කළෙමි.. අළුත් නිවස වඩාත් පැහැදිලිව පෙනෙන්නේ දැන්ය.

එහෙත් ඇය පෙනෙන්නට නැත.

එකවරම කපරාරු නොකළ උඩු මහලේ බිත්තියක් අතර තිබූ සිදුරකින් ඒ සුදු මුහුණ මතුවිය.. මම දෙවන වතාවටත් ගැස්සී ගියෙමි... ඇය එවරද සිනාසුනාය.. මම සිනා නොළෙමි.. මොහොතක් බලා සිට ඇය ගඩොල් බිත්තිය මත තව සුදු සිනා ඉරක් තබා නොපෙනී ගියාය....

මම දෙවන වතාවටත් තැවුනෙමි...

පාන්දර සිට කාමරයට වී පාඩම් කර එක්තැන් කර ගත් සිත මොහොතකට බැල්කනියට පැමිණ මම නාස්ති කරගත්තෙමි. මේ තරමට හිත කලබල වූ තවත් දවසක් නැත. මම අපමණ දුකකින් අලුත් නිවසට එහා වූ රබර් ගස් දෙස බලා උන්නෙමි.. ඇගේ මුහුණේ වූ ලා රෝස පැහැයට සමාන පාටක් රබර් ගස්වලට ඉහළින් වූ බටහිර අහසේ විය.

තව එක් වරක් හෝ ඒ මුහුණ කොහෙන් හෝ මතුවේයැයි සිතා මම බැල්කනියේ පමා උනෙමි.

මේ අළුත් දෙමහල් නිවස හදන්නේ ඇගේ පියා විය යුතුය.

අපේ ගෙයත් ඒ ඉදිරිපිට හැදෙන මේ අලුත් නිවසත් තවත් ගෙවල් තුන හතරකුත් හැරුණුකොට වෙන්දේසි වත්තේ බොහෝ ඉඩම් හිස්ය... මේ ඉඩම හැඳින්වූයේ 'කුරුළු කැලේ' යනුවෙනි. විශාල රබර් වත්තක කොටසක් එළිකර එය කැබලි කර 'කුරුළු කැලේ' පාඩ තිබුණි. කුරුළු කැලේ පළවෙනි ඉඩම ගත්තේ තාත්තාය.. තාත්තා මේ ඉඩම ගන්නට ප්‍රථමව







මාවත් අම්මාවත් නංගීවත් මෙතනට රැගෙන ආවේය. ඉඩම දුටු විටම එය මගේ සිත් ගත්තේය.. බලන බලන අත නිල්වත් රබර් ගස් පිරුණු තරමක් උස් බිමක් වූ මෙතන අපේ කුඩා නිවස හැදෙනවා දකින්නට මම ආශා කළෙමි. පරිසරය පුරා තිබූ අහිංසක ගැමි බවට මගේ හිත තදින් ඇදී ගියේය.

'අපි ඉඩම ගමු තාත්තේ.. මේ ඉඩම ගොඩාක් ලස්සනයි...'

මම එක පෙළට කැබලි කර තිබූ ඉඩම් වලින් රබර් යාය අද්දරම වූ ඉඩම පෙන්වා කීවෙමි.

'පාළු නැද්ද අයියේ....'

නංගී මගේ ළඟට වී ඇසුවාය.

'චුට්ටක් පාළු නම් තමා.. ඒත් නිස්කලංකයි....'

මම වත්තේ මායිම් අතර ඇවිදිමින් කීවෙමි.

'වටේ පිටේ ඔයාට බලන්න කෙල්ලෙක්වත් නෑ.....'

නංගී මගේ ළඟටම පැමිණ රහසින් මෙන් කීවාය.

'ඒකද..... නැත්නම් ලයින් පාරක්වත් දන්න කොල්ලෙක් නැති නිසාද....'

'අනේ යනවා යන්න... ඔයා ගැන පව් හිතිලා කිව්වේ...'

'බයවෙන්න එපා. ගෙවල් හැදෙද්දී.. කොල්ලෝ එයි.....'

තාත්තා ඉඩම ගත්තේය. ජීවිතය පුරාවට ඉතිරි කළ සියල්ලම දමා ඔහු නිවස හැදුවේය.. තනි තට්ටුවට හදන්නට ගිය ගෙය ඔහු බැංකු ණයක් ගෙන තට්ටු දෙකටම හැදුවේය.. අපි ගිය සිංහල අවුරුද්දට කිරි උතුරවා ගෙට ගෙවැදුනෙමු..

'ඔන්න මං දෙන්නටම කියන්නේ. තව ගෙවල් හදන්න මේ තාත්තා ගාව සල්ලි නම් නෑ.. දෙන්නාගෙ කටයුතු කෙරෙන

කාලෙක දෙන්නා තට්ටු දෙක බෙදගෙන ඉන්න ඕන.....'

තාත්තා කිරි උගුරවා අවසන් වූ පසු කීවේය.. නංගී මා දෙස හොරැහින් බැලුවාය..

'අයියා කවදාවත් බඳින්නේ නැතිලුනේ තාත්තේ.. දවසක් මට කිව්වා අනුරාධපුර පැත්තේ ආරාමයකට ගිහිල්ලා මහණ වෙනවා කියලා.. ඒ නිසා ප්‍රශ්නයක් නෑ.. අයියා ගියාට පස්සේ තට්ටු දෙකම මගෙ..'

නංගී කීවේ විහිළුවටය.. නමුත් ඇය කීවේ බොරුද නොවේ.. දවසක් මම එසේ ඇයට කීවෙමි.. ඒ ඇයිදැයි මමද නොදන්නෙමි..

'ඇත්තද ලොකු පුතේ...'

අම්මා දැස් ලොකු කරගෙන ඇසුවාය.

'මට ගෙවල් ඕන නෑ අම්මේ... තාත්තා එකපාරම ගේ නංගිගෙ නමට ලියන්න....'

මම එද නංගී දෙසද බලා කීවෙමි.. ඇගේ ඇස්වල කඳුළු පිරුණි...

'අ....ත්. මං විහිළුවට අයියේ කිව්වේ... ඔයා නැතුව අපිට ඉන්න බෑ.. බලන්න තාත්තේ පිස්සා වගේ කියන කතා....'

නංගීට හැඬුණි.. ඇය එපමණටම මට ආදරය කරන බවක් මම නොදැන උන්නෙමි..

'ලොකු පුතා ඔහොම හිතන්න නම් එපා තමයි... කවදහරි මම නැති කාලෙක ඔයා අම්මවයි නංගිවයි ඇස්දෙක වගේ බලාගන්න ඕනේ.....'

තාත්තාගේ කතාවට මගේ ලය පිච්චී ගියේය.. මම





කඳුළු උනන බව දැනගෙන උඩු මහළට ආවෙමි..

කුරුළු කැලේ අපේ නිවස ඉදිරිපිට තිබූ හිස් ඉඩමේ මේ ගොඩ නැගෙන අළුත් දෙමහල් නිවස ගැන මෙතුවක් මගේ හැඟීමක් නොවීය. ඒ නිවස කාගේද... ඒ නිවසේ සාමාජිකයන් කවුද.. කිසිවක් මම නොදන්නෙමි. එහෙත් ඒ සියල්ල ඉක්මනින්ම දැනගැනීමේ විශාල ආශාවක් අද මට ඇති විය.

දැන් මුළු පරිසරයම කළුවරේ ගිලී ඇත. අළුත් නිවසේ ගඩොල් බිත්ති මතවද අඳුර පහත් වී ඇත.. සමහර විට ඇය යන්නට ඇත... එහෙත් යනවානම් යා යුත්තේ නිවස ඉදිරිපිට ගුරු පාරෙනි.. මම එබී පාර දෙස බැලුවෙමි.. නිවස ඉදිරිපිට නැවැත්වූ ඔවුන්ගේ සුදු කාර් රිය තවමත් එහෙම්මය.

ඇය කොහාට ගියාද... මේ කළුවරේ ඇය ගෙතුළට වී මොනාවා කරනවාද.. ඇය ආවේ කාත් සමඟද... මම අනාථ වී ගිය හදවතින් සිතුවෙමි...

තවත් එක් වරක් අළුත් නිවස දෙස බලා මම කාමරයට ආවෙමි.. කාමරයට ආපසුද එදෙස බැලුවෙමි... නිහඬ ගඩොල් බිත්ති අතර අඳුර මීසක මොහොතකට කලින් දුටු සඳ දැන් නැත...

පාළු වී ගිය සිතින් මම ඇඳට වැටුණෙමි. හිතට තිබුණාටත් වඩා පාළුවක් සාංකාවක් දැනුණි.. ඒ මෙතෙක් මට දැනුණු පාළුව නොවේ... ඊට වඩා තෙතමනයක් ඇති පාළුවකි... නැවතත් ඇයව කවද දකින්නට ලැබේවිද... මම අසරණව සිතුවෙමි...

මම දැහැනින් මිදුනේ නිවසේ සීනුව දෙවරක් නාද වූ නිසාය.. කාමරයෙන් ගෙතුළට පැමිණි මම පියගැට පෙළ වටා වූ ලී අත්වැටට බර වුනෙමි....

'නංගී.. කවුද ඇවිත්... ඔයා කොහෙද...'

මම කෑ ගැසුවෙමි.....



www.sinhalaelibrary.com

'අනේ අයියේ... හොඳ චූටි මහත්තයා වගේ බලන්න....

මං ඇහ හෝදනවෝ...'

නංගී නාන කාමරයේ සිට කෑ ගැසුවාය...

'ඇයි... අම්මා කෝ.....'

'අම්මා වටුමට ගියෝ.....'

මම කමිසයක් ඇඟට දමාගෙන බොත්තම් නොපියවාගෙනම පැමිණ දොර ඇරියෙමි. අහිංසක යැයි... බොහෝ අහිංසක යැයි සිතිය හැකි සුන්දර සිනහවක්ද හීන් බැල්මක්ද සහිතව ඇය දොරකඩ උන්නාය. මම හිරි වැටී ගියෙමි. දොර පළුව අල්ලාගෙන මම මොහොතක් ඇය දෙස බලා උන්නෙමි. ඇය ඈත සිට දක්නාටත් වඩා ලස්සනය. යුවතියකගේ ලස්සනක් මේ තරම් ළඟට මම කෙදිනකවත් දැක නොමැත්තෙමි.

'ඇ..යි...'

මම ගොත ගැසී ඇසුවෙමි. ඇය උන්නේද කතා කර ගත නොහැකිවය. මම සත්තු වත්තේ ඔරං ඔටං කෙනෙකු මෙන් දොර පළුවේ එල්ලී බලා උන්නෙමි.

'අපේ කාර් එක ස්ටාට් වෙන්නේ නෑ... චූ..ට...ට..ක්...'

ඇය අසරණව කීවාය. කුමක් කළ යුතු දැයි මම නොදැන උන්නෙමි.

'මොනවද කරන්න ඕන...'

මම ඇයටත් වඩා අසරණව ඇසුවෙමි.

'පො...ඩි... තල්ලුවක් දැම්ම නම් ස්ටාට් වෙයි... අම්මයි මායි ඩ්‍රයිවර් අන්කල්යි විතරයි ආවේ...'

ඇය දෙඩවූයේ මා තරම් අසීරුතාවයකින් නොවේ...





ඇයගේ බැල්මෙන් උතුර දකුණ සොයා ගත නොහැකිව අනාථ වී ඇත්තේ මං පමණි...

'ය...න්...'

මම කමිසයේ බොත්තම් පියවමින්ම මිදුලට බැස්සෙමි. ඇගේ දෙකොල් මත අර තුනී සිනහව යළිත් සටහන් විය... ගේට්ටුව තෙක් ඇය ගියේ මා ඉදිරියෙනි. ඒ අතරවාරයේදී මම ඇය දෙස ඕනවාටත් වඩා බලා උන්නෙමි.

ඇගේ වරලස පැත්තක කුඩා සමනලයෙකුගේ හැඩයේ කොණ්ඩ කට්ටක් විය. එය ගලවා ගන්නට ඇත්නම් යැයි නිකමට මට සිතුණි.

'අයියට කරදරයක්ද දන්නෑ... පාඩම් කර කර නේද උන්නේ...'

ගේට්ටුව ළඟදී ඇය ආපසු හැරී ඇසුවාය. ඇගේ වතටම යොමුව තිබූ ඇස් හදිස්සියේම ඉවතට ගන්නට මට අමතක විය. මා පාඩම් කරමින් උන් බව ඇය දන්නේ කෙසේද. සමහර විට මා බැල්කනියට එන්නට පෙර සිටම ඇය ඒ පැත්තේ සිට මගේ කාමරය දෙස බලාගෙන ඉන්නට ඇත..

'කමක් නෑ... යන්...'

ඒ වචන ටික පමණක් ශලපා ගන්නට මට හැකි විය. වාහනය ළඟ උන්නේ ඇගේ මවත් රියදුරාත් පමණි. මා දුටු විටම ඇගේ අම්මා දයාබර ලෙස සිනාසුනාය.

'අනේ මේ පුතාට කරදර කළාද දන්නෑ... මේ පැත්තේ කවුරුවත් නෑ පුතා...'

මම එසේ නැතැයි කියන්නට මෙන් සිනාසුනෙමි. ඇගේ දෙනෙත් තිබුනේ මා වෙතමය. මම උවමනාවෙන්ම ඒ දෙනෙත් මඟ හැරියෙමි.



www.sinhalaelibrary.com

'චූටි මහත්තයා පොඩි තල්ලුවක් දෙන්න. පල්ලමට අල්ලගත්තොත් ස්ටාට් වෙයි...'

රියදුරු අහිංසක ලෙස මට කියා වාහනයට නැග්ගේය. මා මැදි කරගෙන අම්මාත් දුවත් වාහනය තල්ලු කරන්නට සූදානම් විය.

'ඇන්ටි ඉන්න... ඇන්ටිට බෑ...'

ඇය අපේ අම්මාගේ වයසේය.. ඒ වයසට මෙවැනි බර වැඩක් කළ නොහැක.

මම ඇය දෙස නොබැලුවෙමි. ඇයටද නවතින ලෙස කිව යුතුව තිබුණි. ඒ සියුමැලි දත් වලින් වාහන තල්ලු කළ නොහැක.

'මං ගණන් කරන්නද...'

ඇය සල්වාර් ගවුමේ පොට කරින් පිටුපසට දමා මහා දෙයක් කරන්නට මෙන් සූදානම් වූවාය. මට හිනා යන්නට ආවෙන් මම ඉවක බලා ගත්තෙමි.

මම ඩිකිය ආසන්නයෙන් අල්ලා වාහනය තල්ලු කළෙමි. වාහනය ඉදිරියට ඇදුනේ හෙමින් හෙමින්ය. මම ඒ අතරවාරයේදී අත්කරු අතරින් ඇය දෙස බැලුවෙමි. ඇත්තටම ඇයට අමාරුය. කොල්පට හපාගෙන අමාරුවෙන් වාහනය තල්ලු කරන ඇය ගැන මට මහා දුකක් දැනුණි.

'අ..නේ... අමාරුයි...'

එක තැනකදී ඇය වාහනය අතහැර ඉණට දත් බැඳගෙන හති ඇරියාය... කුඩා දහදිය බුබුළු ඒ මූණ පුරාම මතුවී තිබුණි...

'අයින් වෙන්න මං තනියම තල්ලු කරන්නම්...'

මම හෙත් බිමට බර කරගෙන කීවෙමි.





'ක..ම..ක්... නෑ.. මට මහන්සි නෑ...'

ඇය මා කියන දේ ගණනකට නොගෙන යළිත් වාහනය තල්ලු කරන්නට ආවාය. අප අතර තිබුනේ අඩියක පමණ පරතරයක් පමණි. ඒ මුහුණට වඩා මට පෙණුනේ වාහනයේ ඩිකිය මත තිබූ ඇගේ කුඩා අත් දෙකය.

පල්ලමකට ටික දුරක් යා යුතුය. ඒ දුරත් ඇය මා සමඟ එනවානම් හොඳය... එහෙත් ඊට කලින් ඇයට හති වැටුණි...

'මට තනියම පුළුවන්...'

එසේ කියා මම ගතේ සියළු ශක්තිය යොදා වාහනය තල්ලු කළෙමි. වාහනය පල්ලමෙන් පහළට තල්ලු කළ වහා එය වේගයෙන් පහළට හඹාගෙන ගියේය. හිතුවාට වඩා කලින් ඇන්ජිම පණ ගැන්විණ..

අප ආ ගුරුපාර මැද නතරවී ඇය බලාගත්වනම බලා උන්නාය. ගෙදරට යනවානම් මා යා යුත්තේ ඇයව පසු කරගෙනය.

සැන්දෑ සුළඟේ තිබූ දඟකාරකමට ඇඳගෙන සිටි සරම සට පට ගා සුළඟේ ගසාගෙන යන්නට විය. මම අමාරුවෙන් එය සකසාගෙන ගුරුපාර දිගේ ඉදිරියට ආවෙමි. ගුරුපාර මැදදී ඇය මා හා සමාන්තරව වැටුණාය.

'මං හිතන් උන්නේ ස්ටාට් වෙන එකක් නෑ කියලා...'

සෑහෙන තරම් ලෙන්ගතු ලීලාවෙන් ඇය මා හා කීවාය.

මට ඒ ඇස්වලට එක එල්ලේ මුහුණ දෙන්නට තරම් ශක්තියක් නොවීය.

'බැටිරි බැහැලා ඇති නේද...'

'ම්...'



www.sinhalaelibrary.com

මම බිම බලාගෙන උත්තර දුන්නෙමි. ඇගේ වචන වල හැටියට මා වචන පාවිච්චි කරනවා හොඳටම මදිය.

ඇගේ අම්මා ඉන්නේ අළුතින් හදන නිවස ඉදිරිපිටය. ඇය වෙත යන්නට අප තව අඩි පණහක් පමණ යා යුතුය. ඕනානම් ඒ අතරතුර මොනවා මොනවා හෝ කතා කළ හැක. මා කතා කරනවානම් ඇය උත්තර දෙන්නට සූදානම්ය... එහෙත් මට කතා කරගන්නට තියා හුස්ම ගන්නට වත් නිස්කලංකයක් නැත. හිතට මේ හදිසියේ වූයේ කුමක්ද...

'ඒ ලෙවල් වලටද පාඩම් කරන්නේ...'

මම සැනින් ඇය දෙස බැලුවෙමි. ඇය උන්නේ සල්වාර් කමිසයේ උතුරු සළුපටකින් ගෙල දෙපස රැඳුණු දහදිය බිංදු පිසමිනි. මම උසස් පෙළට පාඩම් කරනා බව ඇය දන්නේ කෙසේද...

'ඕ...ව්..'

මම තනි වචනයෙන් උත්තර දුන්නෙමි.

'ක..ට.. සති දෙකයි නේද...'

එවැනි සාමාන්‍ය මට්ටමේ ප්‍රශ්නයකට පවා පිළිතුරු දෙන්නට මම අපොහොසත් වූයෙමි.

'අයියගෙ කාමරේ තියෙන තැන හරි ලස්සනයි... නිස්කලංකයි... හොඳට පාඩම් හිටිනවා ඇති...'

මගෙන් පිළිතුරු බලාපොරොත්තු නොවීම ඇය කියාගෙන යයි. මම මහා ආඩම්බරකාරයෙකු නොවූනෙමි. ඔළුව උදුම්මවාගත් කෙනෙකුද නොවීමි. එහෙත් මට ඇගේ එක ප්‍රශ්නයකටවත් බඩ පිරෙන උත්තරයක් දිය නොහැක්කේ ඇයි...

'අද දිනෙල්කා ගෙදර නැද්ද...'





ඇය නම් ප්‍රඥාකාර යුවතියකි.. ඇය කියන්නේ නංගි ගැනයි. මේ සියල්ල ඇය දන්නේ කෙසේද...

ඇයව මා ප්‍රථම වරට දුටුවේ අදය... මා උසස් පෙළ කරනා බව ඇය දනී.. මා පාඩම් කරන්නේ උසස් පෙළට බව ඇය දනී... නංගීව අඳුනයි... මේ කිසිවක් මම නොදනිමි. ඇයවද නොදනිමි.

'නංගි බාත් රූම් එකේ හිටියා...'

'ඒක තමයි පේන්න නැත්තේ.. මම දිනෙල්කට මතක් කළා කියන්න...'

'කවුරු මතක් කළා කියල මං නංගිට කියන්නද..'

මම ඇගේ නමක්වත් නොදන්නෙමි. දුටුවේද අදමය...

පල්ලමට පණ ගැන්වී ගිය ඔවුන්ගේ වාහනය අප සමීපයට සේන්දු විය..

'අනේ පුතා ගොඩාක් ස්තූතියි.. අම්මයි තාත්තයි නම් අපිව දන්නවා.. පුතාලගේ ගේ ඉස්සරහා මේ ගේ හදන්නෙ අපි... පුතා ගැන අම්මා කිව්වා. අද තමා දක්කෙ... යන්නං පුතා...'

ඇගේ මව කුළුණුබරව කීවාය...

'හොඳයි ඇන්ටි.. ගිහිල්ලා එන්න..'

අම්මා වාහනයට ගොඩ වුවත් ඇය ඊට ගොඩ වෙන්නට පමා වූවාය... අපේ ඇස් අවසන් වතාවට හමුවුනේ පරිසරයේ රැඳුණු ලා අඳුර මැදය...

'යන්නම්... කරදර කළාට අයියා අපට සමාවෙන්න... දන් පාඩම් කර කර හිටපු තැනත් මතක නැතුව ඇති..'

ඒ සිනාව හදවතේ ගැස්ම නවත්වන සුළුය. මම රොබෝ

කෙනෙකු සේ හිස වැනුවෙමි. ඇය තවත් එක් වරක් මා දෙස බලා වාහනයට ගොඩ වූවාය..

ඔවුන්ගේ වාහනය ගුරු පාරේ ඉදිරියට යද්දී ඒ දෙස නොබලා ඉන්නට මට නොහැකි විය. අඩි තිහක් පමණ ඉදිරියට ගිය පසු ඇය පසුපස හැරී බලනු මම වීදුරුවෙන් දක්කෙමි.

ඔවුන් නොපෙනීම ගිය පසු මම අනාථ වූවෙකු මෙන් ගුරු පාරේ ඇවිද්දෙමි. ඔවුන්ගේ නිවස දෙස දහ දෙළොස් වතාවක් බැලුවෙමි.

ඇය කියුවා හරිය. දත් පාඩම් කර නැවැත්වූ තැනවත් මතක නැත. සියල්ලම සමඟින් ඔළුව අවුල්වී ඇත. එහෙත් හදවත කොනකට මොන මොනවදෝ වැටෙමින් තිබුණි...

සියල්ල සිදුවූවේ විනාඩි තිහක් පමණ කාලයක් තුළය. ඒ විනාඩි තිහේ හදවත තුළ ඇති වූ කම්පනය දවස් තිහ හතළිහක් තිස්සේ වූ දෙයක් මෙනි.

# 02

මා ගැන ඇය කොතරම් දේ දන්නවාද... ඒවා දනගත්තේ කෙසේද... කාගෙන්ද.. මා නැති දවසක ඔවුන් අපේ ගෙදරට පැමිණෙන්නට ඇත.. අම්මාත් තාත්තාත් අසල්වාසීන්ට හිතවත්ය. ඔවුන් මේ ගෙදර අයට කරුණාබරව සළකන්නට ඇත... මා ගැන කියන්නට ඇත්තේ නංගී සහ අම්මාය. ඒවා ඇසුවේ කවුද... මා ගැන දනගැනීම වැදගත් වන්නේ කාටද...

මා හා ගත කළ මේ විනාඩි විස්සේ වැඩිපුරම කතා කළේ ඇයයි.. මා හුම්ටි තැබුවා පමණි. ඇය ගැන කිසිත් නොදන මා කුමක් කතා කරන්නද...

"අයියේ... තේ හැදුවා..."

නංගී ගේට්ටුව අසළටම පැමිණ කීවාය. ඇය ගැන

කොරතුරක් හෝඩුවාවක් දන ගත හැක්කේ නංගීගෙනි. ඒ කිසිවක් අසන්නට මටනම් ශක්තියක් නැත. ජීවිතේ කිසිම දිනයක මම කෙල්ලෙකු ගැන නංගී සමඟ කතා කර නොමැත්තෙමි.

'ඇයි අයියෙ අද කවදවත් නැතුව පාරට වෙලා...'

නංගී ඉවෙන් මෙන් ඇසුවාය. ඇය ඇඟ සෝදාගෙන අලුත් ගවුමක් දගෙන මුහුණ පුරා තුනී පුයර තට්ටුවක් ගල්වාගෙන උන්නාය.

'ඔයාගේ යාළුවෙක් දන් ඇවිත් ගියා. ඔයාට මතක් කරන්න කිව්වා...'

මම නංගිගේ කටින්ම සියල්ල අසාගන්නට සිතා කීවෙමි.

'ම..ගේ යා...ළු...වෙ...ක්.. මෙහේ..'

ඇය ඇසුවේ පුදුමයෙනි.

'ඔ..ව් මේ ගෙදර..'

මම බොරු සැහැල්ලුවක් මවාගෙන කීවෙමි. නංගී මා දෙස බලා උන්නේ තොල් පිට පෙරලාගෙන මනාමාල සිනහවක්ද සමඟිනි.

'එහෙනම් අයියා කෙල්ලව දක්කා...'

නංගී තවත් පරීක්ෂාකාරීව මගේ මුහුණ වෙතට හැරී කීවාය. මම ඇතුළතින් කලබල වී බාහිරින් සන්සුන් වන්නට සටන් කළෙමි.

'අද ඇඳගෙන හිටියේ මොන පාට සල්වාර් එකක්ද...'

මම ඉවත බලාගත්තෙමි. නංගී ඒ පැත්තට ආවාය.

'මට මතක නැහැ..'

මම ඒ තරම් උනන්දුවකින් තොරව කීවෙමි. නමුත් ඇය



sl - unlimited.com
www.sinhalaelibrary.com



ඇඳගෙන ආ සල්වාර් ගවුමේ පාට පමණක් නොව ඒ දෙබැම මැද තිබූ පොට්ටුවේ පාට පවා මට මතකය. ඒ සියල්ල ඒ තරම් ලස්සනට මගේ හදවතේ ඇඳුනේ කෙසේද...

'කෙල්ල... හරි ල...ස්...ස...න...යි... නේද අයියේ..'

නංගී පද්ද පද්ද ඇසුවාය. මම පොතක් රැගෙනම පැමිණ දෙරකඩ බිම වාඩිළුනෙමි.

'ඔයා කොහොමද දන්නෙ එයාව...'

මම නැඹිලි පැළය ගැන දනගන්නට වට රවුමෙන් ආවෙමි.

'ඒක නෙමෙයි අයියට දනගන්න ඕන.. කෙල්ල කවුද... එයාගේ නම මොකක්ද... කොහෙද ඉන්නේ... ජීවිතේ..'

නංගිව තම්බන්නට මා ළඟ ඇති ගොරකා මදිය.

'පව්නේ... මං කියන්නම්... එයා ශහීනා.. එන අවුරුද්දේ ඒ ලෙවල් කරන්නේ.. හැබැයි මහත්තයෝ කෙල්ල මුස්ලිම්...'

'මු...ස්...ලි...ම්'

මම ඒ වචන ප්‍රතිරාවය කළෙමි.

'ඇයි බයද...'

'මම මොනාට බයවෙන්නද...'

'නෑ එකපාරටම අයියගේ මූණ අමුතු උනා..'

නංගී සමඟ කතා කළ යුත්තේ පරිස්සමිනි. ඇය මගේ මුහුණින් ඉක්මනින්ම හැඟීම් අල්ලාගනී.

'තාත්තට ජුවලරි ෂොප් එකක් තියෙනවා... පවුලේ එකම කෙල්ල... දනට ඉන්නෙ මහරගම.. නව මාසෙකින් ගෙයි වැඩ ඉවර කරලා පදිංචියට එනවා...'

නංගී දිග විස්තරයක් කියවාගෙන ගියාය. තව මොනවා මොනවා හෝ ඇයගෙන් දැනගන්නට හිත ආශාවෙන් බලා උන්නේය.

'ලස්සන හොඳ අයියෙ වටින්නේ.. ශනීනා හරි අහිංසක කෙල්ලෙක්..'

නංගී ඇය ගැන කතා කරන්නේ අවුරුදු තුන හතරක් තිස්සේ ඇය ගැන දත උන්නාක් මෙනි.

ඇය අහිංසක බවට මට සාක්ෂි අවශ්‍ය නැත. ඒ නිහතමානී සිනහව ඇගේ හදවතම මට විවර කර පෙන්වූවේය.

'එයාලා අපේ ගෙදර ආවද...'

'ම්.. දවස් තුනක් විතර ආවා... තුනේම කරුමෙට අයියා ගෙදර නෑ... ඉරිදු ක්ලාස් ගිහිල්ලා... අපරාදෙ නේ...'

නංගී මා අසලින්ම පඩියේ ඉඳගෙන කීවාය.

'මට මොකටද.. මං නිකම් ඇහුවේ ගෙවල් ඉස්සරහට එන මිනිස්සු නිසා...'

මම මවාගත් අමනාපයකින් කීවෙමි.

'අසල්වාසීන්නේ නේද... මේ ඒක හොඳ ගෙදරට ආවේ එයාද...'

'ඔව්... ලෙඩකට තමයි කතා කළේ, කාර් එක හිටලා... තල්ලු කරන්න කතා කරා...'

'ඉතින් අයියා දුවගෙන ගියා...'

'උදව්වක් ඉල්ලුවාම බෑ කියන්න බෑනේ නංගී...'

'ඇරත් මලක් වගේ ලස්සන කෙල්ලෙක් නේද... බැහැයි කියන්න කොහොමටවත් බෑනේ...'



sl-unlimited.com
www.sinhalaelibrary.com



'විකාර කියවන්නේ නැතුව ඉන්නවා. මං පාඩම් කරන්න යනවා..'

'මම නම් හිතන්නේ නෑ ඔයා පාඩම් කරයි කියලා...'

'ඇයි මෝහිනී දක්කද මම...'

'ඒ වගේ තමා.. ඔය මූණ පේන්නේ නැද්ද... බය වෙන්න එපා... කෙල්ල ළඟදීම එනවා... ගේ වැඩ ඉවර වෙයගෙනනේ යන්නේ.. ඊට පස්සේ ඔයා කාමරෙන් හෙල්ලෙන එකක් නෑ...'

'ඒ මොකද...'

මම පියගැට පෙළේ අත්වැට අල්ලාගෙන සිනාසී ඇසුවෙමි.

'දෙන්නගේම කාමර එක ළඟ තියෙන්නේ... පේස් ටු පේස්...'

නංගී තව මොන මොනවදෝ කියවද්දී මම නිහඬවම මගේ කාමරයට ආවෙමි. කාමරයට ආ හැටියේම මම බැලුවේ මගේ කාමරය කෙළින්ම ඉදිවන නිවසේ උඩු මහල දෙසය. ඇය ඒ කාමරයම තෝරා ගන්නා බව නංගී දන්නේ කෙසේද..

මම ආර්ථික විද්‍යා පොතක් රැගෙනම බැල්කනියට ආවෙමි. නංගී කිව්වා හරිය. පාඩම් කරන්නට සිතේ එකලාසයක් නැත. පොත් පිටු අතරින් ඒ මුහුණ මැවී පෙනෙයි..

මම තවමත් වැඩ නිම නොකළ ඇගේ නිවසේ උඩු මහල දෙස බැලුවෙමි. රතු ගඩොල් වැටි අතරින් ඒ සුදු මුහුණ මට මැවී පෙනුණි. නංගී කියූ ලෙසට නම් මාසයකින් පමණ ඔවුන් මේ ගෙදර පදිංචියට එනු ඇත.

බාස්ලා වැඩ අද්දනවායැයි මට සිතුණි. සමහර විට නිවසේ වැඩ අවසන් කරන්නට තව මාස තුන හතරක්වත් යනු ඇත...

ශ...හී..නා... ඒ නම මම හදවතින් නැවත නැවතත්

ප්‍රතිරාවය කළෙමි... ඒ මුහුණට ඒ නම කොතරම් අගේද..

වතේ පැහැයටම ගැළපෙන ඉන්දියානු සල්වාර් ඇඳුම... නළලත මත කුඩා තරුවක් වැනි වූ පොට්ටුව... ගෙළ දෙපසින් පසුපසට දැමූ උතුරු සළුව.. සුදු අත හැඩ කළ තරු මල් ඇල්ලූ අත් වේන් පට.. ඒ සියල්ලම සිතුවමක් මෙන් මට මැවී පෙනුණි.

හදවතේ ප්‍රථම කවුළු පියන් පත් මටත් හොරෙන් විවර කළේ මුස්ලිම් යුවතියක්ද.. මෙතුවක් කාලයකට සිංහල යුවතියන් දස දහස් ගණන් අතර උන් මගේ හදවතට මුස්ලිම් යුවතියක් ගැනම ලෝබ සිතුනේ ඇයි...

ඒ කුඩා ආදරණීය ඇස්වල තිබූ බැල්ම... කැල්ම මුස්ලිම්ද සිංහලද දෙමළද කියා මම නොදනිමි. සියළු ජාතිකුලගොත් වලින් නොකිළිටි වූ නිර්මල සඳක් ලෙස මට ශහීනාව පෙනුණි... ඒ නිර්මල සඳ මගේ කාමරයට ඉදිරියෙන් කුඩා සඳළුතලයේ පායන්නේ කවදාද..

Sl-unlimited.com

sl-unlimited.com

www.sinhalaelibrary

# 03

එසස් පෙළ විභාගය ළං වෙද්දී හිතට කිසිම නිස්කලංකයක් තිබුනේ නැත. එක දිගටම පැය හත අටක් පාඩම් කරන මා පුටුවෙන් නැගිට්ටේ කෑමට පමණි... එහෙත් ඉඳහිට මම පුටුවක් ඇදගෙන බැල්කනියට එමි. දසුන බිදී යන්නේ එවිටය.. පාළුවෙන් සංකාවෙන් මම අලුත හැදෙන නිවස දෙස බලාගෙනම ඉන්නෙමි...

පසුගිය සතියේ ඇය පෙනෙන්නටවත් උන්නේ නැත. දවසකට අඩුම වශයෙන් සිය පාරක්වත් මම පාර දෙස බලමි...

සමහර විට නිවස සාද අවසන් කරන තුරු ඇය නොපැමිණෙනු ඇත.

හදිස්සියේම සදක් මෙන් මට පෙනී මගේ සිත ඇය අවුල් කළේ ඇයි...

සොහොයුරාද හවස මට කියවමින් උන් නිබන්ධනය බඩ උඩ තිබියදීම නින්ද ගොස් තිබුණි. එක දිගටම රැයවල් දෙකක් කිඳස්වත් නිදි නොලබා පාඩම් කළ නිසාදෝ ඇඳට වැටුණු හැටියේ මට නින්ද ගියේය.. කිසිවෙකුගේ සීතල සුරතක් පපුව මතට වැටෙද්දී මම අමාරුවෙන් දෙනෙත් ඇර බැලුවෙමි. නංගී මද හිනාවක් සහිතව මා ළඟ උන්නාය.

'මෙයා බලාගෙන ඉද්දිද්දි එයා නෑ. එයා එනකොට මෙයා නිදි. අනේ මන්ද..'

නංගී කියන්නේ මොනවාද කියා නිදිමතේ උන් මට එකවර තේරුණේ නැත. ඇගේ මුහුණ පුරා මනමාල හිනාවක් තිබූ බව පමණක් මම දුටුවෙමි.

'නිදිමතයි නංගී... මං නිදි..'

මම අතින් ඇලයට හැරී දස් පියාගත්තෙමි. ඇයත් සමඟ හුරතල්වන්නට තරම් හිතට නිවනක් නැත. සියල්ලටම අගෝස්තු විසි එක් වෙනිද පසුවන තෙක් සිටිය යුතුය.

'මේ..'

නංගී ලා රත්තරන් පැහැගත් කුඩා මංජුසාවක් මගේ උරහිසින් පහලට කර පෙන්නුවාය. මම අඩවන් දසින් එදෙස බැලුවෙමි. එය අපූරුය.. ඒත් සමඟම සිසිදිනයක නොවිඳි අපූරු සුවඳක් කාමරය පුරා පැතිරුනි.. මම අතින් ඇලයට හැරුනෙමි.

'මොනවද... කොහෙන්ද...'

'අරයා ආවා.. මේ අපිට ගෙනත් තියෙන්නේ...'

මගේ හදවතේ ශෂීනාගේ රුව පුළුල් තිරයෙන් ඇඳුනි.





ඒ මුහුණ තව එක්වරක් බලා ගැනීමේ අහිංසක ආශාවකින් මම පිවිසී ගියෙමි..

'ගන්න...'

මම නංගී පියන ඇරිය වහා එසව එබුනෙමි. ඉන් ගලා ආවේ අපූරු සුවඳකි.

'මොනවද නංගී..'

'මීන්... කෙල්ලගෙන්ම තමයි අහන්න ඕන... මුස්ලිම කෑමක්..'

අග්ගලා ගෙඩි වැනි වූ ඉන් එකක් ගෙන මම මුවට තබා ගත්තෙමි. මෘදු ලුණු රසයක් සමඟ මුසුවූ සුල්තානා මිදි රසයක් දිවහට දැනුණි.

'මරු නේ.. කෙල්ල කාව මතක් වෙලා ගෙනාවද දන්නෑ...'

'ඔයාගේ යාළුවනේ...'

'බලමුකෝ... එනවද පහළට..'

පහළ ඇය ඉන්නවාද... උන්නද මට යා හැකිද... ඒ ඇස් හමුවෙද්දී හදවතට වෙන්නේ මොනවාද..?

'මට නිදිමතයි...'

මම මවාගත් නිදිමතකින් කීවෙමි. දැන් නිදිමතක් නැත. කොහොමටත් නිදිමත නැත.

'පව්... කෙල්ල ආපුගමන් ඇහුවා...'

ඇතුළු ළය පුරවාගෙන මොනවදෝ ගලා ගියේය.. මම සීරුවෙන් ඇඳෙන් ඉඳගත්තෙමි.

'අඩුම ගානේ බැල්කනියටවත් යන්න.. මං මොනාහරි දන්න නිසා කියන්නේ...'

'මොනවද..'



www.sinhalaelibrary.com

මම සිනාසී ඇසුවෙමි.

'ඒ ළමයා හරි හොඳ ළමයෙක්. අපි දෙන්නා එක්ක යාළු වෙන්න ආසයි. ඒකනෙ මෙච්චර ගොඩාවේ.. අපිටමලු හැදුවේ..'

කුළුඹුබර රසයක් ඒ නම තොදන්නා කැම වල ඇත.

'මං යනවා... නිදාගන්න එපා... පව්නේ තපුරුකම් කරන්න ඔහ කෙල්ලෙක් නෙමේ ඒ... අහිංසකම කෙල්ලෙක්..'

නංගී ගියේ ඒ අහිංසක කම් පසුපෙව් මටාය. මම ඇඳේ ඉඳගෙනම ඉස්සුනෙමි. තවම ඒ රුව උඩ තට්ටුවෙන් ඇදී ආවේ නැත.

එකවරම ඒ රුව මතුවිය.. ඇස් වලට තියුණු ඊතලයක් වැදුනාක් මෙන් විය.. ඇය ගඩොල් බිත්ති අතර එහාට මෙහාට යද්දී මට බැල්කනියට යන්නට අසීරුවිය... මම ඇයට පෙනෙන ලෙස මේසයේ පුටුව අනිත් පැත්තට හරවාගත්තෙමි.

එදා දක්කාටත් වඩා අද ලස්සනය. එහෙත් ඒ ලස්සන පිපී සේ විඳගන්නට මට ලැජ්ජා සිතුණි. ඇය ඉන්නා බව දනාගෙනම බැල්කනියට ගොඩවන්නේ කෙසේද...

මා ආඩම්බර කාරයෙකැයි ඇය සිතනු ඇත. ශහිනා උඩ බලමින් බිම බලමින් ඒමේ අත ඇවිද්දය. ඒ අතරවාරයේදී එක් වරක් මගේ කාමරය දෙසද බලමින් සැරි සැරුවාය..

'අයියේ...'

නංගිගේ රුව ඒ බැල්කනියේ මතු විය. ඇය උන්නේ ශහිනාගේ උරහිසට අතකුත් තබාගෙනය. මම කමිසය උඩින් දමාගෙන බැල්කනියට ආවෙමි.

'ශහිනා අහනවා කෑම රසයිද කියලා...'





නංගී ඔනවාටත් වඩා පණ්ඩිතය.. ඒ ප්‍රශ්නයෙන් මම ඇත්තටම අසරණ උනෙමි. කෑම අතිශයින් රස බව ඇත්තය. එහෙත් එය කියන්නේ කෙසේද...

මගෙන් උත්තරයක් ලැබෙන තුරු ශහිනා ගඩොල් බිත්තියට වාරු වී බලාගත්වනම බලා උන්නාය. කෙල්ලෙක් දෙස හරියට බලන්නට නම් ඒ කෙල්ල අහක බලා ගත යුතු යැයි මට සිතුණි.

'නාම කෑවේ නෑ.. කාල කියන්නම්.'

මම හිත්පිත් නැත්තෙකු සේ කීවෙමි. ඇය අසරණව අහිංසකව සිනාසුනාය. මා මහා මෝඩයෙකි. ඇත්තටම නරුමයෙකි. ඇය මහන්සියෙන් හදගෙන ආ කෑම විත කටපුරා රසයි කියන්නට තිබුණා නොවේද...

'මං යනවා... යන්නම් අයියේ...'

ඇය දැහිලි පටලමින් කියා පහළට බැස්සාය. නංගී මට ඒ පැත්තේ සිටම රැව්වාය. මා වරදක් කළා දැයි මම නොදනිමි. එසේ යුවතියක් අභියස ඔනවාට වඩා නොදෙල් වන්නට මම ඉගෙන ගෙන නොමැත්තෙමි. කොහොමත් ඇය ඉදිරිපිටදී හිතට මොනවද වෙයි.. ඒ කුමක්ද කියා මම නොදනිමි..

'මං හිතුවේ නෑ අයියා මච්චරටම නපුරු කොල්ලෙක් කියලා... පව්.. හරි පව්... ඒ කෙල්ලගේ ඇස්වල කඳුළු..'

නංගිගේ ඇස්වලද කඳුළුය. මම අසරණව ඇය දෙස බැලුවෙමි. මා වරදක් කළේ නැත.



www.sinhalaelibrary.com

sl-unlimited.com

# 04

උසස් පෙළ විභාගයේ අවසාන ප්‍රශ්න පත්‍රය යෙදී තිබුණේ සිකුරාද සවසය... අද සවස පහමාරෙන් පසුව වසර දහතුනක සොඳුරු පාසැල් ජීවිතය නිමාවෙනු ඇත... ඉන්පසුව මගේ අනාගතයට කුමක් වේද... ඒ ගැන කිසිවක් මම සිතා නොමැත්තෙමි...

මගේ දෛවය මගේ ජීවිතයට කුමක් කරන්නට ඉන්නවාද කියා ඇත්තටම මම නොදනිමි. එහෙත් මගේ අනාගතය දෙස ජීවිත තුනක් බලා සිටිති. පවුලේ එකම පිරිමි දරුවා මම වෙමි. නංගීට සිටින එකම සොහොයුරාද මම වෙමි. ඒ නිසාම පවුල් වගකීම් වැඩිය. ඒ වගකීම් පියල්ලවම ආශාවෙන් කර දෙන්නට මම බලා උන්නෙමි.





සිකුරාද වේලාසනම මම නැවෙමි. ටිකක් වැඩියෙන් නිදහසේ නාන්න වූ විට මම වතුර බටය වත්ත පිටුපස කොට්ටම්බා ගස යටට ඇදගෙන නාමි. වතුර බටය ගසේ මුදුන් අත්තක ගැට ගසා පයිප්පය ඇරිය කල බටයෙන් වතුර එන්නේ අඩි දහයක් පමණ උසින් වේගයෙනි... මෙසේ නාන වෙන මොහොතක තමි නංගීද සායක් උඩටම ඇදගෙන මාත් සමඟම නාන්නට ආවාය. අද ඇය පෙනෙන්නවත් නැත.

එළිමහනේ නාද්දී සතුට වැඩිය. කොට්ටම්බා ගහ වටේටම තිරුවානා ගල් අල්ලා ඇති නිසා තැම වඩාත් සුන්දරය...

මගේ රැවුල ගොඩාක් වැවී නැත.. දෙකම්මුල් වල රැවුල් කොට ඇත්තේ ඇතින් ඇතිනි... දවස් දෙක තුනක් රැවුල නොකැපූ කල තැනින් තැන අපිරිසිදුව ගොයම් සිටවූවාක් මෙන් මුහුණ දිස්වෙයි...

අම්මා අලුත් රේසරයක් ගෙනවිත් තිබුණි. මම බටයෙන් නාන අතරතුරම රැවුලද කපා ගත්තෙමි. සතියකට පසු රැවුල කැපූ නිසාදේ මුහුණට අලුත් එළියක් වැටුණි. මම කන්නාඩියෙන් මුහුණේ හැඩ බලද්දී අම්මා කුස්සියේ දොරින් එබී සිනාසුනාය.

නාගෙන සරමක් ඇඳගෙන එද්දී දැනුනේ පුදුමාකාර බඩ ගින්නකි. අම්මා සෑදූ මුරුංගා හොද්දේ සුවඳ දැනෙද්දී ඒ බඩගින්න දෙගුණ තෙගුණ විය. මම තටන මුරුංගා හොද්දට හිස එබුවෙමි. ගෙදර මුරුංගා කන්නට වඩාත්ම ආස කලේ මාය. ඒ බව දන්න අම්මා සතියකට වතාවක් වත් මුරුංගා ඉව්වාය. මුරුංගා හොද්ද වඩාත්ම රස කරවල බැදුමත් සමඟය.

'බඩගිනිද... ඉන්න මුරුංගා හොද්ද දත් බානවා...'

'මහොමම ටිකක් බෙදලා ගන්න... මට බඩගිනියි...'

'දිය ඇල්ලෙන් නාන කොට මට හිතුනා..'

අම්මා දිය ඇල්ල යැයි කියන්නේ මගේ බටයටය... පුංචි කාලයේ සිටම වතුරත් සමඟ සෙල්ලම් කරන්නට මම ආශා කළෙමි.

'විභාගයෙන් පස්සේ මොනාද පුතා කරන්න හිතාගෙන ඉන්නේ...'

අම්මා බත් පිඟානට මුරුංගා හොදිත් කරවල බැදුමත් කතුරුමුරුංගා මැල්ලුමත් දමමින් ඇසුවාය...

'තාම හිතලා නෑ අම්මේ...'

'ඔයා පාස්වෙයි... එහෙම උනොත් කැම්පස් යන්න ලැස්ති වෙන්න... තාත්තාත් හරි ආසාවෙන් ඉන්නේ ඔයාව විශ්ව විද්‍යාලෙට යවන්න...'

• දිගින් දිගට ඉගෙන ගන්නට මමද ආශා කළෙමි. එහෙත් මේ පවුල් බර තවත් තාත්තාට තනිවම උහුලාගෙන යා නොහැක.

'මං ආස ඉගෙන ගන්න ගමන් රස්සාවක් කරන්න අම්මේ... තාත්තටත් තනියම බෑනේ...'

'අමාරු හරිය තාත්තා කරලා දුන්නනේ... ඔයා ඒවා හිතන්නේ නැතුව ඉගෙන ගන්න...'

'ඒ මම පාස් උනොත් නේ...'

'ඔයා පාස් වෙනවා... මං ඒක දන්නවා...'

අම්මා හිතනා දෙයක් වරදින්නේ කලාතුරකිනි. මම තවත් බත් හැන්දක් අම්මාට කියා බෙදාගෙන මුරුංගා හොදිත් මැල්ලුමුත් සමඟ කෑවෙමි.

'ගොඩාක් කාලා නිදිමතත් වගේ...'

මම සිනාසී කීවෙමි.





'කිරි හොදි ගොඩාක් කෑවම නිදිමත එනවා... යන්න ගිහිල්ලා ඇඳගන්න...'

සුදු කලිසමත් කමිසයත් අතට ගනිද්දී මට මහා දුකක් දැනුණි. මේ සුදු ඇඳුම අදිනා අවසාන දවසය. අදින් පසු මේ සුදු පාසල් ඇඳුම ඒ අතීතයේම මතක සැමරුවක් වෙනු ඇත. ජීවිතය කොතරම් පුදුමාකාරද..

නංගි පෙනෙන්නට නැත. වෙනදනම් ඇය මේ වෙද්දි හත් අට වතාවක් වත් වටේ කැරකී ගොස් අවසානය. මම ඇඳගෙන ෆයිල් කවරයත් රැගෙනම සාලයට බැස්සෙමි.

'නංගි කෝ අම්මේ... නිදිද...'

අම්මාට වඳිනා අතරතුරේදී මම ඇසුවෙමි.

'ම්... තුණුරුවන් සරණයි.. අද ඉස්සරහ ගෙයි ළමයා ඇවිත් එක්කරගෙන ගියා... ඒ ළමයා එන්න කලින් අපේ කෝච්චි පෙට්ටිය අල්ලගෙන... තව පැයකට අලුත් ගෙදරින් එළියට එන එකක් නෑ....'

මගේ හිත මහා පසුතැවීමකින් බර විය.. ශනීනා එන්නට ඇත්තේ කොයි වේලාවේද... පැයක් පමණ වතුර බටයක් සමඟ සෙල්ලම් කළේ අපරාදේ යැයි මට සිතුණි. නිකමට වත් මට බැල්කනිය දෙස බලන්නට අමතක වූයේ ඇයි... විභාගය නොවේ නම් මම ගමන නවතා ගෙදර නවතිමි. දුකකට සමාන පසුතැවීමක් මට ඇතිවිය.

ඇය එද ගියේ මාත් සමඟ අමනාපයෙන්ද... වෙනද නම් ඇය ආපසු නංගී මං සොයා එන්නීය.. අද නංගීවත් නාවේ එද මා දමූ බොරු ආඩම්බරකමටද...

ගේට්ටුවෙන් එළියට පැන මම අලුත් ගෙදර දෙස බැලුවෙමි. අම්මා කීවේ ඇත්තය. ඔවුන්ගේ සුදු කාර් රථය



www.sinhalaelibrary.com

ගුරු පාරේ නතරවී තිබුණි.

ඒ මුහුණ නොබලා යන්නට බැරි ගතියක් මට දැනුණි.

'නං...ගී...'

මම අලුතින් හැදෙන ගේ අසළට වී නංගීට කතා කළෙමි.. උණ බම්බු පලංචි අතරින් ශහීනා හිස එළියට දමුවාය... පපුව තුන් හතර පැත්තකින් හිරි වැටිණ... ශහීනා සිනාසුනාය. හිතක් එකතැන ගල් කරවන්නට ඇගේ එක හිනාවක් ඇතිය...

'දිනෙල්කා.... අයියා ඇවිත්...'

ඇය නංගිට කතා කලේ මා දෙසම බලාගෙනය. මට ඒ තරම් පහසුවෙන් ඇය දෙස බලා සිටිය නොහැක. මගේ අසරණකම ඇය ආඩම්බරකමකට ගන්නා බව මම දන්නෙමි.. එහෙත් මම කුමක් කරන්නද...

'ආ... අයියා යන්නද... අද අන්තිම දවසනේ නේද.... ඉස්කෝලෙට වැදලම එන්න හොඳද...'

ශහීනා දිග උණ බටයක් බදාගෙන උන්නාය. අද ඇය පැමිණ ඇත්තේ මුස්ලිම් යුවතියන්ටම විශේෂ වූ පාසල් ඇඳුමිනි. ඒ ඇඳුමට ඇගේ මුහුණ වෙනදටත් වඩා වාම්ව මට පෙනුණි. කොහොම බැලුවත් ඇය ලස්සනය...

'පුතාගේ එග්සැම් ඉවර වෙන්නේ කවදද පුතා...'

ශහීනාගේ අම්මා අලුත් ගෙදර උඩු මහලේ සිට ඇසුවාය.

'අද ඉවරයි ඇන්ටි...'

'ඒක නමයි අද පාටට ඉන්නේ... ඉන්න අපිත් එක්ක යන්න...'

මා බැලුවේ ඇය දෙසය. ඒ මුහුණ උතන්දුවෙන් සෙලවිණ...





'කමක් නෑ ඇන්ටි මම යන්නම්...'

ඇයට විශේෂයෙන් කියන්නට මට අවශ්‍ය විය... එහෙත් බැලීම විනා වචනයක් ගලන්නේ නැත.

'ඕල්ද බෙස්ට් අයියේ...'

ශහීනා සෙමෙන් කීවාය...

'තැන්කියූ... මං යනවා නංගී...'

හිතට සිසිලයක් දැනුණි... එහෙත් ගෙදර නතරවෙන්නට නොලැබීම ගැන මම කම්පා උනෙමි. මේ දුක අද පමණි. අදින් පසු හැමදාම ගෙදරය...

මම පය ඉක්මන් කර ගුරුපාරේ ඇවිදගෙන ආවෙමි. වැඩි දුරක් යන්නට මට ඉඩක් නොලැබිණි...

'අ...නේ... අ...යි...යෝ...'

ශහීනාගේ වේදනා බර කෑ ගැසීම පාරටත් ඇසුණි. මගේ දෙපා හිතල වී ගොස් නතර විය.

'අ...යි...යේ... එ...න්...න..කෝ...'

නංගීද කෑ ගැසුවාය. මම හැකි තරම් වේගයෙන් අලුත් ගේ දෙසට දුවගෙන ගියෙමි.

ශහීනා පරාළ ගොඩ උඩ කකුල අල්ලාගෙන වැටී උන්නාය... නංගීත් ශහීනාගේ අම්මාත් ඇගේ දෙදණිස් වලින් අල්ලා ඇයව නැගිට්ටවන්නට උත්සාහ ගනිමින් උන්නෝය... මම ෆයිල් කවරය වීසිකර ඒ දෙසට දුවගෙන ගියෙමි...

'ඇ...යි... මොකද උනේ....'

'අ...නේ අයියේ... මොකක්ද ඇනුනා...'

ශහීනාගේ දෙනෙත් වලින් කඳුළු කඩාගෙන එමින් තිබුණි... මගේ පපුව පිහි තුඩකින් සීරී ගියාක් බඳුවිය.

'නැගිට්ටවන්න එපා.. එහොමම ඉන්න...'



www.sinhalaelibrary.com

මම පරාල ගොඩ පාමුළ බිම දණ ඔබා ගත්තෙමි... ඇය පුංචි දරුවියක මෙන් අඬමින් දකුණු පාදය මා දෙසට එසවූවාය... ඇල්ලක තිබූ යකඩ ඇණයක් ඇගේ සුදු කැන්වස් සපත්තුව පලාගෙන ගොස් ඇත.. මම සීරුවෙන් ඇගේ පාදය ගෙන මගේ දණහිස මත තබා ගත්තෙමි..

'ඇ...නෝ රිදෙනවා...'

'ටිකක් ඉන්න දරුවෝ... පුතා ඇණේ ගලවලා ගනී...'

මම ඇල්ල අතින් අල්ලාගෙන ඇය දෙස බැලුවෙමි... ශබීනා දෙතොල් හපාගෙන දෙනෙත් හකුළුවා ගත්තාය...

ඇගේ පාදය මගේ දණහිස් මත තබාගෙනම මම ලැලි කැබැල්ල ඇද්දෙමි...

'අ...නෝ...'

ශබීනා තංගීව තදින් බදාගෙන කෑ ගැසුවාය.. එහෙත් ඇය මගේ දණහිස මත තිබූ පාදය සෙලවූයේවත් නැත.

'මේ...'

මම ගේ හදන බාස්ලාට ලැලි කෑල්ලේ ගසා තිබූ ඇණය පෙන්වූයෙමි. එය අඟල් එකහමාරේ යකඩ ඇණයකි...

'මේ සපත්තුවත් පලාගෙනම ඇණේ ගිහිල්ලා ඇති...'

තවමත් ඇගේ පාදය මගේ දෙදණ මතය. මම බිම බලාගෙනම සුදු කැන්වස් සපත්තුවේ ලේස් පටිය ගැලවූයෙමි... ඇගේ පාදයට ඇඳ තිබූ සුදු මේස් එකේ යටි පතුල ලේ වලින් පෙඟී තිබුණි... මම සුදු කලිසම මතම තබාගෙන ඇගේ මේස් එක ගැලවූයෙමි...

ලේ බිංදු තුන හතරක් එහෙමම සුදු කලිසමට වැටුණි..

'අයියගේ කලිසම... දැ...න් විභාගෙට යන්න ඕන නේද...'

ශබීනා ඇසුවේ ඇඬුම් අතරිනි. මම ඇගේ කතාව





ගණනකටවත් නොගෙන සුදු මේස් එක විලුඹෙන් පත්තා ගලවා දැමුවෙමි...

යුවතියකගේ කෝමල පාදයක් මා මේ ස්පර්ශ කරන්නේ ජීවිතයේ ප්‍රථම වතාවටය. ශබීනාගේ සුදු යටි පතුල පලාගෙන යකඩ ඇණය ගොස් තිබුණි. තවමත් ඉන් ලේ ගලයි... මම මගේ කලිසම් සාක්කුවේ තිබූ ලේන්සුව ගෙන මොහොතකට ඇගේ පාදයේ බැන්දෙමි.

ශබීනා සියල්ල බලා උන්නේ දෙනෙත් රතු කරගෙන ගල් ගැහුනාක් මෙන්ය.

'තංගී දුවලා ගිහිල්ලා සැව්ලෝන් කුප්පියයි කෝපි කුඩු ටිකකුයි බැන්ඩේජ් රෝලයි ගේන්න.. දුවන්න...'

'පුතාට විභාගෙට යන්න පරක්කු වෙනවා නේද.. ඔය කලිසමත් කිළුටු උනා...'

ශබීනාගේ අම්මා කියන්නේ ඇත්තය. විභාගය පටන් ගන්නට තව ඇත්තේ විනාඩි විස්සක් පමණි. බිම දණ ඔබා සිටීම නිසාත් ඇගේ ලේ පිරුන පාදය දෙපා මත තබාගත් නිසාත් කලිසම පුරා පැල්ලම්ය.

එහෙත් ඒ කිසිවක් නිසා ජීවිතයේ ප්‍රථම වරට අල්ලාගත් පා කමල අත් හරින්නට මට නොසිතුණි.

'මං බෙහෙත් ටික දලම යන්නම් ඇන්ටි... නැත්නම් හොඳ නෑ...'

එක වරක් පමණක් මම හිස ඔසවා ඇය දෙස බැලුවෙමි. සියළු වේදනා යටපත් කරගෙන ශබීනා මෘදු හිනාවක් පෑවාය. ඒ හිනාවේ වූයේ මට සමාවෙන්න කියන්නාක් බඳු මෘදු හැඟීමකි.

'ඔයාලගේ වැඩ වලත් පරිස්සමක් නෑ. බලන්න දත් වෙච්ච දේ...'

ශහීනාගේ අම්මා බනිද්දී බාස්ලා ඔළුව කසමින් බිම බලාගත්තේය.. නංගී ඒ අතරවාරයේදී බෙහෙත් බැන්ඩේජ් ගෙන ආවාය. ඇය කෝපි කුඩු බෝතලයම ගෙනවිත් තිබුණි. ආරංචියට අම්මාද දුවගෙන ආවාය.

'අනේ කෙල්ලගේ කකුලටම ඇණුනනෙ පව්...'

අම්මා අනුකම්පාවෙන් කීවාය... මම ඇගේ පාදය වෙලූ ලේන්සුව ගලවා එහෙමම කලිසම් සාක්කුවේ රුවා ගත්තෙමි. ඇගේ ලේ තැවරුණු ලේන්සුව ඒ තරම් අරපරිස්සම් කර තබා ගත්තේ ඇයිදැයි මමවත් නොදන්නෙමි.

'වූව්වක් රිදෙයි....'

ශහීනා දෙස බලා කියා මම යකඩ ඇණය ඇනුණ තැන දෙපැත්තෙන් මිරිකුවෙමි. ඇය ඇඬුවේ නැත. යටිතොල හපාගෙන වේදනාව දරාගත්තා පමණි... තුවාලයට ආ අපිරිසිදු ලේ ඉවත් කළ යුතුය. නැතිනම් තුවාලය සෙට වෙද්දී පැසවන්නට පුළුවන..

සැව්ලෝන් දමා තුවාල සිදුර පිරිසිදු කර මම කෝපි කුඩු එයට තැබුවෙමි. සියල්ලෝම බලා ඉන්නේ මා දෙසය..

'පුතා ෆස්ට් එඩ් කරලා තියෙනවනේ. ඒකයි ඔය තරම් දන්නේ...'

අම්මා කීවාය.. මේ මොහොතේ මගේ රිපෝට් එකට ලකුණු අවශ්‍ය නැත.

අවසානයට මම සුදු වෙළුම් පටි වලින් ඇගේ දෙපා බැන්දෙමි. වට තුන හතරකින් කරකවා පටිය අවසානයට ගැටයක්ද දමා මම පරිස්සමින් දෙපොත් එසවූයෙමි. තවමත් ඇය මගේ දෙදණින් පාදය ගත්තේ නැත.

'ආයෙත් සපත්තු දන්න එපා.. ඔහොමම ගිහිල්ලා කාර් එකට නගින්න...'



'අයියට පරක්කු වෙලා නේද...'

ශහීනා අමාරුවෙන් පාදය මගේ දෙදණින් ගෙන කීවාය. මට මහා ලෝබකමක් දැනුණි...

'අම්මේ... කොත්තමල්ලි ටිකක් හදලා දෙන්න... මං යනවා...'

කලිසමේ තිබූ ලේ පැල්ලම් හොඳින්ම මා දුටුවේ නැගිට්ට පසුය..

'අ...නේ සොරි අයියේ...'

'ඒකට කමක් නෑ...'

මම බිම වැටී තිබූ ෆයිල් කවරය අතට ගත්තෙමි.

'පුතා පරක්කුයි නේද... අපි ගිහිල්ලා දන්නම්...'

'ඔව් අයියේ අපිත් එක්ක යන්.. ඔහොම බස් වල යන්නත් බෑනේ...'

මම අසරණව අම්මා දෙස බැලුවෙමි.

'ඔව් පුතා ඇන්ටිලගේ කාර් එකේ යන්න...'

'පුතා හිටියේ නැත්නම් තවම ලේ යනවා... දත් රිදෙන්නේ නැද්ද ඔයාට...'

ශහීනාගේ අම්මා ඇයව වත්තන් කරගෙන ඇසුවාය. ඇය 'නැතැයි' කියන්නට මෙන් සිනාසුනේ මා වෙත දෙනෙත් තබාගෙනය. මම ඇයට වාහනයට ගොඩ වෙන්නට දොර ඇර දුන්නෙමි. නොන්ඩි ගසමින් ආ ඇය අමාරුවෙන් වාහනයට ගොඩ වූවාය..

ශහීනාත් ඇගේ අම්මාත් වාහනයට ගොඩවූ පසු මම වාහනයේ ඉදිරිපස අසුනට ගොඩ උනෙමි. නංගී දෙතොල් තද කරගෙන අමුතුම හිනාවක් පෑවාය.

sl-unlimited.com

# 05

**වා**හනය ඉදිරියට ඇදෙද්දී මගේ හිත මහා සිතුවිලි පොකුරක අතරමං විය. අවසාන ප්‍රශ්න පත්‍රයට පාඩම් කරගත් කිසිවක් දත් මතක නැත.

'ඩ්‍රයිවර් අන්කල් ඉක්මන් කරලා යන්.. අයියට එක්සෑම් එකට පරක්කුයි...'

ශහීනා පිටුපස ආසනයේ සිට කීවාය...

'කමක් නෑ.. හිමිහිට යන්... චුට්ටක් පරක්කු උනාට කමක් නෑ...'

'අයියා විභාගේ ෆේල් උනොත් මට බනියිද දන්නෑ...





නේද අම්මා...'

ඇය කියූ දෙයට මම නිහඬව සිනාසුනෙමි..

'පුතාට එක්සෑම් හුවර්ද...'

'නැත්තෙමත් නෑ ඇන්ටි...'

'තාත්තා නම් දවසක් කිව්වා පුතා යුනිවර්සිටි යයිම කියලා...'

මා නැති මොහොතක ඔවුන් මා ගැන කොතරම් දේ කතාවන්නට ඇත්ද...

'අපේ එක්කෙනා නම් පාඩම් පොතක් අල්ලන්නේ නෑ... කොයි වෙලෙත් නවල් එකක් අතේ... නැත්නම් කැසට් එකක්...'

'බොරු අයියේ...'

මම කිසිවක් නොකීවෙමි. නොවේනම් කියන්නට යමක් මට සොයාගන්නට බැරිවිය. අද නම් හිතම ගොළුව ගොස්ය.

'මං මෙතනින් බහිනවා ඇන්ටී... යන ගමන් නංගිට ඩිස්පැන්සරි එකකින් ටෙටනස් එකක් ගහගෙන යන්න.. නැත්නම් රෑට පිටගැස්ම ඇවිල්ලා උණ ගනී....

'ඔයා වගේ පුතෙක් අපිටත් ඉන්න තිබුණා... පරිස්සමින් යන්න පුතා...'

මම දොර වැසුවෙමි... විශේෂයෙන් ඇයට කියන්නට මට අමතක විය... වාහනය ඊටස් කරද්දී ශහීනා අතවැනුවාය... මම ගල් පිළිමයක් සේ හන්දියේ බලාගෙන උන්නෙමි..

හිත ගොස් නතරව තිබුනේ අභ්‍යාවකාශයේය. සිතන්නට කප්පරක් තිබුණි... ඒවා වල මුලක් අගක් මැදක් නැත. සියල්ලම පැටලී අලුත් රසබර යමකින් පනුව හිරවී තිබුණි..

මම බරවූ හදවතින් පාසැල් ගේට්ටුවෙන් විභාග



www.sinhalaelibrary.com

මධ්‍යස්ථානය වෙත පිය නැඟුවෙමි.

අවසාන ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලියා විභාග ශාලාවෙන් එළියට එද්දී හැන්දෑවේ පහමාර පමණ විය.. විභාග ශාලාවෙන් එළියට පැමිණ පාසල් වත්ත සිසාරා නෙත් හෙලද්දී මගේ පපුව ඇවිලීගෙන ගියේය. අදින් පසු මේ පාසලේ සිසුවෙක් වන්නට මට වරම් නැත. මේ මගේ පාසැල් ජීවිතයේ අවසාන විනාඩි කිහිපයයි...

මෙතෙක් දවස් අතගෑවේ ජීවිත කුසුමේ මල්ය.. රේණුය.. පෙතිය... නොවෙනම් පොහොට්ටුය.. එහෙත් අදින් පසු එසේ නොවේ.. ජීවිතයේ අතු ඉති වලට කදට මුලට කරගැසිය යුතු කාලය දන් එළඹ ඇත...

මම පාසැල් වත්තේ පතරංග කොස් ගහ යටට වී බලා උන්නෙමි.. පාසැල් ජීවිතයේ අධක්ම ගෙවුනේ මේ හෙවණ යටය...

'උඹ අඬලා වගේ...'

පැතුම් මගේ උරහිස අද්දරින්ම අත යවා කොස් බඳට බරවී ඇසුවේය... දස් තෙත්ව යන්නට තරම් දුකක් හදවතේ නැති බව ඇත්තය... එහෙත් තුන් හිතම තුනී දුකකින් පුරවාලන අම්හිරි වියෝගයක කෙලවර මම උන්නෙමි... වසර දහයුනක් එකට බැදගෙන උන් පාසල හැර යාම පෙම්වතියක්ව හැරයාම තරම්ම වේදනාබරය.... මතකයේ සැමරුම් වැඩිය... හදවතේ බැඳීම් වැඩිය.. ඒ නිසාම සමුගැනීම දුෂ්කරය.

'උඹට දුක නැද්ද...'

මම පැතුම් දෙස බලා ඇසුවෙමි. ඔහු අවසානයට පිළිතුරු ලියූ ප්‍රශ්න පත්‍රය කැලි කැලි වලට ඉරා එයද තුඩා කැබලි වලට ඉරා පුලහට පා කළේය.. ඒ කඩදාසි කැබලි මුළු පිට්ටනිය පුරාම විසිරී ගියේ නොසිතූ ඉක්මනිනි..





'එහෙම වැඩ කරන්න එපා බන්.. බලපන් දන් පිට්ටනියම කැත උනානේ...'

මම අමනාපයෙන් කීවෙමි.

'අද අන්තිම දවසනේ..'

'එදට පුළුවන් නම් මේ පොළොව ඉබලා පලයන්.. ජීන් කැත කරලා යන්න එපා...'

'සොරි සංදේශ්.. උඹ කියන්නෙ ඇත්ත.. ජීවිතේ පුල් අංජබජල්.. සුදු කිට මරාගෙන පංති එන්න තිබ්බ නම් හැමදම...'

'ජීවිතේ අපිට ඔත තැන් වලින් නතර කරගන්න බෑ පැතුම්...'

'කියලා වැඩක් නෑ... මටත් මාර අප්සෙට්.. පුල් හොල්මන්... රෝල් එකක් අරගෙන පාත් කාලක් මැදට තියලා රෝල් කරගෙන ඉන්ටවල් එකට ආයි කවද කන්නද...'

ජීවිතේ හැමදමත් මෙහෙම වන්නට ඇත. එක ජීවිතයක් තුළ සමුගැනීම් වැඩි දයි මම නොදනිමි.

'යන්... හෝසෙ පාරක් දලම යන්...'

පැතුම් මගේ කරට අතක් දමාගත්තේය..

ගේට්ටුව දක්වා මම කල්පනාබරව ආවෙමි... පාසල අද්දර කොට්ටම්බා ගහ යට නවත්වා තිබූ වාහනය මා දුටුවේ පාසැල් ගේට්ටුවෙන් පිටවෙනවාත් සමඟමය. ඒ ශහීනලාගේ වාහනයයි...

මගේ දස් විදුලියක් මෙන් පිංගා ගියේ වාහනය ඇතුළටය.. නැත.. ශහීනා නැත... එහෙත් වාහනය එසේ පාසැල ළඟ නතරව තිබෙන්නේ ඇයි... පියදුරා මාව ඇත සිට හඳුනාගත්තේය.. ඔහු මා වෙතට දුවගෙන ආවේ අහිංසක



www.sinhalaelibrary.com

සිනහවක්ද මුව පුරා රඳවාගෙනය...

'චූටි මහත්තයාගේ විභාගේ ඉවරද...'

ඔහු වියපත් කම්මුල් පුංචි කර ඇසුවේය..

'ඔව්.. මේ දන් ඉවර වුනේ.. ඇයි ඩ්‍රයිවර් අන්කල් මෙතන...'

මම පුදුමයෙන් ඇසුවෙමි...

'සංදේශ් මහත්තයව එක්කගෙන යන්න ආවේ..'

'මා..ව.. ඇයි ඒ...'

'ශහීනා බේබි කිව්වේ මහත්තයාව ගෙදරට එක්කගෙන යන්න කියලා... මෙහෙම පාරේ යන්න බැනේ මහත්තයා තෝද...'

රියදුරු අන්කල් මගේ සුදු කලිසම පෙන්වා කීවේය. පැතුම්ද ඒ අනුව එදෙස බැලුවේය. සැබෑය... එහි විශාල ලේ පැල්ලමිය...

'ඒ...යි සංදේශ්.. මේ මොනවා වෙලාද.. උඹේ කකුල යට තුවාල වෙලාද.. නැත්නම් ඇක්සිඩන්ට් වෙලාද...'

මම රියදුරු දෙස බැලුවෙමි...

'නෑ මහත්තයා.. මේ සංදේශ් මහත්තයා අපේ බේබිට බෙහෙත් දන්න යද්දි ඒ ලේ ගෑවිලා...'

පැතුම්ගේ මුහුණේ ප්‍රශ්න පොකුරකි. කිසිවකට මට දන් පිළිතුරු දිය නොහැක.. එහෙත් ඇය මට වාහනය එව්වේ ඇයි... මා ගැන ශහීනා මේ තරමටම හිතන්නේ ඇයි...

'මට බස් එකේ යන්නත් තිබුණා.. අපරාදේ..'

'කමක් නෑ චූටි මහත්තයා.. මං කොහොමටත් අලුත් ගෙදරට යනවා... මේ බාස්ලගේ පඩිදෙන්න ඕන..'





මම පැතුම් දෙස අසරණව බැලුවෙමි...

'මචං... වෙන දවසක තෝසෙ කමු.. උඹ පලයන්...'

මම හදවතම බරව තිබියදී වාහනයේ ඉදිරිපස අසුනට බර වීමි.. වාහනය තුළ අපූරු සුවඳක් ඇත. ඇයට බෙහෙත් දමද්දී ආවේද මේ සුවඳමය...

'බේබිට ටෙටනස් එක ගැහුවේ මේ දන්... මේ බේබිව බස්සලා එන ගමන්...'

මා හිතුවා හරිය.. දන් මොහොතකට කලින් ඇය වාහනය ඇතුළත සිටින්නට ඇත. මේ සුවඳ ඒකය...

ඩෑෂ් බෝඩ් එක උඩ දමා තිබූ බුල් රෙද්ද මත අලුත්ම හින්දි කැසට් පට කිහිපයක් විය.. ඇගේ ලෝකය කොතරම් නිදහස්ද.. අහිංසකද..

'ආ චූටි මහත්තයා.. ඕ..ය.. පිටිපස්සෙ සීට් එකේ තියෙනව පොඩි බ්‍රවුන් පේපර් බෑග් එකක්. ඒක ගන්න...'

මම හැරී බැලුවෙමි.. රන්තරන් පාට කුඩා පිලි පිලි බෑගයක් තුළ බ්‍රවුන් පේපර් බෑගයක දමූ යමක් විය...

'චූටි මහත්තයා ගන්න.. අපේ බේබි ඔය තිබ්බේ... මහත්තයට දෙන්න කියලා...'

ඇය පුදුමාකාර යුවතියකි...

'ම...ට... මොනවද...'

මම කුතුහලයෙන් ඇසුවෙමි.. මේ තරම් අසාමාන්‍ය ලෙස ඇය මට ළං වන්නේ ඇයි...

'ටෙටනස් ඉන්ජෙක්ෂන් එක ගහලා එද්දි ලිවල් ලයන් එකෙන් පැටිස් කාලා අපි කිරි පැකට් බිව්වා... බේබි ඒ වලින් මොනවද ඔය අරගෙන තිබ්බේ... මට එද්දි කිව්වා මේක

සංදේශ් මහත්තයට දෙන්න කියලා.. මහත්තයා කන්න...'

මලක් වුව හිතට එක පිට එක වැටෙද්දී දරා ගැනීම අසීරුය.. මේ සිදුවෙමින් යන්නේ මොනවාද කියා තේරා බේරා ගත නොහැකිව ඇත්තටම මම සිතුවිලි අතර එරී උන්නෙමි...

මම පිටුපස අසුනේ තිබූ කුඩා බෑගය අතටගෙන එහි ඇතුළත බැලුවෙමි.. ඇත්තටම කිවහොත් බඩගින්නක් තිබහක් මට විය... පුදුමය ඇය එය සිතා මෙන් මේ ටික තබා යාමය... මට නම් කෙල්ලෙකු සම්බන්ධයෙන් එසේ කළ නොහැක... මේ තරම් සම්පවන ඇය දෙස පවා මට එක එල්ලේ බැලීම දුෂ්කරය...

කුඩා කඩදාසි බෑගය ඇතුලත පැටිස් දෙකකුත් පාසලේ ක්‍රීඩා උත්සවය දවසේ තිවාස වලින් දෙන තරමේ සැන්ඩ්විච් පෙති දෙකකුත් හයිලන්ඩ් කිරි පැකට් එකකුත් විය. නොකා ඉන්නට හිත හදාගැනීම දෙපැත්තකින් දුෂ්කරය. එකක් මගේ අහිංසක පෙරේතකමය. අනික ඇගේ කාරුණිකත්වයට එලෙස පිටුපෑම මනුස්සකමක් ඇති වැඩක් නොවේ...

මම සැන්ඩ්විච් පෙත්තකුත් පැටිස් එකකුත් අතට ගත්තෙමි.. කෑමෙන් පසු අත පිසදාගන්නට ඇය රෝස පැහැගත් ටිෂූ රෙදි කෑබලි දෙකක්ද එහි ඇතුළෙහි දමා තිබුණි.. මම එකක් අතට ගත්තෙමි.. ත්‍රිකෝණාකාරව නමා තිබූ ඒ රෝස පැහැගත් ටිෂූ කෑබැල්ලක නිල් පාට පෑනකින් යමක් ලියා තිබුණි. මම පරිස්සමින් එදෙස බැලුවෙමි...

සංදේශ්...

මං හිත්ද විභාගේට ලියන්න පරක්කු උනා නේද.. ඒකට සමාව දෙනවා නේද.. මගේ කතුලට බෙහෙත් බැන්දට ඔයාට මොනා කියන්නද කියලා මට තේරෙන්නේ නෑ...



කවදහරි හිතුන දවසට මා එක්ක කතා කරන්න.. මං තරහ නෑ...

විභාගේ ලියලා බඩගිනියි නේද.. පැටිසුයි සැන්ඩ්විච්සුයි කාලා කිරි පැකට් එක බොන්න...

මං ශහීනා..

ඇය ටිෂූ පේපර් එක මත අකුරු ලියා තිබුනේ අමාරුවෙනි. එකම අකුරු මත දෙතුන්වර එකපිට එක ලියා තිබුණි..

මම රියදුරාට නොපෙනෙන්නට ටිෂූ පේපර් එක කමිස සාක්කුවේ දමා ගත්තෙමි. මේ යුවතියක් මගේ නමින් මට සිංහල අකුරු තුන හතරක් හෝ ලියා තැබූ ප්‍රථම වතාවය...

හිතට ගෙදර ගොස් කල්පනා කරන්නට මහා බරක් දී ඇතැයි මට සිතුණි.. අතගා දිවගා බැලිය නොහැකි තමුදු රහසේ හදවත මත සැලී ලෙලදෙන අහිංසක රසබර යමක් පසුවේ කැළතෙතැයි මට සිතුණි...

'ඩ්‍රයිවර් අන්කල් බිව්වද..'

මම කිරි පැකට් එක කටින් කඩන අතරතුරු ඇසුවෙමි. තවම එය සීතලය.. ඇගේ අහිංසක කමට ඇය බටයක් එහිම දමා තිබුණාය..

'මං බිව්වා... බේබි එක්ක ගමනක් ගියාම වේල් කරන්නේ වගේ තමා... අතනින් අරවා ගන්නවා මෙතනින් කීම බොනවා.. ගන්න ගන්න හැම දෙයක්ම මටත් දෙනවා...'

'ශහීනා බේබි විතරද පවුලට ඉන්නේ..'

'අනේ මට... බේබි විතරමයි.. ඒ ඇති ඒක රත්තරන් කඳක්... දන් පේන් නැද්ද ලිට්ල් ලයන් එකෙන් හැන්දෑවේ ෂෝට් ඊට්ස් කද්දි බේබිට මහත්තයව මතක් උනා.. පිට

www.sinhalaelibrary.com

ජාතියක කියලා අහිතක් හිතන්න එපා.. බේබි මහත්තයට හරි හිතවත්.. ගෙවල් ලෙහට දන් එනවනේ. ආපුවහම බලන්නකෝ..'

ඇය ජීවිත උයනේ පිපි පවිත්‍රම මලක් බව මම දන්නෙමි. මම මුස්ලිම් යුවතියක ගැන කියා සිංහල යුවතියන් ගැනවත් නොදන්නෙමි.. සිතාද නොමැත්තෙමි..

එහෙත් දන් හදවතේ සියළු දෙර කවුළු වලින් ඇය එබෙමින් උන්නාය.. හදවත විසාගන්නට මට ලෝබ සිතුණි... මගේ නෙදවයට ඉඩදී මා බලා සිටිය යුතුය...

සියල්ල අමතක කළ හැක... ඇගේ සිනිඳු පාදයේ බෙහෙත් දමද්දී ඇය බලා උන් අයුරු මට අමතක කළ නොහැක.. ඒ මුහුණ ඇයගේම ආගමේ කියනා හැටියට රාමලාන් සඳකි... මගේ ආගමේ පසළොස්වක සඳ වන්නේද ඒ රාමලාන් සඳම නොවේද...

'හවස බේබිට අමාරුවක් තිබුණද...'

ගේ ළං වෙද්දී මම පියදුරුගෙන් ඇසුවෙමි..

'මොන... නොත්ඩි ගගහා ගේ වටේ ඇවිදිනවා.. චූටි මහත්තයාගේ බෙහෙත් බේබිට හොඳට අල්ලලා.. නැත්නම් ඒ ඇනිච්ච ඇඟේ හැටියට මං හිතුවා උණත් ගනී කියලා..'

'ඉක්මනට ප්‍රථමාධාර දුන්නහම උණ ගත්තේ නෑ...'

ඇයව යළි කවද බලන්නට හැකිවේද... දන් ශහිනා මා නෙදරය...

එහෙත් ඇයට මට කතා කරන්නට බැරි වේ... සිතාගෙන්නටද අමතක වේ.. ඒ ගැන සිතිය යුතු නැත. ඇය කියා ඇත්තේ කතා නොකළාට තරහ නැයි කියාය... මා





ගැන ඇය මේ තරමට දන්නේ කෙසේද...

'බේබිට මොනවා හරි කියන්න තියෙනවද සංදේශ් මහත්තයා... මට කියන්න... මම කියන්නම්...'

ඇයට මා කුමක් යැවිය යුතුද... මම නොදනිමි. පැටිස් සැන්ඩ්විච්වස් වලට ස්තූති කළ යුතුය.. වාහනය පාසැල අද්දරටම එව්වාට ස්තූති කළ යුතුය. මාව මතක් වූවාට ස්තූති කළ යුතුය..

'දවස් දෙක තුනක් යනකල් බේබිට නාන්න එපා කියන්න.. පුළුවන් නම් කොත්තමල්ලි ටිකක් බොන්න කියන්න..'

මම ගේ ළඟින්ම බැස්සෙමි.. නංගි ඇස් ලොකු කරගෙන ගේට්ටුව ළඟට දුවගෙන ආවාය... මේ සියල්ල දන් ඇයට සජීවීව වාර්තා කරන්නේ කෙසේද.. මාම අහිංසක බව ඇයට කියන්නේ කෙසේද...

Sl-unlimited.com

www.sinhalaelibrary.com

sl-unlimited.com

# 06

මම බැල්කනියේ විදුලි පහන නිවා දැමුවෙමි.. හැගීම් උතුරා ගලා යන හිතකට මේ විදුලි පහන් එළිය වදයකි... බැල්කනියේ තිබූ කුඩා වේවැල් පුටුවට මම ආශාවෙන් බර උනෙමි.. රබර් ගස් ගාය සිප්ගෙන එන රෑ සුළඟ පසුවේ වැදුනේ කිසිදු ලෙබකමක් නැතුවය... ඒ සුළඟේ සුවඳක් ඇත.. රබර් ගස්වල මල් නැත.. එසේ වී නම් සුළඟට මේ සුවඳ ආවේ කොයි මලෙන්ද..

සුවඳ එන්නේ සුළඟින් නොව හදවත ඇතුළතින් යැයි මට සිතුණි..

මඳ අඳුරේ හිඳගත් ගහිතලාගේ දෙමහල් නිවස දෙස මම බලා උන්නෙමි.. ඒ ගේ සාද අහවර වූ පසුව ලස්සනට





දිස්වෙනු ඇත... මම මවා ගත්තෙමි... මට මැවුනේ නිවස නොවේ... ඇයවය...

උසස්පෙළ විභාගය අවසන් වන තුරු උන්නේ හිත නිදහස් කර ගන්නටය... රෑට හිතේ බරක් නොමැතිව බත් ටිකක් සහ සරමක් දමාගෙන නිස්කලංකයේ ඇහැ පියවා ගන්නා දවසක් එන තුරු මම බලා උන්නෙමි.. හරි නම් ඒ නිදහස සැහැල්ලු බව වැඩිපුරම ඇත්තේ අද රැයේය... විභාගය අවසන් වූයේ අද හවසය... නැත... ජීවිතයේ අත් විඳින කල්පනාබරම රාත්‍රිය අද විය... හිතන්නට යමක් විශේෂයෙන් නැත... එහෙත් නොහිතා නිදගන්නටද හිත සූදනම් නැත.. ඒ නිසාම හිතට නිවනක් නැත...

සියල්ල කළේ ඇයයි... නොවේනම් ඇගේ මෘදු යටිපතුලේ ඇනුණු යකඩ ඇණයයි... ඒ මොහොතේ සිට මට සිදුවූයේ මොනවාද... විභාගයක් තව මොහොතකින් පිළිතුරු ලියන ප්‍රශ්න පත්‍රයත් පසෙක දමා මම ඇගේ තුවාලයට බෙහෙත් දමන්නට ගියේ ඇයි... ලේ පිරුන ඇගේ පාදය දෙපා මත තබාගෙන මගේම අතින් ඒ සපත්තුව ගැළවූයේ ඇයි... මගේම අතින් ඒ ලේ පිසදමා ඇගේ යටිපතුලේ කෝපි කුඩු ගල්වා වෙළුම්පටි දැමුයේ ඇයි...

මේ මෙනෙත් උන් සංදේශ් නොවේ... සුන්දරම යුවතියක් ඉදිරිපිට මේ තරම් සැහැල්ලුවෙන් හැසිරෙන්නට මෙයට කලින් උන් සංදේශ්ට නොහැක...

අද සිදුවූ සියල්ල සිදු නොවුනා නම් හිතට මේ තරම් බරක් නැත... මේ බර තනි මට දරාගන්නටද නොහැක... මම මගේම පුංචි ලෝකයක් හදගෙන ජීවත් වූයෙමි... ඒ ලෝකයටම වී උන්නානම් මේ කිසිදු බරක් නැත...

කොහේවත් යන බෝධි පූජාවකට බලෙන්ම උඩ පැනගොස් අත ගසන්නට මා යන්නේ ඇයි... දහවල් සිදුවූ



www.sinhalaelibrary.com

සියල්ල ගැන මට මහා බොදෙ දුකක් දැනුණි.. මට තිබුණේ මගේ පාඩුවේ විභාගයට යන්නටය... මනුස්සකමට බෙහෙත් ටික දමුවද එතනින් එහාට නොයා ඉන්නට මට තිබුණි... හවස ඇය වාහනය පාසැල ළඟට එවා තිබුණ මොහොතේ මට තිබුණේ එයට ගොඩ නොවී ඉන්නටය... ඇය වාහනය එව්වේ ඇගේ තුවාලයට බෙහෙත් දමා ඇයව සුව කළ නිසා එයට හිලව් එන්නටද බැරි නැත... සමහරු එසේ ණය තබා නොගනිසි...

නිදහසේ පියාපත් ලැබ මල් උයන් පාරාදීස මත පියාඹා යන්නට බලා උන් හදවත මම කුරිරු ලෙස නවත්වා ගත්තෙමි.. ඕනවාට වඩා හිතකට අයාලේ යන්නට ඉඩ දිය නොහැක... අපි බොහෝ පුංචි මිනිස්සු වූයෙමු... කටවල් හතරක් පෙළුවෙන්නේ එක මාස් පඩියකිනි... අප අපේ තරම තේරුම් ගත යුතුය..

ජීවිතය ඉදිරියේ ඇත්තේ එසේ මෙසේ අභියෝගයක් නොවේ.. තාත්තා ඉන්නේ විශ්‍රාම යන වයසේය... වැඩිම උනොත් ඔහු තව වසර දෙකකින් විශ්‍රාම යා යුතුය. ඊට පසු ඔහුගේ අතින් බැටන් එක ගෙන මා මේ රිලේ එක දිවිය යුතුය... ඒ රිලේ එක දුවන්නට සූදානම් වෙනු විනා මේ සුකුරුත්තං එල්ලාගෙන රැය පුරා ඇහැරී හිල්ලීම වැඩකට නැති පිස්සුවකි...

හිත අසරණ වූ විට කිසිවෙකු නැත.. ජීවත් වීමට අරමුණක් පාද ගැනීම ලේසිද නැත.. හිත එකලාසයක් කරගෙන දුර ගමනක් යා යුතු මේ මොහොතේ ඒ හිත ගැස් පිරවූ බැලුම් බෝලයක් මෙන් උඩ පා කරලීම ඇත්තටම භයානකය...

මා මගේ පාඩුවේ ජීවත්විය යුතුයැයි මම තදින්ම සිතා ගත්තෙමි..

'අ...යි...යේ...'





නංගී බැල්කනියට පැමිණ මගේ නිරුවත් උරහිස මත අත තැබුවාය.. ඇත්තටම මම ගැස්සී ගියෙමි.. ඇගේ අත සීතලම සීතල විය..

'මොනවද බැල්කනියට වෙලා අලුත් ගේ දිහා බල බලා කල්පනා කරන්නේ....'

ඇය මා ඉඳගෙන උන් වේවැල් පුටුව පාමුල ඉඳගෙන මගේ දෙදණට දෑතම තබා ඇසුවාය... නංගී මේ තරමටම මනමාල වනවා දකින්නට මම ආශා නොකළෙමි...

'ඇයි නංගි දකලා නැද්ද මම ඉස්සරත් මෙතනට වෙලා ඉන්නවා... එතකොට මේ කෙහෙල්මල් ගෙයක් තිබුණේ නැනේ...'

මම අමනාපයෙන් කීවෙමි. නංගි සැකමුසුව සිනාසුනාය..

'ආයි කියන්න ඒ කතාව... කෙ...හෙ...ල්...ම...ල් ගෙ...ය...ක්...'

'ඔව් කෙහෙල්මල් ගෙයක් තමා... ඉස්සර මේ ගේ නැති කාලේ ලස්සනට ඈත කුඹුරු යායත් පෙනුනා... රබර් ගස් අස්සෙන්... සුළඟ එකපාරටම ආවා...'

මම නිදහසට කරුණු දැක්වීමි..

'මේ ඔයාමද කතාකරන්නේ... හවස අර කෙල්ල කෑ ගහද්දී දුවගෙන දුවගෙන ආපු ඔයාමද... ඇවිත් ඒ කෙල්ලගේ කකුල කකුල් දෙක උඩ තියාගෙන ඇණේ ගලවලා දලා සපත්තුව ගලවලා... මේස් එකත් ගලවලා.. ලේන්සුව අරගෙන ලේත් පිහිදලා... බෙහෙත් දලා.. ඒ වාහනෙන්ම ගිහිල්ලා.. හවසත් ඒ වාහනෙන්ම ගෙදරට ආපු ඔයාමද මේ කතා කරන්නේ... බොරු කරන්න එපා අයියේ... ඔයා අහංකාර වෙන්න හැදුවට ඔයාට බෑ එහෙම කරන්න... ඔයා හොඳයි... ගොඩාක් හොඳයි.. ඔයා මොකකට හරි බයවෙලා...'



www.sinhalaelibrary.com

නංගිගේ කතාවෙන් ඇත්තටම මම කලබල වීමි... මා කුමකට හෝ බයවුනිද... නැත්නම් මා ඕනවාට වඩා අහංකාර වන්නට ගියාද...

'එයා නොමේ වැඩ කරන බාප්පුන්නැගේ කොහෙස්ගේ කකුලේ ඇණයක් ඇනුනක් මම ඇවිල්ලා බෙහෙත් දනවා.. එයා ලොක්කා වගේ වාහනේ ස්කෝලේ ළඟට එවලා තිබුනේ ඒකට තිලව් වෙන්න වෙන්න ඇති...'

'ඉතින් ඇයි ඔයා ඒකෙ නැගලා ආවේ...'

'අර දුප්පත් ඩ්‍රයිවර් මනුස්සයට බෑ කියන්න පව් කියලා හිතුනා...'

'හරි මං පිළිගන්නම්.. එහෙනම් මේක කියන්න...'

'මොකක්ද...'

නංගී මගේ දෙදණට අත් දෙකම තබා නැඟිට ගොස් බැල්කනියේ විදුලි පහන දල්වා නැවත පැමිණ ඉඳගත්තාය..

'මේ මොකක්ද.. ඒ කෙල්ල තිබ්බ සැන්ඩ්විච්සුයි පැටිස්සුයි කිරි පැකට්ටුයි කාලා බීලා මේ විෂු එකක් සාක්කුවේ දගෙන ආවේ අර දුප්පත් මනුස්සයා නිසාද...'

මම නිරුත්තර වීමි.. නංගී හවස මගේ සුදු ඇඳුම් හෝදන්නට රැගෙන ගිය බවත් එහි උඩසාක්කුවේ ගහීනා ලියා තිබූ විෂූ කැබැල්ල තිබූ බවත් මට අමතක විය..

'මං කාපු කෙහෙල් මලක් නෑ...'

'විෂූ තියෙන්නේ අත පිහිදන්න මසස් කම්සේ උඩ සාක්කුවේ ලස්සනට නමලා දගෙන එන්න නොමේනේ නේද...'

මගේ උගුරේ කෙලපවා සිඳී ගොස් තිබුණි...

'අයියේ... ඇයි අයියේ මේ නංගිට බොරු කරන්නේ...'







නංගිගේ කටහඬේ තිබූ අවංක වේදනාවට මට දුක සිතුණි..

'හැම දෙයක්ම හරි කියමුකෝ... ඒත් නංගී...'

'ඇයි...'

'අපි සතුටින් හිටියනෙ හැමදාම... කොහොමටත් ඔයා ඔය අනම් මනම් වෙනවට මං ආස නැහැ... හිතන්න උනත් අපි දෙන්නට කතා කරන්න උනත් ඊට වඩා වැදගත් දේවල් තියෙනවා... දැන් බලන්න තාත්තා තාම ගෙදර ආවේ නැහැ... අදත් ඕ.ටී. වෙන්න ඇති.. නංගී හිතනවද තාත්තා ඉන්නේ ඕවර් ටයිම් කරන්න පුළුවන් වයසක කියලා.. අනික ඕ.ටී. කළයි කියලා බැංකු ලෝන් එකට ගෙව්වට පස්සේ තාත්තට මොනවද ඉතුරුවෙන්නේ.. මටත් හිතන්න දේවල් දැන් තියෙනවා නංගී...'

නංගී නිහඬවම දස් අඩවන් කරගෙන මා දෙස බලා උන්නාය.. මෙතුවක් නැති බැරෑරුම් බවක් ඇගේ මුහුණට වීත් තිබුණි..

'හිතන්න ටිකක්... එක සන්පරයකට හිතන්න.. තාත්තට රස්සාව කර ගන්න බැරුව තාත්තා අසනීප වෙනවා... එතකොට පඩිය නෑ... මේ ගේ හදන්න ගත්ත බැංකු ලෝන් එක ගෙවන්නෙ කොහොමද.. මේ බඩවල් හතර පුරවන්නෙ කොහොමද.. මම ඒවා හිතන්නේ නැත්නම් කවුද හිතන්නේ...'

'අද ඔයා හරි පුදුම දේවල් කතා කරන්නේ... ඔයා ඔය කතා කරන්නේ ඇත්තටම හිතුන දේවල්ද...'

'ඔයයි මායි හිතනවට වඩා ජීවිතේ හරි බරපතලයි නංගී...'

'හරි.. ඒ ඔක්කොම හරි.. ඒත් ඔයා ඔය යන්නේ හැම දෙයක්ම පැත්තක තියලා හම්බ කරන්නද..'

මම පවා එය නොදනිමි..

'අද.. මේ ඒ ලෙවල් ඉවර වෙච්ච දවසෙම මේ ඔක්කොම ඔළුවේ තියාගෙන දුවන්නද ඔයා හදන්නේ... එපා අයියේ.. මම ඉන්නවා.. අම්මා ඉන්නවා.. තාත්තා ඉන්නවා.. අපි ඔක්කොම මේ බර බෙදාගන්නවා...'

'මට ඕන ඔයාලව නිදහස් කරලා ඒ බර මගේ ඔළුවට ගන්න...'

නංගී පිදුණු බැල්මක් මදෙස හෙළුවාය...

'ඒකද ඔළුවේ තියෙන හරි ලස්සන දේවල් හිතත් පසුවක් නැතුව එළියට ඇදලා දන්නේ...'

මේ තරම් ලාබාල වයසකදී නංගී සිතක් කියවන්නට ඉගෙන ගත්තේ කෙසේද... ඒ ඉව කෙල්ලන්ට උපතින්ම ලැබෙනවාද...

'මොනාටවත් ඕනවට වඩා බයවෙන්න එපා අයියේ... යන් පහළට.. අම්මා අද ඔයාගේ විභාගෙත් ඉවර වෙච්ච නිසා ඉඳිආප්ප හම්බනවා..'

'මං තව ටිකක් ඉඳලා එන්නම්... නංගී යන්න අම්මා තනියම උයනවා ඇති...'

'අම්මා කමයි මට කිව්වේ ඉලන්දාරියා ආපුවෙලාවේ ඉඳලා උඩට වෙලා මොනවද කරන්නේ කියලා බලන්න කියලා... ඔයා නෑ කිව්වට ඔයා අද හරි අමුතුයි... එනවද ටිකකින් එහෙනම්...'





නංගී නැගිට යළිත් මා දෙස බැලුවාය..

'ආ.. මේක තියාගන්න.. අරගෙන ආවේ බලන්න වෙන්න ඇතිනේ...'

නංගී මගේ උකුලට ශනීනා ලියූ විකුම් කැබැල්ල දමා පහළට ගියාය.. මම ගල් පිළිමයක් සේ බලාගෙන උන්නෙමි..

මගේ අහිංසක ලෝකය මේ තරම් කලබල කරන්නට මේ කෙල්ල මේ තරම් දෙයක් කළේ ඇයි.. හිත හැප්පත් කර ගන්නට අමාරු මට නොවේද.. නංගීට පවා මුහුණ දෙන්නට බැරි මට නොවේද..

Sl - unlimited.com

sl-unlimited.com

# 07

දැල් ගේට්ටුවේ බඳට දත තබා ඊට මුහුණ බර කරගෙන මම මහේ පාර දෙස බලා උන්නෙමි.. වේලාව රාත්‍රී අට පමණ විය... උසස් පෙළ විභාගය නිමා වීමෙන් පසු හැන්දෑවට මගේ රාජකාරිය මෙය විය. තාත්තා ගෙදර එනතුරු මම පාළුවෙන් පාර දෙස බලා ඉන්නෙමි..

අවට හිස් ඉඩම් වල වැවුණු ගඳපාන ගස් උඩින් කණාමැදිරියන් පොකුරව උන්නේය..

එකවරම පටු මාවත දෙසින් ආ වාහනයක ලාම්පු එළිය කෙළින්ම වැටුණේ මගේ මුහුණටය... මම දෙනෙත් කුඩා කර වාහනය හඳුනාගන්නට මහන්සි ගත්තෙමි..

ඒ ශෂීනාලාගේ වාහනයයි.. ළඟට එන තුරුත් මම





වාහනය නොහැඳිනුවෙමි... එකවරම ගෙට යන්නට බැරි නිසාම මම මහේ ගේට්ටු බඳ අල්ලාගෙන උන් ඉරියව්වෙන්ම උන්නෙමි..

ඇය බැස්සේ කොර ගසමිනි... නොබලා සිටින්නට උත්සාහ ගත්තද දෙනෙත් මට ඉස්සර විය.. ඇය වාහනයේ දොර පළුව අල්ලාගෙන බැස්සේ මා දෙස බලාගෙනය... ඇයට පසු ඇගේ අම්මාද තාත්තාද වාහනයෙන් බැස්සෝය.. හදිස්සියේ කලබල වූ සිත එක්තැන් කර ගන්නට මට විනාඩි කිහිපයක් ගතවිය..

'ගුඩ් ඊව්නින් පුතා... මම පුතාට තැන්ක් කරන්න හිතාගෙනත් උන්නේ...'

ශෂීනාගේ පියා මා වෙතට එමින් කීවේය... ඇය ඔහුට පිටුපසින් සිට මෘදු සිනාවක් දෙතොලකර රඳවාගෙන බලා උන්නාය...

'ගුඩ් ඊව්නින් අන්කල්... අද රෑ වෙලා...'

මම ඔහුව දක්කේ අදය.. උස මහත සිරුරක් තිබුණ ඔහුගේ මුහුණේ තිබුණේ ලෙන්ගතු සිනාවකි..

'මට දුවයි නෝනයි කිව්වා ඊද දුවට පුතා කියලා මෙඩිසින් කළේ...'

මම ලැජ්ජාවෙන් සිනාසුනෙමි.. එය මේ තරම් ප්‍රශංසා ගන්නට තරම් දෙයක් නොවේ... මා කළේ මගේ යුතුකම යැයි මම සිතමි...

'අපිත් ඉක්මනට එන්න හදන්නේ පුතා.. කෝ තාත්තා ගෙදර ඉන්නවද...'

'තාම තාත්තා ආවේ නෑ අන්කල්.. මාත් බලන් ඉන්නේ තාත්තා එනකල්...'

තවමත් ඇගේ දෙනෙත් තෙතරව ඇත්තේ මා වෙතමය.. ඒ දෙනෙත් මගහැර ඉන්නට අසීරුය...

'පුතාගේ එක්සෑම් ඉවරද...'

ශහීනාගේ අම්මා කුළුපගව මගෙන් ඇසුවාය...

'ඉවරයි ඇන්ටි..'

'එද පුතාට පරක්කු උනාද දන්නැ... දුවයි මායි කතා කළෙත් ඒ ගැන..'

'නැ ඇන්ටි ඒක ගාණක් නෑ...'

'අපි ගේ වැඩ බලලා එන්නම් පුතා.. මට තාත්තා එක්කත් කතා කරන්න ආසයි...'

'තාත්තා දන් එයි අන්කල්..'

අම්මාත් තාත්තාත් අලුත හදන ගෙට ගියපසු ශහීනා කොර ගසමින් ගේට්ටුව අද්දරට ආවාය... තත්පරයකට දහස්වාරයකින් මගේ පපුව සැලෙමින් තිබුණි.. සියල්ලටම වඩා දරාගත නොහැකි ලෙස ඇගේ වතින් හමා ආ මෘදු සුවඳක් පරිසරයට මුසුව තිබුණි...

'දන් කකුල සනීපයි.. අයියා බෙහෙත් දපු නිසා හොඳ වෙලාවට පැසෙව්වේ නෑ..'

ඇහිලි තුඩු පටලමින් ශහීනා කීවාය... එක එල්ලේ ඇය දෙස බලන්නට බැරි වීම මහා දුකකි..

'කා...ම කොර ගහන්නේ...'

මම අසම්පූර්ණ වාක්‍යයකින් ප්‍රශ්නයක් ඇසුවෙමි...

'අඩිය තියද්දී වුට්ට වුට්ට රිදෙනවා.. ශො...ඩ...ක් නෑ... අයියා කිව්ව නිසා හොඳයි.. එදම ගිහිල්ලා වෙටනස් එක ගහගත්තා... ඔයා කිව්ව නිසයි ගැහුවේ.. නැත්නම් ජීවිතේට





මම ඉන්ජෙක්ෂන් ගහන්නේ නෑ... කට්ට පෙන්නන කොට බය හිතෙනවා..'

ඇයට වචන ඕන තරම් ඇත... නැත්තේ මටය.. තිබුණද ගළපා ගැනීම අතිශයින් දුෂ්කරය...

'එද වාහනේ එව්වට මුකුත් හිතන්න එපා.. මගේ ලේ ගැව්ච්ච කලිසම ඇඳගෙන බස්වල එන්න අමාරු නිසා එව්වේ... අයියා මොනවත් හිතුවද දන්නෑ...'

'නෑ.. මට බස් එකේ එන්න තිබුනා..

මම හැඟීමකින් තොරව කීවෙමි.. මිදුලේ දල්වූ විදුලි පහනෙන් ගලා ආ මෘදු එළිය ඇගේ මුහුණට කෙලින්ම වැටී ඇත. ඒ නිසා මට ශහීනාගේ මුහුණ පෙනෙන්නේ ලා කහ පාටිනි... ඇගේ නළලත මැද ඇත්තේ රිදී පැහැගත් පොට්ටුවක් වන්නට ඇත.. ලයිට් එළියට එය දිලිසෙන්නේ ඒ නිසාය..

'ඇවිත් දෙන්න එක්ක හොරෙන් කතාව නේද... අපි ඉන්නවද කියලවත් බලන්නෑ...'

නංගී ගේට්ටුව අද්දරින්ම වූ ඉහළමාලයේ බැල්කනියෙන් එබී හෙමිහිට කීවාය... මම අසීරුතාවයෙන් බිම බලා ගත්තෙමි.. හැමදමත් නංගීට පල්වෙන්නේ ඇය නිසාය..

'එන්නකෝ... මං බැලුවා.. කතා කරන්න උන්නේ...'

ශහීනාද ලැජ්ජාවෙන් ඉහළ මාලය දෙස බලා කීවාය.. නංගී බැල්කනියෙන් මෑත් වූයේ පහළට එන්නටය...

'අයියට ස්තූති කරන්න ඕන කොහොමද කියලා මං දන්නෑ... ඒත් මේ තුවාලෙයි අයියවයි මට කවදවත් අමතක වෙන්නෑ... එද සැන්ඩ්විච්වසුයි කිරියි තිබ්බෙ කද්දි අයියවත් මතක් උන නිසා... මොකවත් මං ගැන හිතන්නෙපා...'

ශනීතා එය කියද්දී ඇගේ දෙනෙත් මෘදු ලෙස රතුව යනු මට පෙනුණි.. අල්ලාගෙන උන් ගේට්ටුවේ යකඩය උණු වී ගියාක් බඳු හැඟීමක් මට දැනුණි..

'තව පාරක් බෙහෙත් දගන්න...'

කිසිවක් කියන්නට ගළපාගත නොහැකි තැන මම කීවෙමි...

'දවසක ආවොත් බෙහෙත් දනවද.. සනීප උණේ අයියාගේ බෙහෙත් වලට...'

ආදරණීය සිනහවකින් සිහින් දෙතොල නහවාගෙන ඇය ඇසුවාය.. යුවතියකට ඒ තරම් ලස්සනට හැඟීම්බරව සිනාසිය හැකියැයි මම මීට පෙර නොහිතුවෙමි... ඒ හිනාහවට සමාන්තරව පපුව හරහා ගින්දරක් පැතිරී යයි..

'මං දන්න දත්තේ කෝපි කුඩු විතරයි...'

'ඒ ඇයි.. අයියගේ අතේ අත් ගුණේ තියෙනවා කියලා අම්මත් කිව්වා... ඒකනේ සනීප උණේ...'

අප අතරට නංගී ආවෙන් කතාව නැවැත්විණි..

'කොහොමද ශනීතා අපේ අයියගේ බෙහෙත්.. සනීපද...'

'මාත් සංදේශ් අයියට මේ දත් කිව්වේ ඒක තමා... සනීපයි.. ගොඩාක් සනීපයි...'

'ඒත් තව පාරක් අයියට කියලා බෙහෙත් ටිකක් ද ගමු...'

නංගීට ගන්නට මට සිතුණි..

'බැලූ.. එන්න... යං මං එක්ක අපේ ගෙදරට... බඩුවකුත් දෙන්න තියෙනවා...'

නංගීත් ශනීතාත් අඳුරේම ඔවුන්ගේ අලුත් නිවසට



ගියෝය... යද්දී පරිස්සමින් යන්නයැයි කියන්නට මට සිතුණි...

මම පපුව බර කරගෙන ගෙට ඇතුළු වූයෙමි... ඇයට නංගීට දෙන්නට ඇති බඩ්ඩ කුමක්දැයි මම සිතුවෙමි...

'අර ළමයගේ කකුල සනීප වෙලාද...'

අම්මා පරිස්සමින් මගේ මුහුණ දෙස බලා ඇසුවාය..

'වී...ක...ක් සනීප වෙලා...'

'පිට ජාතියක උනත් හරි සීදේවි කෙල්ල.. දක්කහම හරි ලෝබයි...'

අම්මා ප්‍රශංසා කළේ ඇයටය.. ලැජ්ජා හිතුනේ මටය.. මම ඇයට පිටුපා පුටුවක වාඩිවී නංගී බාගෙට කියවා තමා තිබූ පොතක් ඔහේ පෙරළාගෙන ගියෙමි..

'නංගී කියනව වගේ ඔයා මේ දවස් වල හරි අමුතුයි.. වැඩි කතා බහකුත් නෑ.. ඇයි පුතා ප්‍රශ්නයක්ද...'

අම්මාගේ ප්‍රශ්නයෙන් ඇත්තටම මම අසරණ වූයෙමි..

'නෑ.. ඒ...හෙ...ම දෙයක් නෑ...'

'නැත්තේ නෑ... වෙලාවකට ඔයා ඉන්නේ හරි කල්පනාවක...'

'මට හරි පාළුයි අම්මේ... ගෙදරට වෙලා ඉන්න බැ වගේ... මේ සතියේ පත්තර බලලා රස්සාවකට දන්න හිතුවේ...'

අම්මා හුල්ලන හඬ මට මෙතනට ඇසුණි.

'හම්බ කරන්න දන්ම ඔයා දුක් විඳින්න හිතන්න එපා...'

පුටුවෙන් නැගිට මා ඉදගෙන උන් සැටිය පිටුපසට වී අම්මා කීවේ මගේ හිස පිරිමදිමිනි... මම මොහොතකට දෙනෙත් පියාගත්තෙමි..

www.sinhalaelibrary.com

'අන්න තාත්තා එනවා..'

මම ඒත් දෙනොත් පියාගෙනම උන්නෙමි...

'ඇයි ලොකු පුතාට අසනීපයක් වෙලාද...'

තාත්තා එය ඇසූ හැටියට ඔහු ගැන මෙතෙක් නූපන් ආදරයකින් මගේ පසුව දඩි හියේය..

'ලොකු පුතාට ගෙදර ඉන්න පාළුයිලු. රස්සාවකට යන්න ඕනලු...'

'පි...ස්...සා... ඒවා මම බලාගන්නම්... ඒ ලෙවල් රිසාල්ට් එනකල් ඉංග්‍රීසි පන්තියකට යන්න ලැස්ති වෙන්න...'

ඒත් සමගම වාගේ ගෙදර දොරකඩින් නංගිත් ශහීනාත් ඇගේ අම්මාත් තාත්තාත් ඒවුනෝය...

'එන්න මිස්ටර් හේෂාඩ්... එන්න ඉඳගන්න...'

තාත්තා ඔවුන්ව පිළිගත්තේ උණුසුම් අයුරිනි. මම ඉඳගෙන උන් සැටියෙන් නැගිට ඔවුන්ට අසුන් පැනවූයෙමි.. හිතාමතා මෙන් ශහීනා පැමිණ ඉඳගත්තේ මා ඉඳගෙන උන් තැනමය..

'මිස්ටර් ජයදේව ආපු ගමන් නේද.. මහන්සිත් ඇති...'

'අනේ නෑ මිස්ටර් හේෂාඩ්... තේබර්ස්ලා එක්ක මෙහෙම කතා කරන්න ලැබෙන එක කොච්චර දෙයක්ද... අපිත් හරි පාළුවෙන් මෙහේ ඉන්නේ.. දැන් කවද්ද එන්න හිතාගෙන ඉන්නේ...'

'කොහොම හරි රාමසාන් වලට කලින් එන්න හිතාගෙන ඉන්නේ...'

රාමසාන් එන්නේ ජනවාරි මාසයේය...

'එහෙනම් අපිටත් වටලප්පන් කන්න පුළුවන් මේ පාර...'



අම්මා සිනාබරව කීවාය...

'අපිත් කැවුම් කිරිබත් අවුරුද්දට කන්න බලාගෙන ඉන්නේ... දුවත් කිව්වා...'

එසේ කීවේ ශහීනාගේ අම්මාය...

'අවුරුද්දට විතරක් මොකටද... අපි හදන හදන පාරට දුවට කිරිබත් දෙන්නම්කෝ..'

'එයා ආසත් සිංහල කෑම වලට...'

ශහීනා බිම බලාගෙන සිනාසුනේ ලැජ්ජාවෙනි..

'අදත් කෑම ටිකක් කාලම යමු.. හදන්නම් ඉක්මනට..'

'අපි වෙන වෙලාවක එන්නම්.. දැන් ඉතින් ආවම බැරියැ... එහෙනම් අපි ගිහිල්ලා එන්නම්...'

අපි සියල්ලෝම ඔවුන් සමගම මිදුලට බැස්සෙමු. නංගී උන්නේ ශහීනාගේ සුරතේ පැටලීගෙනමය.

'යන්නම් ඇන්ටි... යන්නම් අයියේ...'

ගේට්ටුව අද්දරින් ශහීනා හැරී කීවාය. අම්මා ඇගේ හිස අතගෑවාය. ඇය නංගීත් සමග පාරට බැස්ස පසු මම පාරට නොයා ගෙතුළට හැරුනෙමි.

ශහීනා ඉඳගෙන උන් පුටුවට මගේ දෙනෙත් ගියේ ඉබේටමය... ඒ මත තිබූ දේ දැක මම පුදුම වූයෙමි. එය අතට ගෙන මම දොරකඩ දෙස බැලුවෙමි. ඔවුන් ගොස් අවසානය...

කිසිවක් නොසිතා මම ඒ කහ පැහැගත් මෘදු සළුව සුරතේ ගුලි කරගෙන ඉහල මාළයට ආවෙමි. මා එසේ කළේ ඇයි... ඒ කිසිවක් ඇත්තටම මම නොදනිමි... මගේ වැඩ වල කිසිම තේරුමක් නැත. නොවේනම් මා තේරුම දන්නේ නැත.

ගිය ඉක්මනින්ම වාහනය යළිත් ගේට්ටුව ළඟ නැවතුනි...

www.sinhalaelibrary.com

නංගිගේත් ශහීනාගේත් හඬ ළං ළංව පහළ මාළයෙන් මට ඇසුණි...

'ෂෝල් එක දලා ගිහින් අනේ..'

මගේ පපුව ගිග් ගිග් ගාන්නට විය... මට තිබුණේ එය තිබූ තැන තබන්නටය... අසරණ කෙල්ල දැන් එය බොරුවට සොයන්නීය...

'කෝ නැනේ.. මෙතනනේ ඉඳගෙන උන්නේ...'

නංගී පුදුමයෙන් ඇසුවාය... මම උඩට ගෙනා ඇගේ මෑදූ උකුරු සළුව ඇඳේ මෙට්ටය යට දමා බොරුවට පොතක් පෙරලා ගත්තෙමි.. මහා හොරකමකට අසුවන්නට යද්දී හොරකම දනෙන නියායක් මට ඇතිවී තිබුණි.. මෙය හොරකමකටත් වඩා දරුණුයැයි මට සිතුණි..

'අ...යි...යේ...'

මම නංගිගේ හඩින් ගැස්සී ගියෙමි. ඇය දුවගෙන දුවගෙන පැමිණ මගේ පොත් මේසය මත දනම තබා තරමක් දෙනෙත් ලොකු කර බැලුවාය.

'අනේ අර කෙල්ලගේ ෂෝල් එක දක්කේ නැද්ද... පව්...'

මම නංගිගෙන් දෙනෙත් මඟ ඇරියෙමි.. සාමාන්‍යයෙන් මට හොරබොරු කළ නොහැකිය..

'මෙන්න ෂෝල් එකක්ද... ඕක මං ගන්නවායැ ඔයා මෙතනට ආවේ. දැපු තැනක බලන්න කියන්න...'

මම මවාගත් කෝපයකින් කීවෙමි. නංගී කාමරය පුරා දෙනෙත් යවද්දී මම ගැස්සී ගියෙමි.

'මට නම් හරි පුදුමයි... එද්දී කෙල්ලගේ කරේ තිබුණා.. මං මිදුලේදී අල්ලලත් බැලුවා...'







දැන් හොරු අසුවන්නට ආසන්නය..

'ගිහිල්ලා එහෙනම් මිදුලේ බලනවා... එහේ වැටිලා ඇති...'

'ඔයත් එන්න හොයන්න...'

'මට බෑ...'

මා නොගියේ ඇගේ දෙනෙත් බලන්නට බැරි කමටය.. අනික එය මිදුලේ නැති බව මා දන්නා නිසාය..

ඔවුන් යන හඬ මට ඉහළ මාලයට ඇසුනි. මහා දුකකින් මගේ තුන් හිත විසිරී ගියේය. පව් වැඩක් කළා යැයි දුකක් මට ඇතිවිය. ඇයට මේ සළුව යළිත් දිය හැකි ක්‍රමයක් නැත. දෙන්නට හිතුවද ලෝබය...

නංගී ඉහල මාලයට එන හඬ ඇසී මම පෑනක් ගෙන බොරුවට මහා වැඩක් කරන කෙනෙකු මෙන් මතකයේ තිබූ සූත්‍රයක් ලියාගෙන ගියෙමි... නංගී පැමිණ මට පිටුපා මේසයට බර වූවාය...

'පුදුම වැඩක්නේ උනේ...'

නංගී ඉන්නේ හිතේ අසහනයෙනි. ඇයට ෂෝල් එක අන්තරස්ධාන වීම පුදුමයකි. ඇත්තටම එය පුදුම වන්නට තරම් කාරණාවකි. ගෙට ඇතුල් වෙද්දී තිබූ සළුව පිටවෙද්දී නැති වූයේ කෙලෙසකද..

'ඔයා ඔයාගේ වැඩක් බලාගන්න.. ඔය කෙල්ල ඔය කෙහෙල් මල් ෂෝල් එකකට ඔච්චර මැරෙන්න යනවද... ඕන තරම් ගෙදර ඇතිනේ...'

මම කැල්කියුලේටරය ගෙන ඔහේ අංක කිහිපයක් ඔබාගෙන ගියෙමි.

'අ..යි...යේ.. කෙල්ලෝ ආස ලොකු දේවල් වලට නෙමේ.. චූටි චූටි දේවල් වලට.. කරාබුවකට... ෂෝල් එකකට...



www.sinhalaelibrary.com

පොට්ටුවකට... කිලුටෙක්ස් කුප්පියකට... චූටි රිබන් එකකට... ජේරුනාද... ඒ කෙල්ල ලෝබ කෙල්ලෙක් නෙමේ.. එයාටත් පුදුමයි...'

'ඒක හරි සැහැල්ලුයිනේ... ගැළපෙන්න ඇති..'

මම අඩමාණයට කීවෙමි.

'ඔයා දන්නේ කොහොමද ඒ ෂෝල් එක සැහැල්ලුයි කියලා...'

මාව හිරවිය. නංගී සමග කතා කරන්නට මා ඉගෙන ගෙන නොමැත්තෙමි.

'ඕවා එහෙම නේද...'

'ම්..ම්... බලමු... කවදාහරි මේ ගෙදරම තියලා ඕක අහුවෙයි...'

මම කිසිවක් නොකීවෙමි. පපුව පුරා සිහින් දහදිය බිංදු පොකුරක් නැගී තිබුණි..

'දිගටම පාඩම් කරපු නිසාද කොහෙද කාමරේ හරියට හැඩි වෙලා. අයියා ගිහිල්ලා කන්න. මං කාමරේ අස් කරන්නම්...'

නංගී හදන්නේ කුමකටද කියා මට නිකමට හැඟුණි. ශහීනාගේ සළුව මා උඩට ගෙන එන්නට ඇති බව ඇය සැක කරන්නීය.. දන් ඇයට අවශ්‍ය එය සැක හැර දනගන්නටය.. මම වෙනසක් නොපෙන්වූයෙමි...

'නෑ ඕන නෑ... මෙහෙමම තියන්න. මං ඉන්නේ ඉරිද මුළු කාමරේම එකපාර අස්කරන්න... උඩින් පල්ලෙන් අස් කරලා වැඩක් නෑ....'

නංගී සිතාබරව පහළට ගියාය. ඇගේ සළුව කොයි







මොහොතක හෝ ඇය සොයාගන්නා බව මට විශ්වාසය.

පහළට ගොස් බත් කටවල් දෙක තුනක් පමණක් කා මම උඩට ආවෙමි. මේ තරමට හැඟීම් වලින් බරව තිබූ රාත්‍රියක් මගේ ජීවිතයේ මා අත්දැක නැත. හදවත වෙන්වෙන් වශයෙන් හැඟීම් බෙදගෙන තිබුණි.. මම කාමරයේ විදුලි පහන නිවා දමා ඇඳේ පෙරළුනෙමි...

නිවසේ සියළු විදුලි පහන් නිවී ගොස් සියල්ලත්ම නින්දට ගිය පසු මම අඳුරේම මෙට්ටය යටට අතදමා ශහීනාගේ උතුරු සළුව අතට ගත්තෙමි... ඒ සළුව ඇත්තටම සිනිඳුය... විදුලි පහන දල්වා ඒ දෙස බලන්නට ආශාවක් දනුණද මම අඳුරේම එය මුහුණට තබා ගත්තෙමි... එයින් ආවේ කපුරු මල් සුවඳට සමාන ආදරණීය සුවඳකි. සිල්ක් රෙද්ද සළුව කම්මුල පුරා තැවරුණේ මොලොක් අපූරු පහසක් ලෙසිනි...

මේ සළුව මා ළඟ ඇති බව ඇය දන්නවානම්... මේ රෑ යේ එය මා මුහුණට තබාගෙන සිටින බව ඇය දන්නවානම්... හැඟීම් වලට තරංග ඇතැයි සිතුවිලි වලට පියාපත් ඇතැයි බුද්ධාගම උගන්වන සාදු දවසක් කීවේය... එය ඇත්තක් නම් ඒ බව ඇයට දනෙනු ඇත...

හදවත් අහසේ පුරපසින් මේ ගලන සඳ රැස් වලට නමක් දිය හැකිද... මම අඳුරේ දෙනෙත් පියාගෙන සිතුවෙමි. අහිංසක ආදරණීය දෙනෙතක් මගේ පාළු හිතට එබෙන්නේ මොනවා ඉල්ලාගෙනද...

බොහෝ රෑ බෝ වූ පසු මම ශහීනාගේ සළුව පරිස්සමින් තුනට හතරට නවා යළිත් මෙට්ටය යටම තැබුවෙමි. ඊට පසුත් ඒ සළුවේ තිබූ කපුරු මල් සුවඳ අත්ලේ විය... ඇගේ සොඳුරු වතේ එල්ලෙන කුඩා සළුවක් මේ තරම් සුවඳ නම්... එතනින් එහාට හිතන්නට මම බිය උනෙමි...





www.sinhalaelibrary.com

si-unlimited.com

# 08

ඒ සිදුවීමෙන් පසු මම මීනවාටත් වඩා පරිස්සම් වුනෙමි... ශහීනා එන මොහොතක් වේ නම් මම හිතාමතාම පහලටවත් නොයා උන්නෙමි.. තැන්නම් තිද ගත්තාක් මෙන් උන්නෙමි. ශහීනා එන හැම්විටම නංගී උඩට පැමිණ මාව සොයන්නීය... නොවැදගත් දෙයක් ගැන හිතන්නාක් මෙන් මම මගේ වැඩක් බලා ගත්තෙමි...

එහෙත් ඇතැම් මොහොතක ඒ මූහුණ එක වරක් පමණක් බලා ගැනීමේ කැදවුම් ආශාවකින් මම දිවී ගියෙමි. එවන් මොහොතක බොරු අවශ්‍යතාවයකට පහළට ආවා සේ පෙන්වා මා පියගැට පෙළ බසිද්දීම ඇගේ දෙනෙත් මා වෙතට යොමුවේ...

මේ රහ දක්වීම ඇත්තටම දුකකි. හිතාමතා හිත රවටා





ගැනීම පාපයකි. කොහොමටත් ශහීනා මා පිස්සෙකු යැයි සිතනු ඇත. මෙසේ හැසිරෙන්නේ පිස්සන් පමණි.

දෙසැම්බර් මාසය වෙද්දී ඔවුන්ගේ නව නිවහන සාද නිමවිය.. එය අපේ නිවසට වඩා දකුම්කළුය. පෙනුමය.. මෙය වෙන කෙනෙකු ගේ වූවානම් හිතට ඊර්ෂ්‍යාවක් එනු ඇත... එහෙත් ඒ ගේ දකිද්දී මට ඇති වෙන්නේ පහන් හැඟීමකි. වැඩ අවසන් වෙන දිනවල ශහීනාගේ අම්මාත් නිතර නිතර ගෙදරට ආවාය...

ශහීනා එසේ ආ එක හැන්දෑවක නංගී මාව සොයාගෙන උඩට ආවාය...

"චුට්ටකට යන් පහලට... අර ළමයා කතා කරනවා..."

නංගී එය කියූ ආකාරයට මට මහා අමුත්තක් දනුණි..

"ඇයි... මො...ක...ට...ද..."

"රට යනවලු... කියලා යන්න ඇවිත් තියෙන්නේ..."

අසාමාන්‍ය දුකකින් මගේ හිත ගැස්සී ගියේය... මම දෙනෙත් අයාගෙන නංගී දෙස බැලුවෙමි.

"ඒ ළමයා මේ ගෙදරට ආවා... ආවා... කතා කළේ නෑ... අඩුම ගානේ පහළටවත් ආවේ නෑ... අඩුම ගානේ අදවත් පහළට එන්න... පව්නේ අහිංසක ළමයෙක් නේ.."

"මං එන්නම් ඔයා යන්න..."

"එනව නේද..."

"එනවා... ඉකිත් ඔයා යන්න..."

ඇය රට යන්නේ ඇයි.. ඒ යන්නේ කිසිදක නොඑන්නටද... මා බලා උන්නේ නව නිවසට ඇය එන තුරුය... ඒ දවස එනතුරු මම ආශාවෙන් බලා උන්නෙමි...

මම සෙමෙන් සෙමෙන් පහළට බැස්සෙමි. ශහීනා පහළ



www.sinhalaelibrary.com

සැටියේ වාඩිවීගෙනම දෙනෙත් එසෙව්වාය... දුරටත් ඒ හිනාව ලස්සනය. ළඟට ඊට වඩා ලස්සනය... නංගීත් ශබීනාත් ඉදගෙන උන් සැටියට සමාන්තරව ඉදිරියෙන් තිබූ පුටුවට මම බර උනෙමි...

අදත් ඇය ඇඳගෙන තිබුනේ සල්වාර් ඇඳුමකි... එයවද ෂෝල් එකක් ඇත. එය සුදු පාටය... මා ඒ දෙස බලනු දක ඇයද එදෙස බැලුවාය...

'අයියට උඩටම වෙලා ඉන්නකොට පාළු නැද්ද...'

මා විඳින පාළුව විස්තර කළ නොහැකි එකකි...

'එහෙම නෑ... වැඩ තියෙනවනේ...'

මගේ වචන වල කිසිදු තෙතමනයක් නැත. මීට වඩා ලස්සන වචන මා දන උන්නත් ඒවා පිට නොකරන්නේ ඇයි...

'මට නම් කාමරේට වෙලා විනාඩි දහයක් ඉන්න බෑ... අපේ අම්මා කියන්නේ කිරි පණු ගාය කියලා...'

'පණු බොහොත් කිව්වම හරියනවා...'

මගේ කතාවට ශබීනා තොල් පට තද කරගෙන සිනාසුනාය.. මේ රට දමා යනවානම් ඇය මේ තරම් සැහැල්ලුවෙන් ඉන්නේ ඇයි.. නංගී මට බොරුවක් කීවාද...

'අපි හෙට ඉන්දියාවේ යනවා අයියේ... සතියකට විතරයි... තාත්තා අවුරුද්දකට පාරයක් ජුවලරි ඩිසයින්ස් ගේන්න යනවා... මේ පාර ඉස්කෝලෙත් නිවාඩු නිසා මාත් යනවා...'

මම නංගී දෙස රවා බැලුවෙමි. ඇය මාව බය කළේ මේකටය..

'මං අද අයියට කිව්වේ මයා රට යනවා කියලා... ඒකයි මය පහළට ආවේ..'



'මෙපාර ඉන්දියාවේ ගියාම අපි අග්‍රාත් යනවා... ටජ් මහල් බලන්න... අයියා අහලා නැද්ද ටජ් මහල් ගැන...'

මම ටජ් මහල් ගැන කියවා ඇත්තෙමි... එය තැනුවේ සාජහන් රජුය. ඔහුගේ ප්‍රියාදර දේවිය වූ මුම්ටාස් මහල් දේවියගේ මරණය දරාගත නොහැකි වූ රජතුමා ඒ දුකත් ආදරයත් සංකේතවත් කිරීමට ටජ් මහල තැනුවේය.

'අහලා තියෙනවා..'

'අයියට මොනවා හරි ඉන්දියාවෙන් ගේන්න තියෙනවනම් කියන්න... මං එද්දි ගේන්නම්..'

ඒ ඇස් එහෙමම මගේ මුහුණ මත නතර විය. ඇගේ දෙනෙත් මගහැර යා නොහැක. ඊටත් වඩා ඒ බැල්මට ප්‍රතිචාර නොදක්වා සිටීමද අසීරුය..

'එහෙම විශේෂ දෙයක් නෑ..'

'මට ඉන්දියාවේ ගිහිල්ලා තෑග්ගක්වත් ගේන්න කෙනෙක් නෑ. ඒකයි මය දෙන්නගෙන් ඇහුවේ මොනවද ඕන කියලා. දෙන්නටම එපාලු... මං හිතලා මොනා හරි ගේන්නම්...'

ශබීනාගේ වචන හරි පරිස්සමෙන් මම පපුවේ තබා ගත්තෙමි.. ඒ වචන මට ඒ තරම් වැදගත්ය. 'මට ඉන්දියාවේ ගිහිල්ලා තෑග්ගක් වත් ගේන්න කෙනෙක් නෑ...' මේ පිත්පාට මුස්ලිම් යුවතියව තොලා ගන්නට තවමත් කිසිවෙකු නාවායැයි සිතීම ඇත්තටම අසීරුය. ඇය බොරු කියනවා යැයි සිතීම දුෂ්කරය..

'ඉන්දියාවේ ගිහිල්ලා ආපු ගමන් අපි ගෙදර පදිංචියට එනවා...'

'අයියා ගියේ නැතේ ශබීනලාගේ ගේ ඇතුළට... ඇතුළ

www.sinhalaelibrary.com

හරි ලස්සනයි...'

නංගී දෑස් විශාල කර කීවාය...

'අපි මුස්ලිම්නේ.. ඒකයි අයියා එන්නේ නැත්තේ... සිංහල ගෙයක් උනාහම් එනවා...'

ශනීතා තරමක වේදනාවෙන් කීවාය. මම අසරණව ඇය දෙස බැලුවෙමි. නිහෙකින් වත් එසේ හිතා නොමැත්තෙමි. මා ඇයව දුටුවේ ජාති කුල ආගම් කිසිවකටවත් අයිති නැති පුංචි සුරංගනාවියක ලෙසිනි. සුරංගනාවියන්ට ආගමක් නැත. ජාතියක් නැත. ඔවුන් දෙවියන්ට අයිති අයය...

'කැමති දෙයක් හිතාගන්න... ඔයාට සුබ ගමන්...'

හැඟීමකින් තොරව එසේ කියා මම වේගයෙන් ඉහළ මාළයට ආවෙමි. මගේ හැඟීම් ගැන තුට්ටුවකටවත් නොහිතා ඇය මුස්ලිම් කතාවක් ඇදගත්තේ ඇයි. මේ තරමටම ඇය ගැන සිතන... මහ රෑ ඇතැම් ඇගේ සුවඳ තැවරුණු සළුව පිඹින මට ඇය ජාතිය ගැන කතාවක් කීවේ ඇයි...

'අයියේ...'

නංගී මා පසුපස එන බව මම දැන උන්නෙමි..

'පව්... ඒ කෙල්ල නොහිතා කිව්ව කතාවට මච්චර කේන්ති ගන්න එපා.. ඔයා එහෙම නෑ කියලා එයා දන්නවා...'

'හරි හරි... දැන් මට මගේ කාමරේ ඉන්න දෙන්න...'

නංගී මොහොතක් අසරණව බලා ඉඳ යන්නට ගියාය.. ඔවුන්ගේ වාහනය පණ ගැන්වූ හඬ නොඇසී යන තුරුම මම ඇඳේ පෙරළී දෙනෙත පියාගෙන උන්නෙමි.

'අා... ශනීතා දීලා ගියා... දැන් ඒ කෙල්ල යන්නේ හිතේ බරෙන්...'





හතරට පහට නැවූ කුඩා කොළ කැබැල්ලක් මගේ පපුව මතට තබා නංගී යන්නට ගියාය. ඇය ඉන්නේද මා සමඟ තරහිනි. මම ඒ කුඩා කොළ කැබැල්ල කුතුහලයෙන් විවර කළෙමි.

මට සමාවෙන්න. කවදාවත් මේ කෙල්ල හිතලා එහෙම කියන්නේ නෑ. ඔයා ඒ වගේ පටු කෙනෙක් නෙමේ කියලා මං හොඳටම දන්නවා. එදා මගේ කකුලේ ඇණේ වැදුණ වෙලාවේ ලේ පිරිච්ච මගේ කකුල අරගෙන පුදු කළිසම උඩ තියාගත්ත ඔයා... අහිතක් නැතුව මගේ ලේ අතින් අල්ලපු ඔයා... ඒ ලේ ගෑවිච්ච කලිසම ඇඳගෙන විභාගෙට ලියන්න ගිය ඔයා... එහෙම නපුරු කොල්ලෙක් කියලා හිතන්න බෑ... ඒත්... ඇයි මා එක්ක කතා නොකරන්නේ... මං ගෙදරම හැදිච්ච කෙල්ලෙක්. ලෝකෙ ගැනවත් පිරිමි ළමයි ගැනවත් දන්නේ නම් නෑ... වරදක් උනා නම් සමාවෙන්න... මං ශනීතා.

ඇගේ හිත රිද්දවා ඇයව යැවීම ගැන මම අසීමිතව පසුතැවුනෙමි. දැන් මා ඇයගෙන් සමාව ගන්නට ඇය ඉන්දියාවට ගොස් එන තුරු සිටිය යුතුය... ඒ ආපසුත් ඇය සමඟ කතා කරන්නට තරම් ශක්තියක් මට ඇත්ද...

Sl-unlimited.com



www.sinhalaelibrary.com

si-unlimited.com

# 09

මම බෝංචි වල නූල් අරිමින් උන්නෙමි. නංගී උන්නේ පොල් ගාමිනි.

'අයියා දන් හරි වෙනස් නේද අම්මේ...'

නංගී නොහිතූ මොහොතක කීවාය... මම හැරී ඇයට රව්වෙමි... නංගී පොල් කැබැල්ලක් දිවගට තබා ගෙන මට ඇසක් ගැසුවාය.. ඇය මේ හදන්නේ අම්මාව අවුස්සන්නටයි...

'ලොකු පුතා හරි වෙනස් තමා... කතා කරන්නෙත් අඩුවෙන්....'

'අම්මත් මේ පිස්සියේ කතා අහනවනේ...'

'මං නංගිට වඩා මයා ගැන දන්නවා ලොකු පුතේ...'





අම්මගේ වදන් මාව හිරිවට්ටවන්නට තරම් විය... අම්මා කතා කරන්නේ මගේ ලොකු හොරයක් අතටම හසුවූ පරිද්දෙනි.

'අම්මා හිතන්නේ අපේ අයියා කොයි වගේ ලේලි කෙනෙක්ව මේ ගෙදරට ගේයි කියලද...'

මේරූ බෝංචි කරලකින් ගත් දම් පැහැ ගත් බෝංචි ඇටයකින් මම නංගීට ගැසුවෙමි. ඇය හිරමණය මත වාඩිවී අම්මාගෙන් පිළිතුරක් ලැබෙන තෙක් බලා උන්නාය...

'ඕක ඉකිත් මගෙන් අහන්න ඕනයැ. එයාගෙන්ම මයා අහන්නකෝ....'

'මං ඔය මල ඉලව් මඟුල් ගැන හිතලා නෑ...'

මම අමනාපයෙන් කීවෙමි...

'අම්මාවත් හිතලා නැද්ද ලේලි මේ වගේ වෙන්න ඕන කියලා...'

'අහිංසක සිරියාවන්ත කෙල්ලෙක් උනාම ඇති... නැත්නම් කොල්ලා ඉවරයි...'

'කවුරු හරි දකිද්දි අම්මට හිතෙනවද එයාව ලේලි කගරන්න තිබුණ නම් හොඳයි කියලා...'

අම්මා තෙම්පරාදුවට පරිප්පු ටික දමා කල්පනාබරව පරිප්පු හොද්ද හැඳි ගෑවාය...

'හිතුනත් ඒක මම අයියට කියන් නෑ ළමයෝ... එයාගේ ජීවිතේ ගැන එයාම හිතලා තීරණ ගත්තදෙන්... එක දෙයක් අයියා හොඳ කෙල්ලෙක්ව මේ ගෙදරට ගේනවා කියලා නම් මං දන්නවා...'

අම්මාගේ වචන මගේ හදවත සිසිල් කරන්නාක් විය...



www.sinhalaelibrary.com

'මං නම් මගේ නෑනා මොන වගේද එයාගේ ගතිගුණ මොනවගේද ඔක්කොම මවාගෙන ඉන්නේ... කියන්නද...'

නංගී හිරමණයේ උඩ හරිබරි ගැසී ඇසුවාය...

'ඔයා ඒක හිතේම තියාගන්න... අයියා හිතලා එයාගේ තීරණ ගනී...'

'මම නම් හිතන්නේ අම්මේ නංගිට මොනා හරි කරගන්න ඕන වෙලා... මගේ මඟුලක් ඇදගෙන දහලන්නේ...'

නූල් ඉවත් කළ බෝංචි භාජනය අම්මා අතට දී මම කීවෙමි...

'අනේ නෑ... මට ඔයා ඉන්නවනේ... ඔයා බැඳලා වෙන කාට හරි අයිති උනාම මම බඳින්නම්... එතකල් මට ප්‍රශ්නයක් නෑ... පාළුත් නෑ...'

නංගී කීවේ හැඟීම්බරවය.

'හැබැයි ඊට පස්සේ ඔයා වගේම අහිංසක... ඔයා වගේම හොඳ මස්සිනා කෙනෙක්ව හම්බඋනොත් මං ගෙදරටම එක්කගෙන එනවා... ඒත් මම හිතන්නෑ එහෙම ඔයා වගේ හොඳ අය ඉන්නවා කියලා...'

නංගිගේ දැස් තෙත්ව තිබුණි... අම්මාද අනුකම්පාවෙන් නංගී දෙස බැලුවාය...

'ඒත් ඔයා අයියට කලින් බඳින්න ඕනනේ දරුවෝ... නංගී ගෙදර ඉද්දී අයියලා බඳින්නේ නෑ... ඒකයි සිරිත...'

'එහෙම කියලා මට ආදරේ නැති පෝරිසාදයෙකුට මාව බන්දලා නම් දෙන්න එපා අම්මේ... මං නම් මැරෙනවා... ඇත්තටම මැරෙනවා...'





ඒ විපත දන් වූ කලෙක මෙන් නංගී අඬන්නට වූවාය...

'ඔයා බයවෙන්න එපා.. ඔයාටත් හොඳ කෙනෙක් ලැබෙනවා... අයියාටත් ලැබෙනවා...'

'අයියට නම් කොහොමත් ලැබෙනවා..'

නංගී කියන්නේ මොනවා හෝ හිතේ හංගාගෙනය. ඒත් හාර හාරා අවුස්සා බැලීමේ ආශාවක් කුතුහලයක් මට නැත.

නංගිගේ හිසද අතගාගෙන මම කුස්සියෙන් පිටඋනෙමි... දවස් ගාණක් තිස්සේ හිසේ පැවති බර අද තවත් වැඩිවිය... කාමරයට නොගොස් මම එහෙමම ගේට්ටුව දක්වා ආවෙමි...

ශබීනාව සතියකින් පමණ දක්කේ නැත... ඇය ඉන්දියාවට ගොස් දන් සතියකටත් වඩා ගතවී ඇත... ඒ දෙස බලන වාරයක් වාරයක් පාසා හිත පාළුවෙන් බරවෙයි... දන් ඒ නිවසේ සියළු වැඩ කටයුතු අවසානය... ශබීනා කීවේ ඉන්දියාවේ ගොස් ආ විගසම ගෙදර පදිංචියට එන බවය...

ඔවුන් සාමාන්‍ය අසල්වැසියන් ලෙස හිතා හදවත සන්සුන් කරගන්නට මම වෙර ගත්තෙමි. හිත සන්සුන් කරගත්තද ඇය සන්සුන් ගමනින් ශාන්තව හදවතට ඇතුළුවෙයි...

Sl-unlimited.com

www.sinhalaelibrary.com

si-unlimited.com

# 10

ඊයේ උදේ සිටම අලුත් ගෙදරට බඩු අදිමින් තිබුණි... ලොරි වලින් බඩු බාන වාරයක් වාරයක් පාසා හිතටද මොනවදෝ බරවෙනු මට දැනෙයි... ඊයේ උදේ වරුව මා කාමරයට වී ගතකළේ දුක් වැයමකිනි. බැල්කනියේ දොර පවා මම විවර නොකළෙමි.

අවසන් දවසේ වූ හිත් රිදීම මේ තරම් දුර දිග ගෙනියන්නේ ඇයි දැයි මමම සිතුවෙමි. ශනීනා දැන් අලුත් ගෙදරට පැමිණ ඇති බව මම හොඳකාරවම දැන උන්නෙමි. වාහන තුන හතර එහාට මෙහාට රිවස් කරනා හඬ උදේ සිටම ඇසුනි. විස්තරයක් දැන ගන්නට හෝ නංගී පෙනෙන්නට නැත. සමහර විට ඇය ශනීනා සමගම විය යුතුය...





ශනීනාගේ කට හඬ අලුත් ගෙදර පැත්තේ සිට දෙතුන්වරක් ඇසුණි. දෙතුන් වරම මම ඇල්පෙනෙති ගොඩකට වැටුණෙක් මෙන් වේදනාවෙන් උන්නෙමි.

එක්කෝ සියල්ල අමතක කර ඇයව හොඳ මිතුරියක ලෙස බාර ගත යුතුය. නැතහොත් ඇයව සදහටම හිතින් ඈත් කර තැබිය යුතුය. දෙවැන්න කරන්නට මා උත්සාහ ගත්තේ වරක් දෙවරක් නොවේ... එය කිරීම කොහොමත්ම බැරි දෙයකි.

මා සමගම මිතුරු වන්නට ඇය කී වරක් ආවාද... ඒ හැම වාරයේම මම මෝඩයෙකු මෝඩ ගණන් කාරයෙකු ලෙස ඇයට පාට් දමුවෙමි. දැන් මිතුරු වෙනවා නම් අලුතින්ම හිතිය යුතුය... ඒත් හිත නිහතමානී වේද කියා නොදනිමි...

කෙසේ වෙතත් මගේ කාමරයට හරි කෙළින් ඇති සඳළුතලයේ පායන්නට කල් පිරෙන මේ සොඳුරු රාමලාන් සඳ සමග තරහා වී මට ඉඳිය නොහැක...

"අයියේ..."

නංගී කෑ ගහගෙනම උඩට ආවාය.. කොයි මොහොතක හෝ ඇය එනතුරු මම මග බලා උන්නෙමි...

"පො..ඩි..ඩ...කට එනවද... අර මිනිස්සු අද බඩු අදිනවා... හොඳ නෑනේ..."

"මං ඇවිත් මොනා කරන්නද..."

"යං අයියේ... හොඳ නෑනේ මෙහෙම ඉන්න එක... අපට ඉන්න එකම දසමහ යෝධයා ඔයානේ..."

මම සරම ගලවා දමා ඩෙනිම් කලිසමත් සුදු ෂර්ට් එකත් ඇඳ ගත්තෙමි... මේ යන්නේ අසල්වැසියෙකුට උපකාරයක් කිරීම සඳහා පමණකැයි මම සිතා ගත්තෙමි...

www.sinhalaelibrary.com

ඒත් හිත මේ තරම් ගැහෙන්නේ ඇයි...

'ඉන්දියාවේ ගිහිල්ලා මොනාද ගෙනල්ලා තියාගෙනත් ඉන්නවා... අද ඔයා තරහ වෙච්ච නිසා බයේ ඉන්නේ දෙන්න...'

පහළට එද්දී නංගී කීවාය.. මට ගෙනත් ඇත්තේ මොනවාදැයි අසන්නට මට සිතුනි..

'මේ... මට ගෙනත්... පව්... මෙච්චර වටිනා තෑග්ගක් මට මගේ හොඳම යාළුවෙක්වත් දීලා නෑ...'

ශහීනා නංගිට ගෙනවිත් තිබූ ලා රෝස පැහැති සල්වාර් කමිසය පෙන්වා නංගී කීවාය...

'මේකට දන සපත්තුයි මාලයි කරාබුයි ඔක්කොම ගෙනත්... ලංකාවෙන් ගන්න ගියොත් පන්දහක් විතර යනවා...'

නංගී ආශාවෙන් කීවාය...

'මට තෑගි ඕන්නෑ... දුන්නත් මට ගන්න ලැජ්ජයි...'

නංගී දිග හැරී සල්වාර් කමිසය දෙස බලා මම කීවෙමි... ඇය මට මොනවාට තෑගි ගෙනාවාද... අප උන්නේ තරහා වී නොවේද...

'ඔයාට ගන්න ලැජ්ජයි... ඒත් හිතන්න කෙල්ලෙක් ගැන. ඔයා හිතන්නේ කොල්ලෙකුට තෑග්ගක් තෝරන්න උනත් කෙල්ලෙක්ට කොච්චර ලැජ්ජද... ඒක අරගෙන එන්න... ඇවිල්ලා දෙන්න... හොඳ අභිමානෙන් ටිකක් නිහතමානී වෙන්න. තෑගි දෙනවට නෙමේ... ශහීනා ඒ තරම් අභිංසක කෙල්ලෙක් නිසා... මනමාල කම එකක්... කෙල්ලෙක්ගේ අභිංසක මනුස්සකම තව එකක්... ඔයාව පහත් කරලා කතා කරනවා නෙමේ... ඕනනම් ඒ කෙල්ලව පිට්ටා අපේ මූණවත් නොබලා ගෙදර ඉන්න. මතකනේ අපි ඉස්සර හිටපු පැත්තේ හිටපු කෙල්ලෝ...







මේ අභිංසක කෙල්ල උන් එක්ක සංසන්දනය කරලා හිතන්න...'

ශහීනා ගැන නංගී කියන්නට අවශ්‍ය නැත. මා මේ ලොව දුටු දයාබරම යුවතිය ඇයයි... ඒ බව මගේ තුන් හිතින්ම මම පිළිගනිමි... මගේ ප්‍රශ්නය එය නොවේ... ලොවේ මා දුටු දයාබරම යුවතියට මුහුණ දෙන්නට තරම් ශක්තියක් මට නැත....

'මං ඇතුළට එන්නද අයියේ...'

මම ඒ හඬින් ගැස්සී ගියෙමි... ශහීනා දොරකඩ ළඟ බලා උන්නාය... බඩු අස්කරන නිසාදෝ ඇය අද ඇඳගෙන උන්නේ ජීන්ස් කලිසමකුත් ටී ෂර්ට් එකකුත්ය... ඇයව දුටු දවසේ සිට ඇය ඇඳ උන්නේ සුන්දර ඉන්දියානු සල්වාර් ඇඳුම්ය... එකවරම ඇගේ පෙනුම වෙනස් වෙද්දී මට මහා අමුත්තක් දනුණි...

'එ...න්...න...'

මම තොල් මැතිරුවෙමි... ශහීනා සන්සුන් ගමනින් අප වෙතට ආවේ මගේ මුළු තුන් හිතම නොසන්සුන් කරවමිනි. ඒ දැස් වලට සැනසිල්ලේ මුහුණ දෙන්නට බැරි තරමට හිත කලබල වන්නේ ඇයි දැයි ඇත්තටම මම නොදනිමි...

'මහත්සිද...'

නංගී කරුණාබරව ඇසුවාය.. ඇත්තටම ඇගේ මුහුණේ තිබුනේ විඩාබර බවකි...

'ඔව් අනේ... මගේ කාමරේ තාම අස් කර ගන්න බැරි උනා...'

ශහීනා කීවේ මා දෙසද බලාය. ඕනානම් මට අද හවස් වරුවම ගෙන ඇගේ කාමරය අස් කර දිය හැක... එහෙත් එය කියන්නට තරම් ධෛර්යයක් මට නැත.

`මං මොනාහරි බොන්න හදාගෙන එන්නම්... ටිකක් ඉඳගෙන මහන්සි ඇරලා යමු..'

අප දෙදෙනා සාලයේ තබා නැගී තත්පරයක් තුළ අන්තර්ධාන වූවාය. ඇය කළොත් කරන්නේ එවැනි වැඩකි.... මම කර කියා ගත හැකි දෙයක් නොමැතිව ඇය වෙතට නෙත් හෙළුවෙමි...

ශහීනා සිනාසුනේ මහ වැරැද්දකට සමාව ඉල්ලාගන්නට මෙන් බයාදුවය...

`ඉඳගන්න...'

ඇය කුමක් හෝ කියන්නට කට හදමින් උන්නාය...

`අයියා තාම මං එක්ක තරහද..'

පිළිතුර නම් මා ඇය සමඟ කිසිම දිනයක තරහ නොවූ බවය. මට තරහ විය නොහැකි බවය...

`නෑ...'

`මං..ට සමාවෙන්න... මෝඩකමට කිව්ව දෙයක් ගැන එච්චර හිතන්න එපා...'

මේ තරමටම මගෙන් සමාව ගන්නට තරම් ඇය වරදක් කර නැත...

`ඉන්දියාවේ යන්න කටුනායක යද්දිත් මට ඒ ගැන හිතිලා දුක හිතුනා. මං දන්නවා අයියා මා එක්ක කතා කරන්නේ නැත්තේ තරහ නිසා... ඉස්සර නම් මෙහේ එන්න හරි ආසාවෙන් උන්නේ.. ඒත් අද හිතුනා වැඩක් නෑ කියලා... උදේට නැගිටලා ගුඩ් මෝනින් කියන්නවත් දන් කෙනෙක් නෑ... මං තමයි අයියාව තරහ කර ගත්තේ...'

ඇගේ කනත් නහයත් රිදෙන්නට මිරිකා හෝ මම තරහා





නෑ යැයි කෑ ගසා කියන්නට මට සිතුණි. අහිංසක කෙල්ල බලා ඉන්නට ඇත්තේ හැම පාන්දරකම බැල්කනියට පැමිණ මට ගුඩ් මෝනින් කියන්නටය... ඒ සොඳුරු මොහොත දන් උදවෙන්නේ නැත්ද...

`මං හිතලා කිව්වේ නෑ... ඒක ඉවරයි...'

එවන් වචන කිහිපයකට පමණක් හිත සන්සුන් කර ගන්නට මට පුළුවන් විය.. ශහීනා දිග සැනසුම් සුසුමක් හෙළා සිනාසුනාය...

`ඉන්දියාවට ගිය වෙලාවේ අම්මයි මායි ටාජ් මහල් බලන්නත් ගියා... ඒක දක්කහම පුදුම හිතෙනවා අයියේ... අපි හැන්දෑවේ ගියේ. මුළු මාජ් මහලම රෝස පාටට හැරිලා ඒ වෙලාවේ. ඒක උදේට සිල්වර් පාටට හැරෙනවලු...'

මම මේ කිසිවක් ගැන නෑසුවෙමි... ඇය ගිරවියක මෙන් කියවාගෙන ගියාය..

`ඉන්දියාවේ ගිහිල්ලා එද්දි අයියට පොඩි තෑග්ගක් ගත්තා.... මා එක්ක තරහ නැත්නම් විතරක්...'

මේ කෙල්ල තව ටිකක් හිටියොත් මගෙන් ගුටි කනු ඇත...

`මට තෑගි එපා... යාළු කෙනෙක්ට දෙන්න...'

එලෙස මට කියවුණේ ඇයිදැයි මමවත් නොදන්නෙමි... කොහොමටත් මගේ වචන ගැන මටවත් විශ්වාසයක් නැත...

`අයියගේ හිතේ තාම තරහ තියෙනවා... කමක් නෑ.. මං ඒක තියාගන්නම්... ඒක දෙන්න තරම් හොඳ යාළුවෙක් මට නෑ...'

පුටුවේ පැත්තකට හැරෙමින් ශහීනා කීවේ දෙනෙත්



www.sinhalaelibrary.com

මංගෙන් වසන් කරගෙනය... ඒවා කඳුළින් පෙනී ඇතැයි මට සිතුණේ ඇගේ අත වලනය වන අසරණ ලීලාව දකිද්දීය... මේ තරමටම මේ කෙල්ලට දුක් දෙන්නට තරම් මම දරුණු වන්නේ ඇයි...

'මං.. ය..න්...නා...ම්...'

ශහීනා දෙනෙත් බර කරගෙනම නැගිට්ටාය...

'නංගී කීම හදනවා.. බීලා යන්න...'

අසරණ කෙල්ලගේ ඇති නිහතමානී කමට ඇය නැවතුනාය...

'මගේ තෑග්ගත් නංගීට දෙන්න... එයා තෑගි වලට හරි ආසයි...'

'එයාට ගෙනාපු තෑගි මං දුන්නා...'

දැන් අසරණ වී ඇත්තේ මාය... සියල්ලටම වඩා ඇය මට ගෙනා තෑග්ග කුමක්දැයි දැන ගැනීමේ ආශාවකින් මම දවී දවී උන්නෙමි...

'ඒක දක්කහම අයියට ආස හිතෙයි... කවදාහරි අයියා මැරි කරපු දවසට ඔයාලා දෙන්නගේ ඇඳේ පැත්තක ඒක තියාගන්න පුළුවන්... අනුෂා වලින් ඒ තෑග්ග ගනිද්දී එයාලා කිව්වේ මේ තෑග්ග ගන්නේ වෙඩින් කපල් එකකටලු... අයියා ආස නැත්නම් ඒක අයියාගේ ගර්ල් ෆ්‍රෙන්ඩ්ට දෙන්න... එයා හරි ආස වෙයි...'

'එහෙනම් දෙන්න... මං එයාට ගිහිල්ලා දෙන්නම්...'

ශහීනා එකෙන් වෙලා මගෙන් සඟවාගෙන උන් දෙනෙත් එසෙව්වාය... තත්පර කිහිපයක් අපේ නෙත් හතර එක තැන වී තිබුණි...





'මං... ගේ...න්...න..ද... එහෙනම්...'

මම හිස වැනුවෙමි... ශහීනා ගෙයින් පිට වූයේ ඇය දමාගෙන ආ පාවහන් යුවළද දොරකඩ තබාය... මම සැටියේ පත්තට බරවී දෙනෙත් මොහොතකට පියා ගත්තෙමි.... ඇය දැන් ගෙනෙන තෑග්ග දෙන්නට මට කෙනෙක් නැත...

'කෝ මේ කෙල්ල...'

නංගී කෝඩියල් වීදුරුවක් ට්‍රේ එක මත තබාගෙනම ඇසුවාය.. මම මහා වික්‍රමයක් කළ එකෙකු මෙන් සිනාසුනෙමි...

'මගේ තෑග්ග ගේන්න ගියා...'

'දැන් යා...ඒ...ද...'

ඇය ඇසුවේ උනන්දුවෙනි... මම හිස වැනුවෙමි...

'පව්... කෙල්ල බයෙන් උන්නේ... මං ඒත් කිව්වා අයියා නපුරු කෙනෙක් නෙමේ කියලා...'

නංගී එසේ කීවද මගේ නපුරුකම් වල සීමාවක් නැත. මනුස්සකමින් ලෙන්ගතුකමින් ඇයව මිතුරියක ලෙස බාරගන්නවා වෙනුවට මා කළේ ඇයව නව නවත් රිදවීමය...

ශහීනා යළිත් දුවගෙන ආවේ සුදු ඉටි කවරයක යමක් දමාගෙනය... මගේ ඇස් මම ඕනෑකමින් සඟවාගත්තෙමි... නංගීද මගේ තෑග්ග බලන්නට දුවගෙන ආවාය.... ශහීනා අප දෙදෙනාටම පෙනෙන ලෙස තිළිණය ටීපෝව මත තබා එය විවර කළාය...

එය ඇත්තටම කදිම තිළිණයකි. මේ තිළිණය අලුත විවාහ වූ ජෝඩුවකට දීම ගැන පුදුම විය යුතු නැත. එය ආදරය පිළිබඳ සදාකාලික අරුතක් දනවන අභිසක තිළිණයකි..

මම මොහොතක් කතා නොකරම ඒ අපූරු ටාජ් මහලේ කුඩා අනුරුව දෙස බලා උන්නෙමි... මේ වැනි තිළිණයක්



www.sinhalaelibrary.com

මට දෙන්නට ශහීනා සිතුවේ ඇයි දැයි මම සිතුවෙමි...

'එයාට මේක දෙනකොට මේ හින්දියෙන් ලියලා තියෙන දේත් කියලම දෙන්න...'

ශහීනා කියද්දී නංගී උඩ බිම බැලුවාය... ටාජ් මහලේ කුඩා අනුරුව පහළින් හින්දි අකුරු වලින් කුමක්ද ලියවී තිබුණි.

'කවුද ඒ...යා...'

නංගී සැපුවම මගේ දෙනෙත් දෙස බලා ඇසුවාය...

'එයා කවුද දන්නවද.. ඔයාගේ නැනා...'

ශහීනා තුනී සිනහවක් පා කීවාය... ඒ සිනහව අසරණ අහිංසක වේදනාබර සිනහවකි..

'ම...ගේ නැ...නා...'

'ඔව්... මේක සංදේශ් අයියයි එයයි මැරි කෙරුවට පස්සේ දෙන්නගේ ඇඳේ පැත්තක තියාගන්න පුළුවන්... හරිනම් මේක දෙන්න ඕන අයියගේ වෙඩින් එක දවසට... අපිට ඉතින් ඒවා කියයිද දන්නෑනේ... ඉතින් මම එදට දෙන ගිෆ්ට් එක අදම දෙනවා...'

නංගී දන් ඉන්නේ ශහීනා ගිය පසු මාව අල්ලාගන්නටය...

'මොනාද මේ ලියලා තියෙන්නේ...'

'මේක අයියා එයාට දෙද්දී එයාට කියලම දෙන්න.. ඒකෙ ලියලා තියෙන්නේ මේ ටාජ් මහල වගේම ඔබේත් මගේත් ආදරය සදාකාලික වේවා කියලයි...'

පපුවේ එලා තිබූ පුළුන් ගොඩකට එකවර ගිනි තැබුවාක් මෙන් මම පිච්චී ගියෙමි... හිස ඔසවා නංගී දෙසවත් ශහීනා





දෙසවත් බලන්නට බැරි ගතියක් මට දැනුණි... වචනයක් වත් කතා කර ගත නොහැකිව දිවග වියළී ගියේය...

'මං යන්නම්... ඔයා එනවා නේද මට කාමරේ අස් කරගන්න උදව් කරන්න...'

ශහීනා නැගිට්ටේ නංගී වෙතට හැරී මෘදු හඬින් කියාය...

'මං එනවා... මේ බීම එක බබා...'

'දෙන්න... මං ගිහිල්ලා බොන්නම්... පැෂන්නේද....'

මහා වරදක් කළ එකෙකු මෙන් මම ගල්ගැසී උන්නෙමි...

'ඔ..ව්... ආසද පැෂන් වලට...'

'හරි ආසයි... එන්න හොදේ...'

දොරකඩ දක්වා ගිය ශහීනා යළිත් යමක් මතක් වීමෙන් හැරී ආවාය...

'මට එක දෙයක් කියන්න අමතක උනා අයියේ.. අයියා එයාට මේක දෙන්න කලින් මෙන්න මෙතනට පොඩි පෙන්ටෝච් බැටරියක් දාන්න ඕනේ...'

ශහීනා ටාජ් මහල පිටුපස කුඩා කවුළුවක් මට පෙන්වා කීවාය...

'එතකොට...'

'අයියා දලා එයාට දෙන්න... හරියටම උදේ හයට මේකෙන් පොඩි මියුසික් එකක් එනවා...'

'ඇයි ඒ...'

'ඒ මියුසික් එකෙන් මොනාද කියවෙනවා... එතකොට එයා හැමදම උදේට ඇහැරෙන්නේ ඒක අහගෙන...'

ශහීනා ගිය පසු නංගී මට රවාගෙන උන්නාය.. ඇගේ



www.sinhalaelibrary.com

තරහා සාධාරණය...

'දන් ඔයා කොහෙන් හරි පිස්සු කේස් එකක් හොයාගෙන මේකට බැටරියකුත් දලා ගිහින් දෙන්න... ඔයා නිසා මටත් දන් ඒ කෙල්ලට මූණ දෙන්න ලැජ්ජයි.... මං ඔයා ගැන හිතන් උන්නේ ඔයිට වඩා ගොඩාක් අහිංසක විදිහකට... මං දන් දන්නවා ඔයා කවදාවත් හොඳ නෑනා කෙනෙක් නම් මේ ගෙදරට ගේන්නෑ කියලා...'

නංගී ගියේ මා සමහ තරහ වීය... මම අනාථ වූවෙකු සේ ටාජ් මහලද රැගෙන ඉහල මාළයට ආවෙමි...

එය මේසය මත තබා මම ඇඳට වැටුනෙමි.. එය කතා කරන්නාක් වැනිය... මට මොනවදෝ කියන්නාක් වැනිය... මේ තරම් හැඟීම් බර තිළිණයක් මට ගෙනෙන්නට ඇය සිතුවේ ඇයි...

www.sinhalaelibrary
Sl-unlimited.com

sl-unlimited.com

www.sinhalaelibrary

# 11

මම මගේ කැල්කියුලේටරයේ තිබූ කුඩා පෙන්ටෝච් බැටරිය ගෙන ටාජ් මහලේ පිටුපස බැටරි රඳවනයට දැමුවෙමි... එහි මැද තිබූ කුඩා ඔරලෝසුව වැඩ කරන්නට ගත්තේ එවිටය... ටාජ් මහල යට ලියා තිබූ හින්දි වැකිය අහිංසක සිංහල වචන වලට ඇය පරිවර්තනය කළ අයුරු මට සිහිවිය... 'මේ ටාජ් මහල වගේම ඔබේත් මගේත් ආදරය සදාකාලික වේවා....'

මම දෙනෙත් තදින් පියාගෙන කොට්ටයේ මූණ ඔබා ගත්තෙමි...

මින් ගලා එන සංගීත රාවය අසන්නට හෙට පාන්දර වෙන තුරු සිටිය යුතුය.... ඉන් කියවෙන රහසිගත පණිවිඩය

ඇය අසන්නට ඇත... මේ සිදුීණය ඇය මට ගෙනාවේ ඒ ප්‍රතිචිඩය මට දෙන්නද...

හිත යටින් දිය සීරාවක් ගලන්නාක් මෙන් තෙතමනයක් දනෙයි... නව ටික දවසකින් ඒ තෙතමනයෙන් මුළු හිතම තෙතබරියම් වෙනු ඇත... විභාගයට පාඩම් නොකළ කොටසකින් ප්‍රශ්නයක් ආවිටෙක මෙන් මම අන්ත අසරණව උන්නෙමි... ජීවිත ගෙවන්නේ මේ පිපෙන අලුත් මල් පොහොට්ටු දෙස නොබලා ඉන්නට මම වෙර ගත්තෙමි... එහෙත් හිත ලෝබකමින් දුව යන්නේ ඒ රුවටමය... ඒ ඇය වෙතටමය...

මම තව දුරටත් පොඩි කොල්ලෙකු නොවූනෙමි... මේ අලුත් හැඟීම්වලින් මුළු හිතම අවුල් කරගෙන මා අනාථ වෙනවා නොවේදැයි මට සිතුණි. අනාගතය ගැන හිතන්නට හිතාගෙන උන් කිසිවක් ගැන මම හිතා නොමැත්තෙමි. මේ සියල්ල අමතක කර දමා ජීවිතයේ හෙට දවස ගැන හිතන්නට මම උත්සාහ ගත්තෙමි...

ඒ අනාගතයට දිවෙන මාවතේ කොනක ඒ අහිංසක දැස දල්වමින් හිඳිනු මම දුටුවෙමි. නොබලා නොතකා මගේ ගමන් යන්නට තරම් මම දැඩි හිතක් ඇති කොල්ලෙකු නොවූනෙමි...

කම්බි පොටක් මෙන් පපුවේ එහි එහි පපුවටම වේදනා ගෙන දෙන මේ අලුත් හැඟීම් මොනවාද... ඒ හැඟීම් වලට නමක් නැත්ද...

සියල්ලටම වඩා දුක කුඩා කාමරයට වී ගොළුවෙකු බිහිරෙකු ලෙඩෙකු සේ පාළුවෙන් ඉන්නට වීමය... මම එහෙම ඉන්නට ආශා නොකළෙමි... එහෙත් හිත මාව පැත්තකට දමා ජේස් දුවන්නාව මෙන් දිව යයි...

රෑ නමයට අමණ වාහන අඟ හතරක් පමණ වේගයෙන් පැමිණ ශහීනලාගේ නිවස ඉදිරිපිට නවත්වනු මට ඇසුණි...





Sl - unlimited.com

www.sinhalaelibrary.com



සමහර විට ඔවුන් මේ රින් බඩු අදිනවා විය යුතුය...

පහළින් එන්නේ අලුත් පිරිමි කඩහඩවල් ගොන්නකි. ඇගේ හඬ ඇසෙයි... පපුවේ ඈත කොනක සිට පටන් ගන්නා ගින්දරක් ළය පුරාම දුවන්නාක් මෙන් හදවත දැවෙයි... දැන් කොහොම වත් නිදගත නොහැක... නිදගන්නට ප්‍රථම තව එක් වරක් ඒ රුව බලාගත හැක. එහෙත් මේ රාත්‍රියේ බැල්කනියේ දොර ඇරගෙන මට පිටතට යා නොහැක.

අලුත් පිරිමි කටහඬක් මගේ කාමරයේ බැල්කනියට සමාන්තරව තිබූ ඇගේ කාමරයේ කුඩා සඳළුතලෙන් ඇසෙද්දී මම ගැස්සී ඇඳමත වාඩි උනෙමි... ඒත් සමගම ඇගේ මෘදු හිනා හඬකුත් මට එතනින්ම ඇසුණි...

මම කාමරයේ විදුලි පහන නොදල්වාම ජනේලය අද්දරට ගියෙමි... හිත මේ තරමට කුරුමානම් අල්ලන්නේ කා වෙනුවෙන්ද... හිතේ ඇති කවර හැඟීමක් වෙනුවෙන්ද...

තවත් වරක් ඇගේ සිනා හඬ ඇසෙද්දී මම ජනේලයේ තිරය හෙමිහිට මෑත් කළෙමි. කාමරයේවත් බැල්කනියේවත් විදුලි පහන් දල්වා නැති නිසා මාව කිසිවෙකුට නොපෙනේ...

බැල්කනියේ කෙටි තාප්පයට බරවී කතා කරමින් උන්නේ ශහීනාත් තවත් තරුණයෙකුත්ය. බැලූ බැල්මට ඔහු මුස්ලිම් තරුණයෙකැයි මම සිතාගත්තෙමි... පපුවේ කොනකට බෝතල් කට්ටකින් ඇන්නාක් වැනි හැඟීමකින් මම පිච්චී කැඩී ගියෙමි...

ශහීනා ඔහු සමඟ වඩාත් ළංව කතා කරද්දී මම හිත සන්සුන් කර ගන්නට වෙර ගත්තෙමි... මේ තරමට හිත අවුස්වා ගන්නට ශහීනා මගේ කවුරුන්ද... ඇය මට හිමි වස්තුවක් නොවේ. අඩුම තරමේ මම ඇයව මගේ මිතුරියක් ලෙසවත් නොසළකමි. ඒ මාය. එහෙත් මගේ හිත මට වඩා සැහෙන දුරකට ඇයව ඇසුරු කරයි... මේ දර්ශනය දක ඇවිලෙන්නේ ඒ හදවතයි...

ඔවුන් බැල්කනියට වී පැය බාගයක් පමණ කතා කරමින් සිටියෝය.. ඔහු ඇත්තටම කඩවසම් ලස්සන තරුණයෙකි... සමහර විට මේ යහිනා විවාහ ගිවිස ගන්නට ඉන්නා මුස්ලිම් තරුණයා විය යුතුය. මුස්ලිම් පවුල්වල එවැනි තීන්දු කිරීමක් ඇතැයි මමද දන උන්නෙමි...

ඕනවාට වඩා ඇය ගැන හිතා මෝඩයා වූයේ මාය. පසුගිය දින කිහිපයම මට හරිහැටි නින්දක් වත් තිබුනේ නැත... ජීවිතය ගැන සරලව බොළඳව හිතන කොල්ලෙකුගේ තත්වයට මම පත්වූයේ ඇයිදැයි සිතා මම මටම සිනාසුනෙමි... කාගේවත් සඳළුතලවල සිටින කුමාරිකාවන් ගැන මේ පුංචි කාමරයට වී හිත හිතා මම මොන තරම් වේදනා වින්දද... මම එසේ කළේ ඇයි...

ඔවුන් දෙදෙනා කුඩා කොකා කෝලා බෝතල් දෙකක් බොමින් තව දුරටත් බැල්කනියේ තනිවම කතා කරමින් සිටිති. මේ රාත්‍රියේ සඳළුතලාවේ තනිවී කෙල්ලෙකුටත් කොල්ලෙකුටත් කතා කරන්නට ඇත්තේ මොනවාද... ඇය ඇඳගෙන උන්නේ රෑ ඇඳුමකට සමාන විල්ලුද ගවුමකි. වාවාගත නොහැකි අසරණ ආත්මානුකම්පාවක් මට මා ගැන ඇතිවිය.

ඇණයක් ඇණගෙන කෑ ගසද්දී ඒ ලේ පිරි පාදය මගේ උකුලට ගෙන මා බෙහෙත් දැමුවේ ඇයි... ඇගේ ලේ පැල්ලම් සටහන් වූ සුදු කලිසම මාරු නොකරම ඇඳගෙන මා ගියේ ඇයි... ඇය වාහනයේ තබා ගිය සැන්ඩ්විච් පෙත්තක් කිරි පැකට් එකක් මා බීවේ ඇයි... සියල්ලටම වඩා අද උදෑසන ඇය දුන් තිළිණයේ මා බාර ගත්තේ ඇයි... ඇත්තටම මම අහංකාරව උන්නෙමි. තෑග්ග ගන්නා ලෙස බල කළේ මගේ සිතයි. ඒ බොළඳ සරල කොල්ලෙකු සේ වැඩ කිරීම නිසාය...

ගැහැණියෙක්ට මායම් හැට හතරක් ඇත්නම් කෙල්ලන්ට ඉන් තිස් දෙකක් වත් ඇත... ඉන්දියාවට ගොස් තෑග්ගක්





ගෙනෙන්නට කොහොත් නැතැයි ඇය මා සමඟ කීවේ පල් බේගලයකි. මමද එය විශ්වාස කළෙමි... එහෙනම් දැන් මේ හුදෙකලාවේ ඇයත් සමඟ බැල්කනියේ ඉන්නේ කවුද...

මම මගේ අහිංසක ලෝකයට නැවත යා යුතුය... ඒ ලෝකය මට නිදහස්ය. නිෂ්කලංකය. මේ තරම් වත් මගේ පපුව පිච්චෙන්නේ ඇය ගැන මා හිතූ නිසාය.

ඕනවාට වඩා බලාපොරොත්තු ජීවිතයට ඕනම නැත. මම ජනෙල් තිර රෙද්ද වසා පැමිණ ඇඳේ පෙරළුනෙමි...

හෙට සිටවත් මගේ වැඩක් බලා ගත යුතුය... මෙසේ දෙතුන් වර ජෝකර්ට ඇඳීම ඒ තරම් හොඳ නැත... ඇඳේ ඇලවී සිටිද්දී මට ඇය හවස දුන් ටාජ් මහල දිස්විය. එය ගෙන එක්කෝ පොළවේ ගැසිය යුතුය. නැත්නම් ඇයටම ආපසු දිය යුතුය. මේ දෙකම කරන්නට තරම් මට හයියක් නැත. නංගීටවත් ඇගේ කාමරයට ගන්නයැයි කිව යුතුය...

කිසිවෙකු එකවර කාමරයේ විදුලි පහන දල්වද්දී මම නෙත් සඟවාගෙන බැලුවෙමි.

'අ..යි...යේ... මම නෙස්ටමෝල්ට් හදනවා ඕනද...'

මට ඇය ගැනද පව් කියා සිතුණි.

'එපා නංගී... මං නිදි...'

'බොරු... අයියා නිදි නෑ...'

නංගී කියන්නේ ඇත්තකි. තව පැය තුන හතරකට මට නින්දක් නොයනු ඇත.

'කරුණාකරලා මට වද නොදී යන්න බබා... නිස්කලංකේ නිදගන්න...'

නංගී හුල්ලමින්ම ජනේලයේ තිරය ඇර ජනේලයද ඇරියාය...



www.sinhalaelibrary.com

'ඇයි මේ එකපාර නපුරු වෙන්නේ.... ආ... මේ...ක...යි... ඒ..හෙ..න..ම්...'

නංගිගේ වචන පැද්දිල්ල මගේ කෝපය වැඩිවන්නක් විය.

'හරි ලස්සන මුස්ලිම් කොල්ලෙක්. අරයත් එයාටම මවලා වගේ නේ..'

මම යංතමට ඒ පැත්ත බැලුවෙමි... තවමත් ඔවුන්ගේ කතාවය...

'කවුද දන්නේ නෑ... හැබැයි කොල්ල නම් හොඳයි... පාකිස්ථාන් ටීම් එකේ ඔය වගේ කෙනෙක් ඉන්නවා.... අයියට මතකද...'

දෙවියනේ මේ කවර දුකක්ද... මට අයිතිව තිබූ හීනයක් අන් සන්තක වූවාක් බඳු හැඟීමකින් මම ඇවිලී ගියෙමි. ඔවුන් දෙස නොබලා ඉන්නට හිතනා හැම විටකම දෙනෙත් මහා ලෝබකමකින් කුහී ඊර්ෂ්‍යාවකින් ඒ දෙසට යොමුවෙයි.

සියල්ල හදවතින් උදුරා දැමිය යුතුය. මේ හදවතේ අලුතින් පැළවූ සියළු පැළ විනාශ වන ලෙස හදවත බුල්ඩෝසර් කළ යුතුය. නැත්නම් මේ ලෙස තව බොහෝ දවසක් මට හිත පුච්චා ගන්නට සිදුවෙනු ඇත. බැරිම උනොත් පහළ නංගීගේ කාමරය සමග මම මාරුවක් ද ගනිමි... මට නිස්කලංකේ ඉන්නට අවශ්‍යය...

'ඇ..යි බබා මේ...'

නංගී අද මහ වාඩිවී කරුණාබරව ඇසුවාය...

'මම මේ ගෙදරින් ගියොත් ඔයාට තනියක් නෑ නේද...'

එකවරම මම ඇසුවෙමි. නංගී පුදුමයෙන් බලා උන්නාය... කොට්ටයක් බිත්තියට හේත්තු කර මම ඇඳමත වාඩි උනෙමි...





'ඇ..යි... කො...හෙ....ද ඔ..යා යන්නේ.....'

'දැන් ඒ ලෙවලුත් ඉවරයි.... අම්මයි තාත්තයි කියනවා ජොබ් එකක් කරන්නත් එපා කියලා. මට මෙහෙම ගෙදර කාමරේට වෙලා ඉන්න බෑ නංගී... ජීවිතේ මොකක් හරි බලාපොරොත්තු මටත් තියෙන්න ඕන...'

'බලාපොරොත්තු ගෙදර නැද්ද...'

'නෑ...'

නංගී පුරහල් ලෙස සිනාසුනාය...

'මොකද...'

'බලාපොරොත්තු ගේ ඉස්සරහා වත් නැද්ද...'

'ජීවිතේ ගැන ළාමක විදිහට හිතන්න එපා නංගී... ජීවිතේ බලාපොරොත්තු පාරවල් වල වැටිලා නෑ... අනුන්ගේ ගෙවල් දොරකඩත් නෑ....'

'අයියා මේ වේදනාවෙන් කතා කරන්නේ... කටහඩත් අමුතුයි...'

මම කතා කරනා අතරවාරයේ කමිසයක් ඔහේ උඩින් දමාගෙන බැල්කනියට ආවෙමි. නංගීද මා පිටුපස ආවාය.. මුස්ලිම් තරුණියා සමග කතා කරමින් උන් ශහිනා වෙනසක් නැතුව සිනාසුනාය... මම සිනාසෙන්නට කට හැදුවා පමණි.

'අපි රෑ වෙලා ගෙදර එනවා. ඕපනින් එකට ඉන්වයිට් කරන්න...'

ශහිනා කෑ ගසා කීවාය... මම තවත් වරක් ඔවුන් දෙස බලා කාමරයට ආවෙමි...

'සංදේශ් අයියට සනීප නැද්ද...'

ඇය හිටිවනම ඇසුවාය. මගේ යටි පතුලේ සිට හිසට විගෙන ගියේය... මගේ මුහුණ ඒ තරමටම ලෙඩ පාටද...

"ඔව්... ටිකක් හිසරදේ වගේනු... කීයටද එන්නේ මෙහේ..."

"තව චුට්ටකින්... නිදාගන්නෙපා..."

නංගී යළි කාමරයට ගොඩ වැදුනේ මගේ මුහුණ දෙස බලාගෙනමය. මේ ප්‍රශ්න නිසා නංගිගේ හිතේ මා ගැන තිබූ ආදර ගෞරවය පවා නැතිවී යතැයි මම බිය වීමි. මේ සියල්ලටම වඩා මට අපේ දුප්පත් ජීවිත තුන වටී...

"ඇයි ලෙඩ කිව්වේ... මට ඇති ලෙඩක් නෑ... එයාලා වගේ සුරංගනාවියන්ට අපි වගේ කබ්බන්ව පේනවා ඇත්තේ ලෙඩ පාටට තමා..."

මම බිස්තියට රවාගෙන කීවෙමි... නංගී පැමිණ මගේ පිට මත සුරත තැබුවාය.

"පේනදේ ඇත්ත නෙමේ අයියේ..."

"මොනා පෙනුනාම මට මොකද... මොකක් ඇත්ත උනාම මට මොකද..."

නංගී හිනැහුවාය...

"කොහෙද අයියා යනවා කිව්වේ..."

"ආ... ඒකත් අමතක උනා.... පුළුවන් නේද මං නැතුව ඉන්න..."

"පුළුවන් කියලා හිතනවා නම් අයියා යන්න... ඒත් කොහෙද..."

"මං බණ්ඩාරවෙල පොඩි මාමගේ දිහා යන්න කියලා හිතුවේ... මම ආසයි පොඩි මාමා එක්ක බිස්නස් කරන්න..."

පොඩි මාමා බණ්ඩාරවෙල 'ජනප්‍රිය' ව්‍යාපාරිකයෙකි.





ඔහු එළවළු තොග වෙළඳම කළේ බණ්ඩාරවෙල නැවතීමය.

නංගී බිම බලාගෙන මේසයේ කොනක් හීරුවාය. ඇගේ ඇස් වලට කඳුළු පිරෙනු මම යාන්තමට දුටුවෙමි.

"සති අන්තේ එළවළු ලොරිය කොළඹ එද්දී මට ඒකෙම එන්න පුළුවන්.... මෙහෙම පාළුවෙන් ජීවත් වෙනවට වඩා එහෙම දෙයක් කරන්න මං ආසයි නංගී..."

නංගී කතා නොකළාය...

"ඇයි ඔයා එහෙම කරන්නේ.. මම ඔයාට වැරැද්දක් කළාද... අම්මා කළාද... තාත්ත කළාද.. මෙච්චර කාලයක් ඔයා අපි එක්ක උන්නා. ඔයාට පාළුවක් තිබ්බේ නෑ... අපි කොච්චර සතුටින් උන්නද... ඇයි දැන් මේ හොරු අරගෙන ගියා වගේ යන්න හදන්නේ..."

මම දිගටම නිහඬව උන්නෙමි. ශහීනා අර තරුණයාත් සමඟ බැල්කනියේ විදුලි පහන නිවා දමා ඇතුළට ගියාය...

"මට මේ ගෙදර ඉන්න දැන් ආශාවක් නෑ..."

"අපි ආශාවෙන් ආපු මේ ගෙදර... ඔයා මේක හදද්දි කොච්චර ආශාවෙන්ද උන්නේ එන්න... අපි කාමර බෙදාගනිද්දි අයියා මේ කාමරේ ගත්තේ පොර කාලා... ඇයි දැන්..."

"කොහොමත් අපි දෙන්නා අපේ කාමර මාරු කර ගමු... මට දෙන්න ඔයාගේ කාමරේ... මේ කාමරේට ආස ඒ ඉස්සර... මේ බැල්කනියට ආපුගමන් ලස්සනට මුළු රබර් යායම පෙනුනා. ඒ පැත්තේ ඉඳලා හුළඟ ආවා. හවසට මෙතන පුටුවක් තියාගෙන මං බලාගෙන උන්නා... උදේට රබර් ගස් වල මීදුම... අද ඒ මුකුත් නෑ...."

නංගී මගේ දෙනෙත් දෙස බැලුවේ පරිස්සමෙනි.



www.sinhalaelibrary.com

'ගස් කොළං... පුළුන... මීදුම... ඒ ඔක්කොටම වඩා ලස්සන දෙයක් දැන් බැල්කනියට පේනවා නේද...'

නංගිගේ ප්‍රශ්නයට ඇය පිළිතුරක් බලාපොරොත්තුවෙන් උන්නාය. මම අයියා ලෙස එයට පිළිතුරු දිය යුතුය.

'මට අයිති නැති දෙයක් දිහා බලලා මට සතුටු වෙන්න ඕන නැහැ නංගී...'

නොදැනුවත්වම මගෙන් ඒ වචන පිටවීම ගැන මම දුක් උනෙමි... මේ තරම් ආත්මානුකම්පාවෙන් අද මම ඉන්නේ ඇයි දයි මම නොදනිමි.

'අයිති කර ගත්තොත් සතුටු වෙන්න පුළුවන්ද...'

'මං දන්නෑ... කෝ ඔයා ගේනවා කිව්ව තෙස්ටමෝල්ට් ඒක... තිබහයි....'

නංගී උතුරා යන තරම් ආදරයකින් බලා මේසය මත තිබූ ශබිනා දුන් ටාජ් මහල පිරිමැද්දය.

'සමහර දේවල් දක්කහම දුක හිතෙනවා තමයි... ඊර්සියාත් හිතෙනවා... මට පව් කියලත් හිතෙනවා... ඒත් ඉතින් ඕකට බණ්ඩාරවෙල යන්න හිතන්න ඕන නෑ... ඔයා හිත නිස්කලංක කරගෙන නිදාගන්න... දන් කෙල්ල පාටිය කියන්න එයි... මං අහනවා...'

මම නංගිව නවත්වන්නට ගියෙමි. නංගී මා කතා කරන්නට පෙර පහලට බැස්සාය. මේ අද පපුවේ දවෙන්නේ අහක යන ගින්දරය. මේ පපුව එසේ ගින්දරින් දැවුණු පපුවක් නොවේ.

නංගීට බණ්ඩාරවෙල යන බව කීවද අම්මා තාත්තා නංගී මේ ගෙදර දමා යන්නට මටද දුකය... ජීවිතය ගැන එසේ හදිස්සියේ කළකිරී දමා යන්නට තරම් දෙයක් මට





සිදුවීත් නැත... උසස් පෙළ නිවාඩු බව ඇත්තය... ජීවිතය ගැන දන් පිළිවෙලකට කල්පනා කළ යුතුය. එසේ තිබියදී මා මේ වද වේදනා විඳිමින් අනුන්ගේ වතු වල රෝස මල් ගැන සිතමින් ගෙවා දමන කාලය අපරාධයක් නොවේද...

sl-unlimited.com
www.sinhalaelibrary.com

sl-unlimited.com

# 12

මීට මාස තුන හතරකට පෙර සිට මීට වඩා පිළිවෙලක් ඇති සංදේශ් කෙනෙක් මේ කාමරයේ උන්නේය. ඔහු කුඩා අහිංසක ළමයෙකි. ඒ ළමයාව දන් හොයා ගත යුතුය... ඒ ළමයා එක මලක් දුටු වනම අවුල් වන ළමයෙක් නොවේ... ඇස් දෙකක් අසළ ගොළුවී යන ළමයෙකු නොවේ...

ගේට්ටුව ගැවෙන හඬ පහළින් ඇසුණි. ඒ එන්නේ ශහීනලාය... හෙට ඔවුන්ගේ ගෙට ගෙවැදීමේ උත්සවයයි... මේ එන්නේ ඊට අපට ආරාධනා කරන්නටය... පාටිය ජයටම පැවැත්වෙනු ඇත.

ගෙට ගෙවැදීමට මට කිසිවෙක් ආරාධනා නොකරයි... එය විශේෂයෙන්ම කරන්නේ අම්මාටත් තාත්තාටත්ය... ශහීනා





නංගීටත් ආරාධනා කරනු ඇත... මට ආරාධනා කළද නොයන්නට මම දැඩි තීරණයක් ගත්තෙමි... රූපියල් අස්සේ අලුක්කාලවල් ගසන්නට යාම මෝඩකමකි...

ශහීනාගේ අම්මාගේත් තාත්තාගේත් කටහඬ පහළින් උඩට ඇසුණි. ශහීනාගේ කටහඬ නොඑන්නේ ඇය තවමත් නිවසේ අර මුස්ලිම් තරුණයා සමග මුකුළු කරන නිසා විය යුතුය. යුවතියන් මා සිතනා තරම්ම පවිත්‍ර අය නොවේ... දුටු විටම එසේ හිතනා අප මෝඩයෝය...

සාදය පැවැත්වෙන්නේ හෙට හවස බව ඔවුන්ගේ කතාවෙන් මම දැන ගත්තෙමි... කොහොටවත් නොයා ගෙදර ඉඳීම වදයක් වෙනු ඇත. එහෙත් මට විශේෂයෙන් යන්නට තැනක් නැත. ඒ අතින් මම අසරණයෙක්මි.

නංගිගේත් ශහීනාගේත් මුණු මුණුව බැල්කනියට පහළ වත්තෙන් මට ඇසුණි... ඔවුන් කුටු කුටු ගාන්නේ මොනවාද.. ඒ තරම් රහසින් මෙන් කතා කරන්නට ඔවුන්ට ඇත්තේ මොනවාද... මොනවා තිබුණද මොනවා කතා කළද මා ඒ ගැන දෙගිඩියාවෙන් හිතන්නේ මන්ද...

ශහීනලා යන හඬ ඇසුණි. හිතට යන්නම් සැනසිල්ලක් දැනුණේ එවිටය... දන් මම මගේම ගෙදර මේ කාමරයේ හිරකාරයෙක් වී ඉන්නෙමි... අවශ්‍ය වෙලාවක පහළට බසින්නටවත් බැල්කනියට යන්නටවත් මට හැකියාවක් නැත.

නංගී කාමරයට ආවේ තෙල් දමා කොණ්ඩය ගොතමිනි. මේ රාජකාරියට ඇය පැයක් පමණ වෙලා ගනී. ළහදී සිට මේ පැවතුම් වලට අළුතෙන් දෙක තුනක්ද එකතු වී ඇත... ඒ ගත පුරාම මෘදු ක්‍රීම් වර්ගයක් ගැල්වීමය. රාත්‍රියට නංගී ළඟින් එන ඒ සුවඳට මම ඇත්තටම ආශා කළෙමි. එය ඉල්ලාගෙන දවසක් දෙකක් වත් ගා ගන්නට සිතුණද මට ලැජ්ජා සිතුණි.

'පාටිය හෙට.. කෙල්ල උන්නේ උඩට ඒ ගන්න බැරුව.

'පාටිය හෙට.. කෙල්ලෙ උන්නේ උඩට ඒ ගන්න බැරුව. -->

'පාටිය හෙට... කෙල්ල උන්නේ ... සංදේශ් අයියට කවිත්ම අන්කලුයි ඇන්ටියි උන්නනේ.... සංදේශ් අයියට කවිත්ම කියන්න ඕන කිව්වා...'

මම ඒ තරම් උනන්දුවකින් කොරව නංගී කියනාදේ අසා උන්නෙමි.

'ගෙදරට මෙච්චර ඉක්මනට එන්න ලැබිච්ච එක ගැන කෙල්ල හරි සතුටින් ඉන්නේ.... එයාලා හිතන් උන්නේ මේ රාමසාන් වලට එන්න බැරිවෙයි කියලලු...'

නංගී මගේ අපිළිවෙලට දමාතිබූ කමිස කිහිපය අතට ගෙන නමා දමුවාය.

'උදේ එයාලගේ පල්ලියේ අය ඇවිල්ල මොනවද ආගමික වැඩ වගයක් කරනවලු... හවස පාටිය...'

මගේ කතා නොකිරීම මටම ප්‍රශ්නයක් විය. නංගී මේවා අල්පෙන් ඔළුවට දමන්නට උඩට ආවේ ඇයි...

'මේ.. දන් හෙට අඳින්නේ මොනවද... ම්... මේ තියෙන ෂර්ට් නම් මදි... අපි අළුතෙන් ෂර්ට් එකක් ගමු... මටනම් තියෙනවා නිරංජලා අක්කගෙ වෙඩින් එකට ඇඳපු සල්වාර් එක...'

නංගී හිතාගෙන ඉන්නේ මා හෙට ඔගට ගෙවැදීමේ උත්සවයට යන බවය.

'ඔයයි අම්මයි තාත්තයි යන්න... මං ගෙදර ඉන්නවා... පවුල් පිටින් යන්න ඕන නැහේ...'

නංගී දිග සුසුමක් හෙළුවාය.

'ඔයා කියන්නේ බොරු... ඔයා ගණන් උස්සනවා... ආ අයියේ... බොරු නේද කියන්නේ... හෙට එනවා නේද...'





'පිස්සුද බොරු කියන්නේ... එන්නේ නෑ... මට ඔය පාටි අල්ලන්නේ නෑ...'

මම වඩාත් කුරිරු ලෙස කීවෙමි.

'හෙට නොගිහින් ඔයා කොහොමද ඒ මිනිස්සුන්ගෙ මූණ බලන්නේ... උදේ හවා ඉන්න මිනිස්සු... ලෙඩක් දුකක් උනත් ඉන්නේ ඒ මිනිස්සු...'

'මෙච්චර දවසක් අපිට හිටියේ එයාලද.. එයාලා කළින් හිටපු තැන්වල ඉඳලා අපේ ගෙදර දුවගෙන ආවද... මැට්ටියෙක් වගේ හිතන්න එපා...'

'ඔයා මහ පුදුම මිනිහෙක් වෙලානේ...'

'බබා... මම යන්නේ නෑ... මට යන්න ආසත් නෑ... පාටියක් කිව්වාම ගෙදර පැටව් ඔක්කොමයි බල්ලවයි කොල්ලවයි ඔක්කොම යන්නේ නෑ.. අම්මයි තාත්තයි යයි... ඔයත් ඕනනම් යන්න. ඒ ඇති... පවුල් පිටින් යද්දි මිනිස්සු උනත් බලයි... ලැජ්ජ නැද්ද...'

නංගී මූහුණ බෙරි කරගෙන උන්නාය.

'ශනීතා මහින් මහටම කිව්වා සංදේශ් අයියට එන්නම කියන්න කියලා...'

'අ..නේ එයාගේ රික්වෙස්ට්... ආයි කියන්න එපා.. මම යන්නේ නෑ... මම අම්මටත් කියනවා. ඔයාලා යන්න...'

'කාටවත් නොවේ ගහන්න ඕන මට... මට අයිය කෙනෙක් ඉන්නවා කියලා හරි වංගෙන් හිතාගෙන ඉන්නේ. හරියට දස මහ යෝධයෙක් ගෙදර ඉන්නවා වගේ... බොරුවට හරකි වගේ මාන් ආඩම්බර වෙනවා... මිනිස්සු එක්ක ඔයා ගැන

කියවනවා... එක දවසක් ඔයා එක්ක පාරේ බැහැලා යන්න ආසයි... නංගි කෙනෙක් එහෙමයි... කවදහරි මාත් කොල්ලෙක් එක්ක පාටියකට යයි. ඒත් අද ආගෙවෙන් ඉන්නේ ඔයා එක්ක ඔයා ළඟින් යන්න... නැත්නම් මට අඩුවක් කියලා මම හිතුවේ... සා..රි.. ඔයා එන්න එපා... මම හිතාගන්නම් මට එහෙම ළඟින් තියාගෙන කොහේ හරි යන්න අයිය කෙනෙක් නෑ කියලා...'

නංගී ඇඳපත්ත හූරමින් ඇඬුවාය. නංගී කියන සියල්ල ඇත්තය. මට යුතුකම් ඇත. අයියා කෙනෙක් ලෙසද මේ පවුලේ එකම පිරිමි දරුවා ලෙසද ඒ යුතුකම් වලින් මට පිට පැන යා නොහැක. මට නොවේ. මා ආදරය කරන අයට මගෙන් යමක් සිදුවිය යුතුය. මේ නංගි අඬන්නේ මා ඒ යුතුකම් ඉටු නොකරන නිසාද...

'සොරි... මං ඔයා ඔහොම හිතනවා නම් මේ ගෙදර ඉන්නෙත් නෑ... මං එච්චර බලු අයියා කෙනෙක්ද... මං ඔයාට එහෙම නොසළකා ඇරලා තියෙනවද... අවුරුදු හතක් මං ඔයාව මේ අතේ එල්ලගෙන ඉස්කෝලේ එක්ක ගියේ නැද්ද... හැමදම උදේට හන්දියේ කිරි මණ්ඩලයෙන් ඔයාට කිරි පැකට් එකයි බිත්තර පාන් එකයි අරන් බෑග් එකට දම්මෙ මං නෙමේද.. කියන්න බබා... ඉස්සර ගෙදර ඉඳිද්දි ඔයාට නාන්න වතුර ටික ඇදලා දුන්නේ මම නෙමේද... පිට අතුල්ලන්න අයියේ කිව්වාම පච්කියලා කොණ්ඩේට හැම්පු ටිකත් දම්මේ මම නෙමේද... ඔයා ලොකු ළමයෙක් වුනාට පස්සේ කවදද මම ඔයාව තනියම රෑක යැව්වේ. කතා කරන්න බබා... ඔයා ඔහොම නම් මට කතාකරන්නේ ඔයා





යන්න මෙතනින්... එක ඉලව් පාටියකට යන්න ආවේ නෑ කියලා මේ අයියා ජීවිතේ පුරා කරපු ඔක්කොම අමතක උනාද ඔයාටත්... ඒත් ඔයා ඇයි මෙහෙම කතා කරන්නේ...'

දස් යංනමට පෙනී ගොස් තිබුණි. ඇත්තටම මට සියල්ල සිහි විය... මම හැමවිටකම මගේ බැඳීම් වලට අවංක වීමි. මීට වඩා දෙයක් මට කරගත නොහැක්කේ මට රස්සාවක් නැති නිසාය...

'ම..ට... සො..රි... මං... මං.. එච්චර දුර හිතුවේ නෑ... ඒවා අමතක වෙන්නේ නෑ... මට දුකයි අද උන්න මගේ අයියා මට නැති වෙයි කියලා...'

නංගී පාත් වී මගේ සරමින් කඳුළු පිසද ගත්තාය. මේ සියල්ල මේ ඉදිරිපස සැදුණු තිවස නිසාය...

'හෙට ඉඳලා ඔයාට යන්න ඕන තැන් ඔක්කොම මට කියන්න... යං මා එක්ක... මං එක්කගෙන යන්නම්... තේරුනාද...'

'එහෙනම් හෙට පාටියට යන්...'

ඒ ගමන පමණක් නොයන්නට මම දැඩි තීරණයක් මොහොතකට කලින් ගත්තෙමි. නංගී නිසාවත් එය වෙනස් කරන්නට මම අකමැත්තෙමි.

'බෑ.... මං හෙට ගෙදර ඉන්නම්... ගියාවගේ තමා ගේ ඉස්සරහනේ...'

'අර ළමයා තරහ වෙනව නේද... එහෙම තරහ කර ගන්න ඕනද එයාව...'

'විශේෂයෙන් යාළු වෙන්නවත් තරහ වෙන්නවත් ඕන නැහැ. ඔයා ඔය උඩ දගෙන හිතුවට එයා ඒක හිතන්නේ



www.sinhalaelibrary.com

නෑ.. මොකද පාටියට අපි විතරක් නෙමෙයිනේ එන්නේ... ඔන්න අපි හතර දෙනාට විතරක් රෑ කෑමට එන්න කිව්වනම් මං කරන්නේ වැරැද්දක්...'

නංගී සිනාසුනාය.

'ඒත් ඔයා එන්නේ නෑ නේද...'

'ඔව්... මං හිතනවා එහෙම යන්න ඕන නෑ කියලා... ඇයි දන්නේ නෑ...'

'ඇයි දන්නවද...'

'ඇයි...'

නංගී ඇදෙන් නැගිට මගේ දණහිස් පත් දෙකට දතම තැබුවාය.

'ඔයා හිතනවා වැඩියි.. රෑට හිතලා බලලා හෙට යන්...'

'සොරි... ඒක වෙනස් වෙන්නෑ...'

නංගී ගියේ මූහුණ පුළුටු කරගෙනය. ජීවිතයේ ටික කාලයකින් පසු හැමෝටම අවශ්‍ය කරන දේවල් කළ නොහැක.

www.sinhalaelibrary

# 13

සියල්ල අමතක කර දමන්නට මා පසුදා උදෙන්ම ලොකු වැඩක් පටන් ගත්තෙමි... ඒ ගෙදර තිබූ සියළුම දොර ජනේල රෙදි ගලවා මම වත්ත පිටුපස තිරුවානා ගල් ළඟ කොන්ක්‍රීට් පඩියට වී සෝදන්නට ගත්තෙමි. එය ලේසි පහසු වැඩක් නොවීය. ජනේල රෙදි දහයක් පමණද දොර රෙදි අටක් පමණද විය. ඊට අමතරව ඇඳ රෙදි කිහිපයකුත් මම ගත්තෙමි.

'මොකද ලොකු පුතේ කරන්න යන්නේ...'

පාන්දර මම දොර ජනේල රෙදි ගලවද්දී අම්මා ඇසුවාය. හදිස්සියේ දොර ජනේල රෙදි ගලවන්නට මට සෑදුනු අසනීපය කුමක්දැයි ඇය සිතන්නට ඇත.

www.sinhalaelibra

'මේවා හෝදලා දන්න අම්මේ... හරියට පරණවෙලා...'

අම්මාද මට පැමිණ උදව් වූවාය.

'මටත් දෙතුන් පාර හිතුනා. හරි අමාරුයි ලොකු වුණත් මේවා හෝදන්න... අළුත් කිර ටිකක් දන්නත් ඕන...'

'පමුණුව පැත්තේ අඩුවට රෙදි තියෙනවා. මං අම්මට කියන්නේ ඒකනේ රස්සාවක් කරන්නම් කියලා. කළානම් මේ මාසෙම මේ කිර ටික දානවා. තාත්තට ඔක්කොම කරන්න බැනේ...'

'ලස්සනට අළුත් ගෙවල් ඔපන් කරද්දි ඔයාට දුක හිතුනාද...'

අම්මා මා ගැන දනී. මගේ හිත ගැනද ඇය දනී...

'මං රස්සාවක් කරන්න ගත්ත කාලෙක මේ ගේ තව ලස්සන කරලා හදනවා...'

අම්මා දයාබර ලෙස සිනාසුනාය...

'හවස මෙයාලගේ පාටියට මං යන්නෑ අම්මේ...'

අම්මාට එය කියන්නට වෙලාවක් සොයමින් මම උන්නෙමි.

'මට නංගිත් කිව්වා... ගියානම් හොඳයිනේ...'

'අම්මයි නංගියි තාත්තයි යන්න... මට කම්මැලියි...'

'එහෙනම් මං ඔයාට බත් ටිකක් ලිපේ තියලා මොනාහරි හදලා යන්නම්... නැත්නම් මං ගිහිල්ලා බත් කටක් කන්නේ කොහොමද...'

මේ අම්මලාගේ හැටි විය යුතුය...

'මං පාන් කනවා...'



www.sinhalaelibrary.com
Sl-unlimited.com



'මෝඩ දරුවා...'

'මට සබන් කැලි දෙකක් දෙන්න අම්මේ...'

කොට කලිසමකුත් ටී ෂර්ට් එකකුත් ඇඳ මම වැඩ පටන් ගත්තෙමි. අම්මා මේවා තනිවම කොහොම කෙරුවාදැයි හිතුණේ සෙත ජනේල රෙදි ඔසවා හෝදන්නට බිම දගනිද්දීය.

'ඔයා හරියට හිතේ දුකට වැඩ කරනවා වගේ. ඔක්කොම කිර ගලව ගත්තේ ඇයි...'

නංගී ගහ යටට පැමිණ කීවාය. මම බිම ඉඳගෙන සබන් නාගෙන ඇය දෙස බැලුවෙමි.

'බාගයක් හෝදලා වැඩක් නැනේ...'

'උදේට කන්නේවත් නැද්ද...'

'මට ඒකත් අමතක උනා... මොනවද අම්මා හදලා තියෙන්නේ...'

සන්ලයිට් කැබැල්ල වේගයෙන් කිරය අතර රූගෙන යන අතරවාරයේ මම ඇසුවෙමි.

'කිරිබතුයි මිරිස් මාළුයි...'

'කිරිබත් හැදුවේ අපේ ගෙවල් ඔපන් කරන්නේ නැනේ...'

මම අමනාපයෙන් කීවෙමි.

'ශහීනලාගේ අම්මා ඇවිත් අම්මට කිව්ව දවාලටත් කෑම හදන්න එපා කියලා...'

'ඉතින් අම්මා හදන්නේ නෑ...'

'නෑ...'

අම්මා ගැනද දන් තරහක් උපදී. මේ ගෙදර මෙතෙක් සිදුවූ සියල්ල දන් කණපිට පෙරළී ඇත...

'වැඩි සෙනේ දඹරෙටයි කියලා කතාවක් තියෙනවා... බලන්නකෝ වෙනදේ... සාමාන්‍ය විදිහට හලෝ කොහොමද කියලා උන්නාම ඉවරනේ...'

මම පණ්ඩිතයා සේ කීවෙමි.

'ඒක තමා මාත් කියන්නේ... බැල්කනියේ ඉඳලා බලාගෙන ඉන්නයි, ඇණ ඇනිච්චම බෙහෙත් දන්නයි... එයාලගේ වාහන වල එන්නයි... බනිස් කන්නයි නොගිහින් හලෝ කොහොමද කියලා ඉන්න තිබුණා...'

නංගී කල් යල් බලා ගැසුවේ මගේ පසුවටමය. මම කතා නොකළෙමි. ඇගේ මුහුණවත් නොබැලුවෙමි. මගේ ආත්මය ගැනම මම තදබල ලෙස කම්පා උනෙමි. නංගී ඉදිරිපිට ඇගේ වචන වලින් මෙසේ අසරණ වන්නට වීම ගැන මම ඊටත් වඩා කම්පා උනෙමි.

සියල්ලම ඉක්මනින් අමතක කළ යුතුය.

'ඒයි... කරන උනාද...'

නංගී කිම ඉඳගෙන රෙදි සෝදන මගේ මුහුණටම එබී ඇසුවාය. මම ඊද නොබැලුවෙමි.

'ඔච්චරම සනකම හිතන්න එපා... මෙතන ප්‍රශ්නයක් ඇත්තටම නෑ... ඔයා ප්‍රශ්න මවාගෙන ඉන්නේ...'

මම ඇය කියන කිසිවක් ගණනකට නොගත්තෙමි. මේවා මට අදාල දේවල් නොවේ...

'මං ශහීනා එක්ක හිටපු කොල්ලා ගැනත් ඇහුවා... මට මුකුත් කිව්වේ නෑ... කියන්න ගොඩාක් දේවල් තියෙනවලු... ගෙදරට ආවට පස්සේ හිමිහිට කියන්නම්ලු... මං හාර අවුස්සන්න ගියේ නෑ...'





'ඔයා ඔයාගේ වැඩක් බලාගන්න... කාගෙවත් ගෙවල් වලට එන කොල්ලෝ ගැන ඔයාට මොකටද...'

'මට ඕනේ...'

නංගී සමඟ මම තර්ක කරන්නට නොගියෙමි... ශහීනා ඔහු ගැන කතා නොකරන්නේ ඇයි.... තිකුවා හරිය. කෙල්ලන් පුදුමාකාර ලෙස කපටිය...

'මං කිරිබත් ටික බෙදලා ගේන්නද...'

නංගී සන්සුන්ව දයාබර ලෙස ඇසුවාය...

'මං මේක ඉවර කරලම කන්නම්. ඔයා කන්න...'

'මේක ඉවරවෙද්දි දවල්ට කන්න තමයි වෙන්නේ.... මාත් ගේ අස් කරන්න ගන්නවා...'

'ඒක හොඳයි... තැන තැන ගිහිල්ලා ඕපදූප හොයනවට වඩා ඒක ගොඩාක් හොඳයි...'

'ඕපදූප හෙව්වේ තව කාටහරි ඒවා වැදගත් වෙයි කියලා හිතන්... වැඩක් නැත්නම් මට මොකටද...'

මම සබන් ගා තිරරෙදි අතින් හොඳින් සේදුවෙමි. සබන් සැරට අතම සුදුවී ගොස්ය. එසේ වනවා දකින්නට මම ආශා කළෙමි. නංගී රෙදි සෝදන තැනින් ඉවත් වී ගියාය...

'ඔයා රෙදි සෝදන්න.. මං අන අන කවන්නම්...'

මිරිස් මාළුත් කිරිබතුත් අනා කටක් නංගී මට කැව්වාය. ඇය කවද්දී මා කනවාට වඩා රසය...

'ෂ්... ෂ්... දෙන්නම බරටම වැඩ වගේ...'

ශහීනා කුස්සියේ දොරින් එබුනාය. මම ඇයව දක දකත් අහක බලා ගත්තෙමි... ඒ දස් දෙස බලා නැවතත් මේ හිත කලබල කර ගත යුතු නැත. ඇය ගහ යටට එද්දී මම උන්

www.sinhalaelibrary.com

ලෙසම සබන් ගොඩේ වාඩිවී උන්නෙමි..

'මටත් හිටිය නම් සංදේශ් අයියා වගේ අයියා කෙනෙක්... මගෙත් රෙදි ලෝඩ් එකක් තියෙනවා සෝදගන්න..'

ඇය සිනාසී කීවාය. මම සබන් පෙණ වලට රවාගෙන උන්නෙමි.

'මොනවද කන්නේ..'

ඇය නංගී වෙතට හැරී ඇසුවාය.

'කිරිබත්... දෙන්නද...'

'හා...'

ශහීනා කීවාය. එවර මට දස් ඉහළට නොගෙන ඉන්නට බැරිවිය... අද ඇය වාමිය... යංතමට සිනාසී මම සබන් ගා රෙදි ටික මතට වතුර බටය දැම්මෙමි... නංගී ඇයවත් රැගෙන ගෙට යනවානම් හොඳය...

'කොහෙද ඔයා යන්නේ...'

නංගී කුස්සියට යන්නට හදද්දී ශහීනා ඇසුවාය.

'ඔයාට කිරිබත් බෙදන් එන්න...'

'අනේ බැ... අනං කන්න කම්මැලියි.. ඕ...කෙ...න්... ක...ට...ක්...'

ඇය මහ පුදුමාකාර කෙල්ලෙකි. ඇයව තේරුම් ගැනීම ඇත්තටම අසීරුය...

'කමක් නැද්ද...'

'කමක් නැ...'

'හා...'

නංගී ඇයට කටක් අනා කවද්දී මම හොරැහින් බැලුවෙමි.





'ම්... හරි රසයි... ඔයා අනලා කවද්දී රහයි... පොඩි බබාටත් කව කව තේද හිටියේ... මං දන්නව... කමක් නැ කවන්න...'

සබන් කැල්ලෙන් ඇයට ගැසිය යුතුය. නොවේනම් මෙතනින් පන්නා දැමිය යුතුය. ඒ දෙකම කරන්නට මට නොහැක.

'හවසට පාටියට කීයටද එන්නේ... මට නම් හරියට වැඩ... පිස්සුවගේ...'

පිස්සු වගේ නොවෙයි... ඇත්තටම පිස්සු... එසේ කියන්නට ඇත්නම් යැයි මට සිතුණි.

'හතට විතර... හැබැයි අපේ අයියා නම් එන්නේ නැ...'

එකවරම කකා උන් කිරිබත් කට ශහීනාට ඉස්පොල්ලේ ගියේය... ඇය පපුව අල්ලාගෙන කැස්සාය... ලුණු මිරිස් සහ මාළු දවිල්ල ඇගේ නාසයට යන්නට ඇත.

'අ..නේ... ඉන්න මං වතුර ගේන්න...'

ශහීනා මා පාමුළම ඉඳ ඇති තරම් කැස්සාය... කොතරම් කැස්සාද කිවහොත් ඇගේ දෙනෙත් දෙකෙළවර කඳුළුද මතුවිය... ඒ පෙඟී ගිය නෙත් දෙකම ඇය එසෙව්වාය. මම සබන් කැල්ලත් අල්ලාගෙන අසරණව බලා උන්නෙමි.

'ඇ...යි එන්නේ නැත්තේ...'

ඉස්පොල්ලේ ගිය කඳුළු අතරින්ම ඇය ඇසුවාය... මම දෙන්නට පිළිතුරක් සොයමින් සබන් පෙණ දෙස බලා උන්නෙමි... එන්නම කියා ඇයට බොරු පොරොන්දුවක් දී ගැලවිය හැක. එහෙත් මගේ අරමුණ ඇගෙන් පළිගන්නටය... එහෙත් ඒ කුමකටද.. කුමන තරහක් පිරිමහා ගන්නදැයි මම නොදනිමි.



www.sinhalaelibrary.com

'නංගියි අම්මයි තාත්තයි එනවා...'

මම අමාරුවෙන් දෙනෙත් ඔසවා කීවෙමි. ඒ මුහුණ අද ලා කහපාටය... ඇය මොනවා හෝ මුහුණේ ටික වේලාවකට කලින් ගාගෙන ඉන්නට ඇත...

'ඇයි අයියා එන්නැත්තේ...'

සාදයට නොයන්නේ ඇයිදැයි මමවත් නොදන්නෙමි... මට මගේ සිත නිස්කලංක කරගන්නට අවශ්‍යය... ඒ හිත කලබල වූයේ ඇය නිසාය... මේ මගේ ඇස් ඉදිරිපිට නටමින් සිටින ඇගේ ඇස් දෙක නිසාය.

'මට වැඩ වගයක් තියෙනවා... කොහොමත් අපේ ගෙදර මම පාටි වලට යන්නේ නෑ... මට කම්මැලියි...'

'එ..න්..නෙ...ම නැද්ද...'

ඒ හඬ ඊනවාටත් වඩා ආයාචනාත්මකය...

'අයියා ඔය බොරු කරන්නේ.. හවස පාටියට අයියා එයි...'

නංගී වතුර වීදුරුවක් ගෙනවිත් එය ශහීනාට දෙන අතරවාරයේ කීවාය... මා එනවා යැයි කියා නංගී බොරු පොරොන්දු දුන්නේ ඇයි...

'එන් නැතුව ඉන්නෙපා... කෝම හරි එන්න... ආවේ නැත්නම් මං හිතාගන්නවා සංදේශ් අයියා මා එක්ක තරහයි කියලා...'

ශහීනා ගියේ ඒ වචන ටික මට කියාය... පසුව අළුතෙන් දවෙන්නට ගත්තේ ඒත් සමඟය... මේ කෙල්ල ඇවිත් ඇවිත් මගේ ලෙඩ පසුවටම දුක් දෙන්නේ ඇයි... මා අසරණයෙකු බව ඇය දන්නේම නැද්ද...





'පව්... ඔයා එහෙම කරන්නෙපා... අද කාලේ කෙල්ලෝ ළඟ ඔය තරම් මනුස්සකම් නෑ... ඔච්චර නිහතමානිත් නෑ... ඔයා කෙල්ලෝ ගැන දන්නේ නෑ... ඒකයි මේ අහිංසක කෙල්ලගේ හිත රිද්දන්නේ...'

නංගී ශහීනා බාගයක් බී ඇය අත තබා ගිය වතුර වීදුරුව මට දිගු කළාය...

'බොන්න කිරිබත් කාලා වතුර බිව්වේ නෑනේ...'

මම අහිතක් නැතුව වතුර වීදුරුව ගෙන බීගෙන බීගෙන ගියෙමි. නංගී බලා උන්නේ ආශාවෙනි.

'මං හිතුවා ඒ කෙල්ල බිව්වා කියලා බොන එකක් නෑ කියලා...'

'මං එච්චර පහත් මිනිහෙක්ද...'

'අ..නේ නෑ... ඔයා එහෙම පෙන්නන්න යනවා... හරි තපුරු කුපිරු යක්ෂ පැටියෙක් වෙන්න යනවා... ඒත් බෑ... ඔයාගේ හිත පොඩි සාදු කෙනෙක්ගේ වගේ... ඒක මූණෙන් පේනවා...'

නංගී එසේ කියා ගෙතුළට ගියාය... මම තිරුවානා පඩිය උඩ ඉඳගත්තෙමි... සාදයට මම යනවාද නැද්ද කියා මම තවත් වරක් සිතුවෙමි. නොගියොත් මම ඇයත් සමඟ තරහ යැයි ඇය සිතා ගනු ඇත. එක අතකට එහෙම සිතා ගැනීම හොඳය... වෙඩරු වලින් පසුව සැදුණු අය ගින්දර ළඟට නොයා යුතුය...



www.sinhalaelibrary.com

si-unlimited.com

# 14

සවස හය පමණ වෙද්දී කුරුළු කැලේ පුරා පාර වාහන වලින් පිරී යන්නට විය... මේ තරම් වාහන ගොඩාක් කුරුළු කැලේට ආ ප්‍රථම අවස්ථාව මෙය විය...

සාදයට පෙනහ එන්නට පටන් ගත්තේ හවස හයේ සිටය... ඒ වේලාවේ සිට මම කාමරයේ සිරගත උනෙමි... සැන්ද කළුවර පාත් විය.. ශහීනලාගේ නිවසේ බැල්කනිය වටා ඉදිවූ කෙටි බැම්ම දිගට කුඩා සුදු විදුලි බුබුළු වැලක් දල්වෙන්නටත් නිවෙන්නටත් විය...

මම මහා ආත්මානුකම්පාවකින් පැලෙමින් උන්නෙමි... මුළු ලෝකයම එක්ව මා තනි කළාක් බඳු හැඟීමකින් මම අසරණ උනෙමි... මේ තරමට මගේ හිත රිදවාගන්නට මට කාරණාවක් නැත.





එහා පැත්තේ බැල්කනියෙන් ගලා ආ සිනා හඬ මාව ඇදේ ඉන්දවීය.. කනට පුළුන් කැබලි දෙකක් ගසාගන්නට තරම් කේන්තියක් මට ඇතිවිය. මම තල්වරේම පැමිණ ජනේලයේ තිරය මෑත් කළෙමි...

තරුණයන් තුන් හතර දෙනෙකුත් ශහීනාගේ වයසේ යුවතියන් හතර පස් දෙනෙකුත් බැල්කනියේ විය... ඔවුන් කතා කරමින් සිනාසෙන්නේ ඇහේ ගැටෙන තරම් ලං ලං විය. මගේ ඇස් සෙව්වේ ශහීනාවය...

ඇය අද කවරදාටත් වඩා හැඩය... ශහීනා ඇඳගෙන උන්නේ රෝස පැහැ ගත් ගගරා චෝලි වර්ගයේ ඉන්දියානු ගවුමකි. එහි දමූ රිදී මල්කම් දල්වෙමින් නිවෙමින් තිබූ සීරියල් විදුලි පහන් එළියට දිස්නේ දෙන්නට විය...

ඇය හීන් දෙතොල් මෑත් කරමින් ලෝබ කමක් නැතුව සිනාසෙන්නීය... මේ සිනාසෙන්නේ මට නොවේද... ඒ හිනාව මට අයිති එකක්ද නොවේ... සමහර විට නියම උරුමක්කරුවා මේ ඉන්නා තරුණයන් දෙතුන් දෙනා අතරේ එක් කෙනෙකු විය යුතුය...

'ශහීනා... අසාද් අහනවා බියර් ටිකක් බිව්වට කමක් නැද්ද කියලා...'

ඔවුන් අතර උන් එක් තරුණයෙක් ඇසුවේ එද ශහීනා සමඟ උන් තරුණයාගේ කරට අතක් දමාය... අසාද්... ඒ නම මම මතක තබා ගත්තෙමි.... ශහීනාගේ පෙම්වතා ඔහු විය යුතුය...

'බොන්න... මං ගෙනත් මෙතන තියන්නද...'

ඇය මෘදුව ඇසුවාය... ඔවුන් ජීවත්වන්නේ කොතරම් සතුටින්ද... සැනසීමකින්ද... ඒ සැනසීම අපට නැත්තේ ඇයි...

'අසාද් ඉස් වූ මව් ශහීනා... බී කෙයාර් ෆුල්... ඔයා



www.sinhalaelibrary.com

දන්මම හදගන්න...'

මා සිතුවා හරිය... ඔවුන් කියන්නේ ඔහුව දත්ම පටන්ම ඇයට හදගන්නට කියාය...

'මං කාටවත් හදන්නේ නෑ... අසාද්ව හදන්න නංගිස් ඇන්ටි ඉන්නේ... මං මොකටද...'

ශහිනා ගත් කටටම කීවාය... ඒද සිනාසෙමිනි... මම ජනේල තිරය පහතට දමූවෙමි... සාදය අවසන් වනතුරු මේ කාමරයේ සිටීම වදයකි... ගෙදර සිටීමද වදයකි... මම ඇඟ සෝදගෙන කලිසමකුත් ඇඟ උඩින් ඔහේ ටී ෂර්ට් කෑල්ලකුත් දමා ගත්තෙමි. ඇඳගත්තද මට යන්නට තැනක් නැත. මගේ ලෝකය මොනතරම් කුඩා එකක්ද...

'අයියා කොහේ යන්නද...'

නංගී සල්වාර් කමිසයේ ෂෝල් එක හදමින් සාලයට ආවාය... ඇය ඇත්තටම අද ලස්සනය... මම ආශාවෙන් නංගී දෙස බලා උන්නෙමි...

'ඇ..යි අයියේ...'

නංගී පුදුම වී ඇසුවාය...

'ඔයා අද හරි ලස්සනයි...'

මම නංගී අසලටම ගොස් ඇගේ ඇඳවී තිබූ පොට්ටුව සකස් කළෙමි.

'ඇයි... මේ කොහේ යන්නද... හරියට හිතන්නෙක් වගේ... ඉන්න මං වෙන ඇඳුමක් මැදලා දෙන්න...'

නංගී කියන්නේ ඇත්තකි... මා අද පිස්සෙකු වාගේය...

'මේ හොඳයි... මාව කව්රු බලන්නද...'

මගේ වචන වල හොන්ඩර ගණනක දුකද







ආත්මානුකම්පාවද තිබෙන්නට ඇත.

'බලන්න දත් අර කෙල්ල තරහාවෙනවනේ... බලන් ඇති අයියා එනකල්...'

මම සමච්චලයට සිනාසුනෙමි...

'ඇයි ඔයා ඔහොම හිනාවෙන්නේ...'

'ඔයා හිතන්නේ එයා දෙරකඩට වෙලා අනේ බලන්න මේ සංදේශ් නෑනේ.. කිය කියා බලාගෙනම ඉන්නවා කියලද... ඔයාට වැරදිලා බබා... අර ඉන්නේ කොල්ලෝ රෑනක් එක්ක උඩ දගෙන...'

'ඉතින් ඇයි ඔයාට තරහ යන්නේ... අපේ ගෙදර පාටියක් තිබ්බ නම් ඔයත් එහෙම ඉඳී... මාත් ඉඳී...'

'හරි මං යනවා...'

අම්මාත් තාත්තාත් ඇඳගෙන කාමරයෙන් එළියට ආවේ ඒ මොහොතේය..

'කෝ දෙන්න තාත්තේ මං ටයි එක දන්නම්...'

මම තාත්තාගේ ටයි පටිය ගෙන එය ලස්සනට බෙල්ලට දමූවෙමි.

'ඇඳුමක් දගෙන යන් ලොකු පුතේ...'

අම්මා අනුකම්පාවෙන් කීවාය... මම අසරණව බිම බලා ගත්තෙමි...

'අම්මලා යන්න...'

'මෙච්චර ලොකු පුතෙක් හදලා වැඩක් නෑ නේද අම්මේ...'

නංගී ලද අවසරයෙන් කීවාය... මම ඇයට රැව්වෙමි...

'දන් ඔයා කොහෙද ඔය යන්නේ...'





www.sinhalaelibrary.com

‘මම පන්සලට යනවා අම්මේ...’

අම්මාවත් තාත්තාවත් නංගිවත් කිසිවක් ඇසුවේ නැත...

‘රෑ වෙන්නැතුව ඇවිත් කෑම කන්න. මං උයලා මේසෙට බෙදලා තියෙන්නේ...’

‘අම්මලා යන්න අම්මේ... මං ඇවිත් කන්නම්...’

අම්මා මිදුලට බැස්සේ මගේ හිසද අතගාගෙනමය.. මේ තුන් දෙනාටම වඩා ඇය මා ගැන දුක් වෙන බව මම දනිමි. තාත්තාවත් අම්මාවත් යන්නට දුන් නංගී ශහීනලාගේ ගෙදරට ගෙන යන්නට ගත් තෑග්ගද අතින් ගෙන මා කරා ආවාය...

‘ඇයි පන්සල් යන්නේ... සසර කලකිරිලද...’

නංගී ඇසුවේ විහිළුවට නමුදු එවැනි උපහාසාත්මක ස්වරයක් ඇගේ වදන් වල නොවීය.

‘කලකිරෙන්න තරම් දෙයක් මට වෙලා නැනේ බබා... දන් යන්න...’

සාලයේ තනිවී මම නංගී මිදුලට බැස යන අයුරු බලා උන්නෙමි... සියල්ලන්ම ගිය පසු මට මහා පාළුවක් දැනුණි. ප්‍රථම වරට සාදයට ගියා නම් හොඳ යැයි මට සිතුණි...

තවත් මොහොතක් සාලයේ එහාට මෙහාට වී ඉදිරිපස දොර වසා යතුර මල් පෝච්චිය යට තබා මම මිදුලට බැස්සෙමි. ශහීනලාගේ නිවස අද මඟුල් ගෙදරක් වැනිය. එහි වූ උත්සව සිරිය මගේ පසුව අඑකින් දැවාලීය. මේ සතුටු සිනා මැද ඇය ඉන්නේ කොතරම් සතුටින්ද...

මම ගුරු පාර පුරා නවතා තබා තිබූ වාහන අතරින් බිම බලාගෙන ඉදිරියට ආවෙමි... ඉදිරිපසින් දෙතුන් දෙනෙකුගේ සිනා හඬවල් ඇසී මම යාන්තමට නෙත් එසවීමි...

මගේ ඉදිරිපස එමින් උන්නේ ශහීනාත් තවත් තරුණ





තරුණියන් පිරිසකුත්ය. ඔවුන් මොහොතකට කලින් උන්නේ බැල්කනියේය. දන් පාරේය...

මම ශහීනා දෙස නොබලාම ඔවුන් පසුකර ගියෙමි... සමහර විට මේ පිරිස් මැද ඇය මාව ගණනකටවත් නොගන්නවා විය යුතුය.

‘සං...දේ...ශ්...’

ඒ හඬින් මම එක තැන නතර උනෙමි. නතර වෙන්නට කියා මම මගේ දෙපා වලට නොකීවෙමි. එහෙත් ඒවා ස්වයංක්‍රීයව නතර විය. ශහීනා මඳ කළුවරේම අඩි තුනහතරක් පියමැන මා කරා ආවාය... දන් ඇය නියම සුරංගනාවියකි. මම නොම්මර එකේ හිහන පැටියෙක්මි...

‘කො...හෙ...ද ය...න්...නේ...’

මම ගඳපාන මල් ගස් උඩ රස්තියාදුවේ යන කණාමැදිරියන් දෙස බලා උන්නෙමි...

‘මං... මං පන්සල් යනවා...’

මොහොතක් ඇය කතා නොකළාය... ඇය වෙතින් එන්නේ අලුත් විලවුන් සුවඳකි... මේ ලස්සන මෙහෙම බලා ඉඳීම දුකකි.

‘මං අහලා තියෙනවා පන්සල් යන්නේ හිතේ කරදර තිබුණාමලු...’

ඇයත් නොදන්නා දෙයක් නැත. ඇත්තටම මගේ හිත තිබුනේ කරදර ගොඩකය...

‘යාළුවෝ බලන් ඉන්නවා...’

මම වැර වෑයම් යොදා කීවෙමි. ශහීනා අනුකම්පා සහගතව සිනා සුනාය...

‘මට යාළුවෙක් නෑ... මං එහෙම කෙනෙක් හොයනවා...’



www.sinhalaelibrary.com

ඇය මට මේ කියන්නේ බොරුය... මම සියල්ල දක්කෙමි...

'ඊට කන්නේ මොනාද...'

මගේ ගත ගිනි ඇවිලිනි. ඇය ඇසුවේ පුදුමාකාර ප්‍රශ්නයකි... මම මොහොතකට කලබල උනෙමි.

'අම්මා උයලා තියෙන්නේ...'

'මං දන්නවා සංදේශ් අයියා මා එක්ක තරහයි... ඇයි දන් නෑ... ඒත් මම තරහ නෑ... පන්සල් ගිහිල්ලා මේ පාරවල් වල රෑ වෙන්න එපා... මං නංගී අතේ බුරියානි එවන්නද...'

වටෙම ගින්දර දමා මට මැද ඉන්න කිව්වාක් මෙන් මම දවී ගියෙමි.

'එපා... මට බඩගිනි නෑ...'

'හා... ඔයා යන්න එහෙනම්...'

ශබීනා කොල් පට විකාගෙන එසේ කියා අපට අඩි තිහක් පමණ ඈතින් නතර වී උන් පිරිස අතරට එක් වූවාය... මම ඉබාගාතේ යන රෑ කුරුල්ලෙකු මෙන් මහ පාරේ ඇවිදගෙන උපවත්තනාරාමය දෙසට පිය නැඟුවෙමි.

හිතට මේ වෙලා ඇත්තේ මොනවාද... සියල්ල අමතක කර සිතට ශාන්තියක් පතා බෝ මළුවේ පැයක් දෙකක් සිටිය යුතුය... උපවත්තනාරාමය පවා පාළුවට ගොස් තිබුණි. බෝ මළුවේ උන්නේද වයසක අම්මා කෙනෙකු පමණි. ඇය බෝ මළුව නාවන්නට ළිඳෙන් වතුර ඇද්දේ හති දමමිනි.

'ආච්චි ඉන්න... මං වතුර පුරවලා ගෙනත් දෙන්නම්...'

මම ඇය අසළට ගොස් කීවෙමි.

'පින් සිද්ධ වෙනවා මගේ පුතේ... වතුර අදින්න බෑ... පපුව හිරවෙනවා...'





මම ආච්චි අම්මාට ළිඳෙන් වතුර ඇද කල හතක්ම පුරවා දුන්නෙමි... ඊට පසු ඇයට දල්වන්නට පොල් තෙල් පහන් වැටේ පහන් එකතු කර එයට තෙල් පිර දමා ද දුන්නෙමි...

'මට දෙකක් ඇති පුතේ... පුතා ඉතුරු වා පත්තු කරන්න...'

ආච්චි අම්මා දල්වූයේ පහන් දෙකක් පමණි. මම ඉතිරි පහන් හය හත දල්වා මළුවේ කුඩා දේවතා බැම්මට වී ඒ දෙස බලා උන්නෙමි...

බෝ ගසේ අලුත් බෝ කොළ ලියලමින් තිබුණි. මඳ සුළඟට ඒ ලා දළු බෝ පත් සෙලවුනේ සිතට මුණු මුණු ගාමිනි. මම තුනී සිසිලසක් ගලන බෝ මළුවට වී පැයක් පමණ වේලා උන්නෙමි. දවසක් ඇර දවසක්වත් මේ පන්සලට එන්නට ඇත්නම් යැයි මට නිකමට සිතුණි.

මම උපවත්තනාරාමයෙන් පිට වෙද්දී රෑ දහය පමණ විය... එතැන සිට කුරුළු කැලේට එන්නට බසයක් ඇති නමුදු මේ තරම් රෑ වූ පසු ඒ බස්රිය වැඩ කරන්නේ නැත. මම පාළු මාවත දිගේ පයින්ම ගෙදර ආවෙමි.

'පන්සල් ගියාද ලොකු පුතේ...'

අම්මා මා එනතුරු බලා උන්නේ සාදයට ඇඳගෙන ගිය සාරිය පිටිනි.

'ඔව්... අම්මේ... මේ වෙලාවට පන්සල හරි නිස්කලංකයි... මං හෙටත් යනවා...'

'දවසක මාත් එන්නම් ඔයා එක්ක යන්න...'

නංගී පෙනෙන්නට නොවීම ගැන මට සතුටක් දනුණි. මේ ගෙදර පිළිතුරු බැඳිය යුත්තේ ඇයට පමණි. එය වෙලාවකට මහා වදයකි.



www.sinhalaelibrary.com

මම කාමරයට ආ හැටියේම ඇඳුම් මාරු කර සරම දමාගෙන ඇඳට වැටුනෙමි...

"අ...යි...යේ.. කෑම කන්නැද්ද... අරහෙත් බුරියානිප් දුන්නා..."

නංගී කාමරයට පැමිණ කීවාය.

"මට එපා නංගී... මං එද්දී ටවුමෙන් බිත්තර ආප්ප කාලා තේ බිව්වා..."

නංගී හිල්ලුවාය. මා කීවේ බොරුවකි. අද රෑට කිසිවක් මගේ බඩට වැටී නැත. මට බඩගින්නක්ද නැත.

www.sinhalaelibrary

Sl-unlimited.com

sl-unlimited.com

www.sinhalaelibrar

# 15

ශහීනලා අලුත් ගෙදර පදිංචි වූයේත් මගේ සිතේ සැනසීම මට අහිමි වූයේත් එකම විටය. එකම දවසකය... මට තිබුනේ ඇයත් සමඟ අනිවාර්යෙන් තරහ නොවී ඉන්නටය. පැත්තකට වී නිස්කලංකයේ කල්පනා කළහොත් ශහීනා සමඟ තරහ වන්නට කිසිදු කාරණාවක් නැත. ඇය ඇත්තෙන්ම මට වරදක් කර නැත. අසල්වාසී මිතුරියක ලෙස ඇය මට ඕනවාටත් වඩා ළෙන්ගතු වූවාය.

හිත කඩා වැටුනේත් ඒ වැඩි ළෙන්ගතුකම නිසාය. නංගී කියන්නේ ඇත්තය. මාව ගණනකටවත් නොගත් ආඩම්බර යුවතියක් උන්නානම් මම ඇයට මේ පාට් දමන්නට නොයමි.

යළි ඇය සමඟ යාළුවෙන්නට මම ආශා කළෙමි. අඩුම තරමේ හමුවූ විටක හිතේ බරක් නොමැතිව සිනාසී කතා බහ කරන්නට මට අවශ්‍ය විය... එහෙත් මගේ බොළඳ හදවත ඇයව ඉල්ලන්නේ මිතුරියක ලෙස... දන්නා හඳුනන කෙනෙකු ලෙස ඇසුරු කරන්නට නොවේ...

හිත කියන්නේ හදවතේ පතුලටම ඇයව ගත නොහැකි තරම් ඇය සමඟ තරහා වන ලෙසය. ඇගේ මුහුණවත් නොබලන ලෙසය... මා අද කරන්නේ ඒ විකය. මේ මා දුක් විඳින්නේ බලෙන් ඇය සමඟ තරහවීය... එක අතකට යළි මිතුරු වී පසුව පුච්චාගෙන දුක් විඳිනවාට වඩා මේ දුරස් වීම හොඳ යැයි මට සිතුණි... ලෝබකමක් දනවන දෙයක් ගැන නොසිතා ඉන්නට තරම් මම සාදු කෙනෙක් නොවූනෙමි... හිත දවසකට විසි තිස් පාරක් ඒ පැත්තට දුවයයි... හිත යන යන පාරට මගේ ගතද බැල්කනිය වෙත දුවයයි....

සියල්ලටම මුල මගේ පාළුවය... තනිකමය... මේ සිත හිස්ව තිබෙද්දී එයට පුළුලේ යන දේවල් පවා වැටෙයි. මම ඊයේ රැය පුරාම කළ හැකි දෙයක් ගැන සිතමින් කල් යැව්වෙමි... ගෙදර ආර්ථිකය යන්නේ තනි පිල්ලෙනි. එය පිලි දෙකකට පත්තා ගන්නට නම් මාද කුමක් හෝ කළ යුතුය...

දවල් දහයට පමණ මම පාරට බැස්සේ අරමුණකින් තොරවය... ජීවිතයට අරමුණක් බලාපොරොත්තුවක් මහ පාරේ වැටී නැති බව මම දනිමි... එවැනි බලාපොරොත්තුවක් කාගෙන්වත් ඉල්ලා ගත නොහැකි බවද මම දනිමි.

කීයක් හෝ තිබුනානම් පුංචි බිස්නස් එකකට අත ගහන්නට තිබුණි. මගේ උඩ කාමරයට වී කළ හැක්කේ එවැනි කුඩා වැඩය. රැකියාවක් ගැන මම දවස් ගාණක සිට හිත හිතා ඉන්නෙමි.

උසස් පෙළ නිමා වූ පසු පාසලින් අපව එළියට දැම්මේ





නාත්නත්කාර කර බව මට ප්‍රථම වරට අවබෝධවිය... වසර දහතුනක් පුරා ඉගෙන ගත්තේ මොනවාදැයි මම සිතුවෙමි. සූත්‍ර සමීකරණ ප්‍රස්ථාර පසෙක ඇත. එහෙත් ජීවිතය අද අනාථය. හෝර මාළු දෙසීය පනහක් ගෙදර යන විට ගෙනියන්නට අතේ කීයක් වත් නැත. එය විශාල දුකකි. අඩුම ගණනේ උණු පාන් රාත්තලක් ඇස්ට්‍රා කාලක් ඇඹුල් කෙසෙල් ගෙඩි ඇවරියක්වත් රැගෙන යන්නට කීයක් වත් නැත.

හිත කොඳෙල් වෙන්නේ ජීවිතය මේ තරම් අසරණව තිබියදීය.

මම දස අතේ කල්පනා කරමින් නගරය පුරාම ඇවිද්දෙමි. උත්සව සමය ළඟ නිසාදේ අලුත් ඇඳුම් කඩවලින් මාවත පිරී තිබුණි. මද සුළඟට වැනෙන ලා නිලට හුරු කුඩා මල් වැටුණු ගවුමක් දැක මගේ දෙපා නැවතුනි. මේ ගවුමවත් මිලට ගෙන එය හවස නංගිගේ අත තබන්නට හැකි නම් ඇය කොතරම් සතුටු වෙනු ඇත්ද. එහෙත් මා එතරම් වාසනාවන්ත අයියා කෙනෙකු නොවේ.

'සංදේශ්...'

සාප්පුවක් අතරින් මගේ නම කියවෙනු ඇසී මම පුදුමවී නතර වූනෙමි. සාප්පුවේ සිට මා වෙතට ආවේ නිරංගය... උසස් පෙළ අවසන් දිනවල දක්කාටත් වඩා නිරංග මහත් වී තිබුණි... මා කරා එද්දීම ඔහුගේ අතේ තිබූ සෙලියුලර් දුරකතනයට ඇමතුමක් ආවේය. නිරංග මගේ කරට අතක් දමාගෙන මාව සාප්පුව තුළට රැගෙන යන අතරවාරයේම එයට ඇමතුවේය.

නිරංග එම්පෝරියම් කුඩා නමුත් ලස්සනය... විවිධ වර්ගයේ විවිධ විලාසිතාවේ ඇඳුම් රාක්ක හැටක් හැත්තෑවක් එහි විය. සාප්පුව ඇතුළත වායු සමීකරණය කර තිබුනෙත්



www.sinhalaelibrary.com

ඇතුළත තිබුනේ මැද්ද සීතලකි.

'ඉතින් කොල්ලෝ...'

නිරංග වෙනදා වාගේමය. ළෙන්ගතුකම උතුරා යන ලෙස මගේ මුහුණ දෙස බලා උන් ඔහු පුටුවක් ඇද මට වාඩිවෙන්නට දුන්නේය.

'වරදක් නෑ නිරංග... මේ උඹේ සාප්පුවද...'

මම ආශාවෙන් අවට නෙත් හොවා ඇසුවෙමි.

'තාත්තත් උදව් කළා... පොඩි මාමා ගාමන්ට් කාරයා නේ... ඒ නිසා බය නැතුව වැඩේට බැස්සා...'

'කොච්චර දෙයක්ද... උඹ මෙහෙම ඉන්නවා දක්කහම හරි සතුටුයි...'

නිරංග මේසය මත තිබූ මගේ සුරතට තට්ටුවක් දැම්මේය...

'උඹ වගේ නෑ සංදේශ් හැමෝම. ගොඩාක් අය හරි ඊර්සියයි. පපුවේ ජරාව...'

'උඹ අපි එක්ක ඉගෙන ගත්ත එකෙක්... ඉතින් සතුටු නැද්ද... පුළුවන් නම් තව ෂොප් එකක් දාපන්...'

'සිංහල අවුරුදු සීසන් එකට තව වැඩකට බහින්න ඉන්නේ... ඒක නෙමේ උඹ මොනවද බොන්නේ.... දවල්ට කාලද උඹ...'

නිරංග ළෙන්ගතුව ඇසුවේය...

'මං ගෙදර ගිහිල්ලා කනවා නිරංග.. ඒක ප්‍රශ්නයක් නෑ...'

'කොහෙහරි ගිහිල්ලා බියර් එකක් බීලා කමුද...'

'එපා... අපි වෙන දවසක යං... මං එන්නම්...'





'මධු... බබා මෙහේ එන්න...'

නිරංග කතා කළේ ඔහුගේ විලාසිතාගාරයේ උන් සුන්දර යුවතියකටය... ඇය මා සමඟද සුහදව සිනාසුනාය...

'අපිට බොන්න මොනාහරි... ඕ කෝක් දෙකක්... ඉතින් ඉතින්... මොනවද සංදේශ් දැන් උඹ කරන්නේ..'

'තාම විශේෂ දෙයක් නෑ නිරංග... මොනවා හරි කරන්න ඕන...'

'උඹ කැම්පස් යන්නද හිතන් ඉන්නේ...'

'බෑ නිරංග... ගොඩක් දුර ඉගෙන ගන්න බෑ... ගෙදර ප්‍රශ්න වැහි වැහැලා... ඉක්මනට රස්සාවකට බහින්න වෙනවා.. නැත්නම් මොකක් හරි පොඩි බිස්නස් එකකට...'

'උඹ මොනවා හරි කරනව නම් කියපන් මං උදව් කරන්නම්... කොහොමත් මම උඹට ආදරෙයි... අපේ අතින් උන් වගේ නෙමේ උඹ....'

සාප්පුවෙන් යන්නට ප්‍රථම නිරංග මාව නැවැත්විය.

'මේක උඹට... මේක නංගීට...'

ඔහු මා අත තැබුවේ ලා දම් පැහැගත් ටී ෂර්ට් එකකුත් ඩෙනිම් ගවුමකුත්ය...

'එහෙම එපා මචං.... උඹේ බිස්නස් එකනේ..'

මම අසරණව කීවෙමි.

'මේ බිස්නස් මොනාද මචං... ඉස්සර අපි ටක් එකේ මේසේ දෙපැත්තට වෙලා එක පරිප්පු එකෙන් පාන් රාත්තල කාපු කොල්ලෝ.... මෙතනින් යනවා නම් නැවිත් යන්නෙපා... මොනවා හරි කරනවා නම් මට කියපන්.. මං උදව් කරනවා...'



www.sinhalaelibrary.com

නිරංගගේ දයාබරත්වය මගේ දෑසට කඳුළු නංවන තරම් විය... ලෝකයේ හැමෝම නිරංග වගේ නැත. බැඳීම් මනුස්සකම් මතක තබාගන්නේ එහෙමත් කෙනෙක් පමණි.

'මං ගිහිල්ලා එන්නම් මචං...'

'මං උඹව ගිහිල්ලා දන්නද... වැස්සක් එන්න වගේ එන්නේ...'

'අනේ එපා මචං... මං යන්නම්...'

නිරංග අලංකාර බෑගයක දමාගෙන දුන් ඇඳුම් දෙක තුනද ඔසවාගෙන යළිත් මම නගරය මැද තනි උනෙමි. ජීවිතය මා පසුකර බොහෝ දුර ගොස් යැයි මට සිතුණි. නිරංග ජීවිතයත් සමඟම ගොස්ය... මා ඉන්නේ ජීවිතයට හත් ගව්වක් පසුපසිනි.

Sl-unlimited.com

sl-unlimited.com

www.sinhalaelibrar

# 16

මේ උදාවී ඇත්තේ හිත කලබල කර ගත යුතු කාලය නොවේ. එකම හිතකින් එකම අරමුණකින් වෙනම දුක් විඳිය යුතු කාලයකි. ප්‍රශ්නය එවැනි අරමුණක් මට නැත්තේ ඇයි...

ජීවිතය යන්නේ ඉබාගාතේය. අපි ඉන්නේ එසේ ඉබාගාතේ යා හැකි ජීවන මට්ටමක නොවේ. පසුගිය දිනවල අර තරම්ත්වත් හිත කලබල වීම ගැන මම දුක් උනෙමි... අද තිරංග ඉන්නා තත්වයෙන් කාලක අරික්කාලක තත්වයකට වත් මා පත්වී නැත. හිතනවානම් මට පත්විය හැකියැයිද මම සිතුවෙමි.

අතේ තිබුනේ රුපියල් අසූවක් පමණි. මම ඉත් රුපියල්

හසලිහක් වැයකොට නීලගිරියෙන් විශාල වී බනිස් එකක් ගත්තෙමි. ඉස්සරම දවස්වල අම්මා මේ විශාල වී බනිස් අපට කිරි තේත් සමඟ කන්නට දුන්නාය. අද ඔවුන්ට එවැන්නක් ගෙනෙන්නට මට වක්කමක් නැත.

පාරට බැස්ස වෙලේ සිට වූයේ මට මා ගැනම දුක සිතීමය...

ගෙදරට එන බසය ප්‍රමාද විය... මම හයිලෙවල් පාරේ ඇවිදගෙන ආවෙමි. තිරංග කීවා හරිය... කුරුළු තැලේට හැරෙන්නට කිලෝ මීටරයක් පමණ තිබියදී මහ වැස්ස කඩා පාත්විය... වැස්ස වැටුනේ හිතක් පපුවක් නැතිවය... ඒ හරියේ මුවා වෙන්නට කඩපිලක්වත් නැත. මම දුවගෙන ගොස් රබර් ගස් හෙවණට වුනෙමි.

වැස්ස තව පැය දෙකකට තුනකටවත් පායන පාටක් නැත. සුළඟ පවා හමා ගියේ ගස් වැල් අඹරවාගෙනය. රබර් ගසක් මගේ හිසට කඩා වැටේදැයි මට බිය සිතුනේ සුළඟට ඒවා ඇඹරුනු සැටි දුටුවිටය.

මුළු පරිසරය පුරාම තිබුනේ අඳුරු මන්දරමකි... පාසල් සිසුවියන් පුරවාගත් පාසල් බස් රියක් මාව පසුකරගෙන ගියේය. එහි උන් සිසුවියන් ගියේ 'අනේ පව් බබා...' කියාගෙන මට විහිළු කරමිනි.

වැස්ස තවත් වැඩි විය. ඇඳුම් ටිකත් බනිස් ගෙඩියත් කමිසය යට තබාගෙන ගෙදරට දුවන්නට සිතුනි. ඒද සැහෙන වේගයෙන් දුව යා යුතුය. කොහොම ගියද මාව තෙමෙන බව මම දනිමි. තව ටික වේලාවක් බලා තෙමී තෙමීවත් යනවා යැයි මම සිතුවෙමි.

රබර් ගස් අස්සෙන් එන වැසි පොද වලට අත අල්ලමින් මම බලා උන්නෙමි. එක වරම කඩාගෙන ගිය සුදු පාට කාර් රථය යළි විවස් කර නතර විය...





විදුරුව පාත් විය... මම වැහිපොද අතරින් පෙනෙන ශහීනා දෙස බැලුවෙමි. මේ ඇය පාසල් ගොස් එන ගමන්ය... අද පාසල් නිවාඩු දෙන දවස නිසා ඇය වේලාසනම එනවා විය යුතුය...

'සංදේශ්... එ...න්...න...'

ශහීනා කතා කළාය.. මට අමුතුවෙන් කාර් වල ගොස් මේ වැස්සෙන් බේරෙන්නට අවශ්‍ය නැත. දැනටමත් මම තෙතබරියම වී අවසානය.

'මං කුඩේ අරගෙන එන්නද...'

මා නොඑන විට ශහීනා ඇසුවාය. හිත කොහොම හදාගන්නද මේ මල්පොකුර හිතේ පැටලෙන්නේ මුළු හිතම අවතැන් කරමිනි.

'එ...න්...න එපා...'

ඇය කුඩයක් ඉහලාගෙන වාහනයෙන් බසිද්දී මම කීවෙමි... පාරත් රබර් මංඩියත් අතර පළල කානුවක් ඇත. ඉත් මම මේ පැත්තට ආවේ ඉත් පැන ගෙනය. ඇයට ඒ තරම් ලෝන්ග් ජම්ප් එකක් කළ නොහැක.

'ඇයි බොරුවට වැස්සෙ තෙමෙන්නේ... යන් මා එක්ක..'

එක තත්පර දෙක තුනකට වැහි පොද අතරින් මම ඒ රුවේ සමීප රුවක් ගත්තෙමි... පුදුමාකාරය... අතිශයින් පුදුමාකාරය... වැස්සේ තෙමෙද්දි මල තවත් ලස්සනය.

'යාළුවෙක් ගියා එයා එනකල් ඉන්න ඕන...'

මම අමු බොරුවක් කීවෙමි... ඇයද එය පිළිගත්තේ නැත. මේ තරමට ඇය මට සමීප විය යුතු නැත. අප දුරස්ව ඉන්නා තරමට හිතට නිදහස්ය.

'තෙමී තෙමී එන්නෙපා... ආ මේ කුඩේවත් ගන්න...'



www.sinhalaelibrary.com

ඇය වැස්සේ තෙමෙමින් මට කුඩය පෑවාය...

'තෙමෙන් නැතුව කුඩේ අල්ලගන්න... මං කොහොමත් තෙමිලා.. ඔයා යන්න...'

මම කුරිරු ලෙස කීවෙමි. මොන පැත්තකින් බැලුවද මගේ වැඩ අසාධාරණය. එහෙත් මම මගේ හිත හද ගත යුතුය. පෙනෙන සමහර දේවල් දකින සමහර දේවල් මේ හිතට වද දෙන හැටි දන්නේ මා පමණි.

'මං යනවා... අපරාදෙනේ තෙමෙන්නේ...'

ශනීනා හැරුණේ දුස කද කරගෙනය... ඇය වාහනයට ගොඩ වූ පසුවත් එහි වීදුරුව ඉහළට නොදමා බලා උන්නාය... මාව පිස්සෙකු මෝඩයෙකු ලෙස ඇය දකිනවාට මම ආශා කළෙමි. ඇත්තටම මගේ නියම ස්වභාවයද එයයි...

වැස්ස තවත් වැඩි කලේ හිටපන් පල් වැඩ කරනව උඹට දෙන්නම් කියා මෙනි... ඔවුන්ගේ වාහනයේ නැග මට ගේ දොරකඩටම යන්න තිබුණි. අඩුම තරමේ ශනීනා දුන් කුඩය වත් ගන්නට තිබුණි... ඒවා දුන්නේ මනුස්සකම්ති. නොවේනම් හිතවත්කම්ති. මා පිටුපෑවේ ඒ හිතවත්කමටය. මනුස්සකමටය.

වැස්ස වැඩි වන වන තරමට බඩගින්නද වැඩි විය. මේ වැස්ස රස විඳින්නට නම් සරමක් දමාගෙන බැල්කනියට යා යුතුය. අම්මාට කියා කෝපි ටිකක් හදගත් කල එය තවත් රස විඳිය හැක. මේ පාළු රබර් ගස් යට ඒ සුවය නැත. දනටමත් මදුරුවෝ මාව උස්සාගෙන යන තරමට වටවී ඇත.

දන් කළයුතු වෙන දෙයක් නැත. මම බනිස් ගෙඩිය තිබූ බෑගයද ඇඳුම් බෑග් එකට දමා තද කර ගත්තෙමි. දන් කොතරම් වැස්සද ඇඳුම් ටිකක් බනිස් ගෙඩියත් නොතෙමේ.





මේ වැස්සේ දිව්වද ඇවිදගෙන ගියද එකම ප්‍රතිඵලය.... ඒ නිසා මම දුවන්නට නොගියෙමි. ලොවි ගෙඩි තරම් වැහි බිංදු අතරින් මම ඇවිදගෙන ගියෙමි. සබන් කැල්ලක් තිබුනානම් මහදි නාගෙන සෝදගෙනම යන්නට තිබුණි. ඒ තරම් වැස්සය.

ගේ ළඟවෙද්දී මගේ ගන්නට දෙයක් නැති විය. ශනීනලාගේ නිවස ඉදිරිපිට නවතා තිබූ කාර් එක දකිද්දී හිත පත්තු විය. මා ඇයගෙන් ගත්තේ දවස පුරාම හිත ගිනි තැබූ ආත්මානුකම්පාවේ පලියද...

රූරා වැටෙන වැහි බිංදු පිසදමමින් ගේට්ටුව අරිද්දි මම නිකමට ඇගේ බැල්කනිය දෙස බැලූවෙමි. දුටු දසුනින් පපුව යලිත් ඇවිලිනි. ඇය පාසලට ඇඳගෙන ගිය වෙස්ට් එක පිටින්ම දොරකඩටවී මා දෙස බලා උන්නාය. ඒ මුහුණේ සිනාවක් නැත. මගේ බොරු දත් ඇයට සියල්ල අසූචි හමාරය.

කිසිවක් කර කියා ගත නොහැකිව මම බිම බලාගෙනම ගෙට ඇතුල් උනෙමි. අම්මා මාව දක කම්මුලට අතක් තබා ගත්තාය...

'ඇයි අර දරුවා කතා කරද්දී ඒ වාහනේ ආවේ නැත්තේ..'

ඇය මේ ටිකට එය අම්මාත් සමඟ කියා ඇත. ශනීනාට ඇත්තේ කුඩා දරිවියකගේ වැඩය.

'කාගෙවත් වාහන වල එනවට වඩා මේ වැස්සේ තෙමෙන එක හොඳයි...'

අම්මා බැලුවේ පුදුමයෙනි. මේ කතා කරන්නේ මමද කියා ඇය හිතුවා විය යුතුය.

'ම්.. හරි හරි ගිහිල්ලා පිහදගෙන එන්න...'

මම ඇඳුම් සහ බනිස් දමූ පාර්සලය මේසයට විසි කර



www.sinhalaelibrary.com

කාමරයට ගොස් පෙත ඇඳුම් සියල්ල ගලවා දැමුවෙමි. මුළු ගතම පිසදගෙන අළුත් සරමක් ද ගත් කල දැනුනේ කිව නොහැකි සැනීපයකි.

ශනිතා යළි කිසිම දිනයක මා සමඟ කතා නොකරනු ඇත. ඇගේ හිතවත් කම් අදින් අවසන්ය. මා වැනි උණහපුළුවෙකු හොඳ මිතුරෙකුට නොගැළපේ.

තිකමට මම ජනෙල් රෙද්ද මෑත් කර බැලුවෙමි. ශනිතා එද්දී දුටු විලසින්ම බැල්කනියේ දොරට හේත්තු වී වැස්ස දෙස බලා උන්නාය... ඕනානම් දොර ඇර ඇයට සොරි කිව හැක. නැත.. එවැන්නක් අවශ්‍ය නැත.

මම පහලට යද්දී අම්මා මා ගෙනා ඇඳුම් බෑග් එක විවර කරමින් උන්නාය.

'කොහෙන්ද ලොකු පුතා මේවා ගත්තේ...'

මම මේසයේ පුටුවට බරවුනෙමි.

'මාත් එක්ක ඒ ලෙවල් කරද්දී තිරංග කියලා යාළුවෙක් හිටියා... මිනිහා දැන් ටවුන් එකේ ටිකක් ලොකු ඇඳුම් සාප්පුවක් දලා. දියුණු වුනා කියලා නෑ තිරංග තාම හරි හොඳයි. මට කිව්වා ඕන දෙයක් කරන්න උදව් කරන්නම් කියලා. එද්දී ඕය දෙකත් දුන්නා. මං එපාත් කිව්වා...'

'ඕය දෙකම නංගිට ගන්න කියන්න අම්මේ...'

'මේ ටී ෂර්ට් එක ඔයාට..'

'ඒකත් නංගිට දෙන්න... එයාට ඒක ලස්සනයි...'

අම්මා දිග සුසුමක් හෙළුවාය...

'මට අද හරි දුක හිතුනා අම්මේ...'

අවංක දුකකින් මම කීවෙමි. නංගී තවම ගෙදර



නොපැමිණි නිසා ගෙතුල තිබුනේ නිස්කලංක බවකි.

'ඇයි ලොකු පුතේ...'

'මට මොනාහරි කරන්න ඕන... තව අවුරුදු හතරක් කැම්පස් බඩගාලා දුක් විඳින්න මට බෑ... මේ ජීවිතේ වෙනස් කර ගන්න ඕන...'

'ඔයාට එහෙම හිතුනේ සාප්පුවේ යාළුවා දැක්කට පස්සෙද. එහෙම නම් වැරදියි පුතේ... ඔයාට ඉහලින් ඉන්න අය වගේම ඔයාට පහළින් ඉන්න අයත් ඉන්නවා... කා ගැනවත් හිතලා තමන් ගැන අඩුවට හිතන්න එපා... ඒත් ඔයා මොනා හරි හිතන එක හොඳයි...'

බනිස් ගෙඩිය අතට ගනිද්දී අම්මාගේ මුවේ ඇඳුනේ අසරණ සිනාවකි.

'ඇයි බනිස්...'

'මට අම්මවයි තාත්තවයි නංගිවයි මතක් උනා... හවසට තේ හදලා කමු...'

අම්මා දෙනෙත් සඟවා ගත්තේ ඒවා වලට කඳුළු පිරුන නිසාය. මම කිසිවක් නොකියා වැස්ස බලන්නට ගේ දොරකඩට ගියෙමි.

www.sinhalaelibrary.com

si-unlimited.com

# 17

ගවස් වෙද්දී මට හෙම්බිරිස්සාව හැදුනේ තද හිස රදයකුත් සමඟමය... ඇගේ කීමට වාහනයට ගොඩ නොවී වැස්සේම දිය කාවෙකුමෙන් තෙමීගෙන ගෙදර ආ එකේ ආනිසංසය මට තේරෙන්නේ දැන්ය... අම්මා තද දුන් කොත්තමල්ලි වීදුරුව සමඟ පෙනඩෝල් හතරක්ම බී නිදගන්නට ගියද හිස බර කිරීම පවා අපහසු විය. කිව්සුම් ගියේ විනාඩියකට එක ගානේය...

ඇඳේ පෙරලි පෙරලී ඉන්නට බැරිම තැන මම දෙර ඇරගෙන බැල්කනියට ආවෙමි. එක දිගට කිව්සුම් හතරක්ම ගියේ නාසය පුරාම හොටු පුරවාගෙනය. මම බැල්කනියේ බිලු පුටුවට බරවී පරණ බැනියමකින් හොටු හුරා දැමුවෙමි... හිස කෙළින් කර තබාගෙන ඉන්නට බැරිම තැන මම පුටු ඇන්දට හිස තබාගෙන දස් පියා ගත්තෙමි...





මම හොටු හුරමින් කිව්සුම් අරිමින් විඳින දුක ඇය බැල්කනියට වී බලාගෙනය... දැන් ඇය සතුටු වෙනු ඇත... මම දුනු පාට් එකට හොඳ වැඩේයැයි ඇය සිතනවා විය යුතුය... අසනීපයක් නැත්තෙකු සේ පත්තර පිටුවක් බලන්නට මම පටන් ගත්තෙමි. එහෙත් මගේ ශ්වාස නාලය මා තරම් ආඩම්බර නැත. කිව්සුම් යළිත් යන්නට පටන් ගත්තේ එක පිට එකය...

මම මේස් බැනියමෙන් නහයම වසාගෙන අමාරුවට රතුවූ දෙනෙත් යංතමට ඔසවා හොර පුසෙකුසේ ඇය දෙස බැලුවෙමි. නැත... ඇගේ මුහුණේ එසේ මා බලාපොරොත්තු වූ සමච්චල් සිනහව නැත.

'එළියේ පින්න.... හෙම්බිරිස්සාව වැඩි වෙනවා. ඇතුළට යන්න...'

ශහීනා මෘදුව කීවාය. මට බැල්කනියෙන් පැන මැරෙන්නට තරම් ලැජ්ජාවක් දැනුණි. දවල් මහ වැස්සේදී මා කළ වැරැද්දට මේ තරම් ඉක්මනින් දඬුවම් ලැබෙතැයි මම නොසිතුවෙමි.

යළිත් හිස ඔසවද්දී ඇය පෙනෙන්නට නොසිටියාය... මම නවත් කිව්සුමක් මහා හයියෙන් ඇර පහළට ගියෙමි...

නංගී කොහෙන්දෝ ගෙනා රෝස අතු කිහිපයක් අළුත් පෝච්චි වලට හිටවමින් උන්නාය... මම බැනියමෙන් නාසය හුරමින් ගොස් දෙරකඩ පඩියේ වාඩිඋනෙමි.

'ඔය කරන වැඩවලට ඔයාට හැදෙන්නේ හෙම්බිරිස්සාව නෙමේ... නිව්මෝනියාව... බුදු හාමුදුරුවෝත් අර ඒ වෙලාවෙම පඩිසන් දෙන කරුම කියන්නේ ඕවට තමා....'

නංගී අලුත් පෝච්චි වලට පස් පුරවමින් කීවේ ඒ තරම් හොඳ මුහුණකින් නොවේ. මම ශහීනලාගේ වාහනයේ නැවීත්



www.sinhalaelibrary.com

වැස්සේ ආ එක නංගීට කියන්නට ඇත්තේ අම්මා විය යුතුය... එය මේ තරම් කතා බහ කළ යුතු තරම් වරදක්ද...

'අද එයාලගේ වාහනේ ආවා කියමු... හෙට මහ වැස්සේ පයින් එන්න එපායැ...'

මම තවත් හොටු කලියක් හූරා කීවෙමි.

'ගොඩාක් පණ්ඩිත වෙන්න එපා අයියේ... අම්මා කොත්තමල්ලි ලිපේ තියල ගියේ... තව වීදුරුවක් ගෙනත් දෙන්නද...'

'එ..පා... රෑ වෙලා බොනවා...'

'ඔයා හැමෝටම හොඳයි... හරි කරුණාවයි... ඒත් මේ කෙල්ලට ඇර... එහෙම වෙනකොට ඒකෙන් සැක කරන්න මොනා හරි තියෙනවා...'

නංගී කියනා කතාවේ ඇත්තක් ඇත. මට ඇයට විශේෂයෙන් තරහක් පාන්නේ විශේෂ හේතුවක් නිසා විය යුතුය...

'මට මගේ පාඩුවේ ඉන්න දෙන්න...'

ඇය සම්බන්ධයෙන් මට විඳින්නට වී ඇති දුක දන්නේ මා පමණි. එය කිසිවෙකුට විස්තර කිරීමට පවා අසීරු අසරණ හැඟීමකි. මේ කිසිවකට ඇය වැරදිකාරියක නොවේ. ගේ ඉස්සරහ නිවසට ආ කෙල්ලව හිත ඉස්සරහින් තබා ගත්තේ මාය. මේ සියළු දුක ඒ නිසාය.

ගේට්ටුවේ උඩ යකඩ කැල්ල කටස් ගා පහළට ගියේය... මම අමාරුවෙන් හිස ඔසවා බැලුවෙමි. ලා නිලට හුරු සායකුත් සුදු බ්ලවුසයකුත් ඇඳගෙන ගේට්ටුවේ ග්‍රිල් දල් අතරින් ශහීනා හිස දම්මාය...

'මං එ...න්...න...ද...'





ඇය ඇසුවේ නංගී දෙස බලා නොවේ. මා දෙස බලාය.

'එ..න්..න..'

මම හෙම්බිරිස්සාව නිසාවෙන් වෙනස් වූ කටහඬින් කීවෙමි...

'ඔයාට ඉඳගන්න පුටුවක් ගෙනත් දෙන්නද...'

නංගී ඇසුවාය...

'අනේ එපා... මං හිටගෙන ඉන්නම්... ඔයා ඒක කරන්න...'

'එහෙනම් ඔයා පඩියේ අපේ අයියා ළඟම ඉඳගන්න... හැබැයි ඔයාට යන්න වෙන්නේ හෙම්බිරිස්සාව හදගෙන...'

ශහීනා අතේ යමක් ගුලි කරගෙන දෙතොල් පට අගිස්සෙන් අමාරුවෙන් සිනාසුනාය.

'මං දවල් වැස්සේ තෙමෙද්දී ඔයාට කිව්වා.... ඇහුවේ නෑනේ... සංදේශ් අයියා මාව ගණන් ගන්නෑ...'

ඇය ඇඬුවා නම් මීට වඩා හොඳය...

'කතා කරද්දී මං හොඳටම තෙමිලා හිටියේ.... නැග්ගනම් වාහනේ සීට් ටිකත් තෙමෙනවා...'

දවස තිස්සේම බොරු කළ මම ගැළවෙන්නට තවත් බොරුවක් කීවෙමි. ශහීනා දෙතොල්පට විකාගෙන බිම බලාගත්තාය...

'වාහනයේ සීට් එක තෙමෙන එක මොකක්ද... එද මගේ ලේ වලින් ඔයාගේ කලිසමම තෙමුනේ.... ඇයි අපිටත් අපිව පුළුවන් විදිහකට හොඳ වෙන්න දෙන්නැත්තේ...'

ශහීනාගේ කතාව ඇත්තටම සාධාරණය... හොඳ මිනිසුන්ට තම හදවතේ ආදරය කියන්නට ඉඩක් තිබිය යුතුය. එය රකුසෙකු සේ නැවැත්වීම පාපයකි.



www.sinhalaelibrary.com

මොහොතක් නිහඬව උන් ඇය තණ පිස්ස පාගාගෙන මං කරා ආවාය... ඊටත් පසු අතේ තිබූ කුඩා කුප්පියක් සුදු අත්ල මැද තබා මා වෙතට පෑවාය...

'ආ මං මේක දීලා යන්න ආවේ... මේ ඉන්දියාවෙන් ගෙනාපු තෙල් එකක්.. චූට්ටක් අරගෙන නහයෙයි නළල දෙපැත්තෙයි බෙල්ලෙයි ගාලා චූට්ටක් නිදගන්න. ඇහැරෙනකොට ඔය බර ගතිය ඇරිලා යනවා...'

එය නොගෙන මම එක එල්ලේම ඇගේ දෙනෙත් වෙතට එබීගෙන උන්නෙමි. ඒ කළු ඇස් බෝල මැද ඉන්නේ සංදේශ් නම් හිතන්නාය...

'ආ... ගන්න....'

තෙල් කුප්පිය නොගෙන ඉන්නට මට බැරි විය...

'යන්නෙපා.. චූට්ටක් ඉන්න...'

නංගී යන්නට ගිය ශහීනාව නවත්වා ගත්තාය...

'අපේ ගෙදරත් කවුරුවත් නෑ... මටත් හරි පාළුයි...'

ටික වේලාවක් හිටගෙන නංගී රෝස කිණිති හිටවන අයුරු බලා උන් ඇය පසුව දෙපා වල තිබූ පාවහන් ගලවා දමා උළුපියළිය පිස්සේ ඉඳගත්තාය... ඇය ඉඳගත් ආකාරයට ඇගේ සාය දෙදණිසින් මදක් ඉහළට එසවී ඇගේ දෙපා නිරාවරණය විය... ජීවිතයේ ප්‍රථම වරට මගේ ඇස් අවංක ආශාවකින් ඇගේ දෙපා මත රැඳවිණ...

'දවසක එන්න ආසයි පන්සල් යන්න...'

ශහීනා නංගී දෙස බලා කීවාය.

'ඉතින් යන් මා එක්ක... අපේ අයියත් එයි...'

'සංදේශ් අයියා නම් අපේ පාටිය දවසෙත් පන්සල්





ගියානේ...'

'අයියා පන්සල් යන්නේ ලොකු දුකක් ආවම...'

එය ඇත්තදැයි අසන්නට මෙන් ශහීනා මා දෙස බලා මෘදු කරුණාබර බැල්මක් හෙළුවාය...

'ඇත්තද... එද මොකටද දුකින් හිටියේ...'

දුක හිතුනේ ඇයි දැයි ඇත්තටම ඇයට කිව හැකි නම්... එහෙත් ඒ තරම්ම බොළඳ විය නොහැක.

'පන්සල් ගියාම දුක අඩුවෙනවද...'

'ඔව්... දුක නැති වෙනවා...'

'මගේ හිතෙත් ලොකු දුකක් තියෙනවා... ඔයාලගේ බුදු සාදු මම පිට ආගමක කෙනෙක් නිසා දුක අඩු කරන එකක් නෑ...'

'එහෙම නෑ... දුක් විඳින කෙනෙකුට පිහිට වෙන්න ආගම මොකක්ද කියන එක වැඩක් නෑ...'

'හැමෝම එහෙම නෑ... ඒවා හරියට හිතලා අපිව කොන් කරන අයත් ඉන්නවා.... එතකොට හරි දුකයි...'

ඇගේ ඇස් අගින් වැටුණ කඳුළක් උළුපියළිය ගොල්ලට වැටුනේ හිතද කඩාබිඳ දමාගෙනය. ඇය මේ කියන්නේ මටය... ශහීනා හිතන්නේ ඇය පිට ආගමක යුවතියක් නිසා මා කොන් කරනා බවද. එය මටද දරාගැනීමට බැරි කතාවකි.

'මං යනවා... පුළුවන් නම් සංදේශ් අයියා ඕක ගාලා රස්නේ වතුරින් පොහවපු පැනල් කැල්ලක් මූණට දන් ඉන්න...'

ශහීනා යන්නට නැගිට්ටේ ඇයට දිගටම ඇඬුන නිසාය... දෑස්වල නැඟුණු කඳුළු ඇය පිසදගත්තේ මටත් නංගීටත් පිටුපා ගේට්ටුව කරා යද්දීය...



www.sinhalaelibrary.com

ගේට්ටුවට එහා වාහනයක් නතර කරනා හඬ ඇසුණේ ශහීනා ඉන්පිටතට යන්නට පෙරය. ඇය එහෙමම පාත්වුනාය...

'ඇ...යි...'

නංගි පුදුම වී ඇසුවාය... ශහීනා ඇඟිල්ලක් දෙතොලතරට තබා කතා නොකරන ලෙස කීවාය...

'අපි යං ඇතුළට...'

ශහීනා නංගිගේ අත තදින් අල්ලාගෙන කීවාය. ඇය මෙ ගෙතුළට ගොස් හැංගෙන්නට යන්නේ කාගෙන් බේරෙන්නටද...

ගෙතුළට යන්නට ගිය ඇය දෙරකඩ පාමුළ මා ඉඳගෙන උන් තැනදී පාත් වුනාය.

'පිස්සෙක් ඇවිල්ලා මාව අහයි. මං නෑ කියනවද...'

මම කිසිවක් නොකියා හිස වැනුවෙමි. ඇය මේ මෙසේ දුවන්නේ කාට බියේද.... මම උන් තැනටම වී ගේට්ටුව දෙස බලා උන්නෙමි.

ඇය කීවා හරිය... ගේට්ටුවෙන් එබුනේ එද ශහීනා සමඟ උන් තරුණයාගේ රුවය...

'මේ ශහීනා මෙහාට ආවද...'

ඔහු ඇසුවේ අමුතුම ආකාරයකට උච්චාරණය කළ සිංහලයෙනි. මට කරකියා ගත හැකි දෙයක් නොමැතිව මොහොතක් බලා උන්නෙමි...

'ඇතුලේ නංගි එක්ක ඉන්නවද දන්නෑ...'

'පොඩ්ඩක් බලලා කතා කරන්න... ප්ලීස්...'

ඔහු ගත ගැල්වූ විලවුන් සුවඳ ගේට්ටුවේ එළියේ සිට මෙහාට ආවේය... ඒ තරම් සුවඳ විලවුන් බිඳක් මම කිසිම දිනයක ගල්වා නැත.





'කවුරු ඇවිත් කියලද කියන්නේ....'

'මං අසාද්... ප්ලීස් මට ලේට් වෙනවා...'

ඔහු කතා කරන්නේ මා පවා ගණනකට නොගෙනය... මට තිබුනේ ශහීනා කියූලෙස ඇය නැතැයි කියන්නටය.. එහෙත් ඇයව අපේ ගෙතුළ සඟවා ගෙන මට බොරු කළ නොහැක.

අසාද් අත තිබූ යතුරු කැරැල්ල කරකවමින් ගේට්ටුවට උපිටින් බලා උන්නේය. ඔහුත් සමඟ සසඳද්දී මං බයියෙකු යැයි මට සිතුණි.

ශහීනා උන්නේ නංගීත් සමඟ කුස්සියට වී මොනවාදෝ රහසින් කියවමින්ය. ඇය මා දුටුවනාම දස් ලොකු කර බැලුවාය.

'ගි...යා...ද...'

ඇය අසද්දී මම අසරණව බිම බලා ගත්තෙමි...

'අසාද් කියලා කෙනෙක්.... ඔයාට කතා කරනවා...'

ශහීනා තොල් පට විකාගෙන දිග සුසුමක් හෙළුවාය...

'ඔයා මම ඉන්නවා කිව්වද...'

මම නාසය ඉහළට හුරා සමාව ඉල්ලන්නටමෙන් හිස වැනුවෙමි...

'ඔයා හරි නරකයි... හරිම නරකයි... මං උදව්වක් කරන්න ගියාම ඒක කරන්න දෙන්නෙත් නෑ... මම උදව්වක් ඉල්ලුවාම ඒක කරන්නෙත් නෑ... ක...ම...ක්... නෑ...'

බලා ඉඳිද්දී කඳුළු පිරුණ දෑස් බිමට බර කර ගත් ශහීනා නංගිගේ පුරත අල්ලා ගත්තාය...

'චූට්ටකට අපේ ගෙදරට යන්... ගෙදර කව්රුවත් නෑ.

මට බයයි...'

ශහීනා නංගිවත් ඇදගෙන ගියේ මගේ පපුව කීරිගස්සවන තරම් වේදනාබර බැල්මක් මා වෙත හෙළාය...

මගේ අතින් ඇයට වෙන්නේ වැරදිමය... සමහර ඒවා කිසිසේත්ම සමාව දිය නොහැකි වැරදිය... ශහීනා මේ තරමට අසාද්ධ මඟ හරින්නේ ඇයි...

බරවූ හදවතින් මම කාමරයට ගියෙමි. ඇඳට වැටී ශහීනා දුන් ඉන්දියානු තෙල් කුප්පිය ඇර ඉන් බිංදු කිහිපයක් නාසය දෙපැත්තේත් නළලත දෙපැත්තේත් ගල්වා ගත්තෙමි... ඒ තෙල් වල තිබූ පැහිරි සුවඳ නාසය විදගෙන පපුවට ගියේ නොසිතූ සහනයක් දෙමිනි.

මගේ අසනීපයක් ගැන පවා හිතනා මේ අහිංසක කෙල්ලට මේ තරම් ගින්දර දෙන්නට මගේ හිත අමනුස්ස වන්නේ ඇයි...

'කෝ.... මූණ මේ පැත්තට හරවන්න...'

දත් පියාගෙන අතින් ඇලයට හැරී අමාරුවෙන් ඉඳිද්දී නංගී පැමිණ කීවාය... අසාද් ගියාදැයි අසන්නට මට සිත්විය...

නංගී උණුසුම් පැනල් රෙදි කැබැල්ලක් මගේ මුහුණ මත ඇතිරුවාය. ඉන් ආවේ ඕඩිකොලෝන් සුවඳක් සමඟ මුසුවූ මෘදු රස්නයකි.

'මම ශහීනා නම් කවදාවත් මම කොල්ලෙක්ට මෙහෙම කරන්නේ නෑ.... විශේෂයෙන් ඔයා වගේ නපුරු කොල්ලෙකුට මෙහෙම කරන්නෑ... එද්දි මේ ඒ කෙල්ල උණුවතුරින් පොඟවලා දුන්නේ... පව්...'

ඇත්තටම ඇය එසේ කරන්නේ ඇයි...

'අයියට සිබ්බේ ඒ කොල්ලට ශහීනා නෑ කියලා කියන්න...





පිස්සා වගේ එපා කියද්දී ඔයා ඒ කොල්ලට කිව්වා ශහීනා ඉන්නවා කියලා...'

'ඒ ශහීනාගේ බෝයි ෆ්‍රෙන්ඩ්... දෙන්නා මොකකට හරි තරහාවෙලා ඉන්න ඇති. ඒකයි ඔය පළිගන්න නෑ කියන්න කිව්වේ...'

මම පැනල් රෙදි කැබැල්ල මුව මත තිබෙද්දීම කීවෙමි. මා කියන්නේ සැබෑවක් දැයි මමම නොදනිමි.

නංගී පැනල් රෙදි කැබැල්ල වේගයෙන් මුහුණෙන් ඉවතට ගත්තාය...

'ඒ කෙල්ල ඒ කොල්ලට ආදරේ නෑ... ඒක තමා ඇත්ත...'

'ආදරේද නැද්ද කියලා අපි දන්නේ නෑනේ... කොහොම හරි එයාව බන්දලා නම් දෙන්නේ ඒ කොල්ලටම තමා...'

මම පරිස්සමින් නංගී වෙත නෙත් යොමා කීවෙමි. ඇය හුල්ලමින් හිස වැනුවාය...

'ඔව්... ඔයා කියන එක හරි... එයාට අසාද්ව බඳින්න වෙනවා... මුස්ලිම් කෙල්ලෙක්ගේ දෛවය සිංහල කෙල්ලෙක්ගේ දෛවයටත් වඩා වෙනස්...'

'එයාගේ දෛවය ඒක නම් ඒ කොල්ලට ආදරේ කරන්න හුරුවෙන එක තමා හොඳම දේ... නැතුව ඒ කොල්ලා මෙයාව බලන්න එද්දි අපේ ගෙදර හැංගෙන එක නෙමේ...'

'ඇත්ත... ඒත් අයියේ... කෙල්ලෙක් මුස්ලිම් උනත් දෙමළ උනත් සිංහල උනත් ඒ කෙල්ලටත් තියෙන්නේ හිතක්... මොන ජාතියක උනත් තමන් ආදරය කරන කෙනාවම අයිති කර ගන්න කෙල්ලෙකුට අයිතියක් නැද්ද...'

අප දෙදෙනා අතර තරමක නිහඬතාවයක් විය...

'එයා කාටද ආදරය කරන්නේ...'

මම බිඳුණු අසරණ හඬින් ඇසුවෙමි. නංගී මගේ කමිසයේ බොත්තම් එහාට මෙහාට කර ශහීනා දුන් උණුසුම් පැතල් රෙදි කැබැල්ල පපුව මත එලුවාය...

'මගේ අයියා ඒක තේරුම් ගන්න බැරි මෝඩයෙක් නෙමේ කියලා මං දන්නවා...'

නංගී කීවේ එපමණකි... ඉන්පසුඇය කාමරයෙන් යන්නට ගියාය. ඇය පපුව මත එලා ගිය ශහීනාගේ පැතල් කැබැල්ලේ තිබූ ගිනි රස්නය පපුවේ ඇතුලාන්තයටම කිදගෙන කිදගෙන බහින්නට විය.

'ඇත්තටම ඇය ආදරය කරන්නේ කාටද... මට ආදරය කරනවානම්... මම දෙනෙත් පියාගෙන සිතුවෙමි...'

www.sinhalaelibrary

si-unlimited.com

www.sinhalaelibrary

# 18

"ඇඩ්වාන්ස් ලෙවල් රිසාල්ට් හොඳ උනත් ඒ රිසාල්ට් වලින් රස්සාවකට යන එක ලේසි නෑ සංදේශ්... මටත් පිස්සු හැදිලා තියෙන්නේ... අපි වගේ ලැත්තරස් පොරවල් තිසා ඉරිදා පත්තර ටික නම් විකිණෙනවා... ඒ වල තියෙන ජොබ් වලත් ඉල්ලන්නේ එක්ස් පීරියන්ස්.... මාරයි...'

නගර ශාලාව අසල වූ බස් නැවතුමට එන අතරවාරයේදී උපුල් කීවේ කලකිරුණු සිතිනි. මගේ සිතද තිබුනේ ඔහුගේ තරමම අවුල් විය...

'හිතුනොත් පාස්පෝට් හදගෙන පනිනවා කොහාට හරි...'

මම සිනාසුනෙමි. ඒ තරම් ඉක්මනට මට මේ මවිබිමට

සමුදෙන්නට හිත හදගත නොහැක... දමා යන්නට බැරි බොහෝ දේවල් මේ මවබිමේ ඇතැයි මට සිතුණි.

'උඹ ගෙදර හිටපු දවස් ටිකට පාට වැටිලා... විකක් ලස්සනත් වෙලා... මොනවා හරි වෙනවද ඒ පැත්තේ...'

උපුල් එය ඇසූ ආකාරයට මට ලැජ්ජා සිතුණි.

'උඹත් මහත් වෙලා.. ඔය බඩත් එන්නේ...'

'හෙට අනිද්දා ජොබ් කරන්න ගත්තහම මේවා බහිනවා සංදේශ්... වෙලාවකට ඇවෙන සයිස් නේද...'

අපි කතා කරමින් නගර ශාලාව අසළ වූ මාර ගස යට බස් නැවතුමේ නැවතුනෙමු. බඩගින්නක් තිබුනද හෝටලයකට ගොස් මිතුරා සමඟ කන්නට තරම් මුදලක් මා අත නැත.

'සංදේශ්... අර උඹට නේද කතා කරන්නේ...'

උපුල් මට උරහිසින් ඇණ කීවේය... මම යුනියන් පෙදෙසේ සිට එමින් තිබූ වාහන පෙළ දෙස බැලුවෙමි. පාර කොනක නැවතුනේ ශහීනා උන් සුදු කාර් රථයයි...

ඇය ඇත්තටම මායාවක් වැනිය... මේ හිතද්දී ඇය මේ පෙනෙයි...

'ගෙවල් ළඟ ළමයෙක්... මං කතා කරලා එන්නම්...'

මා කියද්දී උපුල් බැලුවේ අමුතුම සිනාවක්ද සමඟය... ඇය වැනි සුන්දර යුවතියක් හා කතා කරද්දී එවැනි බැල්මක් හෙලීම සාමාන්‍ය දෙයකි.

'කොහෙද මෙහේ...'

ඇය වාහනයෙන් බැස ඇසුවාය... වාහනයේ උන් වියපත් රියදුරාද හිස දමා සිනාසුනේය...





'මං... මේ ජොබ් එකක් බලන්න ආවා...'

ඇගේ මුහුණම අනුකම්පාවෙන් පිරී ගියේය... මා සිතුවේ ඒ තරම් දුකක් ගන්නට දෙයක් නොවේ...

'ඉගෙන ගන්න ගමන් රස්සාවල් කරන්න පුළුවන්නෙ...'

ඇය හදන්නේ මේ මහ පාරේ මට උපදෙස් දෙන්නටය...

'මං ඉගෙන ගෙන ඉවරයි...'

මම මගේ මෝඩ නිතුවක්කාර ස්වරයෙන් කීවෙමි.

'යන්... අදත් පුළුවන් නම් බෑ කියන්න... අපිත් යන්නේ ගෙදර... මේ තාත්තාගේ ෂොප් එකේ ඉදලා ගෙදර යන ගමන්...'

මම හැරී උපුල් දෙස බැලුවෙමි.

'යාළුවත් දගෙන යන්... එයා කොහෙන්ද බහින්නේ...'

'මට බස් එකේ යන්න පුළුවන්...'

ශහීනා එවර තොල්පට තද කර ගත්තාය...

'මේ වෙලාවේ බස්වල යන්න අමාරුයි... ගෙදර යද්දී දෙක තුන වෙයි එන්න...'

මම උපුල්ට කතා කළෙමි...

'මෙකේ යන්...'

'මං තුන් මුල්ලෙන් බහිනවා සංදේශ්...'

'කමක් නෑ... එන්න නගින්න...'

උපුල් මටත් කලින් වාහනයේ ඉදිරිපස අසුනට නැග්ගේය. ශහීනා හොඳ වැඩේ යැයි කියන්නට මෙන් තොල්පට තදකරගෙන සිනාව සඟවාගෙන වාහනයේ දොර ඇරියාය.

මම ශහීනා ඉදගත් පසු අනෙක් පැත්තෙන් පැමිණ පසුපස ආසනයට ගොඩ උනෙමි. අපේ සිරුරු අතර වුනේ



www.sinhalaelibrary.com

අඩි තුන් කාලක පමණ පරතරයක් පමණි.

ශහීනා උවමනාවෙන්ම මා දෙස නොබලා උන්නාය. ඒ නිසාම මම ඇය දෙස හොරැහින් දෙතුන් වරක් බැලුවෙමි.. ඒ මුවේ තුනී සිනාවක් ඇත. ඇය සිනාසෙන්නේ මටය.. මම ශබ්ද නැගෙන්නට නාසය ඉහළට සීරුවෙමි... මට ඇත්තේ මෙවැනි කිසිම විනීතකමක් නැති වැඩය...

'අද වැස්සේ තෙමිලා මහත්තයට තාම හෙම්බිරිස්සාව නේද.... ශහීනා බේබි ඕක කිව්වා...'

රියදුරා කීවේ පසුපසද බලමිනි. මාව ගල් වන්නේ පුදුමාකාර ලෙසිනි. ශහීනා කිසිවක් නොකියා හයිලෙවල් පාරට පසුවෙන වාහන දෙස බලා සිනාසෙන්නේ මාව තවත් අසරණ කරගෙනය...

'සංදේශ් එහෙනම් මං මෙතනින් බහිනවා...'

උපුල් පසුපස හැරී කියද්දී මම සිර කූඩුවක සිටින්නෙකු මෙන් අපහසුතාවයෙන් හිස වැනුවෙමි.

'තැන්කියු ඔයාට මෙතනට දම්මට... බස් එකේ ආවනම් එපා වෙනවා... යන්තං...'

උපුල් ඇයට කට පුරා ප්‍රසංසා කළේය... වාහනය තුම්මුල්ලේ සළසල ප්‍රදර්ශනාගාරය අසල නැවතුණි. උපුල් බැසගිය පසු මට ඉදිරිපස අසුනට යන්නට සිතුණි. එහෙත් මාව මෙතනට ගම් දමා අලවා තිබෙන්නාක් මෙනි.

'හොඳ යාළුවෙක් ඇත්ත කියනවා... ඔයා වගේ නොමේ...'

මම අසරණව බිම බලා ගත්තෙමි... මම නරක මිනිහෙකු ලෙස ඇය සිතීම හොඳය... එවිට මේ තරම් කරුණාවක් ඇය නොදක්වනු ඇත. එය මගේ හිතට සැපතකි. දෙබසින් දුක වැඩි වන හැම විටකම මුනිවත සැපතකි.





'ඇයි රස්සාවල් කරන්න යන්නේ... දිගටම ඉගෙන ගන්න තිබ්බනේ... සංදේශ් අයියව කැම්පස් සිලෙක්ට් වෙයි...'

මගේ ජීවිතයම හකුලා ඇය අසන මේ ප්‍රශ්නයට මට පවා පිළිතුරු නැත.

'දිගටම ඉගෙන ගන්න මං ආස නැහැ...'

එහෙත් ඇත්ත එය නොවේ.. ජීවිතයේ ප්‍රශ්න කරපිටටම පැමිණ ඇති බව මම ඇයට නොකියන්නේ ඇයි...

'ටිකක් මහන්සි වෙලා ඒ අවුරුදු ටිකත් ඉගෙන ගත්තා නම් හොඳයි නේද... ඩිග්‍රියක් ගත්තහම ලස්සන මැනේජර් මහත්තයෙක් හරි එකවුන්ටන් මහත්තයෙක් හරි වෙන්න පුළුවන්...'

අනාගතය ගැන ඇය මවන සිහිනය මේ හිතට බර වැඩිය... වාහනය තුළ අධික සීතලක් තිබුණද මගේ ලය රත් වී ඇත.

'එච්චර දුර යන්න අපිට බෑ...'

'ඉක්මනට රස්සාවක් හොයන්නේ ඉක්මනට බඳින්නද යන්නේ...'

මම ඇය ඇඳගෙන උන් සුදු පැහැගත් බ්ලවුසයේ අත් අතරින් එල්ලෙන කුඩා අත් වෙන් පට දෙස බැලුවෙමි. එය වඩාත්ම ලස්සන ඇගේ අතේ එසේ එල්ලෙන විටය...

'කුරුළු කැලේ ඉස්සෙල්ලාම ගත්තෙ මගේ වෙඩින් එක නෙමේනේ...'

මම ඇයව පිද්දවන්නට හිතා කීවෙමි.

'එහෙනම් කාගෙද...'

'ඔයාගෙනේ... මුස්ලිම් වෙඩින් එකක් මං දකලම නැහැ...



www.sinhalaelibrary.com

බලන්න හරි ආසාවෙන් ඉන්නේ..'

තොල්පට විකමින් ශහීනා ඇගේ උකුල දෙසම බලා උන්නාය. මා කියූ දෙය කොතරම් දරුණු දැයි මට සිතුනේ ඇය කිඹිරිගස්යායේ සිට කිරුළපනේ දක්වාම කතා නොකර ආ නිසාය... මම මටම දොස් තබා ගත්තෙමි. මා ඇය සමඟ වැඩි කතාවකට නොයන්නේ මේ කාරණාව නිසාය. කතා කළ යුත්තේ මොනවාද නොකළ යුත්තේ මොනවාද කියා මම නොදනිමි.

ශහීනා දෙනෙත් එසවූයේ බොහෝ වේලාවකට පසුය. කියවීමට අපහසු තරම් හැඟීම් ගොන්නක් ඇගේ දෙනෙත් වල විය.

'සොරි...'

එපමණක් මම කීවෙමි... ඇය ඇගේ කුඩාවූ ඇඟිල්ලෙන් ඉදිරිපස අසුනේ කුෂන් කවරය සීරුවාය...

'බේබි කාසිම් මහත්තයලාගේ ගෙදර ගියේ නෑ.... දන් එයා බලාගෙන ඇති. මට අමතක උනා...'

'එහෙනම් ඔයා අපිව මෙතන බස්සලා යන්න... අපි ත්‍රීවීලර් එකක යන්නම්... කාසිම් අන්කල්ගේ ගෙදර ගිහිල්ලා එහෙමම ෂොප් එකට යන්න.... අපි බහිමු සංදේශ්...'

ශහීනා මටත් කියාගෙනම වාහනයෙන් බැස්සාය. ඒ අනුව මමද බැස්සෙමි. වාහනය හරවා ගිය පසු අපි දෙන්නා හයිලෙවල් පාර කොනක තනිවූනෙමු. ශහීනා මෘදු බැල්මෙන් මා දෙස බැලුවාය.

'මො...ක...ද... කර...න්...නේ...'

ශහීනා කැහැල්ලුවෙන් ඇසුවාය. මම අසරණව හයිලෙවල් පාර දෙස බැලුවෙමි...





'මං ත්‍රී වීලර් එකක් කතා කරන්නම්...'

'කොහේ යන්නද...'

'ඇයි ගෙදර...'

ඇගේ දෙනෙත් ගියේ වමතේ වූ රන් පැහැගත් කුඩා ඔරලෝසුව වෙතය.

'චුට්ටක් ඉඳලා ගෙදර යන්...'

ඒ වචන නැවතුනේ පසුවට ගොස්ය.

'පාරවල් වල රස්තියාදු වෙන්න හොඳ නෑ... ත්‍රී වීලර් එකක බෑනේ අපි බස් එකේ යන්... ඔයාගේ අම්මා බලං ඇති...'

ශහීනා කතා කළේ නැත. මම කුරිරු නොවූනෙමි. අසාධාරණද නොවූනෙමි. ඇය හෙට අනිද්දා මුස්ලිම් චාරිත්‍රානුකූලව විවාහ වන්නට සිටින පවිත්‍ර යුවතියකි. ඇය පවිත්‍ර කුරානයේ අත තබා ඒ පවිත්‍රත්වය වෙනුවෙන් පොරොන්දු දී ඇත. ඒවාට ගැරහීම හොඳ නැත. ගින්දරය... වේදනාය... ඒවා අප දරාගත යුතුය...

'යන්.... හොඳ ළමයා වගේ ගෙදර යන්...'

මම ජීවිතේ ප්‍රථම වරට අප්‍රමාණ කරුණාවකින් මෘදුව කතා කළෙමි. ඇගේ ඇස්වල කඳුළුය... මේ මහපාර බව මේ කෙල්ලට අමතක වීද...

'ඔයාට කොච්චර කරුණාවෙන් කතා කරන්න පුළුවන්ද... ඔහොම කියනවා නම් එන්නම්... ත්‍රී වීලර් එකක යන්න බෑ... බස් එකේ යන්...'

මම හිස වැනුවෙමි... ඇගේ මුහුණ පුරා ඇත්තේ වෙහෙස බර රුවකි. මට නිකමට බැලුනේ අපට එහායින් වූ කුඩා



www.sinhalaelibrary.com

ස්නැක්බාර් එක දෙසය.

'යන්... මොනා හරි මෙතතින් බීලම යන්...'

මම මෑදුව කීවෙමි.

'අ..නේ මම ෆාස්ටින්නෙ.. සංදේශ් බොන්න. මං ළඟට වෙලා ඉන්නම්...'

ඒ වචන පසුව දඩබඩාස් ගා සමතලා කළේය... 'මං ළඟට වෙලා ඉන්නම්...' එවදන් මොනතරම් සුන්දරද...

'එහෙනම් එපා... මං දන්නැතුව කතා කළේ...'

'මං ෆාස්ටින් උනාට කමක් නෑ ඔයා බොන්න...'

'මට එහෙම බොන්න බෑ... අපි යන්...'

බස් එක අල්ලා ගන්නට පාර පනින්නට සිදුවිය... පාර මැදදී ශහීනා නොසිතූ දෙස මගේ වමත දඩිව අල්ලා ගත්තාය... මම හැරී බැලුවෙමි.

sl-unlimited.com

www.sinhalaelibrar

# 19

සෙනසුරාද හවස මම තාප්පයට එපිටින් ගුරුපාර අයිනේ තණකොළ උඩුළු ගා ගඩොල් පේළියක් දමුවෙමි... අම්මා වත්ත පිටුපස ඉන්දවා මුල් අද්දවා තිබූ පොකුරු බෝගන්විලා අතු කැබලි මායිම දිගට හිටවීම මගේ අරමුණ විය... උදේ හවා සාත්තු කළවිට බෝගන්විලා ඉක්මනටම වැඩෙයි. මේ පොකුරු බෝගන්විලා වල පැහැයට හුරු මල් පිපුණ කල ඇත්තටම ලස්සනය. බ්ලොක් ගල් පමණක් අල්ලා තනා තිබූ අපේ දුප්පත් තාප්පයට ඉත් එළියක් ලැබේයැයි මට සිතුණි...

හවස පහට පමණ රබර් ගස් අතරින් ඉර සැහව ගියෙන් රබර් ගස්වල දිග හෙවනැල්ල ගුරු පාරට වැටුණි. සැන්ද මෘදු එළියේ වැඩක් කරද්දී ගතට මහන්සියක් නැත. ගඩොල් පේළි තබා සකස් කළ දිග පාත්තිය මැදට වියළි

ගොම දමා මං බෝගන්විලා පැල සිටුවන්නට ගත්තෙමි...

පුරුද්දකට මෙන් ශහීනා ගේට්ටුව අද්දරටම ආවාය.. ඇය ආ බව දක දකත් මම නොදක්කා සේ දිගටම බෝගන්විලා පැල සිටවූයෙමි...

නොසිතූ මොහොතක බෝගන්විලා කට්ටකට දඹරැහිල්ල තුවාල විය. ඉන් ලේ පැන්නේ ඉබේටමය... මම ගොම පස් රූ ඩුණු අතින් අතින් දඹරැහිල්ල තද කොට ලේ නොයන ලෙස අල්ලා ගත්තෙමි. හිත වේනාසක ගිය කල කරනා දෙයක් පවා නිදහසේ කර ගත නොහැක.

'අත තුවාල උනා නේද... සංදේශ් නැගිට්ටින්න. මං පැල ටික හිටවන්නම්...'

ශහීනා එසේ කියා මා කියන්නටත් පෙර බෝගන්විලා අත්ත අතට ගත්තාය...

'යන්න... ඔය අතේ පස් හෝදගන්න...'

අත හිල්වූයේ තුඩා බෝගන්විලා කට්ටකටය. එහෙත් ඇගේ ඒ වචන ගල් ඉන්නකින් පපුව හාරන්නාක් බඳුය... අත සෝද නොගෙන එය කළිසමේ පිසදා මම ලේ නවත්වා ගත්තෙමි...

'මං ඕක කරන්නම්... එක් කෙනෙක්ගෙ අතක් තුවාල උනාම ඇති...'

මම ඇගේ අතින් බෝගන්විලා අතු ටික ගත්තෙමි. ශහීනා බිම ඉඳගෙනම මා දෙස බැලුවාය... එද සිදුවීමෙන් පසු ශහීනා දවස් හය හතක් මට හමුවූයේ නැත. මේ ඇයව ඉන් පසු හමුවූ ප්‍රථම වතාවය...

'මෙච්චර විතර බෝගන්විලා කට්ටක් නැද්ද...'

ශහීනා අතෙත් බාගයක් පෙන්නා ඇසුවාය. මම





තාරප්පතය අත තබාගෙන පුදුමයෙන් ඇය දෙස බැලුවෙමි...

'මො..ක...ට...ද...'

නිරාවරණය වූ දෙකලවා වලට දතම තබා ශහීනා නැගිට්ටාය...

'පපුවට ඇණගෙන ඇණගෙන යන්න...'

මේ කෙල්ල මේ මොනවා කියනවාදැයි මම නොදනිමි... එසේ කියා ඇය පාත්තිය ළඟින් ඉවත් වී යාවි යැයි මා සිතුවද ශහීනා ගියේ නැත. ඇය දත් බැඳගෙන ගුරු පාරේ එහාට මෙහාට ගියාය...

අසාද්ගේ වාහනය මා අසළින් ගොස් නතර විය. මම නිකමට එගේ පස්සට වුවා නම් සංදේශ් නැත. ඔහු වාහන එලවන්නේ පාරේ ඉන්නා මිනිසුන් පුස් පැටව් කියා සිතා විය යුතුය.

'ඇයි මෙහෙම ඩ්‍රයිව් කරන්නේ... තව ටිකකින් අර ළමයාව හැප්පෙනවා...'

අසාද් වාහනයෙන් බසිද්දීම ශහීනා වේදනාවෙන් කීවාය. මම ඔවුන් දෙස නොබලා පොළොව කොටාගෙන කොටාගෙන ගියෙමි.

'හැප්පුනානම් හොස්පිට්ල් ගිහිල්ලා දනවා... දවිස් ඉතර් නෝ... කම් බබා...'

ඔහු කීවේ ගණනකට නොගෙනය... ජීවිතයක් ඔහුගේ වාහනයකට යටවීම ඔහුට ඒ තරම්ම සරල කාරණාවකි...

'මට ගේ ඇතුළට යන්න කම්මැලියි... මෙහෙම ඉමු...'

ශහීනා කියනු මට යාන්තමට ඇසුණි. ඔහු කතා කරන්නේ ඉංග්‍රීසිත් ඔවුන්ගේ භාෂාවත් එකට දමාය. ඒ නිසා මට අසාද් කියනා කිසිවක් තේරුම් ගත නොහැක...



www.sinhalaelibrary.com

'මට බෑ... අයි කාන්ට්... ඩෝන්ට් බොදර් මී අසාද්...'

ශහීනා තරමක කේන්තියකින් අසරණකමකින් කීවාය. හිටවන්නට තව බෝගන්විලා පැළ කිහිපයක් ඇත. නැත්නම් මෙතනින් නැඟිට මට යා හැක. ඇය ඔහුට කරදර කරන්නට එපා යයි කියන්නේ ඇයිද කියා මම නොදනිමි...

'මට සනීප නෑ ප්ලීස්...'

ඇය අඬනා බව පැහැදිලිය. ඒත් ඒ කුමකටද කියා මම නොදනිමි... හැරී ඒ මුහුණ දෙස එක වරක් බලන්නට සිතුනාද මම අමාරුවෙන් අවසාන බෝගන්විලා පැළයද ඔහේ පස් වලට යට කළෙමි... බිම වැටී තිබූ උදල්ල ගනිද්දී මම ඇස් කොනකින් ඔවුන් දෙස බැලුවෙමි. අසාද් ඇගේ මොලොක් බාහුවකින් අල්ලා ඇයව කේන්තියෙන් සොලවා යමක් කීවේය... ශහීනා උන්නේ එක් අතකින් දෑසම වසාගෙන අඬමිනි. මහ පාරක් මැද කෙල්ලෙකුට වදදීම චණ්ඩිකමක් නොවේ. මගේ සුරතම උදළු මිටට තදවිය...

'ප්ලීස්... මාව මරන්න...'

ගේට්ටුවෙන් ඇතුළු වෙද්දී අවසන් වරට ශහීනාගේ මුවින් පිටවෙනු මට ඇසුණි... අහිංසක ඇයට මේ තරම් වදහිංසා කරන්නට තරම් ඇය කළ වරද කුමක්ද... අනෙක් අතට ඔහු ඇයට ආදරය කරනවානම් මේ තරම් තිරිසන් ලෙස ඇයට සැලකිය හැකිද... මගේ ගත මහා දුකකින් බරවිය... යළිත් ගේට්ටුව අසලට ගොස් ඇයට අනතුරක් නපුරක් වෙනවාද කියා බලන්නට හිතුනාද මම අමාරුවෙන් වාවා ගත්තෙමි.

'ඇයි අයියේ...'

අම්මාට උයන්නට උදව් වෙමින් උන් නංගී මම කේන්තියෙන් උදල්ලත් තාරස්සනයත් විසිකරද්දී ඇසුවාය... මම කිසිවක් නොපවසා ඇඟ සෝදගන්නට ගියෙමි... නංගී





ගාමින් උන් පොල් බෑය පසෙක තබා ඉදිරිපසට ගියාය. ඇයට ඇත්තේ පුදුමාකාර ඉවකි.

මම ඇඟ සෝදගෙන කාමරයට ආවෙමි... මොහොතකට කලින් දුටු දෙයින් මගේ මුළු හදවතම කලබලව තිබුණි... මා සන්තක වූ වස්තුවකට කරදරයක් නපුරක් වූවාක් වැනි සංවේගයක් දුකක් මගේ හිතේ විය... අවසන් වරට ඇයව දකිද්දී ඒ මුහුණේ තිබූ අසරණ බව මට සිහිවිය...

ඒ තරම් දුකක් අහිංසක ඇයට දෙන්නට තරම් ඔහුට අයිතියක් නැතැයි මගේ හිත මට කියන්නට විය... ශහීනා ඔහුට අකමැති බව දන දනත් ඔහු එසේ බලපෑම් කරන්නේ ඇයි... කෙනෙකුගේ හිතක් බලහත්කාරයෙන් ගත නොහැක... අනෙක් අතට එසේ සිතීම වැරදිය... අසාද් ඇගේ පෙම්වතා නම් ඔහු කියනා දෙයකට ඇය කැමති විය යුතුය... ඒත් එසේ නොවේනම්... එසේ වුවද මුස්ලිම් යුවතියක් ලෙස ශහීනා ඇගේ දෛවය බාර ගත යුතුය...

බෝගන්විලා කට්ට ඇණුණු ඇඟිල්ල රිදෙන්නේ දැන්ය. ශහීනා පසුවට ඇණගන්නට ලොකු බෝගන්විලා කට්ටක් ඉල්ලුවේ මේ ඇය විඳින දුක නිසාද...

'ශහීනලාගේ ගෙදර ලොකු ප්‍රශ්නයක් වගේ... මං ඒ කෙල්ල එක්ක කතා කරන්න ගියා... එයා අඬ අඬා ඉඳලා ඇතුළට ගියා... ඇන්ටිත් ඇවිත් කිව්වා දැන් දුව යන්න අන්කල් එනවා කියලා...'

'එයා පව් අර කොල්ලත් එයාට හරියට වද දුන්නා.... මාත් එතන තමා උන්නේ... කෙල්ලෙක්ට එහෙම කරන්න හොඳ නෑ...'

මම අවංක දුකකින් කීවෙමි... නංගී මා දෙස බැලුවේ පුදුමයෙනි. සමහර විට මා ඇය ගැන අනුකම්පාවෙන් කතා

සිරිම ඇයට ප්‍රශ්නයක් වන්නට ඇත...

'අයියා එයා ගැන ඔහොම කතා කරනවා කියලා දනගත්තොත් ඒ කෙල්ල පැනලයි... මං දෙන්නාට කතා කරන්න හදලා දෙන්නද...'

නංගී ලද අවසරයෙන් කීවාය...

'කතා කළාම දුක වැඩි වෙනවා මිසක් අඩුවෙන්නේ නෑ නංගී.... එයාට කොහොමත් හිත හදගන්න වෙනවා... එයා අද අසාද් ඉස්සරහ උන්නේ කොටියෙකුට අහු වෙච්ච හා පැටියෙක් වගේ.. ප්‍රශ්නයි...'

නංගී මා ළඟටම පැමිණ මා ඉඳගෙන උන් පුටුවේ ඇන්දට බර වූවාය...

'අපිට බැරිද එයාට උදව් කරන්න... අපි දෙන්නාගේ හොඳ යාළුවෙක් කියලවත් හිතලා...'

නංගී ඇසුවේ මෘදුව රහසින් මෙනි.

'ශ...හී...නා...'

එකවරම පළාතම ගිගුම් දී ඇසුණු ඒ හඬින් පුටු ඇන්ද මත උන් නංගී දරදඬු වී නැගිට්ටාය... මටද ඉබේටම නැගිට්ටවිණි.... ශහීනාගේ තාත්තා ඇයට කෑ ගසාගෙන ආවේ මිදුලේ සිටමය... ඔහු මේ තරම් සැර පරුෂ යැයි මම සිහිනයකින් වත් නොසිතුවෙමි...

'අනේ අ...යි..යේ...'

නංගී මගේ අතකින් අල්ලා ගත්තේ බිය මුසුවය... ශහීනාගේ තාත්තා මහ හඬින් කෑ ගසනා හඬ බිත්ති දෙදරවමින් ඇසෙන්නට විය. මාව වෙව්ලා ගියේ නොදැනීමය...

'මොනවත් තේරෙන් නෑ... මං කිව්වේ මොකක් හරි





ප්‍රශ්නයක් කියලා...'

මම බැල්කනියට විවරව තිබූ ජනේලයේ තිරය මෑත් කර බැලුවෙමි... ශහීනාගේ කාමරයේ දොර වසා ඇත...

'අ..නේ කෙල්ලට ගහනවා...'

නංගී තවත් දැඩිව මගේ සුරත අල්ලා කීවාය... තාත්තා ඇයට තිරිසන් ලෙස ගසනා බව මටද හොඳටම විශ්වාසය... මගේ පපුවේ තුන් හතර පළක් පිච්චී යන්නට විය...

'සොරි ඩැඩී.... සොරි ඩැඩී.... අ.නේ... මට ගහන්න එපා... සො...රි... අයි විල් නෙවර් ඩු දට් අගේන්...'

ශහීනා අඬමින් ඉකි බිඳිමින් කියනු ඇසී මගේ දස් නෙත්ව ගියේය... නංගීට ඇඬුණි.. මේ තරම් තිරිසන් ලෙස ඇයට ගසන්නට ඇය කළ වරද කුමක්ද...

'අයි කිල් යූ...'

ශහීනාගේ පියා කෑ ගසා කීවේය... තවත් පහරවල් කිහිපයක් ඇගේ කම්මුලට හෝ පිටට වදින ශබ්දය ඇසුණි...

නංගී දෑතින්ම මුව වසාගෙන බිත්තියට බර වූවාය... තාත්තා කවරදාකවත් අපට මෙසේ ගසා නැත...

'ඈ..යි එහෙම ගහන්නේ... ශහීනා එයාලගේ දරුවෙක් නෙමේ..ද... තාත්තා කෙනෙක් කොහොමද එහෙම ගහන්නේ...'

නංගී අඬමින් මගෙන් ඇසුවාය...

'අර දරුවට ගහනව නේද... මාව පිච්චෙනවා... පව් අහිංසක කෙල්ල මොන වරදක් කළාද...'

අම්මා උඩට පැමිණ වේදනාවෙන් කීවාය... මම නෙත්වූ දස් බිමට බර කර ගත්තෙමි. කවදාවත් කවරෙකු නිසාවත් මෙසේ පපුව ඇවිලී නැත. ප්‍රථම වරට ඇවිලී ගියේ ඇය

නිසාය...

'අ...ම්...මා... ම..ට අමාරුයි... අ...ම්...මා... ඩැඩීව කි..ය..න්..න මා..ව මරලාම දන්න කියලා...'

ශහීනා උඩ කාමරයේ ඇඳ මතට වී අඬනු ඡායාවක් සේ මට මෙතනට පෙනුණි. මම දෙතොල් පට තද කරගෙන කාමරයේ කෙලවරට ආවෙමි. මට ඇය අඬනු බලා සිටිය නොහැක...

'ෂ්ෂ්... මේවා බලන් ඉන්නේ කොහොමද... බලන්න තාත්තා කොච්චර රත්තරන්ද... කවදද ඔයාලට හයියෙන් බැනලවත් තියෙන්නේ... ඇයි චූටි මේ කෙල්ලට මෙහෙම ගහන්නේ...'

අම්මා ඇඬුම්බරව ඇසුවාය... ශහීනා මේ තරම් අපව අඬවන්නේ ඇය පසුගිය මාස කිහිපයේ අපටත් නොදනී අපේ ජීවිතවලට අහිංසකව එබුන නිසාය....

'දන්නෑ අම්මේ...'

මේ පහරදීමත් හවස අසාද් සමඟ සිදුවූ සිදුවීමත් අතර සම්බන්ධයක් ඇතැයි මට නිකමට සිතුණි. මේ ඇගේ දෛවය බව දන දන ශහීනා එයට මොකට එරෙහි වෙනවාද...

'ඔයාට දන් තේරෙනවා නේද අපිට එයා වෙනුවෙන් කරන්න දෙයක් නෑ කියලා... එහෙම එකේ තවත් ඒ කෙල්ලගේ හිත රිද්දන්න ඕන නෑ... බලාපොරොත්තු කියන්නේ දුකක් විතරයි නංගී...'

කවදවත්ම නුඹ මට නොලැබෙන හන්ද...
මුනිවත හොඳයි දෙබසින් දුක වැඩි හන්ද...

නන්ද මාලනී ගයන ඒ ගීයද මට ඉබේටම සිහිවිය.

'කොච්චර ලස්සන ජීවිතයක් තියෙන්න ඕන කෙල්ලෙක්ද...





කවදහරි ඒ කෙල්ල අපායකට වැටෙනවා... ඒ කෙල්ලට සැනසීමක් ඇත්තෙම නැද්ද අයියේ...'

මම බැල්කනියේ දෙර අඩවල් කර පුටුවට බර උනෙමි. අද ඇයට නින්දක් නැත. සමහර විට මටද නින්දක් නොවෙනු ඇත.

'තියෙනවා...'

'මොකක්ද...'

'කව්රුහරි එයාව මේ හැම දේකින්ම වෙන් කරලා අරගෙන යන්න ඕන... එයා මේ ඔක්කොම දාලා එයා එක්ක යන්න එන්න ඕන...'

නංගී බොහෝ වේලාවක් පුටු පත්තේ ඉරි අඳිමින් කල්පනා කළාය.

'ඇත්තටම එහෙම කෙනෙක් ඉන්නව නම් ඒ කෙල්ල ඇඳගෙන ඉන්න ඇඳුම පිටින් එයි යන්න... ප්‍රශ්නේ මේ කෙල්ලව එහෙම එක්ක යන්න කෙනෙක් ඉන්නවද කියන එක...'

නංගී එසේ කියා මා දෙස බැලුවාය. මම ඇතුළතින් කලබල උනෙමි...

'අයියට බැරිද ඒ කෙනා වෙන්න...'

මම දෑස් එළියට ගෙන ගියෙමි... නංගී මේ ප්‍රශ්නය අසන බව මම දනගෙන උන්නෙමි... නංගී අසන්නට පෙර ඒ ප්‍රශ්නය මම එහෙමම අසා ගත්තෙමි...

'මං වගේ කොල්ලෙකුට ශහීනා වගේ කෙල්ලෙක් කැමති වෙන්නෑ... ඇරත් මම සිංහල... එයා මුස්ලිම්...'

නංගී උන්නේ මගේ වම් පැත්තෙනි. ඇය එකවරම මගේ



www.sinhalaelibrary.com

ඉදිරියට ආවාය. ඒටත් පසු මගේ දෙදණට අත තබා මුහුණට එබුනාය.

'ඔයාට ආදරේ වෙනුවෙන් ඔයාගේ ජාතිය අමතක කරන්න පුළුවන්ද...'

මට නංගීගේ දෙනෙත් ඉදිරියේ වංක වීමට බැරි විය.

'පුළුවන්...'

'ඔයාට එක පාරක් පුළුවන් නම් ශහීනා දහ පාරක් ඒක කරයි...'

ආදරයට ජාතියක් නැත. ආදරයට කාලයක් නැත. සෙනෙහස් බැඳීම් වලට ඇත්තේ එක ජාතියකි. ඒ මිනිස්කම් ජාතියයි. ජීවිත වලට අවශ්‍ය වන්නේ ඒ භාෂාවයි. ඒ හදවතේ භාෂාවය.

'අ..ර ඇහෙනවා නේද... කෙල්ල තාම අඩනවා... පව් අයියේ...'

ඒ ඉකිබිඳුම් හඩ එන්නේ පපුවේ පැත්තක්ම හූරාගෙනය...

'අද මේ කාමරේ නිදගන්න බෑ... මං සාලේ සැටියේ නිදගන්නවා...'

'එපා... අයියා එයා අඩනවා පාන්දර වෙනකල් අහ අහා ඉන්න... එහෙම අඩනවා අහනකොට ඔයාට මොකක් හරි හිතෙයි...'

නංගී මගේ දෙකලවා වලට බරවී නැහිට පහළට ගියාය... ඇය කියා ගියේ පුදුමාකාර දෙයකි... මම එහෙමම දෙනෙත් පියාගත්තෙමි... 'අයියට ආදරේ වෙනුවෙන් අයියගේ ජාතිය අමතක කරන්න පුළුවන්ද...' නංගී ඇසූ ප්‍රශ්නය මගේ හිතේ දෝංකාර දෙන්නට විය...



www.sinhalaelibrary

sl-unlimited.com

www.sinhalaelibrary

# 20

ආදරයක් වෙනුවෙන් හදවතින්ම බැඳුන පසු කළ නොහැකි දෙයක් නැතැයි මම අසා ඇත්තෙමි.... ජීවිතය සත්තක වූ බොහෝ දේවල් කැප කර මිනිස්සු ආදරය පමණක් තෝරා ගන්නා අවස්ථා ඇත. කවර පරිත්‍යාග කරන්නටත් අප අතර ආදරයක් නැත. ඇත්තේ ඒක පාර්ශවික විශේෂ හිතවත්කමක් පමණි. ඒ ඇගේ පැත්තෙනි. මගේ පැත්තෙන් ඇත්තේ මෝඩ නොසළකා හැරීමකි.

මම මටවත් අවංක නැත. මගේ හිත දන දන කරන්නේ බොරුය... මගේ ජීවිතය වඩාත්ම සසල කළ එකම යුවතිය ශහීනාය.... ආදරයක පාටවත් නොදන සිටි මට ආදරය කරන්නට බල කළේ ශහීනාය... මේ පාළු යෝධුන් ජීවිතයේ එවැනි රසබර ලෝකයක් ඇති බව පවා මට පෙන්වූයේ

ශහීනාය...

අද මේ ඉදිරිපස කාමරයට වී ගුටිකා අඬ අඬා ඉන්නේ මට ඒ සියල්ල පෙන්වූ ඇයය.... මේ දුක ශහීනා කෙසේ දරාගන්නවා ඇද්ද... එක පිට එක ඇගේ වතට වැදුනු පහරවල් වල සැර බව මට සිහිවිය.

ශහීනා ඉන්නේ ජීවිතය ගැන කළකිරීය.... නංගී කියූ ලෙස මුස්ලිම් යුවතියකට සිංහල යුවතියකට වඩා වැඩි පවුල් බන්ධන වලට යටත් වෙන්නට සිදුවෙයි. සමහර විට එවැනි යුවතියකගේ දෛවය ඇය හයහතර නොදන්නා කාලයේම කලින් සකස් කර ඇත... ශහීනා අද මේ දුක් විඳින්නේ ඒ දෛවය වෙනස් කර ගත නොහැකිවද...

හමුවෙන හැම වාරයකම මගේ ඇස් දෙස බලාගත් අත බලා ඉන්නා ශහීනා මට කියන්නට හදන්නේ මොනවාද... ඒ දෛවය වෙනස් කර ගන්නට උදව් වෙන ලෙසද...

'අයියේ කෑම කන්න එන්න...'

නංගී ජනේල් රෙද්ද මෑත් කර ශහීනාගේ කාමරය දෙසද බලා කීවාය... කන්නට ගියද පිරියක් නැත.

'පව්... කෙල්ල අද කෑම කන එකකුත් නෑ.. මේ දවස්වල දිගටම පාස්ටින්... දවල්වරුවේ එකවතුර උගුරක් වත් බීලා නැතුව ඉඳලා රෑටත් බඩගින්නේ නිදගනී...'

නංගී කියනා තුරු මට එය සිහි නොවිණි. උදේ සිට හවස් වන තුරු ඇයට උපවාසය... ඇයට කනවා නම් කන්නට වෙන්නේ සවසය... එහෙත් දන් ඇය නිදගන්නට යන්නේ හිස් බඩය...

'මට කන්න බෑ නංගී.... මට බෙදලා තියන්න... බඩගිනි උනොත් මං රෑට කන්නම්...'

'මටත් කන්න බෑ... අද හිතට හරි අප්සෙට්... පව්



කෙල්ල එක්ක කතා කරන්නවත් තියෙනවනම්... අම්මා මොනවා හරි හිතයි... පහළට හිබිල්ලාවත් කටක් හරි කාලා එමු... යන්...'

මම කමිසයක් දමාගෙන පහළට ආවෙමි... තාත්තා තවමත් පැමිණ නැත...

'ඒ දරුවව දක්ක පළවෙනි දවසේ මං හිතුවා හරි වාසනාවන්ත දරුවෙක් කියලා...'

අම්මා මැල්ලුම් හැඳි දෙකක්ම බෙදන අතරවාරයේ කීවාය... ශහීනාව දුටු ප්‍රථම දවසේ මට හිතුනේද ඇය සියළු සැප සම්පත් විඳින වාසනාවන්ත යුවතියක් කියාය... මුල් දවස් වලදී පමණක් නොව අද පවා ඇයට ළංවෙන්නට හිතට මේ තරම් බියක් එන්නේ ඒ සිහිවිල්ල නිසාය.

'ඔහොම ජීවත්වෙනවට වඩා මැරෙන එක ලොකු සම්පතක් අම්මේ... අපේ තාත්තා මට ඔහොම කැඟැහුවනම් මම ඒ වෙලාවෙම මැරෙනවා...'

'චූටිට පිස්සුද... ඕක එහෙම අර දරුවා එක්ක කියනවා නෙමේ... පුළුවන් නම් හිත හදනවා මිසක්...'

'හිත හදන්නවත් කෙල්ලව මේ ගෙදර තියන එකක් නැහැ. හෙට අනිද්දම බන්දලා දීලා පිට කරයි...'

එක බත් කටක් වත් කා ගන්න බැරි තරමට මගේ හිත අවුල් විය. මම බත් පිගනා ඔහේ අතගාමින් හිස බර කර ගෙන උන්නෙමි. නංගී කියන්නාක් මෙන් නිසැකවම ඇයව නුදුරු දිනයකදීම මුස්ලිම් චාරිත්‍රානුලව විවාහ කර දෙනු ඇතැයි මටද සිතුණි.

'ලොකු පුතා ඔය බත් ටික අතගානවා විතරනේ...'

www.sinhalaelibrary.com

අම්මා වේදනාවෙන් කීවාය.

'මට බඩගිනි නෑ අම්මේ...'

'එහෙනම් අත සෝදගෙන යන්න... මම තේ ටිකක් හදලා දෙන්නම්...'

අම්මාත් නංගීත් බලා සිටිද්දීම මම අත සෝදගෙන උඩට ගියෙමි.... මට බත් කටක්වත් කන්නට බැරි වූයේ ඇය නිස් බඩ අඩනා නිසාද... මේ කෙල්ල කෙරේ මේ තරමටම පසුවට හිත්දර ගන්නට ඇය මගේ කවුද... මම ඇගේ කවුද...

'අත්කල් ඉන්නවා නැත්නම් මම කොහොම හරි ශහීනාගේ කාමරයට යනවා... මාව දැක්කොත් කෙල්ල කෑ ගගහ අඩයි...'

'එයාගේ හිතේ තියෙන්නේ බෙදගන්න බැරි දුකක්...'

නංගී කිරි කෝපි කෝප්පය මේසය මත තබා පහළට ගියේ හුල්ලමිනි. රෑ නමයට පමණ මම ජනෙල් රෙද්ද මෑත් කර බැල්කනිය දෙස බැලුවෙමි. ඇගේ මුළු කාමරයම නිසලය... කාමරයේ දල්වෙන මන්දාලෝක විදුලි පහනක එළියක් පමණක් දිග වීදුරු මතට වැටී තිබුණි.

මම කිරි කෝපි කෝප්පයෙන් උගුරක් පමණක් බී ඇඳේ ඇලවුනෙමි... යාංනමට දෙනෙත් පියවෙද්දී තාත්තා ඇයට ගසද්දී ශහීනා කෑ ගැසූ අයුරු මට සිහිවන්නට විය...

පසුවට කටු කම්බි පොටක් වැටී එය පසුවේ ඇණී ඇණී තිබෙද්දී දැනෙනා දුකක් වේදනාවට සමාන වේදනාවක් දැනෙයි. අසරණ ඇය වෙනුවෙන් මේ සංදේශ්ට කළ හැකි දෙයක් ඇත්ද... සිපිංවෙතුගේ පිහිටක් නැති මේ හුදෙකලා රාමලාත් සඳ කුමරියගේ දෛවය මට වෙනස් කළ හැකිද... 'අයියට බැරිද ඒ කෙනාවෙන්න...' නංගීගේ වචන මට සිහිවෙයි.... මම ඇගේ කව්රු වෙන්නද... ඇය මාව ඇගේ කව්රු කරගනීද... අපි ආදරය කරන්නට ගතහොත් ඒ ආදරයට





අනාගතයක් වේද...

විශේෂ ප්‍රචාරයක් දී හදවත විවෘත කර ආදරය කළ යුතු නැත. දැනටමත් මම මගේ මුළු හදවතින්ම ඇයට ආදරය කරමි. මේ පසුවේ තැවරෙන හැඟීම ආදරය නොවේයැයි කියන්නට තරම් මම කුහක නොවෙමි.

මේ ආදරයය... කුරුළු කැලේට මේ රාමලාත් සඳ පායා ආ ද සිට මට නින්දක් නැත. සැනසීමක් නැත.

රෑ දෙළහට පමණ මුළු පළාතම දෙදරවමින් විදුලි කොටමින් වැසි වැටෙන්නට විය... හෙණ පුපුරා ගියේ මුළු කුරුළු කැලේම මොහොතකට විදුලි සැරෙන් එළිය ගන්වමිනි. මම නිරුවත් ළයට කමිසයක් දමාගෙන රහසින් මෙන් බැල්කනියේ දොර ඇරියෙමි...

මගේ දැස් මටම අදහාගත නොහැකි විය. ශහීනා ඔවුන්ගේ බැල්කනියේ තබා තිබූ වේවැල් පුටුවට බරවී දේතින්ම මුහුණ වසාගෙන අඬමින් උන්නාය... ඇයව මට පෙනෙන්නේ වේගයෙන් ගලන වැසි වතුර මැදිනි... ඒවත් බැල්කනියේ විදුලි පහන් නොදල්වේ... මුළු පළාතම තද කළුවරක ගිලී ඇත...

නොසිතූ මොහොතක ශහීනා හිස ඔසවා බැලුවාය... මා ආ බව ඇය දැනගත්තේ කෙසේද... මගේ සුසුම් හඬින් හෝව මා කෑ ගැසුවද ඇයට නොඇසෙන තරම් වැස්සය.

අපේ ඇස් හමුවූයේ තද වැස්සේ තද අඳුරේය... ප්‍රථම වරට මම විනාඩි තුන හතරක් එක දිගට ඇය දෙස බලා උන්නෙමි. ඇගේ මුහුණ අද කවරදාටත් වඩා දුක්බරය.

මොහොතකින් ශහීනා ඇගේ අතේ තිබූ සුදු ටවල් එකකින් මුළු මුහුණම පිසදා සිනාසුනාය.. ඇය සිනාසෙනොවී ඇඬුවා නම් මීට වඩා හොඳය. ඒ තරමටම ඒ සිනාවට පසුව පිච්චී ගියේය.



www.sinhalaelibrary.com

බැල්කනියේම නතර වෙනවාද නැත්නම් යනවාද කියා මම සිතුවෙමි... මේ මහා වැස්සේ මධ්‍යම රාත්‍රියේ එළියට වී අඬනා මේ අහිංසක කෙල්ලව තනිකර නිදගන්නට යන්නට තරම් මට ශක්තියක් නැත...

ඒ පැත්තේ සිට ශහීනා මට නිදගන්නට යැයි ඉඟියෙන් කීවාය... මම ඇගේ කීම ගණන් නොගෙන එතැන තිබූ පුටුවට බර උනෙමි... දැන් මට පෙනෙන්නේ ඇගේ පපුවෙන් ඉහළ කොටස පමණි... ඒද තද වැස්ස අතරිනි...

අපේ ඇස් විනාඩි දෙකක් තුනක් හතරක් එහෙමම එකට හමුවී තිබුණි... ඒ හැම මොහොතකම ඇතුළු හදවත පුරා තදබල දෙදරීමක් සිදුවෙනු මට දැනුණි... රෑ දෙළහට ඇහැරි මේ වැස්සේ එළියට වී කෙල්ලෙකු දෙස බලා ඉඳි මගේ හිත හදන්නේ මේ කුමක් කරන්නද...

ඇය බඩ ගින්නේ බව මම දනිමි... දන්වත් ඇය මොනවා හෝ කනවා නම් හොඳය... නැත්නම් හෙට දවසද ඉන්නට වෙන්නේ බඩගින්නේය... ඇගේ අල්ලා දෙවියන් ඇය දෙස බලන්නේ නැද්ද... ඇයට පිහිටක් වෙන්නේ නැද්ද...

'ක...න්...න...'

මම අතින් ඇයට කන්නට යන්න යැයි කීවෙමි... ශහීනා හිස දෙපසට වැනුවේ බැහැ යැයි කියන්නට මෙනි... කෙල්ල හිතුවක්කාර වී ඇත. එහෙත්.

'ය...න්...න...'

මම ඇයට තරහෙන් කීවෙමි.. විනාඩියකට පමණ පසු ශහීනා නැගිට්ටාය... ඇය කියා ගියේ කෑම රැගෙන එන්නම් මට යන්නට එපා කියාය...

වෙන දවසක නම් මම කාමරයට ගොස් දොරද වසා ගන්නෙමි. එහෙත් අද ගතම මෙතනම තබා ගම් ගා අලවා





තබා තිබෙනා සෙයකි...

ශහීනා යළි ආවේ කිරි පැකට් වැනි යමකුත් බිස්කට් පැකට් එකකුත් රැගෙනය... මුළු දවසම බඩ ගින්නේ සිට මේ බිස්කට් කා ඇත්දැයි මම සිතුවෙමි. එක අතකට පපුවේ ගින්දර තිබියදී බත් කන්නට නොහැක.

'සං...දේ...ශ්... අල්ලන්...න...'

වැස්ස අතරින් ඇය කතා කර කීවාය... මේ කෙල්ලටත් පිස්සුය... ඇය ඒ පැත්තේ සිට විසි කළ කිරි පැකට් එක දමූ සිලි සිලි බෑග් එක මා අල්ලා ගත්තේ අමාරුවෙනි... එහි ඇතුළත චොකලට් බිස්කට් කිහිපයකුත් කිරි පැකට් එකකුත් තව කුඩා කොළ කැබැල්ලකුත් විය... මේ සියල්ල සිලි සිලි බෑගයක දමා ඇය මේ පැත්තට දම්මේ වැස්සට තෙමෙන නිසාය...

ශහීනා කිරි පැකට් එකේ බටය මුව රඳවාගෙන බලා උන්නාය... මම සියල්ලටම පෙර ඇයට නොපෙනෙන්නට එහි තිබූ කොළ කැබැල්ල දිග හැරියෙමි.

'සංදේශ්...'

ඔයා කතා නොකළත් හොඳ යාළුවෙක් නිසා අහන්නේ... මට අද රෑ මැරෙන්න හිතෙනවා සංදේශ්... මම හිතනවා මම මැරුනොත් අඬන්න කව්රුවත් නැහැ කියලා...

එපමණකි... මම ඇයව දමා හළ කරන බැල්මක් මේ පැත්තේ සිට හෙළුවෙමි... මම කෑම කද්දී නංගී කියූ දේ සිහිවිය... 'අපේ තාත්තා මට ඔහොම ගැහුවානම් මම මැරෙනවා...' ඇත්තටම මේ මෝඩ කෙල්ල සිය දිවි නසා ගනීද... මම තෝන්තුවෙන් සිතුවෙමි.

අපේ ජීවිතය නැති කර ගන්නට අපිට වත් අයිතියක් නැත. ඒ අපේ ජීවිත අයිති වන්නේ අපටම නොවන නිසාය.



www.sinhalaelibrary.com

ඒ ජීවිතයේ අයිතිය ඇත්තේ අපට ආදරය කරනා අය ළඟය... එහෙත් ජීවිතයට ආදරය කරන්නට කෙනෙකු නැතිද... ජීවත් වන්නට හිත හද ගන්නේ කෙසේද... ශහීනා හිතනවා ඇත්තේ ඒ ලෙස විය යුතුය...

ශහීනා කිරි පැකට් එකේ බටය දෙතොලතර තබාගෙන බලාගෙනම උන්නාය... ඇය මගෙන් ප්‍රශ්නයක් ඇසුවාය... එයට මං පිළිතුරු දිය යුතුද... දිය යුතු නම් ඒ කවර පිළිතුරක්ද... මගේ තුන් හිතම තෝන්තුවෙන් පිරී ගියේය...

අනෝරාව දන් පොදයක් වී තුනී වී ගොස්ය... එහෙත් වැහි බිරුම එහෙමමය.... මම කිරි පැකට් එක කඩා බටය ඒ තුළට යැව්වෙමි... සීතල වොකලට් කිරි උගුරෙන් වියළි හිස් උගුර තෙමී ගියේය... හෙට හවස වන තුරු ඇගේ බඩට වැටෙන්නේ මේ කිරි උගුරු කිහිපය පමණි... දහවල් කාලය පුරාම නෝම්බි අල්ලන ඇය දවස පුරාම බඩගින්නේය...

කාමරයට ගොස් නිදගන්න යැයි ඇයට කිව යුතුය... ජීවිතය ගැන එක රැයකින් තීරණ ගන්නට යාම මෝඩකමකැයි ඇයට කිව යුතුය... ඇගේ ආගමේ දෙවියන් ගැන පතාගෙන එන ඉරණමක් ගැන උගන්වනවාදැයි මම නොදනිමි. එහෙත් සියල්ලම පතාගෙන ආ ලෙස සිදුවේ යැයි ඇයට කිව යුතුය...

'මං පතාගෙන ආවේ දුක් විඳින්නද.. මේකද මගේ දෛවය... මේ වගේ දුක් විඳින එක මගේ ඉරණම නම් ඒ ඉරණම ඇයි මට වෙනස් කර ගන්න බැරි...' ඇය මගෙන් එසේ අසනු ඇත... කෙල්ලෙකුගේ ජීවිතය ගැන හැඟීම්බරව තර්ක කරන්නට මේ පුංචි සංදේශ් ඉගෙන ගෙන නැත...

ශහීනා කාමරයට ගොස් පොරවනයක් ගෙනවිත් ගත වටා දමා ගත්තේ වැහි සීතල බැල්කනියට තදින් දනුණ නිසාය. හදවත පුරා වාවාගත නොහැකි ආදරයක් නොවේනම් පහන් හැඟීමක් හෝ හෝ ගා මතුවන්නට විය...





මේ රාත්‍රියේ මේ වැහි සීතලේ ඇයව මගේ ළඟ තබාගත හැකිනම්... අපට එකට තුරුල් වී මහේ කියව කියවා ඉන්නට ඇත්නම්... දෛවය ඒ තරම් සරලද... හදවත මේ තරම් බොළඳද... මේ පපුවේ තුනීම පටක ඉරමින් දවමින් ගිනි තබමින් ගලන්නේ මගේ කුළුදුල් ආදරය...ද...

මම හාෆ් ෂීට් කොළයක් ගෙන යළි බැල්කනියේ වාඩිඋනෙමි... බැල්කනිය කළුවර නිසා මම මගේ කුඩා පෙන්ටෝච් එකද දල්වා ගත්තෙමි... එක් වරක් මේ ටෝච් එක ඒ මුහුණට අල්ලා බලන්නට මට සිත්විය... හැඟීම් ගලන්නේ එහෙමය... මම මේ තරම් හිතුවක්කාර බොළඳ සරල ආදරවන්තයෙකැයි මම දැන නොඋන්නෙමි...

ආදරය මාව මලක් නොව මල් පොකුරක් කර ඇත...

කොළ ගත්තේ ඇයට මොනවා ලියන්නද... දන් මොනවා හෝ ලිවිය යුතුය.. ඇය කොළයත් පෑනත් ගෙනෙනවා දුටුවාය...

මොනවා ලිව්ද මට මගේ ආදරයේ දෛවයෝගය මේ කොළයේ ලියා ඒ පැත්තට විසි කළ නොහැක. එය එක පපුවක පමණක් ගලද්දී ඒ පපුවේම මැරී යනු ඇත.

සමහර ආදරයක උප්පැන්න සහතියක් නැත. ඇත්තේ මරණ සහතිකයක් පමණි...

හැම දෙයක්ම දක්කං... නංගිටයි මටයි හරි දුකයි... අද රෑ වෙච්චි දේ ගැන හිතලා ජීවිතේ ගැන අද රෑම තීරණ ගන්නෙපා.... චුට්ටක් නිස්කලංකේ ජීවිතේ ගැන හිතන්න... දන් ගිහිල්ලා නිද ගන්න...

කිරි පැකට් එකකුයි බිස්කට් දෙකකුයි කාලා මදි නේද...

එපමණකි.. ඊට වඩා බරපතල යමක් ඇගේ ලෙඩ පපුවට දමිය යුතු නැත. ගින්දර යැයි දැන දැන හදවතක් මතට පිදුරු දමිය යුතු නැත. කළ හැකි එකම දේ හොඳ



www.sinhalaelibrary.com

යාළුවෙක් ලෙස ශහීනාට හිත හදාගෙන ඉන්නට උදව් කිරීමය. ඇය දුක් විඳින්නේ ඇයි දැයි මම හරියටම නොදනිමි.

මම හාල් මිටි කැබැල්ල දෙකට තුනට හතරට පහට දහයට නමා එය මගේ මේසය මත මා තබාගෙන උන් අත්ලප් තරම් වූ කුඩා වළස් පැටවාගේ බඩට තබා රබර් බෑන්ඩ් එකක් දැමුවෙමි. නැත්නම් බරක් නොමැතිව ඒ පැත්තට ඒ කොළය විසි කිරීම දුෂ්කරය...

ශහීනා දැස් දල්වාගෙන බලා උන්නාය... මම වළස් පැටවාව ඒ පැත්තට විසි කළෙමි. එය ගොස් වැදුනේ හරියටම ඇගේ පපුව මැදය... ඇයට ලිපිය කියවන්නට තරම් එළියක් බැල්කනියේ නැත. මම මේ පැත්තේ සිට ටෝච් එක ඇය දෙසට ගැසුවෙමි... කවාකාර විදුලි පහන් එළිය ඇගේ සඳ මුහුණ මතට වැටී අඳුරු මද කහපැහැ ගත් සඳක් සේ වැටුණි. ශහීනාගේ ඇස් වලින් උතුරන කඳුළු ඒ එළියෙන් මම අපූරුවට දැක ගත්තෙමි... ආයාචනාත්මක ආරාධනාවක ගැහැණු බැල්මක ආත්මයම ඒ දැස්වල තිබුණි...

ශහීනා මගේ අකුරු කියවන්නට ගත්තාය... ඒවා කැත අකුරුය. ලිපිය කියවා ශහීනා දෙනෙත් එසෙව්වාය. දකුණු තල්ලට තබා ඇය කීවේ නිදාගන්නට බැරි බවය... මටද නින්ද ගත නොහැක... කොතරම් දුකක් වුවද අද රෑ ලස්සනය.

ශහීනා අළුත් කොළයක් ගෙන මොනවදෝ ලීවාය. දැන් ඇය හදන්නේ මේ මහ රෑ බැල්කනි දෙක අතර ගුවන් තැපැල් සේවයක් දමන්නටය... කොයි මොහොතක හෝ ඇගේ පියා කාමරයෙන් මතුවී මටද බැණ වදිනු ඇත.

ශහීනා වළස් පැටවාගේම බඩේ කොළ කැබැල්ල ගසා මගේ පැත්තට දැම්මාය. ඇය පාසලේදී නම් නෙට් බෝල් හෝ වොලි බෝල් ගසා තිබෙන්නට ඇත. නැත්නම් මේ තරම් අපූරුවට අතටම පාස් කරන්නට කෙල්ලෙක් දන්නේ නැත.





සංදේශ්...

ජීවිතේ ගැන නිෂ්කලංකේ හිතන්නේ කොහොමද... මොනවද හිතන්නේ... මං කා එක්කද එහෙම හිතන්නේ... මට කියලා දෙන්න බැරිද...

අඳුම ගානේ හිතන්න මං ඔයාගේ ලොකු නංගි කියලා. මට කියලා දෙන්න සංදේශ් අයියේ...

ඔයා දන්නවද මගේ මේ කඳුළු වල ඔයා හිතන්නේ නැති දෙයක් තියෙනවා. ඔයාට කියන්න බැරි දෙයක් තියෙනවා. ඔයාට නිදිමත නම් ගිහින් නිදාගන්න.... මට නම් පොඩ්ඩක් වත් නිදිමත නෑ...

මට මේ රෑ කා ගැනද හිතෙනවා... පාන්දර වෙද්දී ඒ කවුද කියලා හරියටම හිතලා මම තීරණය ගන්නවා...

වළස් පැටියාව මට ආපහු එවන්න. ඌ හරියට ඔයා වගේමයි... අහිංසකයි. චූට්ටක් නපුරු පාටයි. ඒ වුනාට ඒ වළස් පැටියාට මං හරි ආදරෙයි...

ඇගේ ලිපියේ අවසාන පද පේළිය අතර දැස් නැවතුණි. ඇය ආදරේ වළස් පැටියාට විතරද... ශහීනාගේ මේ පැහැදිලි සිංහල අකුරු වලින් මට ලියා එවා ඇත්තේ ඇයට ජීවිතය ගැන හිතන්නට උදව් කරන ලෙස නොවේද...

ජීවිතේ සිද්ධ වෙන දේවල් වෙනස් කරන්නම අමාරු නම් හිත හද ගන්න... ඔහොම හුල්ලලා විඳවන්න එපා... ජීවිතේ එක කාලයක හැමෝටම දුක් විඳින්න වෙනවා. ඒක වළක්වන්න බෑ....

වළස් පැටියා ඒ ලිපියද බඩේ බැඳගෙන ඒ පැත්තට ගියේය... මේ කෙල්ලට කොහොත් කීවද අහන්නේම නැත.



www.sinhalaelibrary.com

එළි වෙන්නට තව හෝරා කීයක් තිබෙනවාදැයි මම නොදනිමි.

මං ඔයා කියන දෙයක් අහන්නම්... ඒත් මේ හැම දෙයක්ම දවසක මාව ළඟින් තියාගෙන මට කියලා දෙන්න... මට ඔයා ළඟට වෙලා අහන් ඉන්න දෙන්න...

කවදද අපි හම්බවෙන්නේ.. ලෝකෙටම පේන්නේ නැතුව අපි හම්බ වෙන්නේ කොහේදීද...

මං කියන්නද...

සෙනසුරාද උදේ... මං ස්ටේෂන් එක ගාව ඉන්නම්... අපි පුංචි කෝච්චියේ අවිස්සාවේල්ලට යන්... දවසක් යාළුවෙක් කිව්වා එහෙම යන්න පුළුවන් කියලා...

එනවා කියලා කිව්වොත් බබා ගිහිල්ලා නිදා ගන්නවා... එහෙම බලාපොරොත්තුවක් පුංචි සහනයක් මේ කෙල්ලට ඕන සංදේශ්...

මට මැවී පෙනුනි. ඒ ඇයව ළඟ තබාගෙන පුංචි කෝච්චියේ අවිස්සාවේල්ලට යනවා මට මැවී පෙනුණි... ශහීනාත් දන්නේ පුදුමාකාර දේවල්ය... කුරුළු කැලේට පැමිණ වසරක් ගතවිය. මේ පුංචි කෝච්චිය ගැන මම නොසිතුවෙමි.

ශහීනාට තමන් ලියා යවන්නදැයි නොතේරේ... ඇගේ හමුවීම අපේ හදවත් වලට අත් සහනයක් වේවිද... නැත්නම් ඊටත් ගින්දරක් වේවිද... මේ ලෙස සසරේ... නොවුල් අතරේ... පෙම් වියෝග දුක් විඳින්න ඇයිද හමුවූයේ... ඒ සින්දුව මට සිහිවිය. කෙළවර වියෝගයක් නම් හමුවීම පලක් නැත.

සියල්ලටම පෙර ඇයව නින්දට යැවිය යුතුය.

මං එන්නම්... දැන් ගිහිල්ලා මොනාහරි කාලා නිදාගන්න...

පිරියක් පමණ වලස් පැටවා ශහීනා තබා ගන්නාය... ඊ ළඟින් දවසක මගේ පැත්තට ඇය එවනු ඇත...





එහෙත් දවසක කොහෙත් හෝ නතර වේ..

ශහීනා බැල්කනියෙන් නැගිට තවත් විනාඩියක් පමණ බලා උන්නාය... ඒ මුහුණේ යංතමට මදහසක් නැවරී ඇත...

'ඔ...ය...ත් නිදගන්න...'

පොදයට අත අල්ලා ශහීනා කීවාය... මමද නැගිට්ටෙමි. අපි කාමරවල දෙරවල් වසා නොගෙනම ඇඳවල් වලට වැටුනෙමු.

සෙනසුරාදට ස්ටේෂන් එකට මම එනවා යැයි කීවේ ඇයි... එය කොතරම් භයානක වැඩක්දැයි තේරෙන්නේ දැන්ය. එවැන්නක් ආරංචි වුවහොත් ඇයට ගෙදරින් තවත් ප්‍රශ්න එනු ඇත. දැන දැන ඇයට ගින්දරක් දුන්නා යැයි මට සිතුණි.

එහෙත් දැන් කිසිවක් කර පලක් නැත. මම ඇයට එදට එනවා යැයි පොරොන්දු වී අවසානය.

මැදියමේ ඉකිරි හෝරා කිහිපයත් ඇහැරිගෙනම ඉන්නවායැයි මම සිතා ගත්තෙමි...

Sl-unlimited.com

www.sinhalaelibrary.com

sl-unlimited.com

# 21

"**අ**යියා රෑ නිදගත්තේ මේ දොර ඇරගෙනද...'

නංගී පාන්දරම පැමිණ ඇසුවාය. රාත්‍රිය පුරාම ඇහැරි උන් නිසා මට නින්ද ගියේ පාන්දරය..

'නෑ.. දත් ඇරියේ...'

නංගී මගේ වචන විශ්වාස කළේ නැත. මගේ මෙන්ම ශහීනාගේ කාමරයේද එළියේ දොර විවර වී තිබුණි...

'ආ... තේක බීලාආයින් නිදගන්න... රෑ ඇහැරිලා ඉඳලා නිදිමත ඇතිනේ...'

ඇය කීවේ සිනාසීගෙනය. මම එක උගුරට තේක බීගෙන බිහෙත ගියෙමි.

'මං අද ගිහිල්ලා කෙල්ලගෙන් විස්තර අහගන්නම්...





එහෙම දෙයක් වෙන්න ලොකු හේතුවක් තියෙන්න ඕන...'

'ඔයා එහේ ගිහිල්ලා ප්‍රශ්න ඇති කර ගන්න එපා...'

'නෑ...'

නංගී උදේ නමයට පමණ ශහීනාගේ පියා පිටත් වූ පසු ඒ ගෙදරට ගියාය... මම ඇඟ සෝදගෙන අළුත් සරමක් දගෙන පහලට ගියෙමි.

'මොකෝ අද දවල් වෙනකල් ලොකු පුතා නිදගත්තේ...'

අම්මා බැදෙන බිත්තර උඩින් ගම්මිරිස් කුඩු ඉසින අතරවාරයේදී ඇසුවාය...

'රෑ වැඩිය නින්ද ගියේ නෑ අම්මේ...'

මම අවංකව කීවෙමි..

'හෙට ඒ ලෙවල් රිසාල්ට් අවුට් වෙනවා කියලා උදේ ප්‍රවෘත්ති වලට කිව්වා...'

'නෑ...'

'ඔයා පාස් වෙලා තියෙයි...'

අම්මා බලාපොරොත්තු සහගතව කීවාය.

'ඒත් කැම්පස් යන්න මගේ හිතක් නෑ අම්මේ.. මම මොනා හරි කරන්න ගන්නවා... අම්මා දන්නවද කැම්පස් සිලෙක්ට් උනත් ඒකට ඇතුල් වෙන්න තව අවුරුද්දක් විතර ඉන්න වෙනවා. ඊට පස්සේ අවුරුදු හතරක් එතනට පහමාරයි. ඒකෙන් පස්සේ ෆයිනල් රිසාල්ට් එන්න තව මාස හයක් යනවා. එතකොට අවුරුදු හයයි. උපාධිය ඉහළින්ම පාස් උනත් රස්සාවක් දෙනවමයි කියලා සහතිකයක් නෑ... එච්චර කල් සාන්තට තනියම ඇදගෙන යන්න දෙන්න බෑ...'



www.sinhalaelibrary.com

අම්මා කිසිවක් කීවේ නැත. මම බිත්තර බුල්සයි එක සමඟ පාන් පෙති දෙකක් පමණක් කෑවෙමි.

හෙට උසස් පෙළ ප්‍රතිඵල එයි. ජීවිතේ එක් අභියෝගයක ප්‍රතිඵල සමඟ එතැනින් එහා අනාගතයට යා යුතු බව මට වැටහිණ. අනාගතයේදී කුමක් කරනවාද කියා හරියටම හෙට්න් පසු තීරණය කළ යුතුය.

තවත් ඉගෙන ගන්නට තිබුණේ දැඩි අකමැත්තකි. ඉගෙන ගන්නට එපා වෙන්නේ උගත්කමේ දුක් මහන්සියට තැනක් නැති බව දකිද්දීය...

නංගීත් ශෙහිනාත් කාමරයේ කතා කරමින් සිටිනු මට පෙනෙයි. මම ඇඳ විට්ටමට කොට්ටයක් තබා ඇලවුනෙමි. සෙනසුරාදා ඇයව හමුවන්නට යන්නේ උසස් පෙළ ප්‍රතිඵලත් දැනගෙනය.

නංගී නැවත ආවේ පැයකට පමණ පසුය. ආ හැටියේම ඇය බැලුවේ මගේ මේසය දෙසය...

'ඇ..යි මොනවද...'

මම ඇසුවෙමි.

'නෑ... මෙතන තිබ්බ වළල් පැටියා කෝ...'

නංගී පැකිළුනුව මගේ දෙනෙත් දෙස ප්‍රශ්නාර්ථකාරීව බලා ඇසුවාය. වළල් පැටවා ශෙහිනා ළඟ තිබෙනවා නංගී දකින්නට ඇත.

මම කතා නොකළෙමි. නංගීට වංක වන්නට තරම් මම වංචාකාරයෙක් නොවූනෙමි. එහෙත් රාත්‍රිය පුරා සිදුවූ දේ ඇයට විස්තර කිරීමටත් මට නොහැක.

'මං කියන්නද දන් ඌ ඉන්නේ කොහෙද කියලා... අර කාමරේ ඇඳ ළඟ චූටි කබඩ් එක උඩ... කෙල්ල ඒකට තහ පාට පොඩි බෝ එකකුත් ගැට ගහලා...'





මම හිස් බිත්තිය වෙත හැරී සිනාසුනෙමි. ශෙහිනා සමඟ හොර වැඩක් කළ නොහැක. ඇගේ අතින් රහස් හෙළිවේ...

'ඒයේ සිද්ධ වෙච්ච දේවලුයි. අද උදේ කෙල්ලගේ මූණේ තියෙන සැනසිලි පාටයි කොහොත්ම සසඳන්න බැහැ... ඊයේ රෑ අරම අඬපු කෙල්ල අද මෙහෙම ඉන්නේ රෑ මොනවා හරි වෙන්න ඕන... ඒ පැත්තෙන් මොනවා හරි මේ පැත්තට ආවද කියලා නම් පිළිගන්න පුළුවන්. ඒත් ම..ට.. පු..දු..ම මේ පැත්තේ හිටපු වළල් පැටියා ඒ පැත්තට ගි...ය එ...ක..'

නංගීගේ ආල වට්ටම් දත් වැඩිය.

'ඒ..ත්... අ..යි...යේ...'

මේ වන තුරු සරළව සිනාසෙමින් විහිළු කරමින් උන් නංගී එකවරම බැරෑරුම් වූවාය... ඇය මේ කියන්නට තටමන්නේ කුමක්ද... මගේ හිත ගැස්සිණ..

'වේලාසන ඔයා කිව්ව කතාවල පොඩි ඇත්තකුත් තියෙනවා...'

වේලාසන මම කීවේ මොනාවාද... මට දන් මතක නැත.

'මොනාද මම කිව්වේ...'

'අඩලා දෙඩලා වෙනස් කරගන්න පුළුවන් තීරණ ශෙහිනාගේ ජීවිතේ නෑ..'

මමද එය දන්නෙමි. අපි හය හතර නොතේරෙන වියේ සමතල පැටව් නොවූනෙමු. මේ ජීවිතයයි...

'ඒක ඔයා දැනගන්න ඕන...'

'කෙල්ල ඒක දන්නවා... අයියා මට ඇත්තම කියන්න... මොනාද ශෙහිනට කිව්වේ...'

www.sinhalaelibrary.com

නංගී ඇසුවේ බැරෑරුම්වය... මම පුටුපත්ත හියපොත්තෙන් සිරුවෙමි...

'එයාට මං තේරුම් කරලා දෙන්න උත්සාහ කළා... අපිට පුළුවන් එච්චරයි...'

'ම..චි.. එකතින් එහා අයියා යන්න එපා.. මං ආස නැහැ ඔයා දුක් විඳිනවා බලන්න... අපිට ඉන්නේ ඔයා විතරයි...'

මම ප්‍රථම වරට නංගී දෙස බලාගත්වනම බලා උන්නෙමි. මෙතෙක් දවසක් ශහිනාව මට ජෝඩු කරන්නට බොළඳ කෙල්ලෙකු මෙන් විහිළු කළ ඇ අද මේ තරම් බරෑරුම් දෙයක් කීවේ ඇයි. එසේ කීවේ ඇයිදැයි කියා අසන්නට මට නොහැක.

'හෙට ඒ ලෙවල් ප්‍රතිඵල පිට වෙනවා...'

නංගී අම්මා කියූ දේම සිහිකළාය... ඇයට දැන් අවශ්‍ය වී ඇත්තේ මාතෘකාව වෙනස් කරන්නටය.

'අම්මා මට කිව්වා...'

'ඔක්කොම අමතක කරලා දලා අපි අලුතෙන්ම මොනාහරි හිතමු... කැම්පස් සිලෙක්ට් නම් මොකුත් ඕන නෑ... නැත්නම් තව පාරක් ඒ ලෙවල් කරමු.. ඒත් මං හිතන්නෑ ඔයාට ඕනවෙයි කියලා...'

අනාගතය ගැන සිතද්දී මට ශහිනාව ඉබේම සිහිවෙයි. අනාගතය ගැන හිතනවා නම් ඇය ගැනද විශේෂයෙන්ම සිතිය යුතු යැයි මට සිතෙන්නේ ඇයි...

'මට අද ඔයා ගැන හරියට බය හිතුනා... ඇයි කියලා මගෙන් අහන්න එපා...'





නංගී ඒ වචන ටික කියා කාමරයෙන් ගියාය... මගේ මළුව තෝන්තු විය. ඇය එසේ කීවේ ඇයි... නංගීට මං ගැන බියක් දැනුනේ ඇයි... මේ සියල්ල ශහිනා හමුවූ පසු සිතෙන්නේ ඇයි...

Sl-unlimited.com
www.sinhalaelibrary.com

sl-unlimited.com

www.sinhalaelibrary.com

# 22

ඒ සාමාර්ථයකුත් බී සාමාර්ථ දෙකකුත් සී සාමාර්ථයකුත් සමඟ මම උසස් පෙළ සමත් වී තිබුණි. ප්‍රතිඵල ගැන මම බිනාවාටත් වඩා සැහසෙමි... අවුරුදු දෙළහක පාසල් ගමනේ අවසාන ප්‍රතිඵලය මේ තරමින් වත් ලබාගන්නට හැකි වීම ගැන සතුටු වූනෙමි...

'උඹට නම් කැම්පස් පුළුවන් වෙයි..'

උපුල් මගේ කරට අතක් දමා කීවේය. ඔහුට තිබුනේ සාමාන්‍ය සාමාර්ථ හතරකි. ඒ ගැන විශේෂ දුකක් ඔහුට තිබුනේද නැත. හැමෝම හිත හදාගෙන ජීවිතයට මුහුණ දෙන්නට හිත හදාගෙනය...

'තවම ලකුණු ආවේ නැනේ.. සමහර විට මදිවෙයි...'







මම සැහැල්ලුවෙන් කීවෙමි.

'ලකුණු ආවම බලපන්... උඹ සිලෙක්ට් වෙලා ඉඳී... දන් පිස්සු හිතන් නැතුව කැම්පස් යන්න ලෑස්ති වෙයන්...'

'හිතුනොත් තමයි...'

පාසල් වත්තේ වැටී තිබූ අළුත් කොට්ටම්බා ගෙඩියක් ගෙන ඈත පිට්ටනිය මැදට වේගයෙන් විසි කර මම කීවෙමි.

'අර මුස්ලිම් කෙල්ල ගැන උඹ හරියට හිතනවා නේද...'

උපුල් සිනාසී කීවේය. 'මචං හරියට හිතනවා..' ඇත්ත ඇති සැටියෙන් කියනවානම් එසේ කීව යුතුය...

'එහෙම දෙයක් නෑ...'

'මුස්ලිම් කෙල්ලෙකුට එයාලගේ ජාතියෙන් ආගමෙන් පිට කෙනෙක් ගැන හිතන්නවත් බෑ.. සිංහල කොල්ලෙක්ව කවදාවත් බෑනා කෙනෙක් විදිහට මුස්ලිම් අම්මා කෙනෙක් තාත්තා කෙනෙක් පිළිගන්නේ නෑ... ඒ වගේම තමා මුස්ලිම් කෙල්ලෙක්ව කවදාවත් ලේලි කෙනෙක් විදිහට සිංහල ගෙදරකින් පිළිගන්නෙත් නෑ.. අත් ඇරලා දාපන් සංදේශ්...'

සියඹලා ගහට බරවී උපුල් කීවේය. මම ඒ අසල වූ සිමෙන්ති පඩියේ වාඩි උනෙමි.

'ඇයි උඹ මාව බය කරන්නේ...'

'උඹේ හිතේ මොනාවත් නැත්නම් මොකටද බය වෙන්නේ.. ලව් කරන්න ඕන තරම් සිංහල කෙල්ලෝ නැද්ද සංදේශ්...'

උපුල්ගේ කතාව කුරිරු කතාවක් ලෙස මට පෙනුණි.

'ලව් එක පැත්තකින් තියපන්... ඒත් අපි ඔක්කොම මිනිස්සු.. ඉස්ලාම් ආගම කියන්නේ හරි පවිත්‍ර ආගමක්...'

'සිංහල කොල්ලෙක් වගේ කතා කරපන් සංදේශ්... මට නම් සැකයි උඹ ජාතියත් පාවා දෙයි කියලා...'

'මිට ජාතියක කෙල්ලෙකුට ආදරේ කරනවා කියන්නේ ජාතිය පාවා දීමක්ද...'

මම තරමක තරහකින් ඇසුවෙමි.

'තමන්ගේ වාසියට ජාතියයි ආගමයි බාල්දු කරන්න එපා සංදේශ්.... උඹ ඒක කළත් කවදාවත් මුස්ලිම් කෙල්ලෙක් ඒක කරන්නෑ... උඹ තරහ වෙන්න එපා... ඒක තමා ඇත්ත...'

එතනින් එහා මම උපුල් සමඟ තර්ක කරන්නට නොගියෙමි. අපි ඉපදුන පසු අපිට ලැබෙන ජාතියත් ආගමත් අපේ ජීවිතය තීරණය කරන එකම බලවේගයද...

'මං යනවා...'

මම හිස් හැඟීමෙන් හයියෙන් නැගිට්ටෙමි.

'උඹ ඔය යන්නේ මා එක්ක තරහ වෙලා...'

උපුල් දුකෙන් කීවේය...

'අනේ නෑ මචං... ඒත් මට හරි පුදුමයි.

'උඹ ලෝකේ ගැන දන්නේ නෑ මස්සිනා ඒකයි උඹට පුදුම... ටිකක් ඇස් ඇරලා බලපන්...'

උසස් පෙළ සමත් වීම නිසා හදවතේ අහිවූ සතුටත් තවත් කවර හෝ කාරණාවක් නිසා හදවතේ පැත්තක වූ ගින්දරක් සමඟ මම ගෙදර ආවෙමි.

කුරුළු කැලේ ගුරු පාර දිගේ එද්දීම ශෂීනා ගේට්ටුව අසළ උන්නාය. ඈය දුර සියාම සිනාසුනාය.

'මොනාද රිසාල්ට්...'





තරමක් පහත් හඬින් ශෂීනා ඇසුවාය. ඈය එය අසන්නටම මෙතනට වී සිටින්නට ඇත. මගේ ප්‍රතිඵල ඒ තරමම වැදගත්ද...

'ඒ එකයි බී දෙකයි සී එකයි...'

මම පිළිතුරු දුන්නෙමි.

'සුවර් යුනිවර්සිටි මං මාක්ස් හදලා කියන්නම්... මගේ සුබ පැතුම්...'

ඒ දෑස් දුල්වේ. එහෙත් එකවර එදෙස බලා සිටිය නොහැක.

'තැන්කියු...'

'හෙ..ට... ඒ..න..ව.. නේ..ද...'

ඇසෙන නොඇසෙන තරම් පහත් හඬින් ශෂීනා ඇසුවාය. ඒ දෑස්වල ආයාචනාත්මක බවක් විය. පිටුපා යා නොහැකි හැඟීමක් විය.

'එ..න්..නා...ම්...'

එපමණක් කියා මම ගේට්ටුවේ ලොක් එක පැන්නුවෙමි.

'පොඩි පාටියක් දමු නේද අම්මේ... මට නම් හරි සතුටුයි...'

ප්‍රතිඵල ඇසූ නංගී කීවාය... අම්මාද උන්නේ සතුටෙනි.. මට එවැනි විශේෂ සතුටක් නොඑන්නේ ඇයි...

'පාටි දන්න මොනවත් උනේ නෑ නංගී... මේ රිසාල්ට් ආවා කියලා මොනවත් වෙනස් වෙන්නේ නෑ...'

'නිකං හිටියොත් වෙනස් වෙන්නෑ තමා වෙනස් කර ගන්න ඕන...'

නංගී කියන්නාක් මෙන් ජීවිතයද එවැනි වෙනසක් බලාපොරොත්තුවෙන් සිටි. ඒ කවරාකාර වෙනසක් දැයි මම නොදනිමි.



www.sinhalaelibrary.com

අම්මාත් නංගීත් උන්නේ මගේ ප්‍රතිඵල කියන්නට තාන්නා එන තුරුය.

සිකුරාද රාත්‍රියේ සිටම මගේ හිත තිබුනේ අසහනයෙනි. ශනීතාව සෙනසුරාද හමුවන්ට පොරොන්දු වූ එක මහා මෝඩකමකැයි මට සිතුණි. පිළිවෙළකට හැදෙන යුවතියකට එවැනි ගමනක් කිසිසේත්ම නොගැළපේ. ඊටත් එවැනි ගමනකට ඇයව මා පොළොඹවනු ලැබුවේ යැයි මට හැමවිටම සිතුණි. සමහර විට නංගී අරම නොකීවා නම් මට මේ තරම් බියක් නොදනෙනු ඇත. එහෙත් ඇය කීවේ බොරු නම් නොවේ.

මතුපිටින් මේ ගමනට කොතරම් අකමැත්තක් තිබුනද මම ඇතුළතින් ඒ ගමන යන තුරු බලා උන්නෙමි. මටත් හොරෙන් හිත මේ ගමන ගොස් තිබුණි... ජීවිතේ කිසිම දවසක නොවිඳි සමනල රසබර බවකින් තුන් හිතම පිරී ගොස් තිබුණි.

අප හමුවන්නේ ඇයි... අපට කතා කරන්නට ඇත්තේ මොනවාද... ඒ කාතබහ කෙළවර වන්නේ කොතනින්ද. මම කිසිවක් නොදනිමි. ඇයද නොදන්නීය.

එහෙත් ඇයට මම පොරොන්දු වුනෙමි. ඒ පොරොන්දුව කැඩීම සරල පහසු දෙයකි. කුඩා වුවද ජීවිතේ වූ ප්‍රථම පොරොන්දුව එසේ කඩන්නට මම අකමැති වීමි.

අවසානයට හදවත ගෙදර තබා මේ ගමන යන්නට මම සෙනසුරාද පාන්දර තීරණය කළෙමි...

www.sinhalalibrary
Sl-unlimited.com

sl-unlimited.com

www.sinhalaelibrary

# 23

සෙනසුරාදවට පහත් වූයේ මහ වැස්සක්ද සමගිනි. අනෝරාව කඩා වැටුණේ රබර් ගස් කරටි කඩාගෙනය... පාන්දර වැටෙන වැස්සට මේ තරම් හෙණ පිපිරීම පුදුමයකි... හදිස්සිම වැඩක් නැත්නම් අද වැනි වැහිබර අඳුර රජයන දවසක කාමරයට කොටුවී ඇඳේ දිගාවී ගුලිවී පොතක් බැලීම සුන්දර වැඩකි...

කුඩයකට පවා ඔරොත්තු නොදෙන තරමට වැස්සය... එක අතකට වැස්ස එක හොඳය... ඒ පිට දමා මට ස්ටේෂන් එකට නොයා සිටිය හැක...

මේ වැස්සේ ගවුමක් සල්වාර් කමීසයක් ඇඳගෙන පාරට බැසීම සබනුත් නැතුව නා ගැනීමකට සමානය. ඒ නිසා අද

ඇයද ස්වේෂන් එකට නොයනු ඇත. ස්වභාව ධර්මයා හරස් වී හෝ අපේ හමුවීම වැලකුණ එක හොඳයැයි මට සිතුණි... ඒ පැත්තේද ගින්දරය. මේ පැත්තේද ගින්දරය. අප එක් වූ තැන ගිනි ජාලාවකි. මට කොහොමත් එකය. මට දුක ඇය පිළිබඳවය...

පිළිවෙලක් පිළිවෙලක් ආදරය කරන්නට හැකිද...? මේ අස්සට ආදරයක් ආවේ කෙසේද...? ඇය පතන්නේ ජීවිතය ගලවා ගැනීමට උපකාරයක් මිසක ආදරයක් නොවේ. මුස්ලිම යුවතියකට සිංහල කොල්ලෙකුට ආදරය කිරීම සපුරා තහනම් බව ඇය නොදන්නේද...

ගලක් පැමිණ සලාං ගා වීදුරුවේ වැදුණි. මම ඇඳෙන් පැන බැල්කනියේ දොර ඇරියෙමි. හිරි කඩ මාව එහෙම පිටින්ම හීතල කළේය...

ශහීනා එහා පැත්තේ බැල්කනියේ උන්නාය. දෙයියනේ ඇඳ ඇඳගෙන අවසානය. මා තවම සරම පිටිනි. එලෙස සල්වාර් ඇඳුමක් දවටාගෙන මේ අනෝරාවේ ඇය යන්නේ කෙසේද...

අප දෙදෙනා අතරිනුත් හෝ ගා වැස්ස කඩා වැටෙයි. ඇය ඒ පැත්තේ සිට මොනවදෝ ඉඟිබිඟියෙන් කීවාය. ශහීනා කියන්නේ කුඩයක් ඉහලාගෙන එන ලෙසය... මේ වැස්සට කුඩ මරොත්තු නොදේ...

අප හමුවන්නේ ඇයි දැයි මෙතන සිට කෑගසා අසන්නට මට සිතුණි. තේරුමක් නැති හමුවීමක් ජීවිතයට කොහෙත්ම වැඩක් නැත. හුදෙකලා මේ පාළු සිතට ඇය පිළිබඳ මතකය පමණක් ඇතිය. මේ සුන්දර රමලාන් සඳ මගේ ඇස්මානයේ කාලයක පිපී තිබුණි.

මට එන්නට කියා ඇය බැල්කනියෙන් නොපෙනී ගියාය. හිරිකඩ ගලන බැල්කනියේ දොර වසා දමා මම ඇඳට බර





වූනෙමි...

ජීවිතයේ සිදු වන හැම දෙයකටම තේරුමක් තිබිය යුතුය... එහෙත් ජීවිතයේ සිද්ධ වෙන මේ දේ වල තේරුමක් නැත.

වැස්ස තවත් වැඩි විය... මම අසරණව යළි බැල්කනියට ආවෙමි... ශහීනා වැස්සේම කුඩයක් ඉහලගෙන ගෙදරින් පිට වූවාය... ඇය මේ කොහේ යනවා කියා ගෙදරින් පිට උනාදැයි මම සිතුවෙමි. මේ වැස්සේ ගෙදරින් ඇයව පිට කිරීම පුදුමයකි...

ශහීනා දුන් කෙළින්ම යන්නේ දුම්රිය නැවතුම් පලටය. මම පමා උනොත් ඇය මේ වැස්සේ ස්ටේෂමේ තනිවෙනු ඇත...

'මේ වැස්සේ අයියා කොහේ යන්නද... යනවා කියා එළියට බහින්නවත් බෑ...'

නංගී කියන්නේ ඇත්තය. මේ වැස්සේ ගෙදරින් පිටවෙන්නේ මෝඩයෙකි... එහෙත් මම ඇයට පොරොන්දු උනෙමි...

'යාළුවෙක්ට මං එනවා කිව්වා... වටුමේ එයා බලාගෙන ඇති... පව්නේ...'

මා කියනා දෙය පිළිගත් බවක් නංගීගෙන් පළ නොවිණි. මා මේ ගෙදරට බොරු කියන ප්‍රථම වතාවය...

'කොහේ ගියත් කමක් නෑ තෙමෙන්නෙපා... ඉන්න මං මගේ කුඩේ ගෙනත් දෙන්න...'

නංගී දුන් කුඩයද ඉහලාගෙනම අම්මාටවත් නොකියා මම ගෙදරින් පිට උනෙමි... වැස්ස වහින්නේ හරහටය. මම කුඩය පැත්තකට අල්ලා ගත්තෙමි. එහෙත් වැහි පොද කුඩය යටින් මුහුණට වදියි.

පරිසරයේ තිබූ හීතල පපුවේ තිබුනේ නැත. ජීවිතයේ



www.sinhalaelibrary.com

ප්‍රථම වරට මම කෙල්ලෙක් හමුවන්නට යන්නෙමි. ඒ හමුවීමේ රස්නය පපුවේ විය.

මේ යන්නේ ශහීනාගේ පපුවේ ඇති ගින්දර මගේ පපුවට දමා ගන්නද... අනාගතයක් නැති බැඳීමක් වෙනුවෙන් දුක් විඳීම තේරුම් ඇති වැඩක්ද... ශහීනා අද හමුවී මට කියන්නට යන්නේ මොනවාද... අපට කතා කරන්නට ඇත්තේ මොනවා ගැනද... මේ මහා වැස්සේ මා ඇයට හමුවන්නට යන්නේ මේ කිසිවක් නොසිතාය...

මම පුංචි කෝච්චිය යන සිල්පර කොට දිගේ කුඩයත් ඉහලාගෙන ඇවිදගෙන ආවෙමි... හතර වටින්ම වැස්සය... 'ලෙව්කෝ මැතිඳු අද තනියම වෙල මැද්දේ...' සිංහල සාහිත්‍ය පාඩමෙන් මතක තිබූ කවියක් මට සිහිවිය...

වැස්ස අතරින් මම ශහීනාව දක ගත්තෙමි... ඇය අද කහ කිරිල්ලියක් මෙනි... පාළු දුම්රිය අංගනය කෙළවර වැස්සට තෙත් සොමාගෙන ශහීනා උන්නාය... මම ගමන බාල කර ඇයව ඈත සිට රස වින්දෙමි...

ජීවිතේ කෙදිනකවත් මෙසේ ගැහැණු රුවක් කෙරේ මගේ හදවත ලොබ වී නැත. ඇය ආ දවසේ සිට ඇස් තිබුනේ ඒ මුහුණටම ඇලවීය... මම සිල්පර කොට උඩින් පැන දුම්රිය ප්ලැට් ෆෝම් එකට ගොඩ උනෙමි. ශහීනා උන්නේ දුම්රිය අංගනයේ එහා කෙළවරේය. මම මෙහා කෙළවරේය.

'කෝච්චිය එන්නේ කීයටද...'

ඈතදී බලා උන් තරම් ආශාවකින් ලොබකමකින් දුන් බැලිය නොහැක. ශහීනාගේ ඇස් මගේ මුහුණ මතය... අපි විකන් වික දුම්රිය අංගනය මැදට ආවෙමු...

ලස්සනට සිනාසෙන්නට සංදේශ් දන්නේ නැත. ඇය දන්නා එකම දේ සිනාසීම පමණකැයි හිතෙන තරම් ලස්සනට ශහීනා සිනාසුනාය...





'සංදේශ් තෙමිලා... ආ... පිහදගන්න...'

මම ළදරුවෙකු සේ කොණ්ඩය අතින් ගැසුවෙමි. හිස මත තිබූ වැහි පොද ගොස් නතර වූයේ ශහීනාගේ මුහුණේය... මා කලොත් කරන්නේ ගොන් වැඩකි...

'කමක් නෑ... කොණ්ඩේ තෙතට මං ආසයි...'

'පිහිදගන්න... මේ වැස්ස හොඳ නෑ... ආ...'

ශහීනාගේ ලේන්සුව හිස පිසදමන්නට නොව අත පිසදමන්නට පවා මදි කුඩා ලේන්සුවකි... මම ඉන් හිස නොපිසදමා මුහුණ පමණක් තෙතමාත්තු කර ගත්තෙමි...

ලේන්සුවේ තිබුණේ මා නම නොදන්නා විලවුන් සුවඳකි... දවසක් වාහනේ යද්දී ආවේද මේ සුවඳමය...

'වැස්සේ තෙමුවට සමාවෙන්න...'

මම සිල්පර කොටත් වලට සිනාසුනෙමි... ඊළඟට මොනවද කියන්නේ කියා මම සිතුවෙමි...

'පාන්දර හතරේ ඉඳලා වැස්ස... මං තුනේ ඉඳලා ඇහැරලා... මං හිතුවා පායයි කියලා...'

කතා කරන්නේ ඇය පමණි. මම වචන සොයාගත නොහැකිව උන්නෙමි.

'ආඩම්බර කමට ඉන්නේ ඒ ලෙවල් රිසාල්ට්ස් නිසාද...'

මම ඇය අතේ තිබූ දිය බේරෙමින් තිබූ කුඩය මගේ අතට ගත්තෙමි... ෆයිල් කවරයත් කරේ තිබූ බෑගයත් නිසා ශහීනා කුඩය අල්ලාගෙන උන්නේ අසීරුවෙනි.

'ඒක මහ දෙයක් නෙමේ...'

'ඇයි එහෙම හිතන්නේ... මට නම් හරි සතුටුයි... ඇත්තමයි මට ඇඬුනත් එක්ක... මං ඕලෙවල් වලින් පාස්



www.sinhalaelibrary.com

වූනා... ඒත් මට ඇහුන් නෑ...'

මේ කතාව විශ්වාස කළ යුතුමය. මේ දනුත් ඇගේ ඇස්වල කඳුළුය...

'ජීවිතේ හැම දෙයක්ම හරි ගිහිල්ලා, හැම අභියෝගයක්ම ජය අරගෙන වාසනාවන්ත අනාගතයකට යන්න මං සුබ පතනවා... ඔයාට අමාරු නැහැ මේ ගමන යන්න...'

මගේ අනාගතය සම්බන්ධයෙන් මා ඇසූ හැඟීම්බරම ආශිර්වාදය මෙයයි...

'පාටියක් දන්නේ නෑ...'

කුඩ රෙද්ද පිළිවෙලට නමා මම ඒ වටා වූ පටිය දැමුවෙමි.

'මං පාටි වලට ආස නැහැ...'

'මාත් ආ...ස නැහැ... බොරු වැඩ...'

හෝමාගම දෙසින් කෝච්චිය එන හඬ ඇසුණි... පුංචි කෝච්චිය අද මාව රැගෙන යන්නේ කොහාටද... ජීවිතේ මින් පෙර නොගිය තැනකටද...

'ගෙදර ප්‍රශ්නයක් තියෙද්දී ඇයි මෙහෙම ආවේ...'

ශහීනා සමාව ඉල්ලන්නාක් බඳුව මා දෙස බැලුවාය. ඒ බැල්මට සැර කරන්නට නොහිතෙයි...

'මට බනින්නෙපා... මුස්ලිම් ගර්ල් කෙනෙක් එන ගමනක් නෙවේ මම ආවේ... මට බයයි...'

'ඒකනේ. යන් මම ත්‍රීවිලර් එකකින් ගෙදරට ඇරලවන්නම්... අපි යන්...'

'චුට්ට දුරක් හරි ගිහින් එමු...'

මමද යළි සිහින් ඒ ගමන යන්නට ආශා කළෙමි.





අවිස්සාවේල්ලටම නොවුනාද හංවැල්ලටවත් අපට එකට යන්නට ඇත්නම්...

'හංවැල්ලට ගිහින් එමු...'

මම කීවෙමි.

'හංවැල්ලට ගියාම අවිස්සාවේල්ලටම යන්න හිතෙයි... අවිස්සාවේල්ලට ගියාම රත්නපුරයට යන්න හිතෙයි... එහෙම එහෙම...'

'එච්චර දුරක් අපිට එකට යන්න බැහැ...'

මම ශහීනාවට වඩා හදවතේ අඩුක් වෙන බලාපොරොත්තුවලට බියෙන් කීවෙමි.

'ඔව් සංදේශ්... අපිට එච්චර දුර යන්න බෑ...'

'ටික දුරක් ගිහිල්ලා හැරෙන එක දුකක් නේද...'

'තර්ක කරන්නෙපා සංදේශ් අයියේ... කෝච්චිය ආවා අපි යන්...'

ශහීනාට මගේ අත ඇල්ලිණ. මොහොතකින් ඇය සෙමෙන් සෙමෙන් ඒ අත අතහැරියාය... අපි පුංචි කෝච්චියේ අන්තිම පෙට්ටියට මෙහා පෙට්ටියට ගොඩ වුනෙමු.

Sl-unlimited.com

sl-unlimited.com

# 24

**කො**ළඹට ප්‍රතිවිරුද්ධ දිශාවට යන නිසා පෙට්ටි පාළුය... කෝච්චිය පණ ගන්වන්නට ප්‍රථම හූවක් තැබුවේය.

'හූ කියන්නේ අපටද...'

ශහීනා ඇසුවාය... මම හිස වැනුවෙමි...

'ඔව්...'

'ඇයි ඒ...'

'තේරුමක් නැති ගමනක් යනවට...'

බිඳුණු හඬින් මම මිමිණුවෙමි. පණ ගැන්වුන දුම්රියේ හඬට මගේ හඬ යටපත් විය...

අවිස්සාවේල්ල සීතාවක බලා දිවෙන මේ පුංචි කෝච්චිය ඒ තරම් හොඳ කෝච්චියක් නොවේ. එය ඉදිරියට යනවාට





වඩා උඩ යනවාය... මගේ වැලමිට ඇගේ වැලමිටේ දෙතුන් වරක් වැදුනු නිසා මම තරමක් මෑතට වීමි.

ශහීනා යටි තොලේ පැත්තක් සපා සිනාසුනාය... ඒ සිනාවේ බයක්ද... දුකක්ද.. සතුටක්ද... එකට කැළතී තිබුණි.

'දවසක් අපි ඉස්කෝලේ ඇරිලා කෝච්චියේ ආවා... හරි ෂෝක්...'

ඇය සමඟ සැහැල්ලුවෙන් කතා කරන්නට තරම් නිස්කලංකයක් මට නැත. හිත කෝච්චි ඇන්ජිමට වඩා වේගයෙන් සැලෙයි.

'මොනාවත් කියන්නැත්තේ ඇයි...'

මොනවා කියන්නද.. කතා කරන්නට මාතෘකාවක් නැතුව පාසලේ සාහිත්‍ය සංගමයෙන් වේදිකාවට නැග්ගවූ විටක මෙන් මම අන්ත අසරණව උන්නෙමි.

'ඔයාට නේ කියන්න තියෙනවා කිව්වෙ...'

මම එසේ කියා ඇඟ බේරා ගත්තෙමි.. ශහීනා දෙස බලාගෙන මට දහසක් දේ කිව හැක... මිමිණිය හැක.

'මූසල දුක හිතෙන ඒවා කියලා මේ වුවට වෙලාවේ අඬන්නේ ඇයි... මට කියන්න එච්චර ලස්සන කතාවක් නෑ සංදේශ්...'

'ඇ..යි එද ඇඬුවේ...'

'එද විතරක් නෙමේ සංදේශ්... මං ගොඩාක් දවස්වල අඬනවා.. ඔයා දක්කේ එද විතරයි...'

කෝච්චිය දුන් යන්නේ ගමේ ගෑණියෙක් පස්ස නටවන්නාක් බඳුව පැද්දි පැද්දීය... මම හොරැහින් පැද්දෙන ඇස් දෙස බැලුවෙමි.

'ඔතන අයිනේ හිරිකඩ එනවා... මෙහාට එන්න...'

දුම්රියේ කවුළුවෙන් එහා හිරිකඩෙන් ඇයව තෙමී යද්දී මම කීවෙමි. ශබීනා විත් නැවතුනේ මා අද්දරමය... අපේ සිරුරු දන් එකිනෙක ගැටී ඇත... මම පොළොන්නරුවේ සෙල් පිළිමයක් මෙන් නිසොල්මන් වූනෙමි. මෙහෙමම ඇගේ කරට අතක් දමා ඇයව තුරුලට ගත හැකිනම්... දෙවියනේ... මේ මට හිතෙන්නේ මොනවාද...

'සංදේශ්... මට බඩුවක් කියන්න...'

'මොකක්ද...'

'සිංහල කොල්ලෙකුට ඕන කෙල්ලෙක්ව බඳින්න පුළුවන්ද...'

'ඔව්.. ඒ..ත්..'

'ඇයි ඒත් කිව්වේ..'

'සිංහල කොල්ලෝ මුස්ලිම් ගර්ල්ස්ලාව බඳිනවා හරි අඩුයි... මුස්ලිම් ගර්ල්ස්ලත් සිංහල කොල්ලෝ එක්ක යාළුවෙන්නේ නෑ...'

ශබීනාගේ අත ඇත්තේ මගේ පුලැහිල්ල යාබඩය...

'ඔව්... ඒක ඇත්ත... මුස්ලිම් කෙල්ලෙකුට එච්චර දුර යන්න බෑ.. අපිට අපේ ආගමෙන් පිට කෙනෙක්ව බඳින්න බෑ... ඒක ලොකු පව් වැඩක්..'

එය පව් වැඩක් බව දන දනත් මේ කෙල්ල මෙවන් ගමනක් ආවේ ඇයි... ඒක අතකට ඇය ආවේ මාව කසාද බඳින්නට නොවේ... ඒ තරම් දුර මම සිතන්නේ කුමකටද...

'ඒත් මුස්ලිම් පිරිමි අය සිංහල ගර්ල්ස්ලාව බඳිනවා... නේ...ද..'

මම එවැනි විවාහ ඕන තරම් දැක ඇත්තෙමි... එය



වරදක් නොවේද...

'ඔව් සංදේශ්... ඒත්... එතනදී සිංහල කෙල්ල එයාගේ බුද්ධාගම ආදරේ වෙනුවෙන් කැප කරනවා... එයා ඉස්ලාම් ආගමට ආවට පස්සේ තමයි බඳින්නේ... නමත් වෙනස් කරනවා... මං දන්න ගොඩාක් සිංහල ගර්ල්ස්ලා අපේ මුස්ලිම් අයව මැරි කරලා තියෙනවා... ඒත් ඉස්ලාම් ආගමට ඇවිත්...'

ආදරය වෙනුවෙන් සිංහල යුවතියක් කරන ඒ කැපකිරීම මුස්ලිම් යුවතියකට කරන්නට අයිතියක් නැත. ආගම වෙනුවෙන් ආදරය කැප කළ යුතුය. එය දෙවියන්ගේ කැමැත්තය.

'මේ..ක.. මං හඳුනු ලෝකයක් නෙමේ සංදේශ්...'

ශබීනා අසරණව කීවාය...

'ඔයාගේ නංගී මුස්ලිම් කොල්ලෙක් එක්ක යාළුවෙනවා.. ඔයා එයාට බඳින්න දෙනවද...'

මම දුම්රිය කවුළුවෙන් එහා වැස්ස දෙස බලා උන්නෙමි. කෝච්චි පෙට්ටිය තුළ වුවද තුනී සීතලකි.. ඒ සීතල හරහා ඇගේ වතින් මෘදු උණුසුමක් ගලා එයි... ඒ උණුසුම පවා තහනම් යැයි මගේ හිත මට කියන්නට විය.

'ඔ..ව්...'

'එතකොට නංගී ඉස්ලාම් ආගමට යන්න ඕන.. ඔයා යන්න දෙනවද...'

'අම්මයි තාත්තයි මොනවා හිතයිද මං දන්නෑ.. ඒත් එයා ආදරේ කරන කෙනා එක්ක යන්න එයාට අයිතියක් තියෙනවා...'

'එහෙම අයිතියක් ම..ට.. නෑ...'

ඒ ගැන ආයෙත් කියා ඇගේ හිත අවුල් කරන්නට මම

www.sinhalaelibrary.com

අකමැති වීමි.

ආදරය හැර අපට කතා කළ හැකි වෙනත් මාතෘකාවක් නැත්ද... කොතරම් කතා කළද එක තැනක ගොස් සියළු කතා හිරවේ නම් එය කතා නොකර සිටීම හොඳ නොවේද...

කෝච්චිය හංවැල්ල ස්ටේෂමේ නතර විය... මම ශහීනා දෙස බැලුවෙමි. අපි කතා කර ගත්තේ හංවැල්ල තැවතුමෙන් බසින්නටය...

'බෑ සංදේශ්... එහා එකෙන්...'

ඇය බැගෑපත්වූවාය... කොහනට ගියද හැරී ආ යුතුය.

'කව්රුවත් දක්කොත් හොඳ නෑනේ...'

'සංදේශ් මෙන්න මුස්ලිම් කෙල්ලෙක් එක්ක රස්තියාදු ගහනවා කියලා කියයි...'

'කවුද...'

'හැමෝම...'

'එතකොට ඔයාට...'

'මාව නම් මරයි...'

'දන දන ඇයි ආවේ...'

ශහීනා දස් තිමට බර කළාය.

'දක්ක පළවෙනි දවසෙ ඉඳලා හරි ආසාවෙන් හිටියේ කතා කරන්න... අ..ජ්..පා හරි ගණන් නේ... මේ බලනවා මේ අහක බලා ගන්නවා... ඇයි ඒ... මං මුස්ලිම් කෙල්ලෙක් නිසාද...'

'ඇයි හැම එකටම ආගමයි ජාතියයි ඇද ගන්නේ... මම එහෙම හිතන්නෑ...'

ආදරයක් ගැන ඇතිවෙන හැඟීම් වලට ජාතියක් ආගමක්





තුලයක් වේද... ආදරයේ උප්පැන්න සහතිකයේ ජාතියට ආගමට තැනක් නැත.

එහෙත් විවාහ සහතිකයට එය වැදගත්ය.

'සංදේශ්...'

ඒ මෙතෙක් කතා කරමින් උන් යුවතිය නොවේ... වර්ෂාවේ හඬද දුම්රිය ඇන්ජිමේ හඬද යටපත් කරමින් ශහීනාගේ ඇමතුම පපුවට කිඳ බැස්සේය...

'සෝර් මගේ ෂෝල් එක.. එද ගෙදරදි හොරකම් කළේ...'

මට කෝච්චියෙන් පැන මැරෙන්නට සිතුණි. මෙතුවක් මා සිතා උන්නේ එය මා ගත් බව ඇය දන්නේ වත් නැතැයි කියාය...

'මොන ෂෝල් එකද...'

කිසිවක් නොදන්නා ලෙස මම ඇසුවෙමි... ඒත් දෙනෙත් හංගාගෙනය.

'හොරා ඇස් දෙක හංගන්නේ මොකෝ... එද රෑ.. සාට්ටියේ උඩ මං දලා ගියේ... ඇ...යි ඒක ග...ත්..තේ...'

මම පිළිතුරක් නොදුන්නෙමි..

'ඇ..යි සංදේශ්....'

'මං ගත්තේ නෑ...'

'බුදු හාමුදුරුවෝ කියලා තියෙනවා නේද බොරු කියන්නෙපා කියලා... මුසාවාද වේරමනී සෝර් දන් ඒක...'

මට අවංක වෙන්නට බැරි ඇයි...

'ති..යෙ...නා...වා...

අපමණ ලැජ්ජාවකින් ඇඹරී මම කීවෙමි. අසූ නොවෙන්නට ඒ හොර වැඩේ මට කරන්නට සිදුුණි.

'ඔයා හරි හොඳ කෙනෙක්... කවදහරි ඔයා බඳින සිංහල



www.sinhalaelibrary.com

ගේල් හරි වාසනාවන්තයි...'

ඇය අඩන්නේ ඇයි... ශහීනා කවිළුවෙන් මබ්බට දෙතොප් පා කර ඇඩුම් වාවාගැනීමේ උත්සාහයක නිරත වූවාය...

ඉන්පසු පැහෙන දුරක් යන තෙක් අපි කතා නොකළෙමු... ශහීනා සිල්ක් ශෝල් පට මුහුණට තබා කඳුළු පිසගත්තාය.

'අපි මෙහෙමම අවිස්සාවෙල්ලට යං සංදේශ්...'

'කමක් නෑ යං...'

මමද ලෝබකමින් කීවෙමි... දුම්රිය වේගයෙන් ගැස්සුණි. මගේ අත ඇගේ කුඩා ඇඟිල්ල හා ගැටිනි. ඒ අත මම සීතා මනාම ඇගේ දකුණත උඩින් වැටෙන්නට දමුවෙමි. ශහීනාගේත් මගේත් ඇඟිලි කරු තද විය...

අපි මොහොතකට අපි දෙසම බලා උන්නෙමු. ප්‍රථම හා අවසාන හමුවීම කොතරම් දුකද...

'මං මෙහෙම ඔළුව තියාගන්නම්...'

මම ඉබ්බෙකු මෙන් හිස වැනුවෙමි.. ශහීනා මගේ උරහිසට හිස බර කළාය... මම එහෙමම දස් පියාගත්තෙමි. මේ උරමඩලේ නිදන්නේ රාමලාත් සදකි. මට කෙදිනකවත් හිමි නොවෙනා රාමලාත් සදකි...

සංදේශ්ලාට ආදරය කරන්නට ශහීනලාට අකැප ඇයි... මම දුකෙන් සිතුවෙමි.

ශහීනා මගේ උරහිසට හිස තබාගෙනම ඇගේ ඇඟිලි කරු හා වෙළී තිබූ මගේ අත්ල දිග හැරියාය... ඇගේ සුදු අත්ල හා සසඳද්දී එය තැන අතකි... මම ලැජ්ජාවෙන් යළි අත්ල නමා ගත්තෙමි...

'කෝ...'

ඇගේ වරලසින් එන්නේ කපුරු මල් සුවඳට සමාන සුවඳකි. ඇය ළඟ ඉන්දියාවෙන් ගෙනා ඒ මල් සුවඳ රැගත්





පැම්පු වර්ගයක් තිබෙනවා විය යුතුය...

මගේ අත්ලේ අපිළිවෙලට ගිය රේඛා අතර ශහීනා ඇඟිලි ඇඳු ගෙන ගියාය... තව්තිසාවට මොහොතකට ගොඩ වැදුනාක් වැනි මත්මත් හැඟීමකින් මම ගොළුව උන්නෙමි. මගේ පපුව ගැහෙන හඬ උරපත්තට හිස තබාගෙන ඉන්නා ඇයට ඇසෙනවාද...

'සාස්තරයක් කියන්නද...'

මගේ මුහුණ දෙස නොබලාම ශහීනා කීවාය.

'කියන්න...'

'මාත්තියට තියෙන්නේ හරි වාසනාවන්ත අතක්... දුක් විඳගෙන තමා ඉස්සරහට යන්න ඕන... මද තැනකට තමා එනවා.. ලස්සන වුනාට මොකද ටිකක් විතර ආඩම්බරයි... ඒ වුනාට හිත තීන්නේ... ඒක නල්ල... හරි හොඳයි... පපුව තීන්නේ... ඒක රත්තරන් තමා...'

මම සිනාව තද කරගත්තේ අමාරුවෙනි.. අනේ මේ කෙල්ල නොලා ගන්නට බැරි අත්තක පිපුනේ ඇයි...

'තා..ව...'

'ආදරේ කරන්න හිතුනොත් මැරීගෙන කරනවා... ඒත් ප්‍රශ්න තමා තීනවා... එක ඇත්තියෙක් තමා ඉන්නවා.. ගිලෙන්ඩ ආදරේ කරන්නේ... මාත්තියාවත් දන්නේ නෑ... ඒත් දෛවය තමා නරක... කොච්චර ආදරේ කළත් ඒ ඇත්තිව දලා තමා යන්න වෙනවා...'

උරහිස තෙත්ව යද්දී ශහීනාගේ හිස මගේ උරමඩලේ තවත් තද විය. සතුටින් සාස්තර කියාගෙන උන් ඇය හිටිහැටියේ අඩන්නේ ඇයි...

'අ..නේ සංදේශ්...'



www.sinhalaelibrary.com

පොඩි දරුවියක මෙන් ශහීනා මගේ උරහිස බදාගෙන ඉකිබිඳ බිඳ හැඬුවාය... කෙල්ලෙක් අඬද්දී කුමක් කළ යුතුද කියාවත් මම නොදනිමි.

'ම..ට ම..ට..'

ඇය වෙව්ලමින් උන්නාය... මේ තරම් පපුව පුච්චා ගන්නට නම් අප අද හමුවූයේ ඇයි... වාවාගත නොහැකි දැවිල්ලකින් ළය දැවෙන්නට විය.

'ඇයි මේ...'

'ඔ..යා වගේ කෙනෙක් මට ලැබෙන්නේ නැතේ...'

එය අනිත් පැත්තටද කිව හැක.. ඇය වැනි කෙනෙක් මටද නොලැබේ. අප අපට නොලැබේ. ඒ අපේ දෛවයද.. නොවේනම් මේ අප මුහුණ දෙන ලෝකයේ හැටිද...

'අපි කතා නොකර මේ ටික දුර යමු...'

මම දුක සඟවාගෙන කීවෙමි. ඊට වඩා අවංක පිළිතුරක් මට ගොනු කර ගත නොහැක... ලෝකයේ සියල්ල නැවති යළි ඇරඹී අළුත් ලෝකයකදී අපිට හමුවෙන්නට ලැබේනම්... එය සිහිනයක් පමණි. ලෝකය නැවතෙන්නේද නැත. වෙනස් වෙන්නේද නැත. ඒ නිසා අපට හමුවෙන්නටද නොහැක.

මේ සිල්පර කොට නැවතුන තැනින් අපි නැවතිය යුතුය...

'අසාද් නරක කොල්ලෙක් නෙමේ නේද...'

සෑහෙන වෙලාවක් ශහීනා නිහඬව උන්නාය. මගේ අත ඇගේ ඇඹිලි කරු හා යළි පැටලුනේ කවර මොහොතකද... එය මමවත් නොදනිමි.

'අසාද් සාධාරණ කෙනෙක් නෙමේ... එයා හරි අවස්ථාවාදී කොල්ලෙක්... ඊට වඩා ඕන තරම් අහිංසක මුස්ලිම් බෝයිස්ලා ඉන්නවා... මං නෑ කියන්නේ නෑ... අසාද් ඒ ලෙවල් කරන කාලෙම අපේ රිලේෂන් නංගී කෙනෙක් එක්ක යාළුවෙලා





උන්නා... ඒ ළමයගෙන් ගන්න තියෙන හැම ප්‍රයෝජනයක්ම ගත්තා... එයාලා අපි වගේ නෙමේ ටිකක් දුප්පත්... මහරූප් අන්කල් පිටකොටුවේ පොඩි බිස්නස් එකක් කරන්නේ... මෙයාලා එහෙම නෙමේ හරි ලොකු මිනිස්සු... ඒත් අර නංගී හරි ලස්සනයි.. හින්දි නිළියක් වගේ.. ඒ කෙල්ල හරකියෙක් වගේ අසාද්ට ආදරේ කළා..... කවුරුවත් මේක දැනගෙන උන්නෑ... ඒත් අසාද් අත් ඇරියා... ඊට පස්සෙ තමයි එයාට මගේ ජීවිතේ එක්ක පැටලුවේ... අර නංගි මා එක්ක අඬ අඬා මෙයා කරපු හැම දෙයක්ම කිව්වා... මුස්ලිම් කෙල්ලෙකුට ගොඩාක් නිදහස අඩුයි... එත අතහින් එහෙම කරන්නේ ඒ කෙල්ලගේ ආත්මය පවිත්‍ර කරන්න... අර ළමයා මෙයා වෙනුවෙන් ඒ හැම දෙයක්ම පූජා කළා... එහෙම අහිංසක කෙල්ලෙකුට ගින්දර දීපු මෙයා මට කොහොම කරයිද සංදේශ්... මං ඒ නංගි තරම් ලස්සන නෑ... එයා වගේ මං ආදරේ කරන්නෙත් නෑ... අපේ මම්ලා ඩැඩීලා මේවා දන්නේ නෑ...'

අසාද් ඇයට ගැළපෙනවාද නොගැළපෙනවාද කියා මම නොසිතුවෙමි.. ඇය ඔහුට අයිති වස්තුවකැයි සිතන්නට මට ලෝබකමක් දනෙයි. අඩුම තරමේ සිතුවිල්ලකින් වත් ඇයව තව කාට හෝ අයිති යැයි සිතීම හිත දවන දෙයකි.

'ම...ම..'

'කියන්න සංදේශ්...'

'දුප්පත් මුස්ලිම් කොල්ලෙක් උනානම්...'

'එහෙම උනානම් මං කොච්චර වාසනාවන්තද...'

අපි ආදරය ගැන කතා නොකෙරුවෙමු. කතා කිරීම පලක් නැති බව අපි දෙදෙනාම දන්නෙමු. කතා කිරීමත්

පවත් යැයි හිතනා තරමට අපි අතර තහනම් නියෝගයක් විය.

ලෝකය එකම යායක් වන දිනයක් ඒ නම්...

'යන් බහිමු...'

කෝච්චිය සීතාවක දුම්රිය පොළේ නතර වෙද්දී මම සිටෙමි... එසේ කීවද බැස යන්නට සිසිදු සූදානමක්වත් නොවිය...

'මා එක්කල තරහද සංදේශ්...'

'ඇ..යි මම තරහ වෙන්නේ...'

'මම වගේ කෙල්ලක් එක්කල යාළු වෙන්න එපා සංදේශ්...'

'ඊත්...'

'ඇයි...'

'තරහ නම් වෙන්න එපා... එහෙම දවසකට කෑමක් බීමක්වත් ගන්න බෑ... මං ඇත්ත කියන්නේ...'

ඇය කියන්නේ බොරු නොවන බව මමද දනිමි. මගේ පැත්තෙන් යථාර්ථයද එයම විය.

දුම්රිය ප්ලැට් ෆෝම් එකට පැමිණ දෙතුන් වරක් ගැස්සී නතර විය... මගීන්ගෙන් තොරවූ දුම්රිය පෙට්ටිය මැද අපි තනිවූනෙමු.

'මෙහෙම වෙන්වෙන්න ඇයි දෙවියෝ අපිව මුණ ගැස්සුවේය...'

දුම්රිය පෙට්ටිය මැද්දී පහන්වී මගේ සුරත සිපගත් ශහීනාද කීවාය...

'ගෙදර ගිහිල්ලා අඬ අඬා ඉන්නෙපා...'

'නෑ සංදේශ්... අද කාලෙකට පස්සෙ ජීවිතේ සතුටක්





කියලා දෙයක් වින්ද... ඔයාට.. මං දන්නෑ...'

කියන්නට ගිය දේ ශහීනා ගිල ගත්තාය...

'ඔයා එන්නෙපා... මං බස් ස්ටෑන්ඩ් එකෙන් බස් එක ගන්නම්... සංදේශ් ටිකක් ඉඳලා එන්න...'

මම ගොළුවෙකු සේ හිස වැනුවෙමි... මම වේදිකාවේ තනිව සිටියදී ශහීනා පසු පස බලමින් රේල් ගේට්ටුවෙන් පැන ගියාය...

වැස්ස නතර වී තිබුණද හීන් පොදයක් විය... ශහීනා ඉහලාගෙන ගිය කුඩය නොපෙනීම ගිය පසු මම හිස් හැඟීමෙන් සිල්පර කොට මතට පැන්නෙමි...



www.sinhalaelibrary.com

# 25

සෑහෙන කාලයක් කුරුළු කැලේ පිපි හදවතට වැදුණු සුන්දරම කුසුම අද මගේ උරමඩල මතටද වැටුණි. දේත මැදටද වැටුණි... අපමණ ලෝභකමකින් ආදරයකින් ඒ කුසුම එක් වරක්වත් සිප ගන්නට තරම් මට ශක්තියක් නොවීය...

තෙලා ගත් මල සිපගන්නට මට වරම් නැත.. තෙලාගත්තා මල් සිප ගන්නට හැමෝටම අයිතියක් ඇත... එහෙත් ඒ අයිතිය මට නැත. ආදරයේ පරම නිර්මල සුවඳ ගලා යන්නේ දෙවියන් ළඟදී නම් ඒ ආදරයට දෙවියන් එරෙහි වන්නේ ඇයි...

අපට රැගෙන ආ කැළණි වැලි දුම්රිය දෙස මම බැලුවෙමි. එය මට පෙනුනේ කළු මුසල මිනීපෙට්ටියක් මෙනි. ආදරයේ ප්‍රථම හමුවීම අවසාන හමුවීම වේ නම් මහු තරම්





තවත් අවාසනාවන්තයෙක් ලොව නැත.

ඒ අවාසනාවන්තයා මම වෙමි...

ගෙදර යන්නට හිතක් නැත. එහෙත් මම ගෙදර නොයා වෙන කොහේ යන්නද... එකට එක්ව ලංවී මා සමඟ සීතාවකට ආ ඇය නොමැතිව යළි කුරුළු කැලයට යාම හිත පාරවනා පාළු ගමනකි.

මේ කිලෝ මීටර් ටික තනිවම යා හැක... එහෙත් ජීවිතය... එය කොතරම් දිගද... ඒ දුරද මා යා යුත්තේ ඒ ආදරය අහිමි කරගෙනය...

තවමුත් එන බව දන දන ආදර මාළිගා තැනුවේ ඇයි... මගේ හිත මගෙන් සරදම් සහගතව ඇසුවේය. මම එයට පිළිතුරක් නොදන්නෙමි.

දහවල් දෙකට පමණ මම බර කරගත් හිසින් කුරුළු කැලේ ගුරු පාරේ එද්දී ශහීනා බැල්කනියට වී බලා උන්නාය... අසීමිත ආදරයකුත් අපමණ දුකකුත් ඒ දැස් වල තිබුණි... මම ළතැවිල්ලෙන් පිරුණ දෙනෙත් බර කරගෙන ගෙට ඇතුළු වූනෙමි.

නංගී බලමින් උන් පුවත්පත පහත් කර මා දෙස බැලුවාය. ඇගේ බැල්මේ වූයේ මා බිය කරනා තරම් සැකමුසු බැල්මකි.

'කන් නැද්ද අයියේ...'

උඩට යන්නට ප්‍රථම පඩියට අඩිය තබද්දී නංගී ඇසුවාය.

'ඉඳලා කනවා... මට බඩගිනි නෑ...'

එපමණක් කියා මම ඇය දෙසවත් නොබලා උඩට ගියෙමි...

නංගී මොහොතකින් කාමරයට ආවාය. මම ඇගේ දෙනෙත් මඟ හැරියෙමි.

'ඔය ගමන් ඔකනින් නතර කරන්න අයියේ...'



www.sinhalaelibrary.com

නංගී වේදනාබර හඬකින් කීවාය... මං ශභීනා සමඟ ගිය බව ඇය දන්නේ කෙසේද...

'අහන්නෙපා දන්නේ කොහොමද කියලා.. ඔය ගමන කෙළවර වෙන්නේ අයියා පිස්සෙක් වෙලා..'

'මං ඒ ගමන යන්න කැමති උනත් ඒ කෙල්ල මාව ඒ දුකට ඇදලා දන්නේ නෑ.... එයාට දෙස් කියන්නෙපා...'

මම විචෑකව කීවෙමි.

'අ..යි..යේ...'

'යන්න බබා.... මට වද දෙන්න එපා...'

තවත් දරා ගත නොහැකිව මම යටි තොල සපාගෙන කීවෙමි. නංගී බියවූ දෑසනත් තෙත් කරගෙන පහළට ගියාය... මට මේ මොනවා උනාද...

මම දවල්ට නොකෑවෙමි. කන්නට පිරියක් තිබුණේද නැත. නංගී දෙතුන් වරක් පැමිණ බත් බෙද ගෙනත් දෙන්නදයි ඇසුවාය... මම ඒ හැම වාරයේම නිද ගත්තාක් මෙන් උන්නෙමි...

හවස හයට පමණ අම්මා කිරි තේ එකකුත් බටර් කේක් කැබැල්ලකුත් ගෙනවිත් මේසය මත තබා ගියාය. ඇය ගියේ මගේ හිසද අතගා උණද බලාය...

තව දුරටත් ගෙදර ඉඳීම මට මහා වදයක් විය... උන්නද මේ කාමරයේ සිටීම මහා දුකකි... හැම පාන්දරකම අවදි වූ හැටියේ මට පෙනෙන්නේ පාසැල් යන්නට ඇඳගන්නා ඇයවය... රෑ නින්දට යද්දීත් මං දකින්නේ මඳ අඳුරු බැල්කනියට වී ඔහේ කල්පනාබරව රබර් ගස් දෙස බලා ඉන්නා ඇයවය.

අපට අද හමු නොවී ඉන්නට සිබුණි. කරහ වී උන් දවස් මීට වඩා ලස්සනය.

'ලො..කු පු..තා...'

රෑ නමයාමාරට පමණ තාත්තා පහළ සිට කෑ ගැසුවේය..





මම ඇදෙන් විසිවී පැන්නෙමි. තාත්තා කෙදිනකවත් මේ තරම් තදින් මට කතා කර නැත. ඔහු කතා කරනා දෙයක් කාමරයට පැමිණ මා සමඟ නිස්කලංකයේ කතා කරයි.

'මං කිව්වා මහත්තයෝ ඔයාට... දන් පත්තු වෙලා... මට කරන්න දෙයක් නෑ.. තාත්තා පරල වෙලා ඉන්නේ... දැ..න් ය..න්..න...'

නංගී හොරෙන් පැමිණ කීවාය... අපේ පුංචි කැදැල්ල උන් හිටි ගමන් ඇවිලී ගියේ ඇයි... සියල්ල කළේ මමද... තාත්තා මේ තරම් මා සමඟ කෝපයෙන් ඉන්නේ ඇයි...

'ය..න්..න.. මොනා කිව්වත් කට පියාගෙන ඉන්න...'

නංගී මාව තල්ලු කළාය. නිරුවත් උඩු කයට මගේ කමිසයක් දමාගෙන මම කරබාගෙන පහළට ගියෙමි. තාත්තා සාලයේ එහා කොණටත් මෙහා කොණටත් ඇවිදිමින් පුපුරමින් උන්නේය. මම අම්මා දෙස බැලුවෙමි. ඇගේ දෑස්ද අසරණ කමින් බරවී ඇත...

මම සැට්ටියේ පත්ත පිරිමදිමින් කරබාගෙන උන්නෙමි. තාත්තා දඩාස් ගා ඉදිරිපස දොර වසා දම්මේය.

'තමුසේ කොහෙද අද උදේ ගියේ...'

තාත්තා මා අසලටම පැමිණ ඇසුවේය. මගේ දිවත වියළිණි. ජීවිතයේ එවැනි මනමාල ගමනක් ගිය ප්‍රථම දරුවා මම නොවෙමි... අනෙක මං ඒ ගමන ගියේ මනුස්සකමට ඇගේ අසරණ සිත හදන්නට මිසක ඊට එහා දෙයකට නොවේ. එය උඩ ඉන්නා දෙවියන් පවා දනී.

'ක..තා කරනවා... කොහෙද ගියේ...'

බොරුවක් කීම පලක් නැත. මට තාත්තා කෙරේ තුනී අප්‍රසාදයක් දළුලා වැඩෙන්නට විය... අවුරුදු විස්සක් ජීවත් වූ පසුවත් තාත්තාට ලොකු පුතාව තේරුම් ගත නොහැක.



www.sinhalaelibrary.com

'කියනවා උගුඩුවා වගේ බලන් ඉන් නැතුව... තමුසේ හිතන් ඉන්නේ මහ ලොකු වීරයෙක් කියලද... කතා කරනවා... කැලණි වැලි ට්‍රේන් එකේ තමුසේ ගියේ කා එක්කද... ක..තා ක..ර..න..වා...'

තාත්තා දත් මිටි කාගෙන කීවේය. මම හිස ඔසවා ඔහු දෙස බැලුවෙමි. මේ මගේ අහිංසක තාත්තා නොවේ... මගේ තාත්තාට මේ තරම් පහත් ලෙස මට කතා කළ නොහැක.

'තා..ත්..තේ ඇයි මේ... මොකටද කෑ ගහන්නේ... ලොකු පුතා වනවර ගමනක් ගියේ නෑ...'

තාත්තා අත මිට මෙලවූයේ මට ගහන්නද... මම දත් පියා ගත්තෙමි...

'උඹ වගේ පුතෙක් හැදුවට මට ගහන්න ඕන... යකෝ කෝච හැදුවේ ජාතියක් ජම්මයක් නැති අභිකුණ්ඨකයෙක් වගේද... මං හිතුවා තමුසේ කවදහරි මුර පවුලටම සැනසීම අරගෙන එයි කියලා... තැබිගෙන තමුසෙට උගන්නලා තැනකට ගේන්න හිතුවේ ඒ නිසා...'

දත් කදුලින් පෙඟී ගියේ තාත්තා මගේ ආත්මයට මේ තරහා ගැරහීම දරා ගන්නට බැරි නිසාය. මම තාත්තා කියනා තරම් පාදඩයෙක් නොවූනෙමි. ඒ බැව් කිසිවකු නැතද මගේ හදවත දනී.

'අවුරුදු විස්සක් ඔෆිස් බඩගාලා බඩගාලා මං තමුසෙව හැදුවේ පිට ජාතියක මිනිස්සුන්ගෙ කතා අහන්නද... උඹට ලැජ්ජ නැද්ද මුස්ලිම් කෙල්ලෙක් එක්ක රවුම් ගහන්න. අඩුම ගානේ සිංහල ලේවත් නෑ... උඹලට කියන්නේ පරයෝ කියලා... පරයෝ...'

දෙපාත්තයේ සිට මාව වෙව්ලා ගියේය.... තාත්තා මේ





තරම් පටු ලෙස ලෝකය දෙස බලන කෙනෙකැයි මම නොසිතුවෙමි.

'සිංහල කෙල්ලෙක්ව තමුසේ හෙට එක්කගෙන එනවා... දවැදි ඕන නෑ... මං අම්මට කියනවා ඒ කෙල්ලව ලේලි හැටියට බාර ගන්න කියලා... මොනවද අපිසේ මේ පරවැඩ... ෂික්.. ලැජ්ජයි තමුසෙව හැදුවටත්... ලැජ්ජයි...'

උලකින් පහුවට ඇණගෙන ඇණගෙන මේ සාලය මැද මැරුණා නම් මට වඩා හොඳය... ශයිනා කීවේ ඇත්තය... එක් වෙන්නට මුණ ගැසුණු දෙදෙනෙක් නොවේ... වෙන්වීමක්. වියෝගයක් ජීවිතේ දරාගෙන හමුවූ කාලකන්නි ආදරවන්තයින්ය...

'තමුසේ දන්නව නේ මේ ගේ හදගත්තේ කොච්චර දුක් විඳලද කියලා.. නේ... තමුසෙට බාල තව නංගි කෙනෙක් මේ ගෙදර ඉන්නව කියලත් දන්නව නේ... මේ ගෙදර මහ ලොකු ලොකු පුතා තමුසේ කියලත් දන්නව නේ.. එහෙම තියාගෙන ඇයි මේ වගේ පාහර වැඩ කරන්නේ.. මං උඹලව දුක් විඳලා හැදුවේ ඒකටද... මං හිතුවා තමුසෙ මොළේ තියෙන බුද්ධිමත් කොල්ලෙක් කියලා... බලං ගියාම හන්දියක් හන්දියක් ගානේ ඉන්න කුඩුකාරයොත් තමුසෙ වගේම තමයි... හොඳලත් වැරදියි... ලොකු පුතා මෙතන මරක්කලයොත් එක්ක මඟුල් නාටකත් ඔයාලා බලන් හිටියා...'

තාත්තා මේ තරම් බාල වූයේ ඇයි... අප අතර යමක් සිදුවූ බව ඇත්තය... අපි අපේ දෛවය තේරුම් ගන්නට බැරි තරම් බොළඳ ආදරවන්තයෝ නොවූනෙමු... සිතාමතා දුම්රිය පොළේදී අප මුහුණට මුහුණ බලාගෙන වෙන් වූයේ ඒ නිසාය... ඒ යළි හමුවන්නට සිතා නොවේ...

'එස්සෙර් මේ ගේ විකුණලා දලා ආයෙත් කුළී ගෙදරකට යන්න ඕන... නැත්නම් තමුසේ කැම්පස් යනකල් බණ්ඩාරවෙල මාමලගේ ගෙදර යන්න ඕන... තේරුණාද... කියනවා මොකක්ද කරන්නේ...'

අලුත් කඳුළු පාරකට ඔහේ ගලා යන්නට මම ඉඩ දුන්නෙමි... මේ වහළ යට මේ ලෙස මා අසරණ වන්නේ ඇයි...

'මේ ගෙවල් විකුණන්න එපා.. ඒවා නංගිට තියන්න... මං කැම්පස් යන්නේ නෑ... මං... බණ්ඩාරවෙල යනවා...'

අම්මා සැටියේ කොනකට වී ඉකිබින්දය...

'තමුසේ ගියත් මෙතන අපිට ඉන්න බෑ... අනික කඩේ ළඟ හැමෝගෙම කතාව මේ දෙන්නා ගැන... පුතෙක් හදලා කර දඬු උස් කරලා තාත්තා කෙනෙක්ට මෙහෙම අහන්න දෙනවට උඹට හෙණ ගහනවා...'

තාත්තා අඬන්නාක් මෙනි. මිනිසුන් කොතරම් මැග දයි මම සිතුවෙමි. අප නොදන අප දෙස මිනිසුන් කොතරම් බලා සිටින්නට ඇත්ද...

මට බය හිතුනේ මේ ප්‍රශ්නයට මෙහෙමම ශහීනාද මුහුණ දී ඇත්ද කියාය...

'තමුසෙට මොනවද හිටපු ගමන් උනේ...'

මට මා ගැනම මහ පිළිකුලක් දැනුණි...

'ද..ත් ඇති... ලොකු පුතා කළේ වැරැද්දක් තමා... එයා ඒ වැරැද්ද දිගටම කරන්නෑ කියලා මං දන්නවා...'

අම්මා අසරණව කීවය.

'මුස්ලිම් කෙල්ලෙක් කවදාවත් මේ ආගමට ජාතියට එන්නෑ... මූ හරකා වගේ යයි ඒ ආගමට...'





'දැන් මොනවත් මෙතන උන් නැතේ.... ලොකු පුතා අද ඉඳලා පහළ නිදගන්න... මං පල්ලෙහා ඔෆිස් කාමරේ ඔයාට ලෑස්ති කරලා දෙන්නම්...'

පහත් වී මම කමිසයෙන් තෙත මුහුණ පිසද ගත්තෙමි.

'එපා මං කුස්සිය ගාව කොරිඩෝවේ නිදගන්නම්... මට කාමර ඕන නෑ.. අද විතරනේ...'

අමාරුවෙන් ඇඬුම් වාවාගෙන මම කීවෙමි...

'මේ ගෙදරට මොන හෙණයක් පාත් වුනාද මන්ද...'

'හෙණ පාත්වෙන්න කළින් මම මේ කියන්නේ... සංදේශ්.. ඕක ඔතනින්ම නවත්වනවා... මේ තාත්තට ආයි මේ ගෙදර යකෙක් කරන්නෙපා... මං උඹට කවදාවත් ගහලා නෑ.. ඒ විකත් මට කියලා කරවන්න එපා....'

තාත්තා මට ගැහුවා නම් හොඳය... මේ කියූ ටික ඊට වඩා දැවිල්ලය.

'ම..ට සමාවෙන්න...'

එපමණක් කියා මම හිස් හැඟීමෙන් ඉහළ මාළයට ආවෙමි... කොට්ටයද මගේ පොරවන රෙද්දද ගෙන කාමරයෙන් පහළට එන්නට යද්දී මම නිකමට ජනෙල් රෙද්ද මෑත් කර බැලුවෙමි. ශහීනා බියවී බැල්කනියේ මුල්ලකට වී උන්නාය...

SI-unlimited.com

www.sinhalaelibrary.com

# 26

**අ**පේ ආදරේ අපරාදේ... මම ඇය දෙස බලාගෙන සිතුවෙමි...

අම්මා තාත්තා නංගී බලා ඉඳිද්දීම මම කුස්සියට යාබදව තිබූ කෑම කාමරයේ මේසය අසළ බිම කොට්ටය දමා එහි ඇලවුනෙමි... කොට්ටය බදා ගනිද්දීම මට ඇඬුණි.

සැහෙන වේලාවකට ගෙදර තිබුණේ තද නිහඬතාවයකි. නිවසේ සියළු විදුලි බුබුළු වසා දමූ පසු අම්මා මගේ කොට්ටය අද්දර පාත් වූනාය.

'තාත්තට වෛර කරන්නෙපා මගේ මහත්තයෝ... මිනිස්සු කතා කියද්දී තාත්තට දුකයි... ඔයා ගැන තාත්තා හිතන් හිටියේ ගැමුණු කුමාරයා කියලා...'





'නෑ අ..ම්..මේ... තාත්තා හරි... ගැමුණු කුමාරවරුන්ට ගැසිමාලා ගැළපෙන්නෑ තමයි... මං.. මං එහෙම තාත්තට බය තරම් කේන්ති ගන්න වැරැද්දක් කළේ නෑ අම්මේ...'

'ගින්දර ඇවිලෙන්නේ කියලා නෙමේ පුතේ... අපි හරි අමාරුවෙන් ජීවත් වෙන මිනිස්සු... කරදර ඊනවට වඩා ආවොත් අපි ඔක්කොම අවුල් වෙනවා...'

ශීතල සිමෙන්ති පොළවේ සිසිලස නිරුවත් බඩට දනෙයි.

'මං හෙට බණ්ඩාරවෙල යනවා අම්මේ... ඔයා කියන්න ඔයාටත් මාව එපානම්... මං කොහේ හරි යනවා...'

'මොනාවද මේ කියන්නේ...'

'ශහීනා නරක කෙල්ලෙක්ද අම්මේ...'

'දන් මං හිතන ඒවා වැඩක් නෑ ලොකු පුතේ... හිතුවක්කාර නොවී අර මෙට්ටෙට උඩට යන්න...'

'එපා අම්මේ... මේ සීතල හොඳයි...'

තනිකමේ අන්ත කටුක දුක් පරතෙරටම විඳගන්නට මම තව තවත් සීතලට ගුළි වූනෙමි... 'මෙහෙම වෙන්වෙන්න ඇයි දෙවියෝ අපිව මුණ ගැස්සුවේ...' අවසාන මොහොතේ දුම්රිය පෙට්ටියේදී මගේ අත සිපගෙන ශහීනා කියූ සැටි මට සිහිවිය... 'මේ ලෝකේ අපි හදපු ලෝකයක් නෙමේ බබා... ඒකයි...'

මම ආදරය කරන්නට පටන් ගනිද්දීම ගින්නට හසුවී පියාපත් පුච්චා ගත් අසරණ සමනලයෙක් වැනිය... අප ජීවත්වෙන ලෝකය මේ තරම්ම දරුණු නපුරු තැනකැයි මම නීතෙකින්වත් නොසිතුවෙමි.

අපට ආදරයක් ගැන නොදෙඩාම පුංචි සඳළුතල දෙකට වී පාළුවෙන් තනිකමෙන් බලා සමණක් සැනසෙන්නට තිබුණි.



www.sinhalaelibrary.com

සඳට කොතරම් මිනිස්සු ආදරය කරනවාද... පුර පසොළොස්වකට සඳ රැස් ලෝබකමකින් තොරව ඇදවැටෙද්දී මිනිස්සු කී දහක් ඒ සඳ එළියේ නැහැවෙන්නට පතාගෙනම ඉන්නවාද... එහෙම පෙනුනත් සඳම හිමිකර ගන්නට අයිතිකරගන්නට කව්රුත් නොහිතති. ඒ බව හිතාවත් මට තිබුනේ එහා සඳළු තලයේ පායා තිබූ අවිහිංසක රාමලාන් සඳ රැස් දෙස බලා පමණක් සැනසෙන්නටය...

පායන්නේ එකම සඳකි... සඳ මෙර්රත්තෝද කලා පිරෙන්නේද එකම විටය... ලොවේ අනන්ත වූ ආදරවන්තයින් සිරි දරුවන් වෙනුවෙන් පායන එකම සඳට එක පිරිසක් රාමලාන් සඳ යැයි කියන්නේත් තවත් පිරිසක් වෙසක් පෝද සඳයැයි කියන්නේත් ඇයි... ජාතියක් ආගමක් දේශසීමාවක් නොමැතිව ගලන සඳ රැසින් ලෝකය එකම යායක් වන දවසක් නැතිද...

අපට හමුවන්නට තිබුනේ එහෙව් දවසකය. මගේ දෙමව්පියන් බලා සිටින්නේ ආරිය කුළ සිරිතට මාල හතක් දමා පෝරු මස්තකයෙන් බසිනා සිංහල මනමාලියක් මා ගෙදරට කැන්දුගෙන එන තුරුය.

එහෙත් හදවත කිසිවක් නොදනී... හදවත ප්‍රථම වරට ආදරයකින් උමතු වූයේ ඇයව දුටු දවසේ පටන්ය... එද සිට දුටු හැම දවසකම මම ඇයට වඩ වඩාත් ආදරය කලෙමි. කැලණි වැලි දුම්රියේදී ශහීනා මගේ උරපත්තට හිස තබාගෙන නිදසිටිද්දී ඒ ආදරය හදවතේ සියළු පෙකිනි වැල් කපාගෙන අලුත් දරුවෙකුසේ ඉපිද අවසානය...

හැමෝම දන් කියන්නේ ඒ දරුවා... ආදරයේ කුළුඳුල් ප්‍රාණය ජීවත් කළ නොහැකි බවය. මේ කටුක සමාජයේ එවැනි ආදරයකට උරුමයක් නැත. හැමෝම දුක් කන්දරා මැද ආදරය කරති. සිහින දකිති. පසුව සියකඩව වෙන්ව ගියද ඒ



සිය කඩේම ආදරය ඇත...

එහෙත් සංදේශ්ට... ශහීනාට ඒ ලෙස දුක් විඳිමින් මිය ආදරය කරන්නට උරුමයක් නැත. ලෝකය මේ තරම් විෂම බව දන දන මින්දද හී සර තිරුවංගල් එළිය වැදුණු දසකින්ම මට විද්දේ ඇයි... මරහෝත්විය ගැ සුරතකින්ම මට ප්‍රේමයේ දේත පා ඉගිලියන්නට වූයේ ඇයි...

දෙතුන් වරක් මගේ දස් තෙමී ගියේය... මේ ආරංචිය ශහීනලාගේ නිවසටත් ගොස් ඇතියැයි මම බිය උනෙමි... එසේ වී නම් මට වඩා දුකක් ඇයට විඳින්නට සිදුවෙනු ඇත. ඇගේ දුකත් මටම විඳින්නට වී ඇයව මේ ගිනි ජාලාවෙන් නිදහස් කළ යුතුය...

මා නෙලූ මල මට අහිමි වේ නම් තවත් මේ කුරුළු කැලේට වී ඉඳීම දුක් පසුව පාරවාගන්නා වැඩකි... අප අපට උරුම නැති දෙවයක අපේ රුව පවා අපට හින්දරකි... මේ කතාන්දරය මීට වඩා ලස්සනට ලියා අවසන් කළහැකි අත් මහක් නැතිද...

මම මුහුණ තදින් කොට්ටයේ හොවා ගත්තෙමි... හීතල පොළව මා ගැන දුක සිතී මෙන් තවත් හීතල වී තිබුණි.

'අ...යි...යේ...'

මහ රෑ නංගී පැමිණ මගේ හිස අතගෑවාය. මට කිසිවෙකු ආදරය නොකරනවානම් හොඳ යැයි මට හිතුණි. මේ සමාජයේ ජීවත් විය යුත්තේ හදවත ගලක් කරගෙනය...

'බඩගින්නේ නේද... මං තේකක් හදලා ගේන්නද...'

නංගීද අඬන්නට ආසන්නය. ඇගේ වරදක් නැත. නංගී මේ තීරණය මට වේලාසන කීවාය... මුලින් මුලින් මට ශහීනාව ජෝඩු කරමින් විහිළු කළ ඇයම පසුව මට අනතුරු ඇඟෙව්වේ යමක් දැනගෙනද...

'ම...ට... ඒ...සා... ගිහිල්ලා නිදාගන්න...'

මම කොට්ටයේ මුහුණ ඔබාගෙනම කීවෙමි.

'ඔහොම හිතන්නෙක් වගේ නිදාගෙන ඉන්න එපා... යන්න ගිහිල්ලා මගේ ඇඳේ නිදාගන්න... මං ඔයා ළඟ බිම නිදාගන්නම්...'

'ම...ට මේ බිම සනීපයි... අද විතරනේ...'

නංගී අඬ දනිව බිම ඉඳගෙන මගේ හිස නොනවත්වා අතගෑවාය.

'ඔයා ගැන තාත්තා පුදුම බලාපොරොත්තු තොගයක් තියාගෙන ඉන්නේ... එකපාර අරම කතාවක් ඇහුවාම තාත්තගේ ඒ සිහින මාළිගාවම බිමට සමතලා වෙන්න ඇති... ඒ ගැන මොනවත් හිතන්නෙපා... හැමෝටම දුකයි... ඔයාට බැණලා තාත්තා සතුටින් ඉන්නේ කියලා හිතනවද... ගිහිල්ලා බලන්න බත් හැලිය එහෙමමයි...'

'මං හෙට යනවා... එතකොට ඔයාලට නිදහසේ බත් කටක් කන්න පුළුවන්... මං මහ කරුමක්කාරයෙක්...'

මට අවශ්‍යව තිබුණේ මගෙන්ම පලිගන්නටය. එසේ කරද්දී දුක තුනී වී යයි.

'ඒ වගේ සම්බන්ධයක් ඔයා හිතනවට වඩා බරපතලයි අයියේ... තාත්තලා අම්මලා ඒක දන්නවා... එයාලා ලෝකේ මිනිස්සු එක්ක කතා බහ කරන අය... අපි ආශ්‍රය කරන්නේ කොල්ලෝ කෙල්ලෝ විතරයි... උන් ඕවා කියන්නේ නෑ...'

'දැන් හරි මිනිය වලලලා පාංශුකූලෙත් දීලා හත් දවසේ දානෙත් දීලා ඉවරයි... කතා ඕන නෑ බබා...'

www.sinhalaelibrary.com



'ඔයා ඔහොම කිව්වට මං දන්නවා අයියා විඳින දුක... ශහිනාට ඔයා වගේම මාත් ආදරෙයි...'

ඒ නමවත් නංගී මතක් නොකරනවානම් හොඳය.

'ඔයා ආදරේ කරනවා බලන්න... ඔයා කසාද බැඳලා ඉන්නව බලන්න මේ නංගී හරි ආසයි...'

'ඒ ආසාව හිතින් අහක් කරගන්න... මේ අයියා තනියම ජීවත්වෙලා පාළු කාමරේම නාකි හිතන්නෙක් වගේ තනියම මැරිලා යනවා...'

නංගිගේ කඳුළු මගේ නිරුවත් පිටට වැටුණි. ඇය හෝටු හුරා දිග සුසුමක් හෙළුවාය.

'තාත්තා අයියට බණිද්දී වැදුනේ මගේ පපුවට... මේ වැරැද්දට ඔයා විතරක් නෙමේ මාත් බැණුම් අහන්න ඕන... ඔයා ශහිනාට ආදරේ කරන්න හීන දක්කා... ඒ වගේම මාත් එයාව මගේ නෑනා කරගන්න හීන දක්කා... මං ඊකට උල්පන්දම් දුන්නා... ඔයාලව ජෝඩු කළා... ඔයාලට තනිවෙන්න දුන්නා... මේ නංගී හිතුවේ එයාගේ අයියට කරන්න පුළුවන් លොකුම උදව්ව ඒක කියලා... ඒත්...'

එසේ උන් නංගී වෙනස් වූයේ කෙසේද... මටද පුදුම ඒකය.

'ඔයා දන්නවනේ අපේ ඉස්කෝලේ මුස්ලිම් ගර්ල්ස්ලත් සෑහෙන ගාණක් ඉන්නවා... පංතියේ හොඳම යාළුවන්ගෙන් දෙන්නෙකුත් මුස්ලිම් ගර්ල්ස්ලා... අවංකවම අයියේ මං ඒ එක මුස්ලිම් ගර්ල් කෙනෙක් එක්ක ඔයාගෙයි ශහීනාගෙයි සම්බන්ධකම ගැන කිව්වා... ඔක්කොම කිව්වා... ඔයා පල්ලා... කියලා ඔළුවට අතක් තියාගත්තා... එද තමයි ෆස්ලියා මට ඔක්කොම

කිව්වේ... එයාලගේ ආගම බෞද්ධාගමට වඩා ගොඩක් වෙනස්... හින්දු ආගමටත් වඩා වෙනස්... එද එයා කිව්වේ ඔයා පුළුවන් තරම් ඉක්මනට ඒ සම්බන්ධෙ අයියට නතර කරන්න කියන්න නැත්නම් අයියත් දුක් විඳියි... ශහීනාත් දුක්විඳියි කියලා... මෙහෙම වෙන් උනත් දුක තමයි... ඒත් හිම්හිට ඒ දුක තුනී වෙයි... එහෙම නැතුව මේවා ඉස්සරහට ගෙනිහිල්ලා තවත් දුක් විඳින්න උනොත් ඔයාට වඩා දුක් විඳින්නෙ ශහීනා... අයියව බලාගෙන ඉන්න පුළුවන්ද...'

එය කළ නොහැක. ආදරයේ දුක දන් මට කොහොමත් එකය. මේ දුක මෙහෙමම හදවතේ කොනක ගින්දර කුට්ටියක්ව තැන්පත්ව තිබෙනු ඇත.

'ඔයා දෙමළ කෙල්ලෙක්ට ආදරේ කළා නම් කෝවිලක බැඳලා සින්දූර් තියලා තංගච්චිව කැන්දගෙන එන්න තිබ්බා... ඒ ආගම් දෙක අතර කොච්චර ප්‍රශ්න තිබුනත් ලෝකේ එහෙම වෙනවා... අර මට බෙහෙත් කරපු ඩොක්ටර් ශිවාංගි ඉන්නේ... එයා බැඳලා ඉන්නේ සිංහල ඩොක්ටර් කෙනෙක්... දෙන්නම පන්සල් යනවා... ඇයි පන්සලේම දේවාලයක් තියෙනවනේ... ඒත් ඉස්ලාම් සංස්කෘතියයි සිංහල සංස්කෘතියයි අහස පොළව වගේ... අපිට එක ගෙදරක ජීවත් වෙන්න බෑ... ඒකයි සිංහල ගර්ල් කෙනෙක් මුස්ලිම් කෙනෙක් බඳිද්දි එයාගේ ඉස්ලාම් ආගමට යන්නේ... මුස්ලිම් ආගමේ තියෙන්නේ වෙනස්ම දේවල්... ඒවා අපි නොදන තාත්තා වගේ විවේචනය කරන්න හොඳ නෑ... ඒත් අපි පැහැන්නේ නැති ආගම් දෙකක ජාති දෙකක්...'

නංගී කියන සියල්ල ඇත්තය. එහෙත් මේ දුක් විඳින





හදවත කිසිවක් තේරුම් නොගනී.

'දිගටම ඉන්න නෙමේ... එහෙම පළිගන්න හිතන්න එපා... ඒත් අයියා ටික දවසක් බණ්ඩාරවෙල යන්න... මං හිම්හිට ශහීනටත් හැම දෙයක්ම කියන්නම්... ඔයාල ගොඩක් ලොකු මිනිස්සුත් නෙවිනේ අයියේ... අපිට අපේ දෛවය බාර ගන්නම වෙනවා...'

'අපි ආයේ හම්බවෙන්න කතා කර ගත්තේ නෑ නංගී...'

මම බිඳුණ හඬින් කීවෙමි. දස් පෙහිගියේ ඒ වියෝගය සිහිවිය. කොතරම් දුකක්ද...

'දුක් විඳ විඳ හම්බවෙන්න ඕන සතුටක් විඳින්නනෙ... ඒත් ඔයාලා දෙන්නට බෑ... මිනිස්සු ප්‍රශ්නෙ දෙක කරනවා... ඔයා ලස්සනට ඉන්න කොල්ලෙක්... පිළිවෙලට ඉගෙන ගත්තා... ගොඩක් අය එහෙම කොල්ලන්ට ඊර්සියයි... තාත්තට අරම කියන්න තරම් ඒක මහ දෙයක්ද...'

'මට හරි දුකයි තාත්තා බැණපු විදිහට...'

'ඔය ඉතින්... අයියා ඔච්චරම මෝඩද...'

'මට නිදගන්න දෙන්න... ඔයා යන්න ගිහිල්ලා නිදගන්න...'

'මට බයයි අයියව මෙතන දලා යන්න... හොඳ ළමයා වගේ එන්න මගේ ඇඳට...'

'යන්... ඔයා ඇඳේ නිදගන්න... මං බිම නිදගන්නම්...'

මම කොට්ටයත් රැගෙන ගොස් නංගිගේ ඇඳ පාමුල වැතුනෙමි. නංගී ඇඳ මත දිගා වී එහි පාමුල නිදළුන් මගේ හිස දිගටම අතගෑවාය.

මගේ අනාගතය මට තව මොන දුකක් දෙන්නට බලා ඉන්නවා ඇත්ද...



www.sinhalaelibrary.com

# 27

පාන්දර මම වෙව්ලන්නට විය... මම හිතල සිමෙන්ති පොළොවේ උක්කුටි වීමි... පොළොවෙන් ආ ශීතල නිසා වෙව්ලීම වැඩිවිය. මම පිටි අත්ල ගෙලටත් තලලටත් තබා බැලුවෙමි...

තද උණකින් මම පෙළුනෙමි... නංගී තවමත් නිදිය... මම නැගිටින්නට සිතා දෙවරක්ම බිම ඉඳගත්තෙමි. ගතට පණක් නැත. වේල් දෙකකින් තොකෑ බව මට සිහිවූයේ එවිටය...

කඳුළු බිංදුවද පේන්නට ඇත... මම බිම ඉඳගෙන නංගීගෙ ඇඳට හිස තියා ගත්තෙමි... උණ වැඩිකමට මගේ දත් කෙස්වෙමින් තිබුණි...

මේ ගෙදරයේ අවශේෂ කාලකණ්ණි දුක විය යුතුය... පාන්දර පරිසරයේ වූ පාළුව විසින් හිත තුළ ඇති කළ



ආත්මානුකම්පාවත් ගැහෙන ගතේ දුබල බවත් මගේ හදවත තුළ තද අසරණකමක් ඇති කළේය...

අම්මාත් තාත්තාත් වයසට යනු ඇත... නංගී කවුරු හෝ සමඟ විවාහ වී ඇගේම ලෝකයක් තනා ගනු ඇත... මම... ආදරය කරන්නට කිසිවෙකු නැතුව තොසැනෙක හෝ මැරී මිය යනු ඇත...

ජීවිතය ගැන ඒ තරම් දුරට මම හිතන්නේ ඇයි...

විරාගයේ අරවින්ද ජයසේන සරෝජිනීට ආදරය කළේය... එහෙත් ඔහු සරාට ආදරය කරන බවත් කෙදිනකවත් ඇයට කීවේ නැත. ඔහු කියනතුරු සරෝජිනී බලා උන්නාය... අවසානයේ සරෝජිනීගේ දෙමව්පියන් සරෝජිනීව සිරිදාසට බන්දවා දුන්නෝය...

අවසාන කාලයේ අරවින්ද තට්ට තනියම කාමරයට වී දුක් විඳියි. ඔහුව බලාගන්නේ බතී නම් දුප්පත් ගැහැණු ළමයාය... අරවින්ද බතීට ආදරය කළාද නොකළාද කියා හරියටම කිව නොහැක...

පාළු කාමරයේ දුක් විඳින අරවින්දව බැලීමට දිනක් සරෝජිනී එන්නීය... සරෝජිනී අරවින්දව දැක බඳගෙන අඬයි...

'අඩන්නෙපා... ස...රා...'

අරවින්ද උපේක්ෂා සහගත දයාබර කමකින් කීවේය... අරවින්ද අන්තිම දවස් වනතුරු සරෝජිනීට ආදරය කළේය... එහෙත් ඔහු එපමණටම සිරිදාසටත් ආදරය කළේය. කෙනෙකුට ආදරය කරන්නට ඇයව හිමි කරගත යුතුම නැත.

අරවින්ද නොසැහෙන දුකක් විඳ අවසන් හුස්ම හෙලයි... නවකතාවේ එතැන කියවද්දී මම ඇඬුවෙමි...

මගේ ෙදෙවයද අරවින්දගේ දෛවය වැනි යැයි මම සිතුවෙමි. කෙදිනක හෝ මටද අපමණ දුක් විඳ තනියම මැරෙන්නට සිදු වෙනු ඇත... අන්තිම දවස්වල අරවින්දව

www.sinhalaelibrary.com

බලන්නට සරෝජිනීට එන්නට පවා හැකි විය. එහෙත් ශක්තියට එයවත් කළ නොහැක...

මම තද උණෙන් ගැහෙමින් නංගිගේ කාමරයෙන් පිට වූයෙමි... මේ තරම් දුරට මම දිරාපත් දවසක් මගේ මතකයේ නැත... කුස්සියට ගොස් මම ඇල් වතුර පොදකින් මුහුණත් ගෙලත් තවා ගත්තෙමි.

ඇල් වතුරට උණ බසී... එහෙත් මම දිගටම රෝගියෙක් වෙතැයි නිකමට මට සිතුණි.

කුස්සියෙන් යා ගන්නටවත් බැරි තරමට මගේ දෙපා වෙව්ලන්නට විය. මම කුඩා කෑම මේසයේ පුටුවක් අමාරුවෙන් ඇද ගත්තෙමි. කෑ ගසා අඬන්නට තරම් වේදනාවක් දැනුනෙන් මම එහෙමම මේසයේ හිස ගසා ගත්තෙමි.

'පුතා... පුතා... ඇ..යි මහත්තයෝ මේ... පුතා...'

පාන්දර තේ හදන්නට කුස්සියට ආ අම්මා කලබලයෙන් මෙන් හිස සොලවා ඇසුවාය. මම අමාරුවෙන් හිස එසවීමි.

'දෙ...යි...යෝ...නේ ඇයි මේ...'

'ම...ට අමාරුයි... අ...ම්...මේ මා...ව ඉස්පිරිතාලෙකට ගි...හි...න් දන්න...'

මම වෙව්ලමින් හඬමින් කීවෙමි.

'අ...නේ... දෙයියනේ ඔයාට සහලේල උණනේ... මොනව උනාද මන්ද මේ දරුවට... ගොඩක් වෙලාද රත්තරන් ඇවිත්...'

'පාන්දර හතරට විතර අම්මේ... මාව ගැ...හෙ...නා...වා මැ...රෙන්න වා...ගේ...'

දසින් බේරී ආ කඳුළු එහෙමම මේස රෙද්දට උරා ගත්තේය.





'යන්... යන් මහත්තයෝ ඇඳට... ඔයාට අමාරුයි... ගහක් ගලක් වගේ ඉඳලා මේ මොනවා කරගන්නද...'

ඇත්තටම මට මොනවා උනාද... අම්මා මාව වත්තම් කර ගත්තාය... මම ආබාධිත දරුවෙකු මෙන් ඇගේ උරහිසේ එල්ලී නංගිගේ කාමරයට ගියෙමි.

'චූටි දුවේ නැගිටින්න... අයියට හොඳටම අමාරුයි... ඉක්මනට...'

නංගී කලබලයෙන් නැගිට්ටාය.

'අයියා මං ගාව නිදගත්තේ... ඇයි මේ අයියට...'

'උණ දෙයියනේ උණ... මේ අත තියලා බලන්න... දුවනවා ගිහිල්ලා තාත්තට ඇහැරවනවා...'

අම්මා නංගීටද බැණ කීවාය.

'එ...පා අම්මේ... තා...'

මට කියන්නට නොලැබිණි. තාත්තා කාමරයේ දොර රෙද්ද මෑත්කර කාමරයට එබුනේය. ඔහුගේ මුහුණේ වූයේ තළතිරුණු ලකුණුය...

'දරුවට හොඳටම සනීප නෑ... ඩොක්ටර් ගාවට ගෙනියන්න වෙයි...'

අම්මා ඇසුවාය... මම තද සීතල මහ හරවා ගනු පිණිස නංගිගේ රෙද්ද පොරවාගෙන ඇඳේ අතින් පැත්තට වකුටු වීමි... ගතම අහිස් පෙට්ටියක දමුවාක් මෙන් ගැහෙමින් තිබුණි.

'මේ බලන්න ගැහෙන හැටි... දරුවට මොනාහරි වෙයි මෙහෙම ගිහිල්ලා... ඉක්මන් කරන්න...'

නලලට ආවේ තාත්තගේ පිටි අත්ල විය යුතුය. මට දස් පියාගත්තෙමි.



www.sinhalaelibrary.com

'මෙච්චර උණක්...'

තාත්තා පුදුමයෙන් ඇසුවේය... මම දස් තදින් පියාගත්තෙමි.

'අනේ දන්නෑ... පුංචි කාලෙවත් මෙහෙම ගැහි ගැහී මෙහෙම උණ අරගෙන නෑ... දවල් හොඳට හිටිය දරුවා...'

'ලො...කු... පු...තා...'

තාත්තා කැඩී ගිය හඬින් කතා කළේය. මම නොහැරුනෙමි...

'රෑ පිස්සා වගේ මොනාහරි බිව්වද...'

මම නැතැයි කියන්නට හිස වැනුවෙමි...

'මගේ කොල්ලා එච්චර බොළඳ කොල්ලෙක් නෙමේ... ඉක්මනට ගිහිල්ලා බෙහෙත් ටිකක් ගමු... ඔයාට බැරි නම් ඉන්න මං යන්නම්... මට ත්‍රීවිලර් එකක් ගෙනත් දෙන්න...'

තාත්තා කාමරයෙන් ගිය පසු නංගී ඔඩී ක්ලෝත් පෙඟවූ රෙදි කඩක් නළලතට දමුවාය. උණ වැඩිකමට එය මොහොතකින් වියළිණ.

'ඊයේ දවල්ට කාලා නෑ... රෑට කාලා නෑ... උදේ කාලා ගිය ඉඳි ආප්ප හතර පහ විතරයි... තාත්තා අයියට බැන්නා පැර වැඩී... එච්චර බනින්න තරම් අයියා වරදක් කළේ නෑ... හරියට අපරාධ කාරයෙක්ට වගේ... චල් වනවර වැඩක් කළේ නැතේ අයියා... රෑ අන්න හිඟන්නෙක් වගේ වැටිලා හිටියේ බඩගින්නේ... කතා කරලා ඇඳට යන්න කිව්වා ගියේ නෑ... අයියාගේ හිත හරි මෙලෙක්... මෙච්චර ඉඳලා තාත්තා එයාගේ ලොකු පුතාව තේරුම් ගත්තේ නෑ... අයියව මේ තත්වෙන් බණ්ඩාරවෙල යවන්න නම් හදන්න එපා... අම්මා තාත්තට කියන්න...'



නංගී මගේ නළලත දෙකෙළවර සිද්ධාලේප ගල්වා පිරිමදිමින් කියාගෙන ගියාය. අම්මා දිග සුසුමක් හෙළුවා හැරෙන්නට කිසිවක් කීවේ නැත. මේ හැටි උණ ගත්තේ තාත්තා අර තරම් බැන්න නිසාද...

'හෙට අනිද්දා ඒ ළමයා බන්දලා දුන්නට පස්සේ මේ ගෙදරින් යනවා... ඊට පස්සේ ප්‍රශ්නයක් නැනේ...'

'චූටි දන් ඔය කතා නවත්තනන්න... ගිහින් අයියගේ කලිසමකුයි ෂර්ට් එකකුයි ගේන්න...'

සීතල තවත් දැඩිවන්නට විය.

'අ...ම්...මේ තව මොනාහරි මට පොරවන්න අම්මේ... හී...ත...ල...යි...'

'ෂිත්... මොනා උනාද මේ දරුවට... උණ තියෙද්දී ගොඩක් පොරවගන්න හොඳ නෑ මහත්තයෝ... එතකොට උණ වහන්නේ නෑ...'

හිස ක්ලාන්තයක් මෙන් හැදී කරකැවෙන්නට විය... මම එහෙමම දස් පියාගත්තෙමි.... මගේ සිහිය මං කෙරෙන් පහ විය...

ඩිස්පැන්සරියේදී කිසිවෙකු මාව පරීක්ෂා කරනවා මම සිහිනෙන් මෙන් දුටිමි... අන්තිමට මං දුටුවේ ට්‍රොලියක තබාගෙන මාව රැගෙන යන ආකාරයයි.

මට මොනවා උනාද...

www.sinhalaelibrary.com

# 28

**මා**ව ජයවර්ධනපුර රෝහලේ නතර කෙරිණ... රෝහලක නේවාසික රෝගියෙක් වන තරමට මට අමාරු විය... අම්මා කියන්නාක් මෙන් ගහක් ගලක් සේ උන් මා එකවර ලෙඩ ඇඳකට වැටුනේ ඇයි... එවැන්නක් ගැන හිතන්නට පවා මට සහනයක් නොතිබිණ...

එන්නතක් දුන් පසු තද නින්දකට මා වැටුණ බව මට මතකය... මම ඇඳේ ඒ අතට මේ අතට කෙඳිරි ගාමින්ම නින්දට වැටුනෙමි...

යන්තමට ඇස් දෙකෙහි විවර කර බලද්දී දහවල්ය... මගේ අතක සේලයින් බටයක් ගසා තිබුණි.... ඒ දැක මට මහා අසරණ හැඟීමක් ඇති විය.

'මට වතුර ටිකක් දෙනවද...'





මගේ ඇඳේ කෙළවර තියා තිබූ කාඩ් එක පරීක්ෂා කරමින් උන් හෙදියට මම කීවෙමි...

'අපි උණ ටිකක් බලලම මොනාහරි බොමු...'

ඇය උණ කටූව මගේ මුවට ඇතුල් කර මා දෙස බලා උන්නාය... දත් ඇරගෙන ඉන්නට පවා මට වාරුවක් නැත.

'වතුර ගොඩක් බොන්නෙපා... දන් ගෙදර අය ආවාම මොනාහරි කාලා අපි බෙහෙත් ටික බොමු...'

'කෝ එයාලා...'

'තව ටිකකින් එයි... ආ... මෙන්න...'

වතුර පොද උගුරින් පහලට ගලා ගියේ වියළී වී ගිය මුළු උගුරම තෙමාගෙනයි... මම ඇඳේ යාන්තමට හැරී වාඩි වූයේ ඉන් අනික් රෝගීන් දෙස බලා උන්නෙමි... ඔවුන් දැක හදවතේ වූ ආත්මානුකම්පාව තවත් වැඩි විය...

අම්මාත් නංගීත් පැමිණ ඇඳේ දෙපස සිට මා දෙස බලා උන්නෝය... මම ඇල්මැරුණ හිනාවෙන් ඔවුන් දෙස බලා උන්නෙමි... ඔවුන්ටත් මා බරක් යැයි මට සිතුණි...

'ඇ...යි අම්මේ මාව නතර කළේ...'

අම්මා නංගී දෙසද බලා සුසුමක් හෙළුවාය...

'එකපාර එහෙම උණ වැඩි වෙන්න හොඳ නෑ... අනික හේතුවක් නැතුව... බය හින්ද මහත්තයෝ නතර කළේ... උණ වැඩිවෙලා වෙන ලෙඩකට ආවොත්...'

'හවසට මාව ගෙදර එක්කගෙන යනවද...'

එක අතකට ගෙදර යන්නේ ඇයි... ඉවසාගත නොහැකි දුකක් දනෙන්නේ ගෙදර ගිය විටය... මාව රෝහලේ නවත්වා ඇති බව ශෙහීනා දන්නවාද... දන්නවානම් ඇය කෙසේ හෝ



www.sinhalaelibrary.com

මා බලන්නට පැමිණෙනු ඇත...

'හොඳටම උණ... බහිනකල් ඉඳලම ගෙදර යන් අයියේ... මේ දවස්වල එක එක ඩෙංගු උණ වර්ග තියෙනවා.... ඩෙංගු... වෛරස්ලු...'

නංගී සූප් බෝතලයෙන් සූප් ටිකක් කුඩා වීදුරුවකට ද ගත්තාය.

'උණුවෙන් බොන්න... එතකොට ටිකක් බොන්න පුළුවන්...'

ඇය කුඩා ප්ලාස්ටික් හැන්දෙන් සූප් ටික ටික පෙව්වාය... එහෙත් හැදි දෙක තුනක් බිගෙන යද්දී මට මහා අප්පිරියාවක් දැනුණි.

'ඇ...ති බොන්න බෑ...'

'අ...නේ.... දවස් කීයක් බඩගින්නෙද...'

'මං පස්සේ බොන්නම්...'

මම එහෙමම යළිත් ඇඳට වැටුනෙමි... විනාඩි පහකට වඩා දැස් ඇරගෙන සිටිය නොහැක.

'ඔයාට ගොඩක් අපලයි පුතේ... ටිකක් කල්පනාවෙන් වැඩ කරන්න... මේක එච්චර හොඳ කාලයක් නෙමේ...'

අම්මා සැහෙන වෙලාවකට පසු කීවාය. එය මටද තේරුම් ගොස් තිබුණි. සමහර විට මගේ අපල කාලය තව සැහෙන කාලයක් යන තුරා තිබිය හැක...

දහවල් ලෙඩුන් බලන වේලාව තිමා විය... තමන්ව බලන්නට ආ නෑසියන් පිටව ගියපසු වාට්ටුවේ උන් ලෙඩුන් ඔහේ ගිලන් ඇඳේ වකුටු වී බලාගත් අත බලා ඉන්නට විය... හිත පුරා මහා කාලකණ්ණි පාළුවක් පැතිරී ගියෙන් මම යකඩ ඇඳ විට්ටමට සුදු කොට්ටය තබා වාට්ටුවට යාබද වූ අරලිය ගස් පේළිය දෙස බලා උන්නෙමි...





ජීවිතයේ කවර දකවත් නැති තනිකමක් පපුවේ බිත්ති කඩාගෙන පපුවට අනවසරයෙන්ම පැමිණ තිබුණි. මට හදිස්සියේ වූයේ කුමක්දැයි මටවත් තේරුම් ගත නොහැකි විය...

මා රෝහල් ගත කළ බව ශනීතා දන්නවාද... සමහර විට නංගී ඇයට සියල්ල කියන්නට ඇත... කිරිදත් පේන්න යාංතමට ආදරයෙන් සිනාසෙන්නට වෑයම් කරද්දීම සියල්ල විනාශ විය... නොවේ නම් ලෝකයම එක් වී ඒ ආදරය ඝාතනය කළේය...

මගේ ආදරය එසේ අඩු වයසින් මරා දැමූවේ මගේම තාත්තා පමණක් යැයි මම විශ්වාස නොකරමි... අනාගතයක් නැති ආදරයක් පස්සේ වැටී ලොකු පුතා විනාශ වේ යැයි තාත්තා හිතන්නට ඇත. ජාති කුල ගොත් වලින් ජීවිත වෙන්කර ප්‍රථම තාත්තා මගේ තාත්තා නොවේ...

ශනීතාට වෙනසක් නොමැතිව අම්මා තාත්තා නංගී ආදරය කළේය. 'හරි සීදේවි කෙල්ල...' ගෙදර හැමෝම ඇය ගැන කීවේ එලෙසිනි. ඒ දවස්වල අපි තරහ වී උන්නෙමු. ඇය බලද්දී මම අහක බලා ගත්තෙමි. ඇය ගෙට ගොඩවෙද්දී මම ඇයව මගහැර කාමරයට ගියෙමි. සමහර දවස්වල මම බැල්කනියේ දොර නොඇරම පාළු කාමරයට වී හැඟුම් මැඩගෙන උන්නෙමි. ශනීතා එක් වරක් නොව දෙතුන් වර බැල්කනියට පැමිණ හැරී ගියාය...

'උඩ ඔයාගේ කාමරේට රබර් වත්තේ ඉඳලා එන සුළඟ හොඳට එනවා ඇති නේද...'

දවසක් මිදුලේ කුරු අඹ ගස යටට වී ඉන්නා විටෙක නංගී ශනීතාගෙන් ඇසුවාය. මම බොරුවට පොතේ නෙත් තබාගෙන මේ කතාව අසාගෙන උන්නෙමි.

'රෑට ඇරගෙන ඉන්න බයයි... නැත්නම් මම රෑටත්

ජනේලෙ ඇරගෙන නිදා ගන්නේ... ඒ තරම් සුළඟ... හරි සනීපයි... ඒ වුනාට සමහර අය නම් මුළු දවසෙම බැල්කනියේ දොර වහගෙන ඉන්නේ... බො...රු...ව...ට රස්නේ පිච්චෙනවා...’

ශහීනා කුරු අඹ ගසේ එල්ලී හොර බැල්මක් මා දෙස හෙලා කීවාය. හිස නොසොල්ලාම මම ඇස පමණක් පොතෙන් ඉවතට ගෙන ඇය දෙස බැලුවෙමි... අඹගසේ කරුවක් අතර දත් තබාගෙන ඇය මට තියෙව්වාය...

‘කවුද අපේ අයියද...’

නංගී සෑහුවම ඇසුවාය...

‘සමහර අය ආස නැහැනේ පාන්දර ඉස්ඉස්සෙල්ලා මුසල කෙල්ලන්ගේ මූණ බලන්න... මං ඉන්නේ පල්ලෙහා කාමරේකට යන්න... එතකොටවත් දොර ඇරගෙන නිදහසේ ඉදියිනේ...’

එද මට මහ දුකක් දනුණි. හිතා මතා මා එසේ නොකළ බව එද මට කියාගන්නට බැරි විය... ඊට පසුද බැරි විය... දත් කොහොමත් බැරිය...

‘අපේ අයියා බැල්කනියේ දොර අරින්නේ රෑට... මං කෝපි ගෙනෙද්දී එයා බැල්කනියේ පුටුවක් තියාගෙන බර කල්පනාව...’

‘රෑට රබර් වත්තේ හොල්මන් තියෙනවලු... මට නම් බයයි...’

මම හොල්පට තදකර ගත්තෙමි. කුරුළු කැලේ හොල්මන් නැත. ඒත් රෑට රබර් ගස් අස්සෙන් වඳුරෝ උඩ යති.

‘ඇත්තද අයියේ...’

නංගී උඳුපියළිය ගස් අතර වූ වල් ගස් ගලවමින් ඇසුවාය.

‘ම... රෑ නමය දහය පැත්තාම සුදු ඇඳගෙන ගෑණු





කෙනෙක් ඉටි පන්දමක් පත්තු කරගෙන රබර් ගස් යට ඉඳගෙන හිනා වෙනවා... කතා කරනවා...’

මම මහා බොරුවක් ගොතා කීවෙමි. රබර් ගස් යට මා දුටු සුදු ඇඳි ගැහැණියෙක් නැත.

‘අ...නේ බලන්න... සංදේශ් අයියා මාව බොරුවට බය කරනවා... ඔය අපි බැල්කනියට එනවට...’

ශහීනා කියමුසු වේදනාවකින් කීවාය. මම ඕනාවටත් වඩා බැරෑරුම් පෙනුමක් ගත්තෙමි.

‘බොරු නම් ඔය කියන එක්කෙනා බලන් ඉන්න එකයි ඇත්තේ... ටික වෙලාවක් බලාගෙන ඉඳිද්දී ඒ ගෑණු කෙනා සාරිය ගලවනවා...’

නංගීත් ශහීනාත් මුහුණට මුහුණ බලා ගත්තෝය. බොරුවක් වුවද නිර්මාණශීලීව ගෙතිය යුතුය.

‘සංදේශ් අහක බලන් හිටියද...’

‘ඔ...ව්...’

‘ඇඳුම් ගලවනවා...’

‘ඔ...ව්...’

‘ඊ...ට පස්සේ...’

‘හූ කියාගෙන රබර් වත්ත මැද්දට දුවනවා... පස්සේ ටික වෙලාවක් යද්දී අඩන සද්දයක් ඇහෙනවා...’

‘දෙ...යි...යා...නේ...’

‘රෑ දෙකට විතර මර ලතෝනියක් ඇහෙනවා... මටත් බය හිතිලා මං කාමරේට ආවා... පාන්දර නැගිටලා එයා ඇඳුම් ගලවන තැන දිහා බැලුවා...’

'එතකොට...'

'එතන ලේන්සුවක් සයිස් සුදු සාරියක තැල්ලක් තිබ්බා...'

ශනීතාගේ දස් ලොකු වී තිබුණි. කෙල්ල බොරුව ගිල්ල බව මම ඉවෙන් තේරුම් ගත්තෙමි...

'ඇ...යි එහෙම වෙන්නේ... ඇයි එයා රෑට අඩන්නේ...'

'ගොඩක් ඉස්සර ඇත්තටම එහෙම ගෑණු කෙනෙක් ඉන්න ඇති... මේ ගෙවල් හැදෙන්න කලින්... එයා රෑක ඉච්පන්දමක් පත්තු කරගෙන එද්දි කව්රුහරි පිරිමියෙක් ඉඳලා එයාගේ ඇඳුම් ගලවලා එයාට කරදර කරන්න ඇති...'

මම අසා තිබූ රෙතත් හොල්මන් කතාවක් මේ බොරුවට මම ගැට ගසා ගත්තෙමි. එසේ ඉන්නේ මෝහිණිය.

'සංදේශ් අයියා බොරු නේද කියන්නේ...'

අහිංසක කෙල්ලව බය කිරීම ගැන මම කම්පා උනෙමි. ඇය බැල්කනියට වී රෑ රබර් වත තුරු බියක් නොමැතිව උන්නාය... මම ඒ නිදහස නැති කළා නොවේද...

'ගෙදරක් කව්රුත් නෑ... දත් තනියම ගිහිල්ලා ඉන්නත් බයයි...'

ගොම්මන් අඳුර යාන්තමට වැටී තිබුනොත් ශනීතා ගෙට යා ගත නොහැකිව උන්නාය. නංගී මා දෙස රවා බැලුවාය.

'අදින් පස්සේ මගේ බැල්කනියේ දොර වහලා දනවා... ඇඳක් අනින් පැත්තට හරව ගන්නවා...'

කර ගත්තේ මෝඩ වැඩක් බව මට හැඟුණි. ඇය බැල්කනියට හොල්මන් සඳ පායනවාත් බොරුය.

'මට වතුර ටිකක් දෙන්න බබා...'

නංගීගෙන් ඇය අසරණව වතුර වීදුරුවක් ඉල්ලුවාය...



කෙල්ල ඉන්නේ පරතෙරටම බය වීය...

'රබර් වත්තේ හොල්මන් නෑ... මං කිව්වේ බොරු...'

මගේ බොරුව කුමක්ද ඇත්ත කුමක්ද කියා දත් ශනීතාට තේරුම් ගත නොහැක. මා බොරු කියන්නේ ඇත්ත මෙනි.

'ඇත්තම කියන්න...'

'රබර් වත්තේ රෑට දුවන්නේ වඳුරෝ විතරයි... හොල්මන් කියලා ජාතියක් නෑ... ඒ බොරු... මං රෑ දෙකට තුනටත් බැල්කනියට ඇවිත් රබර් වත්ත දිහා බලන් ඉන්නවා... රබර් වත්තට හඳ පැයුවාම හරි ලස්සනයි...'

'එහෙනම් උදේ සුදු සාරි පොටක් තිබ්බා කිව්වේ...'

'ඒකත් බොරු... හොල්මන් කියන්නේ මෝඩ නූගත් මිනිස්සු හදාගත්තු විකාරයක්...'

නංගී එන්නට ප්‍රථම මම දොරකඩින් නැගිට ගෙට යන්නට නැගිට්ටෙමි.

'අනේ මාත් එක්ක ටිකක් ඉන්න...'

'මං කිව්වනේ හොල්මන් නෑ කියලා... බය වෙන්න එපා...'

'බයට නෙමෙයි සංදේශ් අයියේ... මට හරි පාළුයි...'

එද ඒ ගොම්මන් සැඳෑවේ ඇති වූ හිරවැටීම මේ දනුත් මගේ ළයේ ඇතිවෙයි. ඒත් ඒ අහිංසක ආදර කතාවට මෙහෙම කළ ලෝකයට හෙණම ගැසිය යුතුය. අප කොතරම් අහිංසකද... අප ජීවිතයේ ඉල්ලා සිටි දේ මොනතරම් පුංචිද...

රහසේම මගේ දස් තෙත්ව ගියේය... ජීවිතය දත් ඉතින් සදාකාලයටම පාළු මළ ගෙයක් නොවේදයි මට සිතුණි...

# 29

පියාගෙන උන් දෑස් හදිස්සියේම මම ඇරියෙමි... රෝහලේ හෙදියක් සමඟ එමින් උන් යුවතියව දැක මම ගැස්සී ගියෙමි... බොඳව ගොස් තිබූ දෙනෙත් මායාවක් දකිනවා විය යුතුය. මම දෑස් පිසද බැලුවෙමි. නැත... හෙදිය සමඟ මේ එන්නේ ශහීනාමය... ඇය පාසල් ඇඳුමින් සැරසී බියපත් දෙනෙත් මා වෙතම තබාගෙන ගිලන් සහන් පදුකර මා වෙතට එමින් උන්නාය...

ලෙඩුන් බලන වේලාවෙන් බාහිරව ශහීනා රෝහලට ආවේ කෙසේද... මම පුදුමයෙන් සිතුවෙමි. අනෙක ඇය යළි යළිත් ප්‍රශ්න ඇතිකර ගන්නට හදන්නේ ඇයි.... මට නම් කොහොමත් එකය... දැන් ගින්දර ඇයටය.

'ස...ං...දේ...ශ්...'





ශහීනාට කතාකර ගත නොහැකි විය. මම දෑත පහලට දමා ඇඳේ ඉඳගන්නට මහන්සි ගත්තෙමි,

'ඩොක්ටර් එන්න කලින් බලලා ඉවර කරන්න බබා... නැත්තම් මගේ රස්සාවත් ඉවරයි... මං ජීවිතේට කරන්නේ නැති දෙයක් මේ කළේ...'

හෙදිය මා දෙසද බලා කීවාය.

'මොනවද රත්තරන් මේ උ...නේ...'

මම තොල්පට හපා ගත්තෙමි. ශහීනාගේ පුරත ඉන්ජෙක්ෂන් කටු ගැසූ මගේ වමත මතය. එය හිඟන්නෙක්ගේ දුබල අතකට සමානය.

'අඬන්නෙපා... හොඳ නැතේ කොහොමද ආවේ...'

'මගේ යාළුවෙක්ගේ අක්කා කෙනෙක්.. එයාව නම්බ වෙනවා වගේ හොස්පිට්ල් එකට ආවේ... ඒ අක්කට අඬලා අඬලා අවසර ගත්තේ... මාව පිච්චෙනවා සංදේශ්... අනේ මං නිසාද මේ ඔක්කොම...'

කුඩා ලේන්සුවේ මල් අතර කඳුළු සඟවාගෙන ශහීනා ඇසුවාය.

'ඇ...යි ගෙදර මොකක් හරි ප්‍රශ්නයක් උනාද...'

'නෑ... තාත්තා කල්මුනේ ගිහිල්ලා... ආවාම පත්තු වෙයි... ඇ...යි අපට මෙහෙම වෙන්නේ අයියේ...'

මමද එය නොදනිමි...

'ඔහොම අඬන්නෙපා... මට බලන් ඉන්න බෑ...'

'හැමෝම කියන්නේ අපි වැරදියි කියලා... නංගිත් එහෙම කිව්වා...'



www.sinhalaelibrary.com

'එයා බැන්නද...'

'අපෝ නෑ... මං වෝඩ් එක අහගත්තේ නංගිගෙන්... ඇයි එකපාර අසනීප උනේ... තාත්ත බැන්න නිසාද...'

'මේ වෛරස් උණ...'

'මං එක්කල තරහද... අනේ එහෙම නම් කරන්නෙපා... ඔයා දන්නෑ...'

ශහීනා පුංචි එකියක මෙන් ලේන්සුවෙන් හොටු හූරා මගේ ඉන්ජෙක්ෂන් කටු ගැසූ පිටි අත්ල දෙස බලා උන්නාය.

'ප...චි...'

'මොනවද මං දුන්නේ නැත්තේ...'

'ම...ට... මෙච්චර ආදරෙයි කියලා මමවත් දනගෙන උන්නෑ...'

ශහීනාගේ වචන ලෙඩ පපුවට බෙහෙත් අලේපනයක් බඳු විය... ආදරය කොතරම් සුවදායකද... මිහිරිද...

'මොනවද සංදේශ් කියන්න හදන්නේ... ජීවිතේම මතක කියාගෙන ඉන්නම් කියන්න...'

මගේ ඇස්වල කඳුළු කැට දෙකක් මතුවිය. මොහොතකින් ඒවා විසල් කම්මුල් වලට වැටී ගලා ගියේය.

'මං අඬන්නම් සංදේශ් අයියේ... ඔයා අඬන්නෙපා... මට මොනා හරි කියන්න...'

පපුව සීසී කඩට වෙන්ව ගියාක් මෙන් හැඟෙයි... මම කඳුළු උතුරන දෙනෙත් එසවීමි... ශහීනා දෑස් ලොකුකර ගත්තාය...

'ඇයි දෙයියනේ... අ...මා...රු...ද...'





'ඔව්... හා...රි... අමාරුයි.... ඔයා නැතුව ජීවත් වෙන්න හරි අමාරුයි... හා...රි...ම අමාරුයි... මං මෙහෙමම ලෙඩෙක් වෙයි බබා...'

කෑ ගසා අඬන්නට හැකි නම් මම එසේ අඬ අඬා එය කියමි. ශහීනා මා හිස තැබූ සුදු කොට්ටය සුරතින් හද කර ගත්තාය. ඇගේ ඇද වූ ඇඹිලි අඩු ඒ පපුවේ කැකෑරෙන දුක කියා පෑවේය.

'මං... මො...න...ව...ද කරන්න ඕන... කියන්න...'

ශහීනා ඇසුවාය...

'කරන්න දෙයක් නෑ... මේ අපේ දෛවය... නෑ මගේ දෛවය... ඔයාලගේ ආගමේ දෛවය කියලා දෙයක් නැනේ... නේ...ද...'

කිසිවක් කියාගත නොහැකිව ශහීනා මා පොරවා පසෙක තැබූ සුදු රෙද්ද ගෙන නමා පසෙක තැබුවාය.

'පුළුවන් නම් බණ්ඩාරවෙල නොගිහින් ඉන්න...'

'උදේ හවා දැක දැක මට පපුව පුච්ච ගන්න බෑ...'

'දකින්න නැති උනාම කොච්චර පිච්චෙනවද කියලා සංදේශ් අයියා දන්නේ නෑ...'

දිග සුසුමක් හෙළූ ශහීනා දුර්වල හඬකින් කීවාය. කොහොමත් අපේ කතාවේ ලස්සන දවස් නැත... කොහෙත්ම නැත...

සෙනසුරාද උදේ මගේ ටිකට් කපනු ලැබිය. ටිකට් කපාගෙන මාව රැගෙන යන්නට ත්‍රීවීලරයකින් ආ තාත්තා මා සමඟ වචනයක් වත් කතා නොකළේය... ලොකු පුතාට මෙහෙම කරන්නේ ඇයි දැයි දහස් වාරයක් මම හිතින් තාත්තාගෙන් ඇසුවෙමි.

ත්‍රීවීලරය ගෙදර ගේට්ටුව අසළ නවත්වද්දී මම හිතාමතාම ශනීතාගේ නිවස දෙසවත් නොබැලුවෙමි. සමහර විට ඇය කොහාට වී හෝ බලා සිටින්නට ඇත... මේ අපට ආදරය කරන්නට තැනූ ලෝකය නොවේ... ලෝකයම එකම යායක් වන ආත්මයක ඉපදේවායි පතා මම මගේ ප්‍රථම ප්‍රේමය මිහිදන් කළෙමි.

ගතේ අසනීප සනීප කරගෙන මා ගෙට පය තැබුවේ හදවතේ සදාකාලික රෝගියෙක් වීය... ලෝකය කෙරේ උපන් කද අප්පිරියාවත් කළකිරීමත් මගේ පපුවේ විය... හද ගැබේ උපන් අහිංසකම හැඟීමකට ගැරහූ මේ ලෝකය කොතරම් නින්දිතද... කෲරද... මේ මිනිසුන් බඩදරු අම්මලාගේ බඩට පයින් ගසන එක පුදුමයක් නොවේ. කිරි දරුවන් පොළොවේ ගසා මැරීම පුදුමයක් නොවේ...

ආදරය හදවතේ උපදින්නේ ජාතියක් නැතුවය... එය ගලායන්නේද ජාතියක් ආගමක් නැතුවය... එහෙත් ලෝකය ආදරයටත් ලේබලයක් අලවයි.

'ඔයා දැන් ඔය හැම දෙයක්ම අමතක කරලා ඉස්සර වගේ ඉන්න...'

මැරී ගිය ගතින් මෙන් සැටියේ වැටී සිටියදී අම්මා පැමිණ මගේ හිස අතගා කීවාය... ඇගේ ඇස්වල කඳුළුය...

'ඔයා නරක ළමයෙක් නෙවී කියලා අපි ඔක්කොම දන්නවා... ඔයා අතින් වරදක් උනේ නෑ කියලත් අපි දන්නවා... කොල්ලෙක් උනාම ජීවිතේ සතුට වගේම දුකත් දරාගන්න ඕන... ඔයාව අපි හැදුවේ ඔහොම පරවැලක් වගේ වැටිලා දුක් විඳිනවා බලන්න නෙමේ... අපි මැරුණත් ඔයාගේ පපුව කෙලින් තියෙන්න ඕන... අපේ මිනිය හරි මේ පාරේ උස්සගෙන යන්න...'





අම්මාට කුමක් කියන්නදැයි මට නොතේරේ... මගේ ජීවිතය පටන් ගනිද්දීම නාස්ති වීයැයි අම්මා හිතන්නට ඇත.

'එදයින් පස්සේ ගෙදර කවුරුවත් බත් කටක් කන්නේ නෑ... මම ඉව්වෙත් නෑ... මේ ගෙදර එහෙම මළ ගෙදරක් කරන්න එපා මහත්තයෝ... අපි එහෙම ජීවත් වෙච්ච හතර දෙනෙක් නෙමෙයිනේ...'

මම දැස් තදකරගෙන බිත්තියේ ගසා තිබූ මොනාලිසාගේ ඡායාරූපය දෙස බලා උන්නෙමි. ඒ ඇස්වල මහා දුකක් හිරගත කළ පාළු හිනාවක් විය. මොනාලිසා සිනාසෙමින් අඬනවාද... නැත්නම් අඬමින් සිනාසෙනවාද... එය දන්නේ මොනාලිසා ඇන්ද මයිකල් ආන්ජලෝමය...

'ඊයේ මාමා ඇවිත් තාත්තාටත් බැන්නා... ඔයාට එහෙම කතා කළා කියලා... තාත්තත් දන්නවා එයා වරදක් කළා කියලා... මිනිස්සුනේ පුතේ... තව ටිකක් සනීප උනාම ටික දවසකට බණ්ඩාරවෙල යන්න... මාමා පොඩි හෝටලයකුත් දානව වගේ... ඒ වැඩ ටික දවසක් ගිහින් බලා ගන්න...'

'පුළුවන් නම් බණ්ඩාරවෙල නොගිහින් ඉන්න...' ශනීතා රෝහලට ආ මොහොතේ කියූ වදන් මට සිහිවිය. කොහොමටත් කුරුළු කැළේ ජීවිතය දැන් දුකකි.

'මං හෙටම බණ්ඩාරවෙල යන්නම්...'

අම්මාගේ මුහුණ මැලවී ගියේය. මා ගෙදරින් පිට ඉන්නවාට ඇය කැමති නැති බව මම දනිමි.

'එච්චර ඉක්මණට යන්න ඕනෙත් නෑ... මාමාට කතා කරලා බලමු...'

'මං කොහොමත් මෙහෙ ඉන්න ආස නෑ අම්මේ...'



www.sinhalaelibrary.com

'අනේ මහත්තයෝ... මේ අපි හදගත්ත ගේනේ...'

අම්මා කියන්නේ ඇත්තය... මේ ඉඩම ගත්ත දවසේ සිට මම ආශාවෙන් මේ ගේ සෑදෙන හැටි බලා උන්නෙමි. එහෙත් දුක පැටලෙන දසුන් හදවතට වදයකි.

'මට බඩගිනියි අම්මේ...'

වේල් දහයක් දෙළහක් මගේ කුසට යමක් වැටී නැත. මගේ අත් දෙස මටම බලන්නට දුකය. ඒවා කෝටු වී ඇත.

'ටිකක් ඇලවෙලා ඉන්න... මං සුරුස් ගාලා උයලා කතා කරන්නම්...'

මම අම්මා බලා සිටියදීම නංගිගේ ඇඳට ගියෙමි. ජීවිතේ යළි කිසිම දවසක උඩ ඇඳේ නිදගැනීමට මම නොයමි.

'මං අයියගේ කාමරේ අස් කරලා තියෙන්නේ...'

නංගී අසරණ හඬින් කීවාය.

'අද ඉඳලා ඔයා උඩ නිදගන්න...'

මම නංගීට පිටුපා ඇඳේ වකුටු උනෙමි.

'ඊයේ හවස ශහීනා අපේ ගෙදර ආවා... ඒ ළමයත් හරියට බය වෙලා...'

ශහීනා මේ ගෙදරට පය තැබුවේ ඇයි. මෝඩ කෙල්ල හිතාමතාම ප්‍රශ්න මවාගන්නේ ඇයි.

'කෙල්ලගේ ඇස්වල කඳුළු... මටත් හරියට දුක හිතුනා... නරක කෙල්ලෙක් නෙමේනේ...'

මම කතා නොකළෙමි.

'සංදේශ් අයියව ගෙදරින් පිට කරන්න තරම් වරදක් කළේ නෑ කිව්වා... වැරැද්දක් උනා නම් එයාගේ අහින් කියලා කිව්වා... ආයේ කවදාවත් ඒ වරද වෙන්නේ නෑ කියලත්





කිව්වා...'

ආදරය කිරීම වරදක් නම් ඒ වැරැද්ද මුලින්ම කළේ මම බව මම කෑ ගසා කියමි. අපේ ආදරය නම් වූ නඩු විභාගයේ ප්‍රථම වග උත්තර කරුවා මම වෙමි.

'අයියට චූට්ටක් ඉවසන්න තිබ්බා... එහෙම උනානම් සමහර විට...'

මම හැරී නංගී දෙස තියුණු බැල්මක් හෙළුවෙමි.

'ඇයි... ඉවසුවා නම් මට ශහීනාව බඳින්න තිබ්බද... බයා යන්න කරුණාකරලා... මට අමාරුයි...'

'ඔයා කේන්ති ගන්නේ දුකට...'

'ඔව් මට දුකයි... ඒ දුක මමම දරා ගන්නම්... තායි මිය ගැන කතා එපා...'

නංගී කාමරයෙන් පිටවී යළි මගේ සරමද රැගෙන කාමරයට ආවාය.

'කොහොමත් ශහීනාව ලබන මාසේ බන්දලා දෙනවා... ඊට පස්සේ ඔයා එයා ගැන හිතුවත් පව්... ආ මිය ඇඳුම ගලවලා මේක ඇඳගන්න...'

ශහීනාගේ විවාහය පැවැත්වෙන දවස්වල මා කුරුළු කැළේ නැතිවීම හොඳය. එය ආදරය කළ පසුවක් ඇත්තෙකුට බලා සිටිය හැකි දෙයක් නොවේ.



www.sinhalaelibrary.com

# 30

ඉරිද හවස පාළුව දරාගත නොහැකිව මම සති අන්ත පත්තරයක් ගන්නට කඩයට ගියෙමි. ශහීනා කඩයේ කවුන්ටරය අසළ සිටිනු මා දුටුවේ කඩයට ගොඩ වූවායින් පසුවය.

ශහීනා මාව දැක මූළු පපුවම හිස් කරමින් දිග සුසුමක් හෙළුවාය. මම අමාරුවෙන් තොත් ඉවකට ගත්තෙමි.

'මේ ළමයා හරියට ඇදිලා ගිහිල්ලනේ... හිටියයින් බාගයයි'

මුදලාලි කීවේ ශහීනා දෙසත් බලා ඔලොක්කුවට මෙනි.

'උණ හැනිලා උන්නා... මට දිවයින පත්තරයක් දෙන්න...' තරමක කෝන්තියෙන් මම කීවෙමි.

'හිටි හැටියේ මොකද ලෙඩ වුනේ... අසුරුවට උන්නනේ...'



පත්තර ගැනිල්ල පැත්තක තබා ගෙදර යන්නට තරම් කෝන්තියක් මට ආවේය. මිනිස්සු මේ තරමටම කුහුරු ඇයි.

'වෛරස් උණ... කියලා හැදෙන්නේ නැතේ...'

මුදලාලි මට පත්තරය දීම පමාකර ශහීනාගේ බඩු කිරමින් උන්නේය. ඇය අසරණව රාක්කයේ කොනක් පහුරු ගාමින් උන්නේය.

කුරුළු කැලේ මුලින්ම ගෙවල් හැදූ ජයරත්න කඩයට ගොඩ වී එල්ලා තිබූ පුවත්පත් වල මුල් පිටු බලන්නට විය. මගේ සල්ලි ගන්නා නම් මට යා හැක.

'වරායේ අනියම් සේවකයෝ ස්ථිර නොකළොත් අත්හරප් ආණ්ඩුවෙන් යයි... යකෝ මුන්ට හිය රටක්... අපේ සිංහල නායකයන්ට ගහන්න ඕන මේ පිට ජාතියේ උන්ව එකතු කරගෙන සහාග ගහනවට... අපේ උන්ගෙන් තියෙන බලු කම...'

බල්ලා උඹය කියා කියන්නට මට සිතුණි. අත්හරප් මහත්තාගේ දේශපාලන තීරණ වෙනම එකකි. මුස්ලිම් කොංග්‍රසයේ දේශපාලනය තවත් එකකි. එහෙත් ජයරත්න මේ සියල්ල මෙතන කියවන්නේ ශහීනාත් මාත් උන් නිසාය.

'නැම්පු එපා මුදලාලි... මගේ සල්ලි ගන්න... ආ...'

ශහීනා ගන්නට ආ බඩුද නොගෙන යන්නට හදන්නේ මේ තරුමයාගේ කතා ඉවසා දරා ගත නොහැකිවය...

'ප්‍රභාකරන් උතුර ඉල්ලනවා... මෙයලා කොංග්‍රස් ගහගෙන හෙට අතිද්ද නැගෙනහිර ඉල්ලයි... දීපල්ලකෝ...'

මම හැකිම් මැඩගෙන උන්නේ අසීරුවෙනි. සහෝදර ජාතීන් සමඟ මිත්‍රත්වයෙන් කටයුතු කර මේ රට දේශපාලනීය ලෙස බෙදු වෙන් නොකර තබාගත නොහැක්කේ මෙවැනි පටු

ජාතිවාදී මිනිසුන් නිසාය. මහ ජාතිය කියා සහෝදර ජාතියකට මහ ජාතිය දමන්නට මානුෂික සදචාරයක් නැත. අප හැමෝම උපන්නේ මේ රටේය.

ශහීනා බඩු ටිකද රැගෙන යන්නට යද්දී එක් වරක් හිස ඔසවා මා දෙස බැලුවාය.

'මං යනවා සංදේශ්...'

මම හිස වැනුවෙමි. ජයරත්න ඇස් කරකවමින් මා දෙස බැලුවේය. මා උන්නේ ඔහු මට මොනවා හෝ කියන තුරුය.

'මේ ළමයත් හරියට නෝම්බි අල්ලලා වගේ ඇදිලා ගිහින්නේ...'

පත්තරය රැගෙන කඩයෙන් එළියට බහිද්දීම ජයරත්න කීවේය. මම හැරී රවා බැලුවෙමි.

'ඔව් ජයරත්න අන්කල්... අන්කල්ලා ඡන්දේ දීලා පත්කරපු සිංහල නායකයෝ රට කරන හැටියට ඉස්සරහට අපිටත් නෝම්බි අල්ලන්න වෙනවා තමා... මේ පාරත් ඡන්දෙට ගිහිල්ලා පාන්දරම කහිරෙ ගහන්න... අෂ්රොප් මහත්තයා දවස ගානෙ කල්මුනේ යනවා... සමන්තුරේ ගිහිල්ලා මුස්ලිම් මිනිසුන්ගේ දුක සැප හොයනවා... තොන්ඩමන් මහත්තයා වතුකරයට ගිහිල්ලා වතුවල මිනිස්සුන්ගේ ප්‍රශ්න විසඳනවා... ඒ මිනිස්සු වෙනුවෙන් ආණ්ඩුවලින් එළියට යනවා... කෝ ජයරත්න මහත්තයල ඡන්දේ දුන්න ඇමතිතුමා... අඩුම ගානේ බංගලාව තියෙන්න තොහෙද කියලවත් දන්නවද... පුළුවන් නම් එයාට කියලා මේ පාරට ලයිට් තුනක් ද ගන්න... මං යනවා...'

ඔහු දස් ලොකු කරගෙන බලා උන්නේය... මාව වෙව්ලමින් තිබුණි. සිංහල මිනිසුන්ගේත් වැරදි ඇත. මුස්ලිම්





මිනිසුන්ගේත් වැරදි ඇත. දෙමළ මිනිසුන්ගේත් වැරදි ඇත. මේ ජාති තුනම එකට කළ වැරදිද ඇත. එහෙත් ඒ කිසිම වැරද්දකට ශහීනාවත් මමවත් වැරදි නැත. මිනිස්සු තුනකය... තිරිසන්ය...

ශහීනා මට ඉදිරියෙන් මීටර් පනහක පමණ දුරක් යමින් උන්නාය. මම හිතාමතාම ගමන බාල කළෙමි. ඇය දෙතුන් වරක් හැරී යංතමින් බැලුවාය.

ගඳපාන පඳුරු වැවී තිබුණු හිස් ඉඩම් හරියෙන් යද්දී ශහීනා ෂොපින් බෑගයේ දමාගෙන උන් යමක් තණකොළ පිස්සට දමා ගියාය. ඇය ගේට්ටුවෙන් ගෙට ගියේ එය මට අතින් පෙන්නාවමිනි. මම ඒ හරියේදී ගමන බාල කර ඒ දෙස බැලුවෙමි.

එය කුඩා කැඩ්බරි චොකලට් එකකි. දුක පපුවට දඩාස් ගාගෙන කඩා පාත්වෙද්දී මම පාත්වී එය අහුලාගෙන සාක්කුවේ රුවා ගත්තෙමි.

'අපි මොන තරම් අසරණ පෙම්වතුන්ද...'

මම හන්දියට පැමිණ බණ්ඩාරවෙලට ඇමතුමක් ගත්තෙමි. මාමා එන්නට කියුවොත් අද හවසම ඉන්ටර්සිටි එකක නැගී බණ්ඩාරවෙල යන්නට මම හිතාගෙන උන්නෙමි. ජීවිතයට කලාවක් නැති තැන හුදෙකලාවත් හොඳ කලාවකි.

'මාමේ... මං ලොකු පුතා...'

මාමා මොහොතක් නිහඬව උන්නේය.

'මගේ පුතාට දුන් සනීපද...'

ඔහු කරුණාබරව ඇසුවේය. හේතුවක් නැතුවම මගේ පපුවට දුක කඩාගෙන එයි.

'සනීපයි මාමේ... ඊයේ විකට් කපන් ආවා... තාම ඇහට

පණ නෑ...'



www.sinhalaelibrary.com

'උඹේ පණ තැත්තේ ඈතට තෙමේ කොල්ලෝ හිතට... මං හිතුවේ නෑ ලොකු පුතා එච්චර දුර්වල හිතක් තියෙන කොල්ලෙක් කියලා...'

'මාමත් මට දෙස් කියනවා...'

'නෑ පුතේ... ලෝකේ ඉස්සෙල්ලාම ආදරේ නිසා දුක් වින්දේ උඹ නෙමේ... මං දන්නවා උඹ වැරදි නෑ... උඹේ වයසේ මං උන්නනම් මා තාත්තට බැණලා ගෙදර බඩුත් කුඩු කරලා එද රෑම ගෙදරින් එළියට බැහැලා... ඒත් උඹ ඊට වඩා ගුණ යහපත්...'

ඒවා දන් ඇදගෙන දුක් විදීම තේරුමක් නැත.

'මං ඒවා අමතක කරලා දලා ඉන්නේ මාමේ...'

'මට උඹව හොඳට තේරුම් ගන්න පුළුවන් ලොකු පුතේ... මං ඒ කෙල්ලව දක්කා... චූටි දූව මට පෙන්නුවා... ඒ වගේ කෙල්ලෙක්ව අමතක කරන්න හරි අමාරුයි තමා... ඒත් කොල්ලෝ මේ ලංකාව... එක ජාතියක් අනිත් ජාතිය දිහා බලන්නේ වෛරයෙන්... නමසිය හතලිස් අටට කලින් අපි තුන් ජාතියම එකට හිටියේ... කුමාර් පොන්නම්බලම්ලත් අපේ ජාතික සටනට සටන් කළා... ඒත් සුද්දා ලංකාව ආයි බාර දෙද්දී ජාති භේද ඇති කරලා ගියේ... ඊට පස්සේ දෙමළ මිනිස්සු ළඟ තල තෙල් ගඳයි කියනවා... පර දෙමළා කියනවා... මුස්ලිම් මිනිස්සුන්ට හම්බයෝ කියනවා... එයාලා අපිට කුණු සිංහලයෝ කියනවා... මේක කවදාවත් විසඳෙන්නේ නැති අවුලක්... උඹ ඉඳලා ඉඳලා ගිහිල්ලා කුඩු හැළුවේ ගල් දෙබොක්කාවක...'





මේ කිසිවක් හදවත නොදනී. හදවත ඇලෙමින් සැබෑ ගැහැනියට ආදරය කරයි.

'මං ඒ කෙල්ලට ආදරය කළා පොඩි මාමේ... ඇත්ත... ඒ මං ආදරේ කරපු පළවෙනි කෙල්ල... අන්තිම කෙල්ලත් එයාම තමයි...'

'අද මම උඹට මොනවත් කියන්නෑ... උඹේ අවාලේ උඹටයි විඳෙන්නේ... මං උපදෙස් දීලා වැඩක් නෑ... මොකද කොල්ලෝ දන් කරන්නේ...'

'මට තේරෙන්නේ නෑ පොඩි මාමේ...'

'ජීවිතේ සුළි සුළං එනවා පුතේ... ඒත් ඒ කුණාටු වලට ජීවිතේ තියෙන දේවල් ගහගෙන යන්න දෙන්න එපා... කුණාටු වලදී ටිකක් පාත් වෙන්න ඕන... කුණාටුවට ගස් කොළන් වැටෙන්න පුළුවන්...'

මම ඉදිරි වැටී ඇත්තෙමි. යළි නැගිටින ක්‍රමයක් මම නොදන්නෙමි.

'මම මොනවද මාමේ කරන්න ඕන... ගෙදර ඉන්න බෑ...'

'මට තේරෙනවා... ආදරේ කරපු දෙයක් නැති වෙලා ගියාම හිතම හිස් වෙනවා තමයි...'

මාමා තාත්තාට වඩා මානුෂිකය. තාත්තා එද මගේ ප්‍රශ්නය දෙස මාමා බලන්නාක් මෙන් බැලුවා නම් මේ තරම් ප්‍රශ්නයක් නැත.

'මා...ව බණ්ඩාරවෙලට ගන්න මා...මේ...'

මට ඇඬුණි.

'අනේ මහත්තයෝ... මොකද මේ... ළඟ හිටියනම් උඹ

මගෙත් ගුටි කනවා... උඹ අඩන්නෙපා... මං උඹේ ජීවිතේ මුල ඉඳලා හදලා දෙන්නම්... උඹ වරෙන් බණ්ඩාරවෙලට...'

'මං අද රෑම ඉන්වර්සිටි එකක එන්නම්...'

මම ආශාවෙන් ඇසුවෙමි.

'පුළුවන් නම් මම ඇවිත් උඹව එක්කගෙන එනවා... මෙහෙම කරන්න පුතේ... අපි ලබන සතියේ එමු... මං පොඩි වැඩ වගයකට කැන්ඩි යනවා... පුළුවන් උනොත් මං ඒ ගිය ගමන් උඹව එක්කන් එන්න එන්නම්... නැත්නම් උඹ බදාදා උදේන්ම කෝච්චියේ වරෙන්...'

'බණ්ඩාරවෙල සීතලද මාමේ...'

'උඹ මම වගේ තනිවෙච්ච මිනිස්සුන්ට මේ සීතල හරි හොඳයි කොල්ලෝ... මං පොඩි ගෙස්ට් හවුස් එකක් පටන් ගන්න යන්නේ... මරු ප්ලේස් එකක් මට හම්බ උනා... හැම දෙයක්ම අමතක කරලා දාලා අපි ඒකේ වැඩ කරමු...'

'මං එනවා මාමේ...'

අප අතර නිහඬතාවයක් විය.

'උඹ දාලා එද්දී කෙල්ලට හරි දුක හිතෙයි...'

'එයා ළඟදී බඳිනවා පොඩි මාමේ...'

'උඹ ඒ කාලෙට මෙහේ ඉන්න එපා...'

'ඔව් මාමේ... ඒකයි මං කියන්නේ මාව ඉක්මනට ගන්න කියලා...'

'බදාදා උදේන්ම උඹ වරෙන්... මතකයි නේද ගේ...'

'ඔව්... මාමට මාව කරදරයක්ද දන්නෑ...'

'මොන කරදරයක්ද ලොකු පුතේ... මාත් ඉන්නේ හරි





පාළුවෙන්.... වෙලාවකට පාළුව ඉවසගන්න බෑ... වටුම වගේ රවුමක් ගහලා බියර් එකක් ගහලා ගෙදර එනවා... එක දිගටම තනියම ඉද්දිත් තනිකමට පදම් වෙනවා...'

මටත් අවශ්‍ය එයයි.... තනිකම මිහිරිය... මගේ පසුව දවන්නේ නැත.

පොඩි මාමාට කතා කර මා දුරකථන කුටියෙන් එළියට ආවේ සැනසීමෙනි. ජීවිතය මේ තරම් ඉක්මනට පරිවර්තනය වෙතැයි මම නොසිතුවෙමි. දෛවය ඒ තරම් ඉක්මන් වේයැයි මම නොසිතුවෙමි.

මම වටුම පුරා මෙහේ මෙහාගාතේ ඇවිද්දෙමි. හඳුවන්නට කෙනෙක් නැත. ආශා කරන දෙයකුත් නැත. බැලූ බැලූ අත මට පේන්නේ දයාවක් නැති මුහුණුය... මම හිස් හදවතින්ම ගෙදර ආවෙමි... ශහීනා ගේට්ටු පියන කාලක් පමණ ඇරගෙන මුහුණ ඔබාගෙන උන්නාය... ඒ මුහුණ දකින්ම දමා යන්න බැරි මහා ලෝබකමකින් මම දවුනෙමි. බණ්ඩාරවෙල ගොස් හිත එකඟ කර ගත හැකිද...

මම ගෙවල් දෙක දෙසම බැලුවෙමි. හාත්පස පාළුය... මම නොහැරී ශහීනලාගේ ගේට්ටුව අද්දරට ගියෙමි.

'බදාදා බණ්ඩාරවෙල යනවා... ආයේ කියන්න වෙන එකක් නෑ...'

ශහීනා කතාකර ගත නොහැකිව වෙව්ලමින් දෙකොල් පට මුහු කළාය... දෑසේ කඳුළු පාරවල් දෙක තුනක් එහෙමම සටහන් විය...

'අපි ආයේ හම්බවෙන්නෙම නැද්ද සංදේශ් අයියේ...'

හෙමින් ඇය ඇසුවාය.

'සඳුදා හවස මම සැලෝන් එකට යනවා... නයිලෙවල්



www.sinhalaelibrary.com

පංරේ ෆිල්ම් එකට...'

'මං කොහොමද එන්නේ...'

'සැලෝන් එකටම එන්න... ඒ අක්කා හරි හොඳයි...'

මම ගේට්ටු කුළුණ හෙමින් හෙමින් අතහැරියෙමි. අවසන් වතාවටත් ඇයව හමුවන්නට ලැබීම ගැන මට කුනී සතුටක් දැනුණි.

ඒ හමුවීම තවත් ගිනි ජාලාවක පටන් ගැනීමක්ද... නැත. අප සඳුද හමුවෙමු... බදාදා මම යන්නෙමි... ඉන් පසු අපේ ජීවිත වල බොහෝ දේ සිදුවෙනු ඇත.

'පොඩි මාමට කතා කළාද අයියේ...'

නංගී ඇසුවාය.

'ඔව්... බදාදා උදේ මං බණ්ඩාරවෙල යනවා...'

පුදුමයෙන් මා දෙස බලා උන් නංගී කඳුළු පිරි මුහුණ බිමට බර කරගත්තාය.

'එක්කෙනෙක් නිසා අපි ඔක්කොමල්ලටම ඔයාව නැති උනා...'

නංගී කීවේ දැඩි සංවේගයෙනි.

'ශහීනාට බඳින්න එපා...'

මම වේදනාවෙන් කීවෙමි.

'ඔච්චර ආදරයක් තියාගෙන කොහොමද බණ්ඩාරවෙල ගිහිල්ලා ඉන්නේ... දවස් දෙකෙන් එනවද...'

'මිනිස්සු අයිති කර ගන්න බැරි දේවල් වලට ජීවිතේ පුරාම ආදරේ කර කර ඉන්නවා... ඒකට කාගෙන්වත් තහනමක් නෑ... මුස්ලිම් කෙල්ලෙක් බඳින්න සිංහල කොල්ලෙක්ට





බෑ... ඒත් සිංහල කොල්ලෙක්ට පුළුවන් මුස්ලිම් කෙල්ලෙක්ට හිතින් ආදරේ කර කර ඉන්න...'

මම සිනාසී කීවෙමි. මගේ සිනහව වියරු සිනහවක් වන්නට ඇත.

# 31

සඳුද දවල් මම නාන්නට ඇඳගෙන ගේ පිටුපස ජම්බු ගහ යටට වී ඔහේ උන්නෙමි. කුරුළු කැලේට ආ දවසේ සිට වතුර බටය ජම්බු ගහේ අත්තක සිර කර ඒ වැටෙන වතුර මලෙන් පැය දෙකක් පමණ නෑ අහිංසක සැහැල්ලු සංදේශව මට සිහිවිය. ඇතැම් දිනයක ජම්බු ගහ යට තිරුවානා ගල් අතර මම ඉඳගෙන ඇස් පියාගනිමි. අඩි හය හතක් උඩ සිට වතුර සීරාව වැටෙද්දී ගතට සිතට වෙනස්ම හැඟීමක් දැනෙයි.

පැය දෙකක් පමණ නෑ පසුව දෙපතුල් අත් කිරි පාටින් සුදු වෙයි. ගෙදර බාත් රූම් එකෙත් නාපු කිසිම විටෙක ඒ තරම් පවිත්‍ර නිර්මල නැවුම් හැඟීමක් නොදැනෙයි.

ජම්බු ගහට නැග බටය උඩ අත්තේ සිර කර දුන් පැයකටත් වැඩිය.... ලොකු තිරුවානා ගල උඩ ඔහේ කල්පනා

www.sinhalaelibrary.com



කර කර උන්නා ඇරෙන්නට තවම මට නාන්නට සිතක් නැත.

ආදරය ජීවිතයේ සැපද... සැනසීමද... සතුටද... නිස්කලංක බවද.... ලස්සනද රැගෙන පලා යනවද. සියල්ල රැගෙන ගොස් පපුවේ ගින්දර පමණක් ඉතිරි කරන ආදරයට මිනිස්සු මේ තරම් පැලෙන්නේ ඇයි...

ශශිකා කීවේ සවස හතරට පමණ සැලෝන් එකට එන ලෙසය... සමහර විට එතැනදී අපට කතා කරන්නටවත් නොලැබෙනු ඇත. ඒද මම හිත හද ගනිමි. කොහොමත් බණ්ඩාරවෙල ගෙන යන්නේ මගේ ආදරයේ මළකද පමණි.

'අදින් පස්සේ ඔතන නාන්නේ කවුද...'

අම්මා පැමිණ මගේ රත්වූ නිරුවත් පිට මත අත තබා සිටියාය.

'නාන්න රත්තරන්.. මේ පිට ගින්දර වගේ...'

'මං අද නාලා බටේ ගලවලා දාලා යන්නේ...'

'ඒ මොකටද.. ඔයා බණ්ඩාරවෙල දිගටම ඉන්නෑනේ...'

'මං දිගටම ඉන්නවා අම්මේ...'

අම්මා හිල්ලුවාය. විශේෂයෙන් කෙනෙක් නැතද සියල්ලන්ගෙන්ම පළිගන්නට මට අවශ්‍ය විය. ඒ තුළින්වත් මේ තුවාල වූ ළය සනීප කර ගත යුතුය.

'නාන්නේ කොහේ යන්නද...'

'යාළුවෝ දෙතුන් දෙනෙක් ඉන්නවා කියලා එන්න...'

'ඔයාවත් හරියට හොරු අරගෙන ගියා වගේ තියෙයි...'

මම කතා නොකර වැප් එක ඇරියෙමි. ජම්බු ගසේ ඉහළ සිට අළුත් සීතල වතුර පහළ තිරුවානා කලාවට කඩාගෙන එන්නට විය...

අද බටයෙන් නාන අවසන් දවසය. සමහර විට අද ඉන්නා සංදේශ් ආයේ කෙදිනකවත් මේ සුන්දර දවස් වලට නොඑනු ඇත.

අද දුක හිතෙනා සැඳෑවකි. හාත්පස කළු කර තිබුනේ වහින්නට මෙනි. මන්දරමේ එළියට බහින්නට මම ආශා කළෙමි. බණ්ඩාරවෙල දිගටම ඇත්තේ මෙවන් නෙකබරින මන්දරම් පරිසරයක් විය යුතුය.

මා ගෙදරින් පිටවෙන්නට එන්නට කලින් ශහීනලාගේ වාහනය පිටට යනු මට යාන්තමට ඇසුණි. ඇයට කොතරම් දුකක් අද දැනෙනු ඇත්ද. සදහටම වෙන්වී යන අපේ ආදරයේ වේදනාව අප කෙසේ පපුව උඩ තබාගන්නද...

ලොවේ උපනුපන් ආදරවන්තයින්ට නම් මෙවන් දුකක් නොවේවා... ආදරය කරන්නට මිසක... ඒ ගැන අනන්තයට හීන දකින්නට මිසක වෙන් වන්නට හමුවන පෙම්වතුන් කවුද... එහෙත් දෛවය අද සැඳෑවේ අපව මුණ ගස්සවන්නේ එවැනි කටුක දුක හිතෙන  වෙන්වීමකටය.

ජීවිතය කියන්නේ එයනම් වෙන්ව යා යුතුය...

අපේ ඇසුර පුරා ඇය මට බොහෝ දේ දුන්නාය. ඒ අතර පුංචි පුංචි සැමරුම් විය.... ඉන්දියාවේ ගොස් ශහීනා මට තිළිණ කළ ටාජ්මහල් අනුරුව තවමත් කාමරයේ ඇත. මම එය බණ්ඩාරවෙල රැගෙන යමි. ඒ මගේ ජීවිත කාලයේ මට ආදරය නමින් ලැබුණු ප්‍රථම හා අවසාන තිළිණය විය.

මම ඇයට කිසිවක් දී නොමැත්තෙමි. යළි අප හමු නොවේ. මේ ආත්මයේ මා දෙයක් දෙනවානම් අදම දිය යුතුය... යළිත් දෙයක් දෙන්නට තවත් ආත්මයක් බලා සිටිය යුතුය.

හත වසරේ සිට මාස්පතා රුපියල් සීය සීය දමා ගොඩනැගූ පාසල් ඉතිරි කිරීමේ ගිණුමක් මා සතුවිය... උදේ





මම ජාතික ඉතිරි කිරීමේ බැංකුවට ගොස් ඉන් රුපියල් තුන් දහක් ගත්තෙමි. පොඩි මාමා මට වියදම් කරනා බව මම දනිමි. එහෙත් අද කීයක් හෝ තිබිය යුතුය.

සාප්පු අතර ත්‍යාගයක් සොයමින් යන අතරවාරයේ ෂෝ කේස් එකක දමා තිබූ අලංකාර මුතු පළඳනාවක් මම දුටුවෙමි... එය දුටු මොහොතේම මගේ සිත් ගත්තේය. මට කෙදිනකවත් හිමි නොවන මට ලස්සන බලන්නටවත් වරම් නොලැබෙන එහෙත් මා ජීවිතයේ පණ වගේ ආදරය කළ මගේ ශහීනාගේ ගෙලට ඒ මුතු පළඳනාව අපූරුය. සරල විලාසිතාවකට තනා තිබූ එය ඇය නිතර අඳින ලා පාට සල්වාර් ඇඳුම් වලට කදිමය...

'මේක කීයක් වෙනවද...'

මම බියුටි ෂොප් එකේ සේවිකාවගෙන් ඇසුවෙමි.

'එක්දස් පන්සීයක් විතර...'

එය දමා යන්නට මට ලෝබය. සද කාලයටම දුකක් වූ අපේ ආදරයට තිළිණ දෙන්නට එයට වඩා හැඟීම්බර තිළිණයක් ගැන මට නොසිතෙයි. ඇයට මේ පළඳනාව මගේ අතින් පළඳින්නට වරම් නැත.

'මට ඒක දෙන්න...'

'තව සීයක් අඩු කරන්නම්...'

'කැමැත්තක්...'

සේවිකාව පුදුමයෙන් මා දෙස බැලුවාය. මගේ හදවත පැහැර ගත් තිළිණයේ රුපියල් සීයක් අඩු කොට එය බාල්දු කරන්නට මට නොසිතෙයි.

'බිස්නම් එක හින්ද කියනවා නෙමේ... කාටද මේක අරගෙන යන්නේ....'

ඇය අභිංසකව ඇසුවාය.

'මං ආදරේ කරන කෙනෙකුට...'

මම අවංකව කීවෙමි.

'එහෙනම් මේ මාලේ එක්ක මේ ඉයරින් එකක් ගන්න... එතකොට තමා අපේ ජුවෙලරි මැච් වෙන්නේ... මාව වදරවලා හිතන්න එපා... ඔයා දන්නේ නැති නිසා කිව්වේ...'

ඇය කියන්නේ බොරුවක් නොවේ. මේ පළඳනාව සමඟ එයටම යන කරාබු ජෝඩුවක් ඇත. ලස්සන ඒ දෙකම පළඳවා ගත් විටය. මම ඒ කුඩා මුතු කරාබු ජෝඩුවද රුපියල් දෙසීයකට ගත්තෙමි.

සේවිකාව මුතු පළඳනා ටික අලංකාර බෑගයක දමා දුන්නාය...

'එයා දගෙන ආවට බලන්න මං කිව්වේ බොරුද කියලා...'

අප දිගටම එක්ව ඉන්නා පෙම්වතුන් යැයි ඇය සිතන්නීය...

'ඒක මට බලන්න වෙන්නෑ... අදින් පස්සේ එයාව මට හම්බවෙන්නෑ...'

මම සාප්පුවෙන් පිටව යන අතරවාරයේ කීවෙමි. සේවිකාව දෙනෙත් ඉහළට ගත්තාය... 'දුරස් වෙන්නට මේ ලෙසින්... කිමද අප හමුවූනේ...'

සැලෝන් ඩිල්ෂි තිබුනේ හයිලෙවල් පාරේ හෝමාගම නගරයට ආසන්නවය... එය ප්‍රදේශයේ යුවතියන් අතර ජනප්‍රිය සැලෝන් එකකි... සමහර විට ශහීනා සැලෝන් එකට එන්න යැයි කීවේ මගේ මුහුණ බලා සමුදෙන්නට විය යුතුය...

එක අතකට එසේ එනවානම් හොඳය... අද අප කතා කරනා දෙයක් අනාගතයට තවත් බරක් වෙනු ඇත.





සැර හිරු රැස් පෙනෙන්නටවත් නැත. අප හමුවූ බොහෝ දිනවල මෙන් අදද මන්දරමය... මම එකවර සැලෝන් ඩිල්ෂි එකට නොයා පාරේ එහා පැත්තේ වූ හෝටලය අසලට වී උන්නෙමි.... එවිටම වාගේ ශහීනාලාගේ වාහනය පැමිණ සැලෝන් එක ඉදිරිපිටම නැවතිණ. මම බැලුවේ එහි ඉදිරිපස අසුන දෙසය. වාසනාවකට මෙන් එහි උන්නේ ඔවුන්ගේ රියදුරුය... ශහීනා වාහනයෙන් බැස රියදුරු අසලට පැමිණ යමක් කියා ඔහුව පිටත් කළාය...

අවට බලමින් සැලෝන් එකතෙක් ගිය ඇ එහි දොරකඩට ආ පසු මාව දක්කාය... අප අතර මීටර් පනහක පමණ දුරක් තිබුණද ඒ ඇස්වල නැවරී තිබූ දුක මම හොඳින් තේරුම් ගත්තෙමි.

ශහීනා මට ඇඟිලි තුඩු වනා කතා කළාය... පසුව ඇය සැලෝන් එක ඇතුළට ගියාය... අලංකාර බෝගන්විලා ගස් වවා තිබූ කුඩා ගොඩනැගිල්ලක රූපලාවන්‍යාගාරය පිහිටා තිබුනි. එය කුඩා නමුදු සුන්දරය...

ශහීනා එනතුරු මම එහි දොරකඩ පමා උනෙමි. එකවරම ඇතුලෙන් ඔළුව දමා ශහීනා මට ඉඳගන්නා ලෙස කීවාය...

අප දෙදෙනාම උන්නේ හෙට මරන්නට නියමිත වූ වරදකරුවෙකු මෙන් ගැහෙමිනි. ශහීනා යළි ආවේ තරමක් ලස්සන අක්කා කෙනෙකුද සමඟය... ඇය මාව දැක දුක්බරව සිනාසුනාය.

'මේ සංදේශ් අක්කේ...'

මම සිනාසුනෙමි.

'අපිට හම්බවෙන්න විදිහක් නෑ. ඒකයි ඩිල්ෂි අක්කට කරදර කළේ...'

'මට තේරෙනවා බබා.. මෙතන කතා කර කර

ඉන්නෙපා.... එන්න...'

ඇය ශහීනාගේ අතින් අල්ලාගෙන කුඩා පියගැට පෙළක්
දිගේ ඉහළට ගියාය. එය එක්කෙනෙකුට පමණක් යා හැකි
කුඩාම කුඩා ටයිල් ඇල්ලූ පියගැට පෙළකි.

'එන්න මල්ලී...'

ඇය පසු පස හැරී මට කීවාය...

'මේ මගේ රේෂ්ල් රූම් එක.. හරි චූටියි... කතා කර
ගන්න දෙයක් කතා කර ගන්න... මං මොනා හරි බොන්න
එවන්නම්...'

එය දෙදෙනෙකුට පමණ ඉඳගත හැකි කුඩාම කාමරයකි.
එහි තිබුණේ ජේෂල් කිරිමේදි යොද ගන්නා කුඩා සැලෝන්
පුටුවකුත් දිග කන්නාඩියකුත්ය.

අක්කා ගිය පසු ශහීනා බිත්තියට වාරුවී දෑස් එසෙව්වාය.
මම ඇය දෙස එකවර නොබලා ඇගේ රුව විශාල
කන්නාඩියෙන් දක ගත්තෙමි. ඇස්වල කඳුළුය.

ශහීනාගේ කඳුළු අඩන්නට බලා උන් මගේ දෙනෙතට
ගැසූ ඇල්පෙනෙති තුඩවල් බඳු විය. අඩන්නට මිසක වෙන
කුමකටද නොතූ අපට...

'මං ආවේ ඔයාගේ කඳුළු බලලා යන්න නෙමේ... ඔහොම
අඩන්න එපා...'

තොල් පට හපාගෙනම සිටියෙමි. නෙලූ මල තුරුල් කර
ගන්නට බැරි වූ දුකින් මගේ පපුතලාවම ඇවිලෙන්නට විය.
දෙවියනි ඔබ මේ ගිනි නිවන්නේ කවදද...

'අනේ සං..දේ..ශ්...'

දෑතින්ම මුහුණ වසාගෙන ශහීනා ඉකිබිඳින්නට වූවාය...
පැට්‍රෝල් ගැලුමක් හිස සිට හලා ගිනි කූරක් ගැසූ කලෙක



මෙන් මම වේදනාවෙන් පිච්චුනෙමි...

'බබා... මේ බලන්න...'

ශහීනා හිස එසවූයේ නැත.... ජීවිතයේ අවසන් වරටවත්
මේ රාමලාන් සඳවත පැහැදිලිව දකගන්නට නොලැබේ යැයි
මම බිය උනෙමි...

'ම..වත් අඩන්නද කියන්නේ...'

ශහීනා ඉඳගෙන උන් කුඩා පුටුව අසළ බිම දණ ඔබා
මම ඇගේ දුහුල් සල්වාර් කලිසමෙන් වැසුණු මොලොක්
දෙපා මත දකම තබා ගත්තෙමි...

'අපි ආයේ හම්බවෙන්නේ නෑ රත්තරන්...'

ඒ දෙපා මත හිස තබා මම ඇඩුවෙමි... ශහීනා මගේ
හිස මත ඇගේ දේතම තබා පිරිමැද්දය...

'මං මං ජීවත්වෙන්නේ කෝමද දෙයියනේ... මං ඔයාට
කො..ච්..ච...ර ආදරේද... ආයේ මම කාට මෙහෙම ආදරේ
කරන්නද...'

මගේ හිසේ ඒ මුහුණ දෙතුන් වරක් තබා ශහීනා ඇසුවාය.
මටද අසන්නට ඇත්තේ එයමය... නැත. මේ දුකින් පිරුන
සසර ගමනේ යළි කෙදිනකවත් මට ඇය තරම් ආදරේ
කරනා කෙනෙක් හමු නොවෙනු ඇත...

'මට අඩන්නෙපා කියලා ඔයා අඩනවනේ සංදේශ්...
මටත් බෑ රත්තරන් බලාගෙන ඉන්න...'

'අදින් පස්සේ ජීවිතේම හරි පාළුයි...'

'ආදරේ මෙච්චර දුකද...'

'වෙන්න ඇති බබා... මාත් කාටවත් මෙහෙම ආදරේ
කරලා නෑනේ...'

www.sinhalaelibrary.com

'මා..ත් කරලා නෑ... කාටවත් මෙහෙම ආදරේ කරන්නෙත් නෑ...'

ශනීතා මගේ හිස ඔසවා පුටුවෙන් රුවා විත් මා උන් තැනම හිම ඉඳගත්තාය... වාවාගත නොහැකි ආදරයකින් මම ශනීතාව තුරුල් කර ගත්තෙමි.

ඇගේ කුඩා දෑස් නලියමින් තිබුණි. ඒ කම්මුල් තෙමී වෙව්ලමින් තිබුණි...

'ත..ව එක දවසක් ඔයාට ආදරේ කරන්න තිබ්බා නම්... එ..ක දවසක්...'

'මේ කෙල්ලට මොනවද සංදේශ් කරන්න කියන්නේ....'

'බෑ බබා.. අපිට මොනවත් කරන්න ඉතුරු වෙලා නෑ... ජීවත් වෙන අන්තිම දවස අද වුනා නම් කොච්චර හොඳද...'

ශනීතා තොල්පට තද කරගෙන මගේ උරහිස මුදුනට නළලත තබා ගත්තාය.... අපේ ඇඟිලි තුරු අතර අපේම දැඟිලි හිරවී තදවී තිබුණි... කොතරම් හයියෙන් අල්ලා ගත්තද ඒවා තව මොහොතකින් සදහටම වෙන්ව යයි...

'බණ්ඩාරවෙල යන්නම ඕනද...'

හිස පැත්තකට හරවා මම ශනීතාගේ වරලස මුදුන සිප බැලුවෙමි. සුදු හඳුන් සුවඳට සමාන මෘදු පැම්පු වර්ගයක සුවඳක් ඒ හිස මුදුනින් එයි...

'දන් කොහේ ගියත් එකයි.... හැමදම මට රෑ වෙලා...'

'ඔයාව හොරු අරගෙන ගියා වගේ... මට මේ මූණ පොඩ්ඩවත් බලාගන්න බැරිද... සතියකට පාරක් හරි...'

'අපි අපිට නැතිවෙලා යනවා මැණිකා... ඊට පස්සේ දකින දකින වාරෙට දුකයි නේද...'



'ඔයා නිසා විඳින දුකත් මට සැපක් සංදේශ්... ඇයි මේ ලෝකේ මෙච්චර අපි දෙන්නට නපුරු වුනේ... අපි කොච්චර අහිංසකද...'

එහෙත් මේ ප්‍රශ්නය අසන්නේ කාගෙන්ද... දෙවියනුත් අද අපට දෙස් තහනු ඇත.

'මේ පොඩි කාමරෙන් එළියට යද්දී මේ සංදේශ්ව අමතක කරලා දන්න... එයා වගේ කෙනෙක් උන්නා කියලවත් මතක තියාගන්නෙපා...'

'ඒ..ක කරන්න ගොඩාක් අමාරු වෙයි සංදේශ්... සමහර විට බැරිවෙයි... ජීවිතේ හම්බවෙච්ච හොඳම කෙනාව මම හිතලා මතලා අමතක කරන්නේ කොහොමද...'

'ජීවිතේ එහෙම තමයි ශනීතා... මේ අපි හදපු ලෝකයක් නෙමේනේ...'

'ඔයා නැති ලෝකෙක මං කොහොමද ජීවත් වෙන්නේ...'

'ලෝකේ හරි පුදුමයි... හ..රි පුදුමයි...'

ලෝකය පුදුම නැත. එය නපුරුය. කුරිරුය... අහිංසකම හදවත් වලට ගින්දර දෙන ලෙස හැදූ මේ ලෝකය ඇත්තටම නපුරුය...

'හිත හදගෙන අපි ජීවත් වෙමු...'

මම මගේ හදවතට බොරුවක් කර කීවෙමි. එය කළ නොහැකි බව මම දනිමි...

'අපිට විසඳුමක් ඇත්තෙම නැද්ද සංදේශ්...'

'නෑ බබා... තව ආත්ම ගාණකට නෑ...'

'විසඳුමක් හිතමු...'

www.sinhalaelibrary.com

'තවත් දුක් විඳින්න එපා.... ඔයාට දුක් විඳින්න බෑ...'

එම කම්මුල ශහීනාගේ නළලෙහි හිරකර මම කීවෙමි... ඒ මතින් ගිහිගෙන දුවෙනා යකඩ කැල්ලක් සේ තද රස්නයක් එයි.

'අ..නේ ඇයි අපි හම්බ වුනේ... දැන් මෙහෙම වෙන් වෙන්නේ කොහොමද....'

'හිත ගලක් කරගෙන ජීවත්වෙමු. හෙට අනිද්දා ඔයා මැරි කරලා අළුත් ජීවිතයක් පටන් ගත්තහම මාව අමතක වෙලා යයි...'

ශහීනාගේ ඉකිබිඳුම් වේගවත් විය. මා සිතා මතා මේ කෙල්ලව ඇඬෙව්වාවත්ද.

'එම කියන්න එපා සංදේශ්... මං ඔයා එක්ක හැමදම ඉන්න හීන දැක්කා.... අද නෙමේ ඔයාව දැක්ක දවසේ ඉඳලා... බැල්කනියට වෙලා ඔයා දිහා බලාගෙන මං හීන දැක්කා.... ම.. මට හ..රි ලෝබයි...'

'අපට කරන්න වෙන්නේ ඒකනම් වෙන මොනවා කරන්නද... අද අන්තිම දවස.. කඳුළු පිහදගෙන වුට්ටක් හිනාවෙන්න...'

'හිනාවෙන්න මට මතක නෑ සංදේශ්...'

මහදි ශහීනාට ගත් මුතු පළඳනාවත් අරුංගල් ජෝඩුවත් කුඩා පුටුව මත විය. මම ඉස්සී එය සුරතට ගත්තෙමි.

'මම දීපු ආදරේට මේ වුටි තෑග්ග ළං කරන්නවත් බෑ... ලස්සන වෙයි කියලා හිතලා ගත්තේ... අා...'

මම අසුරනයෙන් මුතු පළඳනා කට්ටලය එළියට ගෙන ඇය වෙතට පෑවෙමි. ශහීනා වෙව්ලමින් උන්නාය. ඇය මට





මේ තරම් ආදරය කරනා බවක් මීට කලින් මම දැන නොඋන්නෙමි.

'අ..නේ.. ම..ට ඔ..යා..ව නැති වෙනා..ව..නේ.. මහත්තයෝ..'

'මට අයිති උනේ නැති උනාට කමක් නෑ... ජීවිතේ ගැන කළකිරෙන්නෙපා... හැමෝගෙම ජීවිතවල එහෙම දේවල් තියෙනවා... අපි හරි අවාසනාවන්තයි... මං නැති උනත් ඔයා ලස්සනට ජීවත් වෙන්න...'

මුතු පළඳනාව ගෙන ඇගේ සුදු ගෙළට මොහොතකට තබා මම හැඩ බැලුවෙමි. ජීවිතේ මා අයින් දෙන අවසාන ආදර තිළිණය මා දෙස අඩන්නට මෙන් බලා උන්නේය.

'ඔයා වගේ හොඳ කෙනෙක් ආයේ කවද ලබන්නද...'

'මටත් වඩා හොඳ කෙනෙක් ඔයාට ලැබෙන්න ඕනා... සමහර විට ලැබෙයි...'

'ඔයා තරම් හොඳ කෙනෙක් ලැබෙන්නේ නෑ සංදේශ්.. මා..ව අඩවන්නෙපා...'

තෙත මුහුණ මගේ කමිසයේ අතුල්ලා ඇය පිසද ගත්තාය.. කඳුළු වල තෙතමනයට ඇස් පිහාටු නෙත් කෙවෙනි තුළට ඇලී ගොස්ය.

'සං..දේ..ශ්...'

ගැහෙමින් උන් ශහීනාව මම වම් අත යවා තද කර ගත්තෙමි.... අපේ මුහුණු තිබුනේ ළං ළංවය. මේ සංසාරණයේ මට හමුවන අවසන් ඉරණම් කුමාරිකාව මම මොහොතකට එක තත්පරයකට සිප ගත්තෙමි.

'ඔ...යා..ට මොනවද ඕන සංදේශ්...'

ගැහෙන කට හඩින් ශහීනා ඇසුවාය... නෙලා ගන්නට



www.sinhalaelibrary.com

බැරි වුව මලක් අපවිත්‍ර නොකළ යුතුය...

'එපා බබා... මොනවත් එපා... මාව කිස් කරන්නවත් එපා... ඔයාගේ ආගමේ හැටියට ඔයා මේ දුර ආව එකත් පව්... හැම දෙයක්ම අමතක කරලා මං වෙනුවෙන් ජීවිතේට මුහුණ දෙන්න.... ලස්සනට ජීවත් වෙන්න...'

ඇය කතා කළේ නැත. දෑස් පියාගෙන එහෙමම මගේ උර මඬලට බර වූවාය.

'මං මොනවද ඔයාට දෙන්නේ...'

'දීපු දේවල් ගොඩක් මං ගාව තියෙනවා.... ඒ හැම දෙයක්ම මං මැරෙන තුරු රැකගන්නවා...'

'එපා සංදේශ් අයියේ... ජීවිතේ ලස්සනම දවස් ටික කාලකන්නි කරපු මේ පිටජාති කෙල්ලගේ නූල් පටක්වත් තියාගන්නෙපා...'

ජීවිතයේ ලද ආදරණීයම සන්තකයට ගිනි තබන්නේ කෙසේද... නැත. එය කෙදිනකවත් සිදු නොවෙනු ඇත.

'කවදහරි අපි හම්බවෙයි සංදේශ්...'

'ඒ වගේ දවසක් උද වෙන්න එපා... මහදි හරි මාව දක්කොත් මඟ ඇරලා යන්න...'

'ඔයා පව්...'

'මං පව් නෑ...'

විනාඩි දහයක් පහළොවක් විස්සක් අපි එහෙමම දෑස් පියාගෙන ලංවී උන්නෙමු.

'රෑ වුනා.. දන් වාහනේ ඇවිත් ඇති නේද...'

ශහීනාව සොලවා මම කීවෙමි. අකමැති වුවද මේ





කර්කශ සැඳෑවට සමුදිය යුතුය.

'අ..නේ.. මා...ව දා..ලා යන්න එපා...'

ශහීනා මගේ උරපත තදින් අල්ලා ගත්තාය... මම ඇයව දේසින්ම නැඟිට වූවෙමි.

'දා..ලා යනවා නෙමේ රත්තරන්... මම ඔයාව අරගෙන යනවා... අමතක වෙන්නෑ... කවදාවත් අමතක වෙන්නෑ... මේ මූණ... මේ පුංචි පොට්ටුව මේ අතේ ගාපු මෙහෙන්දි.. කකුලේ යකඩ ඇණේ ඇනිච්ච වෙලාවේ ආපු ලේ... පුංචි කෙච්චිය... කවදාවත් අමතක වෙන්නෑ... ඒත් බබා...'

මට ඇඬුම් ඒවි යැයි මම බිය උනෙමි...

'ඒ..ක පාරක් ම..ට ආදරෙයි කි..ය..න්..න...'

එවැන්නක් මට ඇසුනේ ඇයි... මොන පිස්සුවකටද.

'මං... මං.. ආ..ද..රෙයි... රත්තරන්...'

එතැනින් එහා ඇසිය යුතු නැත. මෙතන සිටිය යුතුද නැත... අපමණ හක්තියකින් ඒ තළලත සිප මම තුඩා දෙර ඇරගෙන වේගයෙන් පඩි පෙළ බැස්සෙමි.

'සං...දේ..ශ්...'

ශහීනා කෑ ගැසුවාය. මම විකල් වූ සිහින් පාරට බැස ඔහේ ආ බස්රියකට අතක් දමා එහි එල්ලුනෙමි.

# 32

බස්රිය මෙන්ම ජීවිතයද කොහේ සිට කොහාට යනවාදැයි මම නොදනිමි... කඳුළු ගලා ආවෙන් මම සාක්කුවේ වූ ලේන්සුව දෙනෙත් වලට තද කරගෙන සෙනඟ අතර බිම බලාගත්තෙමි.

ගොඩගමින් සෙනඟ බැස ගිය පසු මම බස් රිය පසුපසම අසුනට ගොස් හිස ගසා ගත්තෙමි.... හතර අතින් ගිනි ජාලා නැගෙන ගිනි ගොඩක් මැද මාව සදාකාලයටම ගිනි ගන්නා බවක් මට දැනුණි. මොහොතකට පෙර පසළොස්වකව තිබූ මගේ ලෝකය එකවරම මාසේ පෝය දවසක් මෙන් කළුවරට හැරුණි. හැඬුම් ආවේ පපුවේ බිත්ති කඩාගෙනය. ඉකිබිඳුම් හඬ පිටතට ඇසේවි යැයි බියෙන් මම තොල් පට තදින් විකාගත්තෙමි.

මේ හමුවීම දුකක් ගින්දරක් බව දන දනම අප යළි





හමුවූයේ ඇයි... තව දස දහස් වතාවක් හමුවූවද අපට සිදුවන්නේ අද සේම දුකින් පසුව පුච්චාගෙන වෙන්වීමටය.. මෙලෙස පසුව දවා වෙන් කරන්නට නම් අපව මුණගැස්සවූයේ ඇයි දැයි අපේ දෛවයෙන් ඇසිය යුතුය.

කඳුළු බේරෙන මුහුණ මම කමිසය ඇද පිසද ගත්තෙමි. මේ පිසදමූ මුහුණ මේ බලද්දී කඳුළින් තෙත් වෙයි. මම ශහීනාට මේ තරම් ආදරය කළ බවක් මම නොදන උන්නෙමි. එක ආදරයක් වෙනුවෙන් මේ තරම් කඳුළු හෙළිය යුතු බවක් මම නොදැන උන්නෙමි. අසරණ කෙල්ල නොදන ඉන්නට ඇත.

'ඕ...යා...ට මොනවද ඕන රත්තරන්...' පුංචි කාමරයේ දෝංකාර දුන් ශහීනාගේ වචන මට යළිත් සිහිවිය. හදවත හැපී හැපී පතන්නේ ඇයව පමණි. ඇගේ අහිංසක නිර්මල ආදරය පමණි...

ලස්සන හාද්දක්වත් දෙන්නට බැරි වූ විකල් ප්‍රේමයක නටබුන් දන් පපුවේ තබාගෙන ජීවිත කාලය පුරාම දුක් විඳිය යුතුය... සදාකාලයට එක් කරන්නට බැරි පෙම්වතුන්ගේ තළලත පසාරු කර මිත්දද කුමට හීසර විදිනවාද...

කොහේ ඉන්නවාද කොහේ යනවාද මට තේරුමක් නැත. හයිලෙවල් පාර අවට පරිසරය තුළ අඳුරක් ගිලී ඇති බව පමණක් මට පෙනෙයි. ඒ අඳුරට වඩා අඳුරක් මගේ ළයේ ඇත.

ශහීනා අවසන් වරට කියන්නට ගියේ මොනවාද... කුමක් වුවද එය අසන්නට මම නොඋන්නෙමි. මගේ දෙඋර මත දෑතම තබා මුහුණට එබී මට ලෝබකමක් නැතුව ආදරෙයි කියා ඇය කීවාය... මේ සංසාරය පුරාවට ඒ වික මතක තබා ගන්නාම මට ඇතිය... එතමිත් එක කාලයක මටත් ආදරයක් තිබූ බව එවිට කිව හැක. මාත් ආදරය කළ



www.sinhalaelibrary.com

බවත්... මටත් එක අහිංසක කෙල්ලෙක් ආදරය කළ බවත් මට මතක් කළ හැක. ඒ මතකය අමතක නොවෙන තුරු මට ජීවත් වීමට වරම් ඇත.

කිසිවෙකු නැත්නම් මට කෑ ගසා හැඬිය හැක. කුඩා වියේ මෙන් එසේ හඬාවත් මේ දුක පිට කර ගන්නට තිබුණි නම් මහා පිනකි... එහෙත් අද සියළු දුක් දරාගෙන නාඬා ඉන්නට සිදුව ඇත...

'පාදුක්ක ස්ටෑන්ඩ් බහින්න...'

කොන්දොස්තර තරුණයාගේ හඬින් මම ගැස්සී ගියෙමි. හෝමාගම සිට පාදුක්කට සෑහෙන දුරක් ඇත.. බස් රිය මෙපමණ දුරක් එනතෙක් මා අවසිහියෙන් උන්නාද...

මම ලේන්සු පටින් තෙත මුහුණ වසාගෙන බස් රියෙන් බිමට පැන්නෙමි... ලෝකයම එක්වී මාව අනාථ කළාක් වැනිය... හැමෝම එක්වී ඇයව මගෙන් පැහැර ගත්තාක් වැනිය.

ජීවිතය දන් කොහේ කොතැනින් පටන් ගන්නද...

මම පාදුක්ක ස්ටෑන්ඩ් එක අසළ වූ කුඩා කඩයකින් සිගරට්ටුවක් දල්වාගත්තෙමි... මාව ඉක්මනටම නැති නාස්ති වී යන බවක් මට දැනුණි... යා යුතු අතක් සිතා ගත නොහැකිව මම දුම්වැටිය උරමින් බස් නැවතුමේ කුඩා කාප්පයට බර උනෙමි...

දසතින් අඳුරුය.. අද ගෙදර නොයා මහේ හිස හැරුණු අත යා හැකි නම්.. මට අම්මාව තාත්තාව නංගිව සිහිවිය... ඉකිබිඳමින් මාව සොයන ඔවුන්ගේ දුප්පත් මුහුණු මට සිහිවිය...

ජීවිතය දකින හැම විටකම එය දමා යා නොහැකි බව මම දන් දන්නෙමි.. තද පිපාසයක් දැනුනෙන් අසල කඩයෙන් වතුර ටිකක් ඉල්ලාගෙන බී මම හෝමාගමට යන බසයට නැඟී අසුනකට බර උනෙමි.



කෙල්ලෙක්ගේ ඇස් දිහා බලද්දී... ඒ සුවඳ පපුවට දැනෙද්දී... ඒ වත හා මුහුණ ස්පර්ශ වෙද්දී... පපුවට දැනෙන ලෙංකම කොතරම්ද... ආදරයෙන් පැටලී පැටලී උන් සමනල පපුවම අහිමි වී ගිය පසු දැනෙන හිස් බව කොතරම්ද...

මේ හැඟීම් දෙකෙන්ම මම අද දුක් වින්දෙමි.

පිළිතුරක් ලැබේ නම් අපට එක්විය හැකි තවත් එක ක්‍රමයක්වත් ඇද්දැයි මම සොයා බලන්නෙමි. නැත. අප වෙන්වන්නට එක්වූ පෙම්වතුන් මිසක හමුවන්නට එක්වූ පෙම්වතුන් නොවූනෙමි. අපේ ආදරය පටන් ගත්තේම එහි මළගමට සුදු කොඩි එල්ලාය...

ප්‍රේමය මේ නම්... යළි කෙදිනකවත් මම කිසිවෙකුටවත් ආදරය නොකරමි... මියෙන තුරා ජීවිත් වන්නට මේ ගින්දර ටික ඇතිය.

කුරුළු කැලේ ස්කීම් එක ළඟින් බහිද්දී රෑ අටට පමණ විය.... පළාතම තද අඳුරක ගිලී තිබුණි...

'සංදේශ්...'

අපේ ගෙදරට ගෙවල් දෙකක් එහා උන් තිලත්ත වැලිය මා අසල නවතා කතා කළේය... ඔහු මොහොතක් මා දෙස අනුකම්පාවෙන් බලා උන්නේය...

'ගෙදර පොඩි කලබලයක්...'

මම එකානැන දුවී ගියෙමි.

'ඇයි... කාටහරි කරදරයක්ද...'

ඔහු මගේ අතක් තදින් අල්ලා ගත්තේය.

'කාටවත් නෙමේ මචං කරදරේ උඹට... ගනිතලාගේ කාත්තා උඹලගේ ගෙදරට ඇවිත් කෑ ගැහුවා... දන් ටිකකට කලින්...'

වචනයක් වත් කතා කර ගත නොහැකිව මම ගොළුව ගියෙමි. පිටත් ගින්දරය... ඇතුළත් ගින්දරය... දැන් ගෙදර යන්නේ කෙසේද...

'තාත්තලා දෙන්නම යක්කු වගේ කෑ ගහ ගත්තේ... ඔය කහන්දරේ දූක වැඩියි මචං... අත් ඇරලා දාපන්... බලපං උඹත් ලෙඩා දූකා වෙලා...'

'ගො..ඩා..ත්.. කලබල කළාද...'

'උඹ ගෙදර නැතිවෙන එක හොඳයි... ශනීතලාගේ තාත්තා කෑ ගැහුවේ අයි කිල් සංදේශ් කිය කියා... උඹලගේ තාත්තත් ඒට එහා...'

අපි සදහටම වෙන්වී ඇති බව ගෙවල් දෙකටම ඇසෙන්නට කෑ ගසා කිව යුතුය.. ශනීනා කොතරම් දුකෙන් ඉන්නවා ඇත්ද...

'ශනීනාට මොකද...'

'කෙල්ලව කොහෙද ඇරලා... මං දක්කා අර එන මුස්ලිම් කොල්ලගේ කාර් එකේ අම්මත් එක්ක යනවා... උඹ දැන් ගෙදර පලයන්... ප්‍රශ්න ඇති කර ගන්න එපා...'

නිලන්ත මගේ උරහිසට අත තබා මොහොතක් බලා උන්නේය.

'මට කොහේ හරි යන්න තියෙනවා නිලන්ත...'

'පිස්සු කෙළින්න එපා සංදේශ්... මං දන්නවා උඹ ගැන... මට ඒක කරන්න පුළුවන්... ඒත් උඹට බෑ.. පිස්සු නොකර ගෙදර පලයන්.. ගැහුවත් ඉවසගෙන ඇඳට ගිහිල්ලා නිදගනින්... නැගපං මං ගිහින් ගෙදරට දන්නම්...'

'එපා.. මං තනියම යන්නම්...'





තිලන්ත මා යන තුරු වැලිය නවත්වා ගෙන උන්නේය. කණාමැදිරියන් දහස් ගණනක් හදපාන යාය පුරා විසිරී උන්නෝය. ලෝකය කෙරේ උපන් අපමණ කලකිරීමකින් මම නිවස දෙසට පිය මැන්නෙමි.

ශනීතලාගේ නිවස පාළුය.... මම එදෙසවත් නොබලා ගැහෙමින් ගේට්ටුවේ පලුව විවර කළෙමි.

ගෙට පය තබන්නට ලැබුණේ නැත. තාත්තා යකාවේශ වී කඩා පැන්නේය.

'ප..ර බල්ලා... මං... තෝ..ව...'

ඔහු වගේ කම්මුලට ගැහුවේය. මම හැරුනෙමි. ඔහුගේ අනිත් අත මගේ දකුණු කම්මුලට ආවේය.

'බ..ල්..ලා... බ..ල්..ලා.. තෝ... යකෝ අපිව කැවා...'

තාත්තා අඩමින් මට ගහන්නට විය...

'තා..ත්...තේ...'

නංගී කෑ ගසාගෙන ආවාය. අම්මා තාත්තාව බදා ගෙන අල්ලා ගත්තාය.

'ප..ල..ය..න්.. තෝ ඉන්නෙපා මේ ගෙදර... පලයන්.. පලයන්... මොනවද යකෝ බලන් ඉන්නේ පලයන්...'

මම වෙව්ලා ගියෙමි... දෙතොල තුවාල වී ලේ ගලන්නට විය. තාත්තා පිස්සෙකු සේ මගේ කමිසයෙන් අල්ලා කෑ ගසන්නට විය...

'ඒ..පා.. මොනවද මේ කරන්නේ.. ම..ගේ දා..රු..වා...'

අම්මා ඉකිබිඳ හැඬුවාය...

'මූ.. මූ අපේ දරුවෙක් නෙමේ...'

'පුතා යනවා උඩට... ය..නා..වා...'



www.sinhalaelibrary.com

අම්මා මාව තල්ලු කළාය.. මම හොගියෙමි...

'තොට හෙණ ගහනවා යකෝ මේ කරපු නින්දවට... බැණුම් අස්සන එකේ අස්සපිය සිංහල එකෙක්ගෙන්.... මේ මොක්කුද...'

යළිත් වතාවක් ඔහු මට ගහන්නට පැන්නේය. පහර වැදුනේ මැදට පැන ආ නංගිටය... ඇය වේදනාවෙන් හිස බිමට බර කර ගත්තාය.

'අ..යි..යා හැම දෙයක්ම ඉවර කරලා තා...ත්...තේ තියෙන්නේ.. අ..යියට ඉන්න දෙන්න...'

නංගි හඬමින් කීවාය. මම බිත්තියට වාරුවී මුහුණ ගසා ගත්තෙමි.

'ඔ..ව් මූ ඔක්කොම ඉවර කරලා තියෙන්නේ.... ප..ර වැඩ කරපු බල්ලා...'

මගේ අතමිට මෙලවී ගියෙන් මම තදින් බිත්තියට දමා ගැසුවෙමි.

'මං යනවා අම්මේ.... යනවා නංගී...'

ඇඳුම් මැද මම ගෙයින් පිටළුතෙමි. ඇත්තටම හිස හැරුණු අතක ගොස් සියදිවි නසා ගන්නට මම සිතා ගත්තෙමි. කොහොමත් ජීවත් වීමට වඩා මියයාම දන් සැපතකි.

'අ..නේ අයියේ...'

නංගි මගේ වම් අතක එල්ලුනාය.

'යන්නෙපා බුදු අයියේ.. මොනවද මේ කරන පිස්සු වැඩ...'

'පුතා...'

අම්මා හඬමින්ම පාරට ආවාය...





'උඹ පලයන් මාවත් මරලා... උඹලා ඔක්කොම මට හින්දර දෙනවා...'

ඇගේ වචන මගේ පපුව අළුයින් අවුළුවන්නට සමත් විය.

'හැ..ම දෙ..ය..ක්..ම ඉවරයි ර..ත්..න..රත් අම්මේ... මා..ව විශ්වාස කරන්න.... ඉ..ව..ර..යි... ඉ..ව..ර..යි...'

මම තරමක් කෑ ගසා කීවෙමි.

'ඉවර නිසා නේන්නම් අර කෙල්ලත් ගෙදර ඇවිත් ඇළහින්නා වගේ ඇඩුවේ...'

අම්මා හිච්චනම කීවාය... ශහීනාට දරා ගන්නට බැරි වන්නට ඇත... මට හීල්ලින... දෙපස ගිනි ගොඩවල් ගසා පපුවේත් ගිනි ගොඩවල් ගසා අපේ ආදරය සෑ අහ හතරක මිහිදන් කළාක් වැනිය.

'මෙහෙම ගෙ..ද..ර ඉ..න්..න.. බෑ අ..ම්..මේ...'

මම බෙරිවූ දෙතොල් තද කර කීවෙමි.

'අ..නේ මං ඔයාව කොච්චර ලස්සනට හැදුවද... මොනවද මේ උනේ....'

'මොනාවත් උනේ නෑ අම්මේ... පුතා කෙල්ලෙකුට ආදරේ කළා.. කරුමෙට ඒ කෙල්ල මුස්ලිම්... එච්චරයි...'

අම්මා පපුවම දවා හළු කරන සුසුමක් හෙළුවාය.

'හෙට යනවා... හෙට පාන්දරම බණ්ඩාරවෙල යන්න ලෑස්ති වෙනවා.. දන් ඔක්කොම ඉවරයිනේ...'

'ඔව්... මං පාන්දරම යනවා... පිටකොටුවේ ඉන්ටර් සිටි තියෙනවා ඕන නම් මං රෑම යන්නම්...'



www.sinhalaelibrary.com

'සංදේශ් අම්ම කෙනෙකුට උනත් ගින්දර දෙන එකේ සීමාවක් තියෙනවා. කියන දේ අහලා යනවා හෙට...'

'යන් අයියේ...'

'මං අර පැත්තට ගිහිල්ලා එන්නම්... රෑ වෙලා ඇවිත් නිදා ගන්නම්...'

'දැන් කොහේ යන්නද... ලෝකෙම දන්නවා විස්තරේ. මෙතන යුද්ධයක්නේ ගියේ... ලෝපේ උන් හිනාවෙනවා ඇති...'

නංගී ගෙට දුව ගොස් සෙරෙප්පු දෙක දමාගෙන ආවාය.

'අම්මා යන්න ගෙදර... අරයට නිදා ගන්න කියන්න... මං අයිය එක්ක පාර පැත්තට ගිහිල්ලා එන්නම්.... මිනිහෙක් මැරුණා කියලා දැනගත්තටත් පස්සේ පිහියෙන් අනින්න ඕන නෑනේ.. තාත්තා හොඳටම දන්නවා ඒක දන් නෑ කියලා... ඒ දැන දැන අයියට ගැහුවා.. යන්.. අම්මා යන්න ඉතින්...'

නංගීත් මමත් අඳුරු පටු මාවත දිගේ ඇවිදගෙන ආවෙමු. අම්මා ගේට්ටුව අසල බලා උන්නාය. ආදරයකට ජීවිත කීයක් ගිනි තැබිය හැකිද.

'කතා කරලා වෙන්වුනාට පස්සෙත් දෙන්නා හම්බ උනේ හත් දවසේ දනේ දෙන්නද... ඔයාලටත් පිස්සු අයියේ...'

නංගී කුළුපගව නමුත් චෝදනාත්මකව කීවාය. සැබෑය... අප අද කළේ නොකළ යුතු දෙයකි. වරදකරු මාය. මට තිබුනේ සියල්ල අමතක කර බණ්ඩාරවෙල යන්නටය.

'ඔයා ඩිල්ෂි එකෙක් පිටවෙලා ටිකකින් එයත් පිටවෙලා... ඒක අර අසාද් බලං ඉඳලා... මට ශහීනලාගේ ඩ්‍රයිවර් කිව්වේ... මේ කෙල්ල ගෙදර ආපු ගමන් අඩන්න ගත්තා. අඩන සද්දේ මෙහාට ආවා. ශහීනලාගේ තාත්තා ඇවිත් ඒ ගෙදර කෑ





ගැහුවා. මං හරි බයේ උන්නේ. එකපාර අපේ ගේට්ටුව ළඟට ඇවිත් තාත්තට කතා කළා.. ඉස්සෙල්ලා ඉංග්‍රීසියෙන් බැණගත්තේ... මුස්ලිම් ලේයි සිංහල ලේයි අද හොඳට රත් වුණා... පැයක් විතර...'

'ශහීනා...'

'එයාවයි අම්මවයි අසාද් අරගෙන ගියා... එයාලගේ ආගමේ තියෙන දේවල් වල හැටියට එයාලට මේ ප්‍රශ්න වාවගන්න බෑ...'

'මුස්ලිම් නායකයෝයි සිංහල නායකයෝයි එකතු වෙලා සභාග ගහලා ආණ්ඩු පිහිටවනවා....'

මම මෝඩයා සේ කීවෙමි.

'අනේ ඔයා දන්න දේශපාලනේ.. එහෙම ගහලා අවුරුදු පහක් එක දිගට තිබ්බ එක ආණ්ඩුවක් ඔයා මට කියන්න..'

නංගීගේ ප්‍රශ්නයෙන් මම අන්දුන් කුන්දුන් වූයෙමි. මගේ බොළඳ දේශපාලන අවබෝධය ගැන මම ලැජ්ජා උනෙමි. ඇය කියන්නේ ඇත්තය. සාම්බාරු සභාග වැඩි කල් තිබුනේ නැත. එක්සත් ජාතික පක්ෂය සමඟ සභාගයක් ගොඩනැගූ අෂ්රොෆ් මහතා අනූ හතරේදී පොදු පෙරමුණට එකතු විය. ඒ සභාගය ටික දවසකින් දියවී ගියේය. පසුව අෂ්රොෆ් මහතා පොදු පෙරමුණෙන් ඉවත් විය... දෙදස් දෙකේදී පොදු පෙරමුණේ උන් හකීම් මහතා මැතිවරණයෙන් පසු යූ ඇන් පියට එකතු විය. සිංහල නායකයෝද බලය සඳහාම සභාග ගැසූවෝය. ඒවා ඒ ඉක්මනටම බිඳී ගියේය. තොන්ඩමන් මහතා කළේද එයමය.

එහෙව් රටක ශහීනාගේ තාත්තාත් මගේ තාත්තාත් බැණ ගැනීම පුදුමයක් නොවේ...



www.sinhalaelibrary.com

‘ලෝකෙ ගැළපෙන්නෙම නැති දේවල් තියෙනවා අයියේ...’

‘ඔව් නංගී.. මං දන්නවා ඒක...’

‘ශශීනාගේ තාත්තා එයාව ඔයාට දෙන්න කැමති නෑ... එහෙමම තමා. අපේ තාත්තත් ඔයාව ශශීනට දෙන්න කැමති නෑ...’

‘මට මගේ ජීවිතේ ගැන හරි කලකිරීමක් දනෙනවා නංගී...’

‘හිතලම ජීවිතේ නාස්ති කර ගන්න එපා අයියේ.. ඔයාලට වඩා ආදරෙන් හිටපු අය වෙන්වෙනවා... කසාද බැඳලා බබාලත් හම්බවෙලා වෙන්වෙනවා.. අර අපි ඉස්සර හිටපු ගෙවල් ළඟ මයූරි අක්කා එයාගේ මහත්තයා නැති උන වෙලාවේ අඬපු හැටි මතකද... යාපනෙන් ගෙනාවේ සීල් කරපු මිනී පෙට්ටිය... ඒක ඇතුලේ මිනියක් නෑ කියලා ඔයාමනේ කිව්වේ... ඒත් ඒ ගෑනි දත් දරුවෝ දෙන්නා හදාගෙන ජීවත් වෙනවා... ජීවිතේ එහෙමයි...’

‘ඔව්... මං කියලා මොනා කරන්නද.. කොහොම හරි ජීවත් වෙනවා...’

‘ආයෙත් නම් රත්තරන් අයියේ ශශීනා ගැන හිතන්නවත් එපා... සුවර් එකට මිනියක් මැරෙයි...’

නංගී කිවේ සීතල ඇඟිලි තුඩු වලින් මගේ බාහුව අල්ලාගෙනය.

‘සාමය ආවේ මිනිය වළදෙලා... ආයෙත් ගොඩගන්නේ නෑ..’

‘බණ්ඩාරවෙල පාන්දරම යන්න... ගිහිල්ලා පිස්සු





නටන්නත් එපා... විනාශ වෙලා යන්න හරි ලේසියි... ඒත් අයියේ අපි නැගිට්ටේ හරි අමාරුවෙන් නේද...’

ජීවිතය ගැන වෙනස්ම ලෙස සිතිය යුතු කාලය පැමිණ ඇත. නංගී කියන දෙයක් ගැන සිතා බැලිය යුතුය. හරි පරිස්සමින් ගොඩනැගූ ජීවිතය මෙසේ අයාලේ යාම දුකකි. සියල්ලටම පෙර හදවතට තුවාල සනීප වන්නට කාලයක් දිය යුතුය.

‘මං බණ්ඩාරවෙල ගිහිල්ලා වෙනස්ම මිනිහෙක් වෙනවා...’

පාර කෙළවරටම ගොස් අපි යළිත් ගේ දෙසට හැරුනෙමු.

‘අ..නේ.. එහෙම එපා... ඔයාගේ වෙනස් කරගන්න මොනවත් නෑ... ඔය ඉන්න සංදේශ් හොඳයි...’

‘ඌ පිස්සෙක්... තොම්මර එකේ මැට්ටෙක්...’

‘ආදරේ කරන්නේ මැට්කමට නෙමේ... හැමෝම එතනදී ටිකක් වැරදි කරනවා...’

කඩය හරියේදී මම බිම බලා ගත්තෙමි.

‘ගෙදර පැනඩෝල් තිබ්බද...’

‘ඔව්... ඇයි හිසරදේද...’

‘නෑ කම්මුල දෙපැත්ත රිදෙනවා... පුපුරු ගහනවා...’

‘අ..නේ..’

තාත්තාගේ පහර වැදුණ කම්මුල් නංගී අතින් පිරිමැද්දය.

‘මං නටන්නම්...’

‘ශශීනලාගේ තාත්තා මාව මරනවා කිව්වද...’

‘ඕවා දන් වැඩක් නෑ... මිනිස්සු කරන හියාම කියන දේවල්... කොහොමත් ඔයා එයාලි ගැනත් කරන හිතේ



www.sinhalaelibrary.com

කියාගන්න එපා...'

ශහීනලාගේ නිවසම පාළුය.

'ශහීනලාගේ තාත්තා... ගේ විකුණනවා කිව්වා...'

'ඒක හොඳයි...'

'ඒ පාර අපේ තාත්තත් කියනවා 'යූ ජස්ට් හියර් ඊ විල් ඩිසාව' කියලා. මාර ගෙරියක්... කොහොමත් මට එක දෙයක් නම් හිතුණා...'

'මොකක්ද...'

'කවදහරි මේ රට තුනට කැඩෙනවා... සිංහල මුස්ලිම් දෙමළ ජාති තුනටම එකම රටක ඉන්න බෑ... පුදුම වෛරයකින් ඉන්නේ...'

'ඔව්... උතුර ප්‍රභා ඉල්ල ගනී... නැත්නම් ගහලා ගනී. නැගෙනහිර මුස්ලිම් අය ගනී.. අපිට දකුණ ඉතුරු වෙයි. ඉන්දියාවේ උනේ එහෙමනේ...'

'ඒ කොහොමද...'

'ඇයි ඉස්සර තිබ්බේ මහා භාරතය... ඉංග්‍රීසි රට නිදහස් කරන කොට තුනට කඩලා තමයි දුන්නේ පකිස්තානය බංගලා දේශය ඉන්දියාව කියලා.... තවම දේශ සීමා වලට මිනී මරා ගන්නවා.. මේ පැත්තේ අය පාකිස්තාන් සිංදාබාද් කියනවා... අර පැත්තේ අය හින්දුස්ථාන් සිංදාබාද් කියනවා...'

'ඕවා දනගෙන ඔයත් ලව් කරන්න ගියානේ...'

නංගී මට විහිළු කරන්නේ නැත. කොහොමත් අපට මීට වඩා හිතන්නට තිබුණි.

'බණ්ඩාරවෙලදී ලස්සන කෙල්ලෙක්ව අයියට හම්බවෙයි...'





'ඒක මහා දුකක් නංගී... තනියෙන් ඉන්න එක හරි සැහැසීමක්..'

'නෑ අයියේ ඔයා ආදරේ කළේ නැහැ ඒක පාට දනගන්න... ඔයා ආදරේ කරන්න හැදුවා විතරයි...'

'හදද්දී මෙච්චර දුක නම් කරද්දී කොහොම ඇත්ද...'

නංගි නිහඬ වූවාය. අපි ගේ එළිපත්තම පැමිණ උන්නෙමු.

'අද උඩ නිදාගන්න... මේ පැත්තේ තව ආත්මයක ඔයාගේ ගමලාන් හඳ පායන්නෙත් නෑ...'

'ඒ හඳ බැහැලම ගියා... පව්..'

'ඇත්තටම එයා පව්... ඒත් දුන් හිතන්නෙපා... ඔයා දන්නවද අම්මත් ලෙඩ ගානේ... හවස පසුවේ අමාරුව ආවා... සුදු එළුත් තම්බලා බිව්වා... මොනාහරි උනොත් ඔයාට ජීවිත කාලෙම විඳවන්න වෙයි...'

'නෑ නංගී...'

'යන්න ගිහිල්ලා නිදාගන්න.. මං බත් බෙදං එන්නම්..'

'බත් එපා...'

'තේ ටිකක්... කිරි දලා...'

ගහකට පණක් නැත. හිතට ඊට වඩා පණ නැත. ගෙයම නිස්කලංකය. මම ඉබ්බෙකු මෙන් උඩහළ මාළයට ගියෙමි.

ඉක්මනට හෙට පාන්දර වෙනවා නම්...

මට ඇහැරුනේ පාන්දර තුනට පමණය. වේල් දෙක තුනක් නොකා උන් නිසා ගතම අප්‍රාණිකව තිබුණි. කට දෙපැයකින් තුන් පැයකින් එළිවනු ඇත.



www.sinhalaelibrary.com

# 33

**කො**ළඹට හිරු පායන්නටත් ප්‍රථම මේ කොළඹට සමුදී බණ්ඩාරවෙල යන්නට මම සිතා ගත්තෙමි... එක අතකට ජීවිතයේ මේ සියල්ල මෙහෙමම වූ එක නිදහස්ය. ආදරය කොතරම් බරක්දැයි වේලාසනම මම තේරුම් ගත්තෙමි.

වතුර පොදකින් මුහුණ තෙමාගෙන මම පහළට බැස්සෙමි. තද බඩගින්නකුත් ඉවසා ගත නොහැකි පිපාසාවකුත් මට තිබුණි. පහළ තට්ටුව තිබුනේ තද කළුවරක ගිලීය. මළ ගෙයක් වී ගෙවී ගිය පළමු සතිය තුළද නිවසක ඇත්තේ මෙවැනි පාළුවක් විය යුතුය.

මම අම්මාත් තාත්තාත් නිදන කාමරයේ තිරය මෑත් කර බැලුවෙමි. අම්මාත් තාත්තාත් පව් යැයි මට ප්‍රථම





වරට සිතුණි... තව හෝරා කිහිපයකින් ඔවුන්ට දමා යන්නට වෙනවා නොවේදැයි මට සිතුණි. නංගීගේ කාමරයට යද්දී ඇය අනිත් ඇලයට හැරී නිද ඉන්නවා මම දුටුවෙමි. ඇය ඇඳගෙන උන් රෑ ඇඳුම ඇඹරී ඉහළට එසවී තිබුනොත් මම කාමරයට ගොස් ඇගේ වත වසා පොරොනය දමුවෙමි. නංගීගේ මුහුණේ තුනී හසරැල්ලක් විය...

ඇය නැතුව බණ්ඩාරවෙලදී මට මහා පාළුවක් දනෙනු ඇත. එක අතකට පාළුව කොහොමත් එකය.

අඳුරේම කුස්සියට පැමිණ විදුලි පහන දල්වා මම ශීතකරණය ඇර බැලුවෙමි. එහි කන්නට ගත හැකි දෙයකට තිබුනේ ක්‍රීම් ක්‍රැකර් බිස්කට් කිහිපයක් පමණි. නිවස සාගතයට හසුවූ නගරයක් වැනිය. සියල්ලට වගකිව යුත්තේ මාය... එහෙත් මා කුමක් කරම්ද...

ශබ්ද නොනැගෙන්නට කේතලය ලිප තබා මම කිරි කෝපි එකක් හද ගත්තෙමි. උණු කිරි කෝපි වල සුවඳ බඩගින්නෙත් ඇවිලුනු රස නහර පිනවාගෙන ගලා එන්නට විය... හදගත් කිරි කෝපි එකත් ක්‍රීම් ක්‍රැකර් බිස්කට් පැකට්ටුවත් ගෙන මම යළිත් ඉහළ මාළයට ආවෙමි...

ජීවිතේ අවසාන වරට මම කාමරයේ දෙර ඇර බැල්කනියට පිවිසුනෙමි. නැගෙනහිරි අහසේ බටහිර පැත්ත ලා දම් පැහැයට හැරී තිබුණි. ශශිනලාගේ නිවස මට පෙනුනේ නටබුන් වූ පාළු වෙහෙර ගෙයක් මෙනි. මේ බැල්කනි වලට වී මුළු රැයක් අපි අපේම මුහුණු දෙස බලා උන්නෙමු.

කැමැත්තෙන් හෝ අකමැත්තෙන් ඒ අතීතය දන් හදවත අමතක කර හමාරය... ශශිනාට මාව මතක් වෙනවා ඇත්ද... ඇය මා ගැන අනුකම්පාවෙන් හිතනු ඇත... කොහොමටත් අප හමු නොවී හිටියානම් ජීවිතය මීට



www.sinhalaelibrary.com

වඩා නිදහස්ය. නිස්කලංකය.

ක්‍රීම් ක්‍රැකර් තුන හතරකට වඩා කන්නට නොහැක. එහි කිසිදු රසයක් නැත. මා කුඩා වියේ සිටම ආශා කළේ චොකලට් බිස්කට් වලටය. ඉස්සර අම්මා දවල් තේ බොද්දී නංගීටත් මටත් කන්නට චොකලට් බිස්කට් පීයක් ගෙනවිත් තබා තිබුණාය. චොකලට් බිස්කට් කමින් මා තේ බිව්වේ පේර ගසේ අත්තක නැගය...

ඒ දවස් කොතරම් ලස්සනට තිබුණිද... ඒ දවස්වල මාළු වැංකියේ කාප් මාළුන්ට කෑම දමමින් උන්ගේ දඟලිල්ල බලමින් මම පැය දෙකතුන වැංකිය ළඟට වී උන්නෙමි. එදවස මේ හිතේ තිබුනේ මොනවාද. මොනවා තිබුණද දුකක් වේදනාවක් කලකිරීමක් හෝ ඇවිලීමක් නොතිබූ බව මට ඉදුරාම කිව හැක.

ආදරයේ කවිරුත් කියනා තරම් ලස්සනක් නැත.

අපේ නිවස ඉදිරිපිට මෙවන් නිවසක් ඉදි නොවුනා නම්... ඒ නිවසට ශහීනලා නාවා නම්... ආවද අප අතර බැඳීමක් ළෙන්ගතුකමක් හට නොගත්තා නම්.. හට ගත්තද ශගීනා මුස්ලිම් යුවතියක නොවුනානම් අපේ දෛවය... මගේ දෛවය මීට වඩා වෙනස් වන්නට තිබුණි. එහෙත් සියල්ල දන් සිදුවී හමාරය...

දවසක් පුරා වියළී වී තිබූ උගුරට මඳ රස්නයක් තිබූ කිරි කෝපි උගුර බිඳුන හිත නිවා සනසාලන්නට විය.

බණ්ඩාරවෙල ගොස් කෙල්ලෙක් දෙසවත් නොබලා ඉන්නට මම හිතා ගත්තෙමි. එහෙට ගිය පසු කුමක් හෝ දෙයකට දඩිව හිත යොදවන්නට මම සිතා ගත්තෙමි... හිත කුමකින් හෝ පුරවා තැබූ කල අතීත මතකය ගිනි රස්නයක්ව පසුවට කඩා පාත් නොවෙනු ඇත.

එක අතකට තනිකම හුදෙකලාවීම සුන්දරය... මම





හුදෙකලාවේ උන් කාලයේ විඳි සැහැල්ලුව සැනසීම සිහිකර ගන්නට උත්සාහ කළෙමි. එය සිහි කිරීමට අපිරු තරම් ඈතට ගොස් තිබුණි.

පාන්දර ප්‍රථම අරුණළු දහර රබර් අතු අග්ගිස්සෙන් වැටුණි. මුළු නැගෙනහිර අහස් කුසම ලා කහ පැහැයකට හැරුණි... ඒ අරුණළු දහරත් සමග මගේ ජීවිතයත් අළුත් වේවායැයි මම පැතුවෙමි.

මගේ ජීවිතය සතු අහිංසක බොහෝදේද ගෙන ආදරය පරව ගියේය... මේ අරුණළු දහරින් උදවූ දවසත් සමග ඒ අත්තකයම යළි දිනා ගන්නට මා සටන් කළ යුතුය.

ආදරවන්තයෙක් වූ සංදේශ්ට වඩා තනිකඩව උන් සංදේශ් ලස්සනය.. ජීවිතයේ කිසිම දවසක මා මේ තරම් ලෙඩ ගාණට වැටී නැත. අම්මාගේ තාත්තාගේ නංගීගේ හදවතකට දුකක් දී නැත. මගේ ආදරයත් සමග මුළු ගෙදරම මළ ගෙයක් විය... එවැනි ආදරයක් කොහොමටත් යළි පැතිය නොහැක. පැතුවද එය ගින්දරකි.

කිසිදු එක් නොවෙන්නට වෙන්වූ අප යළි කිසිම දිනයක හමු නොවේවායි මම ප්‍රාර්ථනා කළෙමි. මහත කොටකවත් ඒ මුහුණ දකින්නට වරම් නොලැබේවායි මම පැතුවෙමි.

ඈත කුඩාවට දිස්වන සමනල කන්ද දෙස මම මොහොතක් බලා උන්නෙමි. අද මීදුම් රහිත දවසක් නිසා කඳු යාය පැහැදිලිව පෙනෙයි. මම දනම එක් කොට සමනල කන්දට වැඳ බැල්කනියේ පුටුවෙන් නැගිට්ටෙමි.

පාන්දරම මම නාන කාමරයට වැදී පැයක් පමණ වෙලා ගෙන නා ගත්තෙමි. සීතල වතුර බිංදු ගතට වැටුනේ පුංචි පුංචි අයිස් කැට මෙනි. පසුවේ තිබූ ගින්දරත් ඒ සීතල වතුරින් පහව යන්නාක් මෙන් විය.



www.sinhalaelibrary.com

ජීවිතයේ විඳි ආගන්තුක උණුසුමකට මේ සිසිලස ගින්දරය... ගත පුරා රැඳි දිය බිඳු ය.නමට පිසදගෙන මම තුවාය පිටින් කාමරයට ආවෙමි...

නංගී මා එනතුරු කාමරයේ රැඳී උන්නාය.

'ගුඩ් මෝනින් අයියේ...'

ඇයද කතා කළේ සියල්ල අමතක කළ නියාවෙනි. එසේ විය යුතුය.

'ගුඩ් මෝනින් බබා...'

'පාන්දරම ඇහැරුණා නේද... මං අහගෙන හිටියේ දැදී...'

'මං හතට විතර ඇහැරුනේ...'

'නරක දෙයක් එහෙම හිතුවේ නෑ නේද...'

අඩමානයට මා දෙස බලා නංගී ඇසුවාය. මම තෙත තොණ්ඩය අතින් පිසදමා ඒ තෙත රැඳුණු අත්ලෙන්ම නංගීගේ කම්මුල අතගෑවෙමි.

'මේ අයියා ආයේ කවදාවත් තරහ වෙන්නේ නෑ... ඉස්සර හිටපු අයියව මතකද...'

'අයියටවත් එයාව දන් මතක නැද්ද...'

'නෑනේ...'

'ඉස්සර හිටපු අයියගේ මූණේ හැම වෙලාවෙම අහිංසක හිනාවක් තිබ්බා... පාන්දරම ඇහැරෙනවා.. මූණ හෝදගෙන තුස්සියට ඇවිත් අම්මා එක්ක කතා කර කර ඉඳලා තේ එකක් අරගෙන මටත් විහිළුවක් කරගෙන කාමරේට එනවා... රේඩියෝ එකේ ඒ වෙලාවට පිරිත් යනවා... ඔයා පිරිත් අහ අහා පොතක් බලනවා.. හාෆ් ෂීට් එකක් ළං කරගෙන





මොනවා හරි ලියනවා. උදේට හරි ලස්සනට ඉස්කෝලේ යන්න ඇඳගන්නවා... මේ ගෙදරින් ඔයා එළියට බහින්නේ හරි ලස්සනට... අපි දෙන්න යනගමන් දහක් දේවල් කතා කර කර යනවා... ඔයාට හරි ලස්සන අදහස් තිබ්බා. දේශපාලනේ ගැන උනත් ඔයා හරියට උනන්දුයි... මැච් එකක් තිබ්බොත් එතනින් හෙල්ලෙන්නේ නෑ... ගෙදරම දෙවනත් වෙන්න අත්පුඩි ගහනවා.. මුළුගේම පිරිලා... කවදාවත් කාමරේ ඇඳ බැඳගෙන ඉන්නේ නෑ... මට ඉන්න දුන්නෙත් නෑ... දවල්ට ජම්බු ගහේ බටේ බැඳගෙන පැය දෙකක් විතර නානවා... හිතුනාම මාවත් ළං කරගෙන මොනවා හරි ගෙදර අස් කරනවා... පුටු සෙට් එක ඒ ඇන්දෙන් මේ පැත්තෙන් අදිනවා.. මෙතනින් අතනට එනවා... ඉරිදට අම්මා නොගිය දවසට ඔයා පොළට යනවා... තනියම සිංදු කියනවා. ඔයා ඉන්නේ කොතනද එතන රස ලෝකයක්... දන් මටත් අවුරුදු දහනමයක් උනා... කවදාවත් මං මේ ගෙදරින් පිට දෙයක් ගැන හිතලා නෑ... ඒ ඔයා නිසා. මට හිත සතුටයි සැනසීමයි මක්කොම මේ ගෙදර තිබ්බා.. පහුගිය මාස තුනේ ඇරෙන්න... අපි ඒ දවස් ටික ආයෙත් හදගමු... නැත්නම් මටත් කව්රුහරි කොල්ලෙක්ව අල්ලගෙන යනවා...'

මම ඇත්තටම බිය උනෙමි. නංගී කියන්නේ බොරු නොවේ... මා වැඩකළේ වගකීමක් නැති මහා ආත්මාර්ථකාමියෙකු ලෙසිනි. අවම තරමේ නංගී ගැනවත් හිතුවේ නැත.

'මොනා දේවත් කළින් මං ටික දවසක් බණ්ඩාරවෙල



www.sinhalaelibrary.com

යළි ඉපදෙන නිසා විය යුතුය... මම සියල්ල අමතක කර යළි ජීවිතය පටන් ගන්නා බවට අම්මාට පොරොන්දු වූයෙමි. අම්මා කිරිබත් හදන්නට ඇත්තේ මගේ ජීවිතේ පැවති නපුරු දවස් කිහිපයක් ගෙවී ගිය නිසා විය යුතුය.

බොහෝ කලකට පසුව මම අම්මා තාත්තා නංගී එකට මේසයට වාඩි උනෙමු. රවුම් මේසයේ උන් ඇස් හයම බලා උන්නේ මා දෙසය...

'අයියා අද මනමාලියෙක් බලන්න යන දවස වගේ... හෝද තාත්තේ... රවුල ලස්සනට කපලා... අත් දිගට දලා... ටයි එකත් දලා...'

නංගිගේ කතාවට තාත්තා කිසිවක් නොකීවද ඔහුගේ මුවේ සියළු එදිරිවාදිකම් අත්හිටවූ බව හඟවන සුන්දර සිනාවක් විය.

එහෙත් නංගී කියූ ලෙස කිසිම දවසක මම මනමාලියෙක් නම් බලන්නට නොයමි. මනමාලියන් සියල්ල ජීවිතේ හදන්නේ අති කටුක දුක්ය... වේදනාය...

'තව කිරිබත් කෑල්ලක් කන්න...'

අම්මා හතරවෙනි කිරිබත් කෑල්ලත් මගේ පිඟානට බෙදුවාය. ඒ මතට තලපක් මිරිස් මාළු හොදි දම්මේ තාත්තාය.

'උදේන්ම ගියොත් තමයි අවයි කිස් තුනේ ට්‍රේන් එකට යන්න පුළුවන්... එද මං ගියේ ඒකේ... තුන තුනහාමාර වෙද්දි බණ්ඩාරවෙලට ගිහිල්ලා...'

තාත්තා කීවේය. කෝච්චියේ බණ්ඩාරවෙල යන ගමන සුන්දරය. ජීවිතේ ප්‍රථම වරට මම තනිවම එතරම් දුරක් යමි. එයද වෙනස් අත්දැකීමකි.



'පුතා ත්‍රී වීල් එකකම පිටකොටුවට යන්න... බස් වල දත් යන්න ගියොත් පරක්කු වෙනවා...'

පිඟානේ ඉතිරි වූ අවසන් කිරි බත් ඇට දෙක තුනද මම හුරාගෙන කෑවෙමි. අදින් පසු අම්මාගේ බත් නැත. මට මහා දුකක් දැනුණි. අවසන් කට කද්දි මට අම්මා දෙස බැලුණි. ඇගේ ඇස් වල කඳුළුය.

'අම්මා අයියගේ හිත අවුල් කරනවා... අඩන්නැතුව ඉන්නකෝ...'

නංගී කීවාය... අම්මා පහත්වී ගවුමෙන් කඳුළු පිසදු ගත්තාය.

'තෝරනා අරක ගේන්න...'

තාත්තා එකවරම කීවේය. අම්මා කාමරයට ගොස් සිහින් දිග කුඩා පෙට්ටියක් ගෙන ආවාය. තාත්තා ආඩම්බරයෙන් එය විවර කර එහි වූ රත්තරන් පැහැගත් ඔරලෝසුවක් මා අත තැබුවේය.

'ගොඩක් දවස් තාත්තා ගෙනත්... දුන්නේ නෑ...'

අම්මා සිනාසී කීවාය.

'තාත්තම බඳින්න...'

තාත්තා මගේ අතේ තිබූ ඔරලෝසුව ගලවා රන් පැහැගත් සිව්සන් ඔරලෝසුව වමතේ බැන්දේය. එය පැළඳි විට අත වෙනදට වඩා හැඩ විය.

අද යන්නේ ඉරණම් ගමනකැයි මට නිකමට සිතුණි... ප්‍රේමය පසුපසුවේ ඇති කළ තුවාල සදාකාලයටම මා සුවකර ගත යුතුය. ජීවිතය අලුතින් පටන් ගත යුතුය. මා නිසා හැලූ අයගේ කඳුළු වලට වන්දි ගෙවිය යුතුය.

තාත්තා හන්දියට ගොස් ත්‍රී වීලරයක් කතා කරගෙන

www.sinhalaelibrary.com

ආවේය.

මම ගමන් මල්ල බිම තබා තාත්තාට වැන්දෙමි. ඔහුගේ දෙතොල් වෙව්ලුවේ ඇයි දැයි මම නොදනිමි.

'ලොකු පුතා මා එක්ක තරහද...'

ඔහු අඩමින් ඇසුවේය. තාත්තා ගැසූ පහරවල් වල මතකය තවමත් කම්මුලට දැනෙයි. එහෙත් එහි දුක දැන් නැත.

'නෑ... තා...ත්...තේ...'

මටද ඇඬුණි. ඔහු මාව දැඩිව වැළඳගෙන මගේ හිස සිප ගත්තේය. තාත්තාගේ පපුව ගැහෙන රාවය මගේ පපුවට ළං ළංව දැනුණි.

අම්මාට වඳිද්දී අම්මාද මාව ළංකරගෙන දෙතුන් වරක් මගේ කම්මුල් සිපගත්තාය.

'ඔයාට වරදින් නෑ මගේ පුතේ... අපල දවස් ඉවරයි කියලා හිතලා යන්න...'

නංගී පැත්තකට වී අඩයි. මම ඇය ළඟටම ගොස් ඇගේ හිස අතගෑවෙමි.

'අයියා යන්න බබා...'

'මු...දු...ස...ර...ණ...යි... හැමදාම බණ්ඩාරවෙල ඉන්න හිතන්නෙපා... අපි කොහොමද ඉන්නේ...'

එසේ කියමින් නංගී මට දණ ඔබා වැන්දය. අම්මාගේ තාත්තාගේ නංගීගේ දෙනෙත් අභියස මම කුරුළු කැලේ නිවසට සමුදුන්නෙමි.

අම්මා තාත්තා නංගී බලා සිටියදීම පැහැදිලි ඇස් වලින් ශනීනලාගේ නිවස දෙස බැලුවෙමි. මුර නිවසම පාළුය.





'මේ ළමයව දක්කොත් බණින්න එපා... එයා හරක ගැණු ළමයෙක් නෙමේ...'

එපමණක් මම කීවෙමි. එසේ කියන්නට මට යුතුකමක් ඇත. දෛවය අපව වෙන් කළ බව ඇත්තය. එහෙත් මිනිස්කමක් කියා දෙයක් ලොව ඇත.

මම ත්‍රී වීලරයට නැඟ යළිත් අම්මා තාත්තා නංගී දෙස බැලුවෙමි. ඇස් හයේම කඳුළුය.

මගේ ඇස් තෙමී ගියේ කුරුළු කැලේ මැදක් හරියේදිය... අසමණ සැමරුම්... ආදර මතක... ජීවිතේ ප්‍රථම කඳුළු... සියල්ල හැරද මම යමි. ගඳපාන මල් සුවඳ ඉහිරි ගිය රැයක දුටු ශනීනාව මට සිහිවෙයි... සියල්ල එකම කඳුලක දියවී වැගිරෙන්නට විය.

මේ ජීවිතය විය යුතුය. කම් නැත. එය දරා ගත යුතුය. ප්‍රේමයේ ප්‍රථම ප්‍රාණය කුරුළු කැලේ ගුරු පාරේ මිහිදන් කර දමා ත්‍රී වීලරයේ පුංචි රෝද තුන මාව කොළඹ ගෙන ගියේය.

'සංදේශ් මල්ලි පණිවිඩයක් තියෙනවනම් ශනීනා බේබිට මං කියන්නම්... බය වෙන්න එපා... බේබි කාර් එක නැති දවසට යන්නේ මගේ ත්‍රී විලර් එකේ...'

මම කොළඹ රැගෙන ආ ත්‍රී වීලරයේ රියදුරු ගාමිණී අයියා කීවේය. මම ත්‍රී වීලරයෙන් බැස ත්‍රී වීලරයේ පොල්ල අල්ලාගෙන ඔහු දෙස බලා උන්නෙමි.

'හැම දෙයක්ම අමතක කරලා දලා එයාට හොඳට ජීවත් වෙන්න කියන්න... ඉක්මණටම කසාද බැඳලා බබාලා හදාගෙන ලස්සනට ජීවත් වෙන්න කියන්න...'

වෙව්ලමින් මම එසේ කීවෙමි. ඔහු අසරණව හිස

වැනුවේය.

'මං යන්නම් ගාමිණී අයියේ...'

'හොඳයි සංදේශ් මල්ලී...'

බණ්ඩාරවෙල යන දුම්රියේ ප්‍රවේශ පත්‍රයක් මිලට ගෙන මම මගී සාලමෙන් එගොඩ වී දෙවන වේදිකාවට ගියෙමි... තවම බණ්ඩාරවෙල බලා යන බදුලු කෝච්චිය පැමිණ නැත. තව මොහොතකින් එය වේදිකාවට එන බව ශබ්ද වාහිනී යන්ත්‍රයෙන් කියවිණ. බදුලු කෝච්චිය මාවත් රැගෙන බණ්ඩාරවෙල යන්නේ දෛවෝපගත සිදුවීම් රැසක් අවසානයේය.

ඇත්තටම මගේ ජීවිතයේ හෙට දවස කුමක්ද...

ශහිනා කොහේ කොතැනක ඉන්නවා ඇත්ද. මා අද බණ්ඩාරවෙල යන බව ඇය දනී. ඊයේ රෑ වූ ප්‍රශ්නයද ඇය දනී. සියල්ල නිමා වූ බව ඇයටද අමුතුවෙන් කිව යුතු නොවේ.

ප්‍රේමය අරභයා පසුව කඩාගෙන දනෙන ලෝබකම ඊටත් වඩා නැති කර ගත යුතුය. ශහිනාව සිහිවෙන වාරයක් වාරයක් පාසා එකී ලෝබකම මට දනෙයි. ඒ ලෝබකමට ජීවිතයේ මත මැවූ දුක් කන්ද මා සිහිකර ගත යුතුය.

ලොවේ පෙම්වතුන් සියල්ලෝම එක් නොවෙති... හමුවෙන බොහෝ අයගෙන් බොහෝ දෙනා වෙන්වෙති. 'පෙම් ලෝකයේ මතක වික කාලයයි...' කියා ජෝති කියන්නේ ඇත්තදයි මම නොදනිමි. තවමත් මගේ ප්‍රේමයේ මතක මා අඬවයි.

අදින් පසු ජීවිතය දවන තනිකම හුදෙකලාව... පාළුව... යළි යළිත් මාව හඬවනු ඇත. එහෙත් සියල්ල ඉදිරියේ ජීවත් වන්නට මම අද පාන්දරම හිතා ගත්තෙමි. ජීවත් වෙමින් දුක් විඳීම ප්‍රශ්නයක් නොවේ. හදිසියේ මෙන් දුක පැමිණ පසුව පාරවන බව පමණක් මම දනිමි.





ශහීනාව විවාහ කර දෙනු ඇත. අසාද් ඇයව සාම්ප්‍රදායික ඉස්ලාම් කුල සිරිත අනුව විවාහ කරගනු ඇත. ශුද්ධ වූ කුරානයේ අත තබා ඔවුන් වෙන් නොවන්නට පොරොන්දු දෙනු ඇත. පසුව බබාලා හදනු ඇත. පේද පැළඳගත් සාම්ප්‍රදායික මුස්ලිම් ගැහැණියක් මට සිහිවිය.

මම ඊර්ෂ්‍යා නොකරමි. වෛර නොකරමි. ආදරය කරන්නාටම සියල්ල හිමි නොවේ. අවසාන වතාවටත් මතක බිම දමූ මම දෙවෙනි වේදිකාවට ආ බදුලු කෝච්චියට නැග්ගෙමි.

මං ඉකින් යන්න යනවා
මට යන්න අවසරයි...
මට අරන් යන්න ඇත්තේ
ඒ මතකය විතරයි...

# කුංකුම අංජන
# පළමුකොටස
# නිමි.

**ආදරය** යනු දෙවියන්ගේ පාරිශුද්ධම මැවීමයි. නමුත් අපට ආදරය කරන්නට වන්නේ දෙවියන්ගේ ලෝකයේදී නොව කුහක නිර්දය වර්ගවාදී ජාතිවාදී ආගම්වාදී නොමිනිසුන් ජීවත්වන මේ ජරාජීර්ණ වූ මනුසත් උයනේදීය. ඒ මනුසත් උයනේදී හමුවූ අහිංසක

KUNKUMA ANJANA 220.00

# කුංකුම අංජන

*Kumkuma Anjana*





www.sinhalaelibrary.com

220/=